# කලා

## සඟරාව

1 වැනි වෙළුම
6 වැනි කලාපය

විශේෂ සමරු කලාපය



ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ප්‍රකාශනයකි


# කලා සඟරාව

සිව්මාසිකය

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ප්‍රකාශනයෙකි.

1 වැනි වෙළුම
(නව පෙළ)

6 වැනි කලාපය



## විජයග්‍රහණ වර්ෂ පූර්ණය

## විශේෂ කලාපය

2010 මැයි 18

සංස්කාරක

මානවවිද්‍යාඥ පණ්ඩුල ඇඳගම

ශ්‍රී ලංකා කලා මණ්ඩලය,
ජාතික කලා භවන,
ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ - 07.

මෙම සඟරාවේ ඇතුළත් ලිපිවල අන්තර්ගත අදහස් හා ප්‍රකාශ පළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු වන අතර, ඒවා අවශ්‍යයෙන් ම ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ අදහස් පිළිබිඹු නොකරන බව සැලැකුව මනා ය.

පිට කවරය හා පරිගණක අක්ෂර සැකැසුම
කසුන් ගීවන්ත විසිනි.

මුද්‍රණය
ඇඩ් ඇඩ්ස් - මහරගම.

# III

## සංස්කාරක සටහන.......

වසර 600 කට පසු රට ජාතිය එක් සේසත් කරන ලද ප්‍රථම අවස්ථාව උද කළ 2009 මැයි 18 දින අත්පත් කොට ගන්නා ලද ජාතියේ අසම සම යුදමය විජයග්‍රහණයට වසරක් පිරීම නිමිත්තෙන් ජාතිය බේරා ගත් දේශපාලන නායකත්වයට යුද පිටියේ ජීවිත පරිත්‍යාගයෙන් සටන් වැදුන විරෝධාර රණවිරු බල ඇණියට හා ඒ සියල්ලට ශක්තිය ධෛර්යය හා ආශිර්වාදය නොඅඩුව ලබා දෙමින් තමන්ට මුහුණ දෙන්නට සිදු වූ සියළු දුක් වේදනා ජාතියේ නාමයෙන් ඉවසා දරා සිටි දේශප්‍රේමී ජනතාවට ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ බැති උපහාරය පළකරනු වස් කැප කරන ලද විශේෂ සමරු කලාපයයි මේ. මුළු රටම සමග එකතු වී ශ්‍රී ලංකා කලා මණ්ඩලය ද මෙසේ ජාතියේ විජයග්‍රහණයේ ප්‍රථම වර්ෂ පූර්ණය සමරන්නේ ඇයි?

වසර 3000 කට ආසන්න වූ ප්‍රෞඪ වර්ණවත් අතීත ඉතිහාසයකට උරුම කියන අපි ඒ දීර්ඝ කථාවලියේ නොයෙක් අවස්ථාවල දී විදේශික සතුරු බලවේග රට ජාතිය ආක්‍රමණය කොට යටත් කොටගත් හැම විටම ඊට එරෙහිව අපේ වීරෝධාර මුතුන් මිත්තන් එඩිතරව ජීවිත පරිත්‍යාගයෙන් නැගී සිටි ආකාරය පිළිබඳ කියවා ඇත්තෙමු. එහෙත් ඒ එක ද සිදුවීමක් හෝ අප විසින් දැක නොතිබූ නිසා දෝ නැතිනම් අපේ ජාතිකත්ව හැඟීම් අධිරාජ්‍යවාදීන් විසින් සුණු විසුණු කොට දමා තිබුණු නිසා දෝ අපේ ලේ නහරගතව අපව නිරතුරුව ප්‍රබෝධමත් කරවන ලද බවක් හෝ කිව නොහැකිය. එසේකුදු වුවත් ඒවා කියවා අසා අපි අපමණවත් කුල්මත් වීමු. එසේ නම් එවන් හෝ ඊටත් වඩා බරපතළ සිදුවීම් සියැසින්ම දැක අපේ වීරෝධාර ආරක්ෂක වීරවරයන්ගේ සුරවීරකම් නහරයක් නහරයක් පාසා ගලා යන අත්දැකීම් ලබන්නට තරම් වාසනාව ලද විට ඒ ජනතාව තුළ උතුරා යා හැකි දේශප්‍රේමය කෙතරම් විය හැකි දැයි සිතා ගනු අපහසු නැත. එහෙයින් පසුගිය වසර 30 ක් පුරා කාලයක් තිස්සේ මෙරට ජීවත් වූ හැම දෙනාටම 2009 මැයි මස 18 වැනිද යනු තම ජීවිතයේ අන් කවරදකටත් වඩා සදනුස්මරණීය ඓතිහාසික දිනයක් කොට සැළකෙනවා නිසැකය.

එය එසේ වන්නේ ලැබූ ඓතිහාසික විජයග්‍රහණය නිසාම නොවේ. එය ලැබූ ආකාරය, ලැබීමට දෙන ලද දයකත්වය මෙන්ම එය ලබා ගැනීමේ දී රටේ රාජ්‍ය නායකයා විසින් ජනතාව වෙත ප්‍රදර්ශනය කරන ලද දැඩි අධිෂ්ඨානශීලිත්වය, අවංක බව, සෘජු බව හා කිසිදු ජගතෙකු ඉදිරියේ නොනැමෙන සුළු බව විසින් ජනතාව තුළ ඇති කරනු ලැබූ ඉතා ගැඹුරු අභිමානය නිසාය. රට, ජාතිය, දේශීයත්වය වෙනුවෙන් එදා හෙළ රජ දවස අපේ දේශමාමක වීරෝධාර මුතුන් මිත්තන් ජීවිත පරිත්‍යාගයෙන් කැප කිරීම් කළ හැටි විනිවිද දැක රට දැය වෙනුවෙන් තමා ද එසේ කැපවිය යුතුය යන හැඟීම ජනතාව තුළ ඇති කරනු ලැබ ඇත. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් අපේක්ෂිත මතෙන් තොර, සාරගුණධර්මවලින් පිරි, සදචාර සම්පන්න සෞභාග්‍යමත් සමාජයක් බිහි කිරීම ස්ථිර යයි ජනතාවට හැඟෙන ආකාරයේ කම්පනයක් ඇති කිරීමම උදම් ඇනීමට හේතුවකි.

එහෙයින් බිඳුන සිත් සුවපත් කරන්න ඇත් වූ හදවත් ලංකරන්න වීරෝධාර රණවිරුවන් විසින් දිනා දෙන ලද විජයග්‍රහණයම යොද ගනිමින් රාජ්‍ය නායකයා

විසින් ගෙනයන වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා දායක වීම දේශප්‍රේමී සැමගේ යුතුකමය. මෙම ප්‍රථම වර්ෂ පූර්ණ සමරු කලාපයේ ප්‍රධාන අරමුණ මෙම වගකීම පිළිබඳ රටටම මතක් කර දීමය. මෙම විශේෂ සමරු කලාපයට තවත් ලිපි කිහිපයක් අපේක්ෂා කළ නමුදු ඒවා නොලැබීමෙන් විශේෂ කලාපයෙන් බලාපොරොත්තු වූ පූර්ණ විග්‍රහයක් වැළකී ගොස් ඇත. කෙසේ වුව ද අපේ ආරාධනය පරිදි ලිපි සැපයූ සියළු දෙනාට දේශප්‍රේමී ජනතාව වෙනුවෙන් කෘතඥ වෙමු. ලිපි සැපයූ අය තරමටම තම දායකත්වය සැපයූ, ඒවා පරිගණක කොට සෝබමාන ලෙස මුද්‍රණයට සූදානම් කළ කලා මණ්ඩලයේ පරිගණක ක්‍රියාකරු කසුන් ගීවන්ත ද කලා මණ්ඩලයේ ලේකම් කමල් බී. දිසානායක ප්‍රධාන කාර්ය මණ්ඩලය ද අපේ ගෞරවයට හිමිකම් කියති.

මෙම සමරු කලාපය හරවත් කිරීම සඳහා වටිනා උපදෙස් සහිත පණිවුඩයක් නිකුත් කිරීමට තරම් කාරුණික වූ ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යතුමිය වූ නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනියට අපේ කෘතඥතාවය පළ කරමු. එලෙසින්ම යහපත් මග පෙන්වීම් සහිතව පණිවුඩයක් නිකුත් කිරීමෙන් අප දිරිමත් කළ අපේ ගරු නියෝජ්‍ය අමාත්‍ය ගුණරත්න වීරකෝන් මැතිතුමාට ද අපේ කෘතඥතාවය හිමිවනු ඇත. අමාත්‍යාංශයේ ලේකම් විමල් රූබසිංහ මහතා අපට හැමවිටම මහත් ධෛර්යයක් වී ඇත. මෙවන් කටයුතු බෙහෙවින් අගේ කරමින් පණිවුඩයක් නිකුත් කිරීම ගැන එතුමාට ද කෘතඥ වෙමු.

මෙම විජයග්‍රහණය අත්පත් කරදීමට එඩිතරව අභීතව ගතයුතු තීරණයන් නොබියව ගනිමින් නිවැරදි නායකත්වය ලබා දෙමින් විරෝධාර රණවිරුවන් දිරිමත් කළ අනෙක් පැත්තෙන් ජනතාව මත සියළු විශ්වාසය තබා ඔවුන්ගේ සහාය පතමින් හා ලබමින් සමනළ කන්ද සේ නොසෙල් වී එකම එල්ලයකට ක්‍රියා කළ රාජ්‍ය නායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට ද රට ජාතිය හා තම සහෝදර ජනතාව ගැන මිස තම ජීවිත ගැන නොසිතා ඉදිරියටම යමින් සතුරාට පවා කරුණාව මෛත්‍රිය පාමින් ම්ලේච්ඡ ත්‍රස්තවාදීන් පමණක් විනාශ කිරීමට තරම් සිංහලකම ප්‍රදර්ශනය කළ විරෝධාර රණවිරුවන්ට ද රට ජාතිය වැටී ඇති අඳුරු අගාධය ගැන මැනවින් සිතා බලලෝභී නායකයන්ගේ වාටු බස්වලට නොරැවටී විරෝධාර රණවිරුවන් ඔවුන්ගේ වගකීම ඉටු කරන තුරු සුවිශාල දුක් වේදනා විඳමින් නිසොල්මනේ ගමනට ආශිර්වාද කළ පොදු ජනතාවට ද ඒ හැමට ආශිර්වාද කළ ගරුතර සංඝරත්නය හා පූජක තුමන්ලාට ද මෙම විශේෂ කලාපය පුදන්නට ලැබීම වාසනාවකි. කළගුණ දත් හෙළ ජනතාවගේ හැදිච්චකම එය යයි පාඨකයාට හැඟේ නම් අපේ ව්‍යායාමයේ ප්‍රතිපල ලැබුණේ යයි අපි සැනසෙමු.

පණ්ඩුල ඇඳගම
සභාපති
ශ්‍රී ලංකා කලා මණ්ඩලය

# පටුන

පිටුව

1. "මහින්ද චින්තනය" ජනහිතකාමී අර්ථාන්විත
රාජ්‍ය ප්‍රතිපත්තියකින් පෝෂණය වන
ශ්‍රී ලාංකික ජන සමාජය හා සංස්කෘතිය.
විමල් රූබසිංහ 1-16

2. ආනන්දයෙන් ප්‍රඥාව කරා ජනතාව රැගෙන
ගිය කලාව ද සුණු විසුණු කළ බෙදුම්වාදී
ත්‍රස්තවාදයට පෝෂණය සැලසූ මෙරට
මාධ්‍ය භාවිතය
මානවවිද්‍යාඥ පණ්ඩුල ඇඳගම 17-73

3. යුද බංකර්වලින් ගලාහැලෙන කලා රසය
බංකර් කුරුටු ගී
මේජර් ජෙනරාල් ප්‍රසාද් සමරසිංහ 74-87

4. ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජයගැනීමට
බාධාකාරී විය හැකි සංරෝධක
ඩී.ඇම්. අජිත් දිසානායක 88-99

5. ත්‍රස්ත උවදුරින් නිදහස් වූ සමාජයේ
සංස්කෘතික ප්‍රගමනය සාක්ෂාත් කරවිය
හැකි කලා භාවිතය
කලාසූරි රෝහණ දේව 100-109

6. ත්‍රස්තවාදී උවදුරෙන් මුදගත් ශ්‍රී ලංකාව ලත්
නිදහස සහ අනාගතය (සාමය, සදාචාරය,
කලාව, සංස්කෘතිය හා සංවර්ධනය කරා
යන ගමන)
ආචාර්ය ලීල් ගුණසේකර 110-117

# VI

## ලේඛකයෝ

විමල් රූබසිංහ, ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළපුරුදු ජ්‍යේෂ්ඨ නිලධාරියෙකි. ලේඛකයෙකි. ගී පද රචකයෙකි.

පණ්ඩුල ඇඳගම, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති.

මේජර් ජනරාල් ප්‍රසාද් සමරසිංහ, යුද හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක වේ. ත්‍රස්තවාදී භීෂණය මර්දනය කිරීමේ මහා සටනේ විශිෂ්ඨ කාර්ය භාරයක් ඉටු කළ රණ විරුවකු වශයෙන් සම්මානයට පත් වූවෙකි.

ඩී.ඇම්. අජිත් දිසානායක, කැළණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික අධ්‍යයන අංශයේ ජ්‍යේෂ්ඨ කතිකාචාර්ය වරයෙකි. කාලීන සමාජ-ආර්ථික දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වන්නෙකි.

කලාසූරි රෝහණ දේව, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභිකයෙකි. රූකඩ රූපණ කලාවේ වර්ධනය අරමුණු කොටගත් "තිදෙර" සංවිධානයේ අධ්‍යක්ෂවරයාය. ගුවන් විදුලි නිවේදකයෙකි.

ආචාර්ය ලීල් ගුණසේකර, ජ්‍යේෂ්ඨතම පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරියෙකි. ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභාවේ සභිකයෙකි. රාජ්‍ය සම්මානනීය සාහිත්‍යකරුවෙකි.

# VII

## ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍යතුමියගේ සුබ පැතුම් පණිවුඩය.

පසුගිය වසර තිහකට වැඩි කාලයක් තුළ මෙරට වෙලාගෙන සිටි රුදුරු ත්‍රස්තවාදය විසින් සිදුකරන ලද අතිමහත් විනාශයෙන් අපව මුදවාගෙන සමස්ත රට වාසීන්ට අළුත් නිදහසක සුවය ලබාදෙන ලද ඓතිහාසික අවස්ථාවකි. සාමය ලැදි ගැටුම් අකමැති සමස්ත ලෝකයාටම ත්‍රස්තවාදය යනු නිවැරදි එඩිතර අවංක නායකත්වයක් ඇත්නම් විනාශ කළ නොහැකි බලවේගයක් නොවන බව පෙන්වා දීමෙන් සැනසිලි සුවයක් ලබාදෙන ලද ඓතිහාසික විජයග්‍රහණයකි. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වූ මෙම අසමසම සංසිද්ධියේ ප්‍රථම සාංවත්සරය අති උත්කර්ෂවත් අන්දමින් සැමරීම දේශප්‍රේමී හැම දෙනාගේ පරම යුතුකමක් බව අප හැදුනු වැඩුනු පෝෂණය වුනු හැදියාව අනුව අපට අවධාරණය කරනු ලබයි.

එහෙයින් ජාතියේ සංස්කෘතික උරුමයන් සුරැකීම හා සංවර්ධනය කිරීමේ වගකීම දරණ ශ්‍රී ලංකා කලා මණ්ඩලය මෙම ඓතිහාසික විජයග්‍රහණයේ ප්‍රථම සාංවත්සරය සැමරීමට පියවර ගැනීම ප්‍රශංසනීය කටයුත්තකි. මන්ද යත් තම ජීවිත පුද අප හැම වෙනුවෙන් රට නිදහස් කොටදුන් වීරෝධාර හැම වෙනුවෙන් කරන ඉහළම උපහාරය වන නිසාය.

ජාතියක් වශයෙන් අප ලබාගන්නා ලද ඒ ඓතිහාසික විජයග්‍රහණය සැමරීමේ ඉතාමත් පලදායක ක්‍රමය වන්නේ රටේ සියළු ජනතාව වෙත ලබා දුන් නව නිදහස සැබෑ ලෙස විඳ ගැනීමට හැකිවන පරිදි සාමය, සමගිය ඇති කරනු වස් සංවර්ධනයේ ප්‍රතිලාභ ලබාගැනීමට සෞභාග්‍යය උදාකරලීමයි. එහෙත් සීඝ්‍ර සංවර්ධනයක් ළඟා කරගැනීමේ මහා සංග්‍රාමයේ දී ද පළමුවෙන්ම කම්පනයට පත්වන්නේ ද සමස්ත ජනතාව සුහදව, ලෙන්ගතුව, එකට බැඳී ජීවත් වීමට මග කියාදෙන ඒ සංස්කෘතියම ය. නව නිදහසක් භුක්ති විඳින ජනතාවට සැනසිලිදායක පරිසරය සූදනම් කිරීමෙහි ලා අනගිතම සේවාව සලසන සංස්කෘතිය හා කලාව සීඝ්‍ර සංවර්ධනයේ නාමයෙන් හැල හැප්පීම්වලට භාජනය වීමට ඉඩකඩ ඉතිරි කිරීම

යනු රැකගත යුතු, වර්ධනය කළ යුතු, පෝෂණය කළයුතු දෙයම විනාශ වීමට මග පෑදීමක් වැනිය. එහෙයින් ජනතාව ජීවත් කරවීම සඳහා බිහිකරනු ලබන සංවර්ධනය සමබර සංවර්ධනයක් බවට පත් කිරීමට අප වග බලාගත යුතුය. භෞතික සංවර්ධනය අධ්‍යාත්මික සංවර්ධනය සමග අත්වැල් බැඳ ගත යුතුය. එනම් සංස්කෘතිය හා කලාව සංවර්ධනය කළ යුතුය. අද යුගයේ අවශ්‍යතාවය වී ඇත්තේ මෙම සාමබර සංවර්ධනය බවත් සංස්කෘතිය සමාජයේ සෑම අස්සක් මුල්ලක් නෑර සෑම තැනකම පවතින හා පැවතිය යුතු බවත් අමතක නොකොට කටයුතු කිරීම අපගේ අනාගත සෞභාග්‍යයේ නොවරදින මග බව අවධාරණය කළ යුතුය.

ත්‍රස්ත විනාශයෙන් මුදවා සියළු ජන කොටස් සතුට, සැනසිල්ල, සාමය, සෞභාග්‍යය කරා ගෙන යාමට සපත වූ මහින්ද චින්තනය ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් වේ. එනම් ලොව කිසිදු පැරදවිය නොහැකි තරමට බලසම්පන්නතම ත්‍රස්ත ව්‍යාපාරය ලෙසට ව්‍යාජ පුරසාරම්වලින් පුම්බා තබන ලද කොටි ත්‍රස්තවාදය කෙටි කලකින් සුණු විසුණු කර දැමීමය. ඒ සිදු කළ වීරෝදාර රණවිරුවන්ට, ඔවුන්ට නිවැරදි එඩිතර නායකත්වය සැපයූ අසමසම රාජ්‍ය නායක අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙන්ම ඔවුන්ට අවශ්‍ය ශක්තිය ධෛර්යය සැපයූ දේශප්‍රේමී පොදු ජනතාව වෙත කෘතගුණ සලකනු වස් මුළු ලොවම විශ්මයට පත් කළ ඒ විජයග්‍රහණය ලැබූ මොහොත අනුස්මරණය කිරීම සියළු දේශප්‍රේමී ජනතාවගේ යුතුකම බව අමුතුවෙන් කිවයුතු නොවේ. මෙම පරම සත්‍යය මැනවින් අවබෝධ කොටගෙන ශ්‍රී ලංකා කලා මණ්ඩලය සිය වාර ප්‍රකාශනයේ විශේෂ කලාපයක් ඒ සඳහා වෙන් කිරීමෙන් පෙන්වා ඇති විශිෂ්ට උදාර සංස්කෘතික ගුණය බෙහෙවින් ප්‍රශංසනීය බව ඉතා ආඩම්බරයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. එහෙයින් මේ වෙනුවෙන් ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු ගරු ඇමතිතුමිය වශයෙන් මගේ ද ජනතාවගේ ද ගෞරවය ශ්‍රී ලංකා කලා මණ්ඩලය වෙත පුද කිරීමට නිර්ලෝභී වෙමි.

නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි
ජාතික උරුමයන් හා
සංස්කෘතික කටයුතු අමාත්‍යතුමිය

# IX

## ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ සුභ පැතුම් පණිවුඩය.

අද අප ජීවත්වන්නේ පශ්චාත් යුද සමයකය. තිස් අවුරුද්දක් තිස්සේ ඉතා දැඩි කෲරත්වයකින් යුතු ත්‍රස්තවාදයක් දියත් කරමින් තමාගේ වර්ගයා මෙන්ම අනෙක් වර්ගයා ද උගත්-නූගත්, ස්ත්‍රී-පුරුෂ, බාල-මහළු භේදයකින් තොරව හැම දෙනා වෙත විනාශය ගෙන දෙමින් රටත් ජාතියත් නව යටත් විජිත වාදයට පාවා දීමට කටයුතු කළ කොටි ත්‍රස්තවාදය විනාශ කොට දැම්මා පමණි. කිසිදු පරාජය නොහැකි ලොව ප්‍රබලතම ත්‍රස්ත ව්‍යාපාරය ලෙස කිරුළු පැළඳ සිටි එය සහමුලින් විනාශ කොට රටට, ජාතියට, සියළු රට වැසියනට නව නිදහසක අස්වැසිල්ලක් සැනසිල්ලක් ප්‍රීති ප්‍රමෝදයක් ගෙන දීමට යමෙකු සමත් වූයේ නම් ඒ මොහොත කළගුණ දත් සැම සියළු දෙනාගේ මතකයේ හැමවිටම රැව් පිළිරැව් දිය යුතු අනුස්මරණීය අවස්ථාවකි. මේ බව සැමට කියා පෑමට ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසින් ගෙන ඇති උත්සාහය හා උනන්දුව ඉතා ප්‍රශංසනීය වේ.

යුද කෝලාහල හේතු කොටගෙන විනාශ වූ ජීවිත හැර අන් සියල්ල නැවත ලබා දීම සඳහා උපරිමයෙන් පූර්ණ උත්සහාය ගත යුත්තේ මෙම පශ්චාත් යුද සමයේ දී ය. ඒ සඳහා ඇති එකම මග රට සංවර්ධනය කොට සෞභාග්‍යය උදා කරලීමයි. එහෙත් එම සංවර්ධනය අංග සම්පූර්ණ විය යුතුය. එය කළ හැක්කේ භෞතික සංවර්ධනය සමග අධ්‍යාත්මික සංවර්ධනය ද අත්වැල් බැඳ ගනී නම් පමණි. එනම් සංස්කෘතික හා කලා ක්ෂේත්‍රවල ප්‍රගමනය සිදු කිරීමයි. ත්‍රස්තවාදය විසින් විනාශ කරනු ලැබූ ගේ දොර, මග තොට, පාරවල්, පාලම්, බෝක්කු සියල්ලට වඩා බරපතළම විනාශය නම් සාරගුණධර්ම, සදාචාරය හා යහපැවැත්ම සෝදා පාළුවට ලක් කිරීම හරහා කලාවත් කලා කරුවනුත් විනාශයට පත් කරවීමය. එසේ කළේ ආනන්දයෙන් පටන් ගෙන ප්‍රඥාවෙන් කෙළවර වන බිඳුන සිත් සනසවන ඈත් වූ හදවත් සමීප කරවන සියළු ජන කොටස් හදවතින්ම එකට ගැට ගසන ඒකායන මග එය වීම නිසාය. එසේ නම් සංවර්ධනයේ නාමයෙන් සිදු කළ යුත්තේ යුද කෝලහල මගින් ඇත් කරන ලද

කලාකරුවන් එක්සත් කොට කලාවේ සංවර්ධනය ආර්ථික සංවර්ධනය හා ඒකාබද්ධ කිරීමය. මහින්ද චින්තන ඉදිරි දැක්මේ පරමාදර්ශය ද එයම වන බව මෙහිදී සැළකිය යුතුය.

මෙම යථාර්තය මැනවින් අවබෝධ කොටගෙන උගත් පාඨකයා වෙත එයම සංනිවේදනය කිරීම සඳහා ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසින් සිය වාර ප්‍රකාශනය වූ කලා සඟරාව මෙම ඓතිහාසික ජනතා විජයග්‍රහණ වර්ෂ පූර්ණය සැමරීම සඳහා වෙන් කිරීම අන් සියළු දෙනාට ද මහඟු ආදර්ශයකි. එහි දී ජාතිය වෙත සාමය, සමගිය, සෞභාග්‍යය ළඟාකර ගැනීමට කලාව හා කලාකරුවන් යොදා ගැනීමේ අගය පහදා දීම සඳහා ගෙන ඇති උත්සහාය සැබවින්ම ප්‍රශංසනීයයි. මෙය ජාතියේම ගෞරවය හිමි විය යුතු ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් වන බැවින් ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් මගේ කෘතඥතාව ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු සැම වෙත පුද කරනු කැමැත්තෙමි.

**එම්.එච්. ගුණරත්න වීරකෝන්**<br>
**ගාලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා**<br>
**ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු**<br>
**නියෝජ්‍ය අමාත්‍ය**

# XI

## ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ සුභ පැතුම් පණිවුඩය.

වසර 2009 මැයි 18 දිනය වර්ණවත් වූ ද ආකර්ෂණීය වූ ද ශ්‍රී ලංකා වංශ කථාවලියේ අතිශයින් අමරණීය දිනයක් ලෙස වර්තමානයේ පමණක් නොව අනාගතය පුරාම සැමරෙන බවට කිසිදු සැකයක් නැත. ඒ මේ ධර්මද්වීපය විනාශ කිරීමේ දේශීය විදේශීය කුමන්ත්‍රණයක කොටස් කරුවන් ලෙස මැත ඉතිහාසයේ ලොව මිලේච්ඡතම කුරිරුතම ත්‍රස්තවාදී ව්‍යාපාරය ලෙසත් කිසිදු පැරදවිය නොහැකි මහා බල සම්පන්නම සටන්කාමී ත්‍රස්ත ව්‍යාපාරය ලෙසත් ලෝක බලවතුන්ගේ ද සහතික ලැබූ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදීන් අපේ වීරෝධාර රණවිරුවන් විසින් මුළු ලොවම මවිත කරවමින් විනාශ කළ දිනය වන බැවිනි. අපේ දේශපාලන නායකත්වය දුර දක්නා නුවණින් ඉතා නිවැරදිව අභීතව එඩිතරව තීරණ ගනිමින් වීරෝධාර රණවිරුවන් වෙත ලබා දෙන ලද අයෝමය නායකත්වයට පිං සිදු වන්නට වසර දෙකක් තුළ හෙළයාගේ ශක්තියත් ධෛර්යයත් ප්‍රදර්ශනය කරමින් රණශූර ත්‍රිවිධ හමුදා පොලීසිය ඇතුළු සියළු ආරක්ෂක හමුදාවන් විසින් ලබා දෙන ලද ඓතිහාසික විජයග්‍රහණය සිදු වූ දිනය එය වන බැවිනි.

රටට දැයට අපේ කමට ආදරය කරන කිසිවෙකුට මෙම දිනය අමතක කළ නොහැකිය. එය වසරක් පාසා අති උත්කර්ෂවත් අන්දමින් සමරා ජාතියම නැවත නැවත අවදි කළ යුතු අවස්ථාවකි. අපට දිනා දෙන ලද නිදහස රටේ ජාතියේ එක්සේසත් බව හා අඛණ්ඩත්වය වෙනුවෙන් ජීවිත හා ශරීරාංග පූජාවෙන් කටයුතු කළ වීරෝධාර රණවිරුවන්ට නිසි උපහාර දැක්විය හැක්කේ මෙම ඓතිහාසික විජයග්‍රහණය සමරා තම නිදහස භුක්ති විඳීම සඳහා ආර්ථික සංවර්ධනය සමග සංස්කෘතික සංවර්ධනය ද සමබරව ළඟා කොට ගනිමින් සෞභාග්‍යමත් ජාතියක් බිහි කිරීමෙනි. ජීවිත පරදුවට තබා එඩිතරව නිවැරදි තීරණ ගනිමින් ජාතියට නායකත්වය දුන් ජාතියටම ආඩම්බරයක් වූ ඒ විරළ ගණයේ ප්‍රශස්ථ දේශපාලන නායකයාට අපේ උපහාරය දැක්විය හැක්කේ අප කෘතගුණ සළකන

ජාතියක් බව එතුමාගේ ජීවිත කාලය පුරාම ප්‍රදර්ශනය කිරීමෙනි. ඒ හැමටම අවශ්‍ය කරන ශක්තිය ධෛර්යය නොඅඩුව ලබා දීම සඳහා සියළු දුක් කරදර අඩුපාඩු මුවින් නොබැන ඉවසා දරා සිටි දේශප්‍රේමී ජනතාවගේ කැපකිරීම්වලට වටිනාකමක් ලබාදිය හැක්කේ ඒ කැපකිරීම් මත දිනාගත් රට ජාතිය ආරක්ෂා කළ පමණිනි.

මෙම යථාර්ථය අවබෝධ කොටගෙන හෙළ සංස්කෘතියේ සැබෑ පුත්‍රයන් බව සනාථ කරමින් කළගුණ සලකන විශිෂ්ඨයන් පිරිසක් බව ලොවට හඬගා කියමින් මෙම ඓතිහාසික දිනයේ වැදගත්කම අන්‍යයන්ට ද කියා දීම පිණිස තම වාර ප්‍රකාශනයේ විශේෂ කලාපයක් ලෙස ඓතිහාසික විජයග්‍රහණයේ වර්ෂ පූර්ණ කලාපය සැකසීමට ගන්නා ලද තීරණය නිසා ශ්‍රී ලංකා කලා මණ්ඩලය ජාතියේ උපහාරයට සුදුසු වී ඇත. මෙම උදාර කටයුත්ත නිසා තමා රටට ජාතියට ඇති බැඳීම ප්‍රදර්ශනය කරනවා පමණක් නොව සමස්ත ජනතාව ද ඒ වෙනුවෙන් පෙළ ගැස්වීමට ගෙන ඇති උත්සහාය අගේ කටයුතුය. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු සියළු දෙනාට ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ගෞරවය පුද කරමි.

විමල් රූබසිංහ
ලේකම්
ජාතික උරුමයන් හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# XIII

# පිදුම

භීෂණය වැපුරූ වසර තිහකට අධික කාලයක් තිස්සේ මෙරට
ලොව ම්ලේච්ඡතම බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදීන්ගෙන්
රට ජාතිය නිදහස් කොට ගෙන
නැවතත් එක්සේසත් රාජ්‍යයක් බවට පත් කිරීමේ
ඓතිහාසික විජයග්‍රහණයේ
ප්‍රථම වර්ෂ පූර්ණය නිමිත්තෙන්
ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසින් ප්‍රකාශිත
මෙම සමරුව
එකී විජයග්‍රහණය අත්පත් කරගන්නා තුරු
ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී
රණවිරුවන් ධෛර්යමත් කරමින් ද
ජනතාව අතර ඉහළම විශ්වාසය තහවුරු කරමින් ද
රටටම එඩිතර නායකත්වය ලබාදුන්
අසිරිමත් රාජ්‍ය නායක
අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ද
මෙම දේශය මුදගැනීම සඳහා
ජීවිත පරිත්‍යාගයෙන් සිය වගකීම ඉටුකරමින්
නොබියව නොපසුබටව
තම එකම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සටන් වැදුන
සියළුම ආරක්ෂක සේවාවල සාමාජික සාමාජිකාවන්ද
උපන් දේශය
නිදහස් නිවහල් කොට දිනා දෙන තුරු
රජයට, රණවිරුවන්ට අවශ්‍ය සහාය ලබාදෙමින්
දැඩි උපේක්ෂාවෙන් සියළු දුක් වේදනා ඉවසා දරා ගනිමින්
බලා සිටි මහජනතාව ද
ඉතිහාසයේ සෑම ව්‍යවසනයකදී ම සිදු වූ පරිදි
ජාතිය අවදි කරමින්, ජනතාව දේශප්‍රේමයෙන් නහවමින්
රණවිරුවන් ධෛර්යමත් කරමින්,
සියලු ආශිර්වාද ලබා දුන්
පූජනීය මහා සංඝරත්නය ඇතුළු
සියළුම ආගමික පූජ්‍ය හා පූජක තුමන් ද වෙත
ගෞරවපූර්වක භක්ත්‍යාදරයෙන් පුදකර සිටිමු.

## ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභාව

මානවවිද්‍යාඥ පණ්ඩුල ඇඳගම (සභාපති)

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ (උප සභාපති)

විශ්වනාදන් සදනන්දම්

රෝහණදේව පෙරේරා

ආචාර්ය ලීල් ගුණසේකර

කමල් බී. දිසානායක (ලේකම්)

# "මහින්ද චින්තනය" ජනහිතකාමී අර්ථාන්විත රාජ්‍ය ප්‍රතිපත්තියකින් පෝෂණය වන ශ්‍රී ලාංකික ජන සමාජය හා සංස්කෘතිය.

විමල් රූබසිංහ

තිස් අවුරුදු බෙදුම්වාදී කුරිරු ත්‍රස්ත ශාපයෙන් මිදී වසර 30 කට පසු එක්සේසත් වූ රටක සැනසිල්ලේ ජීවත්වීමේ වාසනාව ලද අපට ඒ සුන්දර නිදහස භුක්ති විඳීමේ අවස්ථාව සැලසී වසරක් පිරෙන දිනය වූ මැයි 18 අමතක කළ නොහැකිය. එහෙයින් හැකි සෑම අයුරකින්ම අභිමානයෙන් හා ප්‍රතාපවත් ආකාරයෙන් එදින සැමරිය යුතුය. ඒ නිදහස අප වෙත උරුම කොට දෙනු වස් තම අත් පා ඇස් කන් පමණක් නොව ජීවිතය ද පරිත්‍යාග කළ දස දහස් ගණන් විරෝධාර රණවිරුවන් සඳ සිහිපත් කරමින් ඔවුන්ගේ නාමයන්ට හරසර දැක්විය යුතුය. ඔවුන්ගේ පවුල්වල අය අපේම අය ලෙස රැක බලා ගත යුතුය. ඔවුන්ගේ පරිත්‍යාගයන් අපතේ යාමට ඉඩ කඩ නොතබා රට සංවර්ධනය කොට සියළු ජන කොටස් සන්තුෂ්ටිමත් කොට කිසිදු රට නැවත එවන් අනතුරකට පත් නොවන ලෙස රැක ගත යුතුය. එම භාරදූර කර්තව්‍යයේ දී ඉතා ප්‍රබලම පලදායක මගක් වන්නේ බිඳුන සිත් සතන් සුවපත් කොට නැවත එක් කරන සංවේදී කලා මාධ්‍යයන් ජනතාව වෙත ගෙන ගොස් ඊර්ෂ්‍යා, වෛර, ක්‍රෝධ පිටු දැකීමට උනන්දු කරමින් කලාවට නැඹුරු කර ගැනීමයි. එහිදී පෙරමුණට ගත හැක්කේ ගත යුත්තේ සංවේදී ගුණය තම ආත්මය කොට ගත් සැබෑ ජනහිතකාමී කලාකරුවන්ය. එහෙයින් එම කලාකරුවන්ගේ හමුවීමේ පොදු නිවහන ලෙසින් සැලකිය හැකි ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සිය කාර්ය

භාරය හා වැඩසටහන් කුරිරු ත්‍රස්තවාදයෙන් මුදගත් රට නව ලොවක් කරා ගෙන යමින් ජනතාවට සුභ අනාගතයක් සහතික කරන "මහින්ද චින්තන ඉදිරි දැක්ම" යථාර්තයක් කරවීම දෙසට මෙහෙය විය යුතුය. එසේ යෝජිත වූ වැඩසටහන් මාලාවන් සියල්ල මෙසේ සටහන් කරන්නේ ජාතිය නිදහස් කරගැනීමේ ප්‍රථම සංවත්සරය නිමිත්තෙන් තෙරුවන් විෂයෙහි පිදූන. මෙම පිංබිම රැක ගැනීම සඳහා ජීවිත පරදුවෙන් කටයුතු කළ සෑම සියළු දෙනාගේ ගෞරවය අභිමානය උද්දීපනය කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙනි.

ලෝකයේ බොහෝ දියුණු ජාතීන්ට නොමැති තරම් දීර්ඝ, එසේම උසස් මට්ටමේ සාභිමානි ඉතිහාසයක් ශ්‍රී ලංකාවේ අප සතුව ඇත. වසර 3000 කට අධික දීර්ඝ කාලීන වූ මෙම ඉතිහාසය වාර්තාගත තොරතුරු සහිත භෞතික සම්පත් විශාල ප්‍රමාණයකින් සමන්විතය. ක්‍රි.පූ 543 සිදු වූ විජයාගමනයටත් පෙර සිට මෙරට ශිෂ්ඨ සම්පන්න ජනතාවක් විසූ බවත්, ඔවුහු දියුණු සංස්කෘතික ලක්ෂණවලින් සමන්විත වූ බවත් ඉතිහාසය සාක්ෂි දරයි. විජය කුමරු දිවයිනට ගොඩබට දින රාත්‍රියේ අසල ගමකින් "සංගීතය මුසු නාදයක්" ඇසුන බවත් මහාවංශය සඳහන් කරයි. (මහාවංශය - මොග්ගල්ලාන සංස්කරණය, ප්‍රථම භාගය, පිටු අංක 85). අනුරාධපුරයේ පැරණි ඇතුළුනුවර ප්‍රදේශයේ කරන ලද පුරාවිද්‍යාත්මක කැනීම්වලින් සොයාගත් දෑ වසර 3350 ක් පමණ පැරණි බවත්, ඒවායේ ඉදිකිරීම් ලක්ෂණ අධ්‍යයනය කරන විට එවකටත් අප රටේ යම් මට්ටමක දියුණු ජනාවාස පැවති බවත් ඉතා පැහැදිලි වේ. ප්‍රමාණවත් තොරතුරු සොයා ගැනීමට නොහැකිවීම ද ඇතුළු තවත් හේතු සාධක නිසා ඒ සා විශාල අඛණ්ඩ ඉතිහාසයක් අනාවරණය කර ගැනීමට දුෂ්කර වුව ද පවත්නා සාධක අනුව ක්‍රි.පූ. 900 පමණ සිට මෙරට අඛණ්ඩව ජනාවාස පැවති බව ඉතා පැහැදිලිය.

විජය කුමරු ලංකාවේ රජ පදවි ප්‍රාප්ත වීම, ජනාවාස පුළුල්වීම, බුදුදහම ලංකාවට රැගෙන ඒම, පාලි ආදී භාෂාවන් ව්‍යාප්ත වීම, ශ්‍රී මහා බෝධිය වැඩමවීම හා රෝපණය, ගෘහ නිර්මාණ, කැටයම්, චිත්‍ර මූර්ති ආදී අටලොස් ශ්‍රේණියක ශිල්පීන් ලංකාවට පැමිණීම, දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වසභ, මහසෙන් වැනි කීර්තිමත්

නරපතීන් බිහිවීම යන මෙකී වැදගත් සංසිද්ධීන් රැසක් නිසා අප රට ඉතා වේගයෙන් මෙන්ම විශාල ලෙසින් දියුණු විය. අනුරාධපුර නගරය පිහිටුවීමෙන් පසුව එය අගනුවර කොට පළමු රාජධානිය බිහි වීම, රුවන්වැලි, අභයගිරි, ජේතවන ආදී දාගැබ්, බසවක්කුලම, තිසාවැව, නුවර වැව ආදී දහස් ගණනින් වැව් හා වාරි කර්මාන්ත බිහිවීම, අධ්‍යාපනික ස්ථාන බිහිවීම, වෙහෙර විහාරස්ථාන ගොඩනැගීම, පොළොන්නරුව හා තවත් නගර බිහිවීම, සීගිරිය වැනි විස්මිත බලකොටු ගොඩනැගීම, දඹුල්ල ලෙන් විහාරය ආදී විචිත්‍ර නිර්මාණ ගොඩනැගීම, දළදා වහන්සේ වැඩමවීම ආදී ඉතා වැදගත් කරුණු මතින් අප රට මේ දක්වා ලෝකය මවිත කරවන කලා හා සංස්කෘතික දියුණුවක් ගොඩනංවමින් පවතී. බුදු දහමින් ලද දිවි හැඩගැස්ම, විනය ගරුකත්වය සිංහල පාලි සංස්කෘත හා ද්‍රවිඩ භාෂාවන්හි දියුණුව, උසස් සාහිත්‍යයක් වර්ධනය වීම ආගම් ආශ්‍රිතව උදාර චාරිත්‍ර, වාරිත්‍ර ක්‍රම ගොඩනැගීම, ප්‍රධාන ආගමික හා වාර්ගිකයන් අතර අන්‍යෝන්‍ය දීර්ඝකාලීන සමගියක් පැවතීම යන කරුණු හේතු කොටගෙන අප රටේ ජාතික හා සංස්කෘතික උරුමයන් රැසක් මේ වන විට නිර්මාණය වී ඇත. ශේෂ වී ඇත. අපට උරුම වී ඇත. ක්‍රි.ව. 1 වන සියවසේත් විශේෂයෙන් ක්‍රි.ව. 1505 සිටත් විදේශ ආක්‍රමණවලට ගොදුරුවීමෙන් අප රටේ යම් යම් කාලවල විශාල සංස්කෘතික පරිහානියන් පැවතිය ද රටවැසියාගේ ශූර වීරකම් නිසාම ඒවායින් ගොඩ ඒමට ද අපට හැකිවිය. එසේම එකී ආක්‍රමණශීලී ජාතීන්ගෙන් ද ඇතැම් යහපත් ලක්ෂණ උකහාගෙන අප ජාතිය ගොඩනගාගෙන ඇත. ලන්දේසි අධිකරණ ක්‍රමය, ඉංග්‍රීසි භාෂාව, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආදීන්ගේ සමාජ චාරිත්‍ර අප සමාජය විසින් උකහා ගෙන ඇත. හෙළ සමාජයේ නම්‍යශීලී බව මෙන්ම වාර්ගික සමගිය පිළිබඳ කදිම නිදසුනක් ලෙස එය ද දැක්විය හැකිය. එසේ නම් අද අප සතුව ඇත්තේ අපේ යටගියාව නැවත මතුකර ගැනීම පමණි. එවිට ජාතික සමගිය නිරායාශයෙන්ම බිහිවනු ඇත.

මෙසේ සහස්‍රවර්ෂ තුනක් පමණ කලක් පුරා ගොඩනැගුන අපගේ සංස්කෘතිය හා සමාජ හර පද්ධතීන්, අපේ උරුමයන් සේ සළකා අප විසින් සුරක්ෂිත කර පෝෂණය කළ යුතු වේ. එකී ක්ෂේත්‍රයන්හි මෑත ඉතිහාසයේ ඇති වූ අපගමනයන් නිසා සමාජ

පරිහානිය කෙතරම් ප්‍රබල වී තිබුණේ ද යත් 2005 වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමා සිය "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය පිළියෙල කිරීමේ දී මෙරටේ සංස්කෘතික හා කලා කටයුතු දියුණුව සඳහා විශේෂ අවධානයක් යොමුකරන ලදී. එහි සඳහන් වචනවලින්ම ගෙනහැර දක්වතොත්

1. විනයගරුක සමාජයක්
2. සෙනෙහස පිරි පවුලක්
3. මතට තිත
4. ජ්‍යෙෂ්ඨ පුරවැසි බුහුමන්
5. දැහැමි රටක්
6. අතීත අභිමන මෙහෙවටත්
7. නොබෙදුන රටක් - ගෞරවනීය සාමයක්
8. පිරිපුන් සමාජයක්
9. උරුම අරුණ, නැගෙනහිර නවෝදය, සෙංකඩගල නවෝදය
10. කලාකෙත අස්වැද්දීම

යනාදී තේමාවන් රැසක් මතුකර පෙන්විය හැකිය. යහපත්-අයහපත් බව පිළිබඳ ඇගයීමකින් තොරව විවෘත ආර්ථිකය හා ගෝලීයකරණය වැළඳගැනීම නිසා ඇතැම් කරුණු අතින් පිරිහී තිබුණ සංස්කෘතිය නිසි මගට ගැනීමට මහින්ද චින්තනයේ විශේෂ අවධානයක් යොමු විය. මේ නිසාම ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය එකී අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමෙහිලා සිය වගකීම පැහැදිලිව හඳුනාගෙන ඉකුත් වසර පහක පමණ කාල සීමාව තුළ රටට, දැයට, සමාජයට දැනෙන පෙනෙන මහඟු සේවා රැසක් ඉටුකර ඇති බවත්, ඉදිරියටත් තවත් එවැනි දහසකුත් එකක් සේවාවන් මහින්ද චින්තන ඉදිරි දැක්ම ඔස්සේ සැළසුම් කර ඇති බවත් සඳහන් කරන්නේ සතුටිනි. යහපත් බලාපොරොත්තු රැසක් ඇතිවය. දිනාගත් දේශය තවත් ශක්තිමත් ලෙස රැක ගැනීම පිණිස සියළු ජන කොටස් ඒකරාශී කිරීමට නොවරදින මග කලාව හා සංස්කෘතිය පෝෂණය කිරීම වන බැවිනි.

මෙම අමාත්‍යාංශය සිය කාර්ය ක්ෂේත්‍රය තුළ සේවා ඉටු

කිරීමට දෙපාර්තමේන්තු හා ආයතන ගණනාවක් පවත්වාගෙන යයි. සංස්කෘතික, පුරාවිද්‍යා, ජාතික කෞතුකාගාර, ජාතික ලේඛනාරක්ෂක ආදී දෙපාර්තමේන්තු, මධ්‍යම සංස්කෘතික අරමුදල, ශ්‍රී ලංකා කලා මණ්ඩලය, (ජාතික චිත්‍රපට සංස්ථාව - මේ වන විට වෙනත් අමාත්‍යාංශයකට අයත් වේ.) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය, ටවර් හෝල් රඟහල පදනම, ගාලු උරුමය පදනම, ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන ආදිය ඒ අතර වේ. ඉහත කී ආයතන විසින් මහින්ද චින්තනයේ විශේෂයෙන් සඳහන් කර තිබෙන විනය ගරුක සමාජයක් ගොඩනැගීම වැනි අදට බෙහෙවින් අවශ්‍ය යහගුණ සපිරි සමාජයක් ගොඩනැගීමට විවිධ ක්‍රියාමාර්ග ගනිමින් ඇත. අපගේ සියලු ආයතන එකී උසස් අරමුණ ඔස්සේ සිය වැඩ සැලසුම් සකස් කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 334 කට සංස්කෘතික නිලධාරියකු බැගින් ලබාදී ඔවුන් ජනතාවට සමීප කර විවිධ මහජන උපයෝගී සේවාවන් ලබාදෙන්නෙමු. ගැබිණි මව, පූර්ව ළමාවිය, දරුවා, පාසැල් ශිෂ්‍යයා, පාසැල් හැරගිය ශිෂ්‍යයා, වෘත්තීය පුහුණු අපේක්ෂකයා, සෑම ක්ෂේත්‍රයකම කලාකරුවා, වයෝවෘද්ධ ශිල්පියා, රසිකයා, පාඨකයා, පාරම්පරික ශිල්පියා, ලේඛකයා ආදීන් අපේ සේවා ලාභීහු වෙති. අපි ද ඔවුන්ගේ සේවාලාභීන් වම්හ. ඒ අප සැවොම ඔවුනොවුන් සුහදව එක්ව ක්‍රියාකරමින් ප්‍රාදේශීය මධ්‍යස්ථාන මට්ටමින්

- මාතෘ පෝෂණ වැඩසටහන්
- මාතෘ සෞඛ්‍ය අධ්‍යාපනික වැඩසටහන්
- වැඩිහිටි අධ්‍යාපනික වැඩසටහන්
- පෙර පාසැල්
- කලා ශිල්ප පුහුණු කිරීම්
- භාෂා කුසලතා පන්ති
- ජාතික උත්සව සැමරීම් - උදා නිදහස් දිනය
- ආගමික උත්සව පැවැත්වීම්
- සහජීවන ප්‍රබෝධන ආදී වැඩසටහන් රැසක් පවත්වාගෙන යන බැවිනි.

මෙම සියළු වැඩසටහනක්ම හරහා උසස් රසඥතාවක් කලා වින්දනයක් හා අන්‍යෝන්‍ය බැඳීමක් හා විශ්වාසයක් ඇතිකර නූතන ජාතික සමගියට කදිම පසුබිම එමගින් සකසනු ලබයි. වාර්ෂිකව

මෙම මධ්‍යස්ථාන මගින් සේවා ලබන පිරිස් දහස් සංඛ්‍යාත ගණනකි.

පාසැල් ශිෂ්‍යයා කුඩා කළ සිටම ගුණවත් පුරවැසියෙක් බවට පත් කරනු වස් "දූයෝ දරුවෝ - පාසැල් සංස්කෘතික සමාජ ව්‍යාපෘතිය" අධ්‍යාපන අමාත්‍යාංශයේ ද අනුමැතිය ඇතිව අපි ක්‍රියාත්මක කරමු. දිවයිනේ පාසැල් 9662 ක දරුවන් සඳහා වන වැඩසටහනක් වන මෙයින් දූයට ආදරය කරන, දූය අවදිකරන, අපේකම අගයන දරුවන් රැසක් බිහි කිරීම අරමුණ වේ. මේ සඳහා මිත්‍රත්ව කඳවුරු පැවැත්වීම, සංස්කෘතික හා කලා නිර්මාණ තරඟ පැවැත්වීම, ප්‍රාදේශීය ජාතික උරුමයන් අධ්‍යයනය කිරීම, දනුවත් කිරීම, සිරිසරය සංවර්ධනය, විවිධ තරඟාවලි පැවැත්වීම, ඇගයීම, ජයග්‍රාහකයන් තේරීම, දිරිගැන්වීම ආදී ක්‍රියාකාරකම් රැසක් ඇත. මෙම වැඩසටහන්වලට එක්වන හැම දරුවෙකුම කුළුණු හදක් ඇති අන්‍යන්ට මෛත්‍රිය කරුණාව දක්වන මහඟු රසඥතාවක් ඇති සැබෑ මනුෂ්‍යයෙකු ලෙස සමාජයට ඇතුල්වීම අපේක්ෂිත ඉලක්කය වේ.

"මහින්ද චින්තන" ප්‍රතිපත්තිය ආර්ථාන්විත කාර්ය සැලැස්මක් බවට පත්කර ඒ යටතේ විවිධ වැඩසටහන්, ව්‍යාපෘති හඳුන්වා දී ක්‍රියාත්මක කරමින්, එහි විපුල ඵල ප්‍රයෝජන අප අමාත්‍යාංශය විසින් මෙරට සමස්ත ජාතියට උරුම කර දී ඇත. තවදුරටත් එම වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටිමු. ඒ සියල්ලේ අග්‍රපලය වන්නේ එකිනෙකාට ආදරය කරන ලෙන්ගතු සෙනෙහසින් පිරුණ තමාගේකම දේශීයකම අපේකම හිස් මුදුණින් සලකන අළුත්ම පරපුරක් බිහිවීමය. අළුත් රටක් නව ශ්‍රී ලංකාවක් උදා කිරීම කිසිවිට සිහිනයක් නොවන්නේ එහෙයිනි.

## "මහින්ද චින්තන ඉදිරි දැක්ම"

සාහිත්‍ය කලාවේ ප්‍රසාංගික වේදිකාවේ ප්‍රබෝධයේ සුවිසල් යුගයක් එම ඉදිරි දැක්මේ අවධාරණය කර තිබේ. ඒ යටතේ මෙරට කලාවේත්, සංස්කෘතියේත්, චිර ජීවනය සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ඇප කැපවීම විදහා දක්වා ඇත. මේ සඳහා එතුමාගේ අපේක්ෂාවන් පිරිදි දැනටමත් අප අමාත්‍යාංශය ක්‍රියා කරගෙන යන බව ජාතියේ සාමය හා සෞභාග්‍යය උදාකර ගැනීමෙන්

සියළු ජන කොටස්වල සමගිය හා සාමූහිකත්වය සඳහා කලාව හා සංස්කෘතිය නංවාතැබීමේ අවශ්‍යතාවය අවධාරණය කරන සැමගේ දැන ගැනීම සඳහා දන්වනු කැමැත්තෙමි.

## 1. ජාතික සංස්කෘතික ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරීම.

මහින්ද චින්තනයෙන් අවධාරණය කළ මෙම කරුණ අමාත්‍යාංශය විසින් දැනටමත් ඉටුකර ඇත. ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය පිළියෙල කර රජයේ අනුමැතිය ලබාගෙන ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. රටේ පොදු ජාතික සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා අපේ ඉපැරණි කලා හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම, විශ්ව කලා සංස්කෘතික උරුමයන්හි ප්‍රබුද්ධ අංගයන් දේශීය ජනතාවට හඳුන්වා දීම, පුරවැසියාගේ ජන ජීවිතය උසස් මානසික හා අධ්‍යාත්මික ගුණ වගාවන්ගෙන් පෝෂණය කිරීම, සමස්ත ජන සමූහයේ සමගිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම, ප්‍රඥා සම්පන්න විචාරශීලී ප්‍රබුද්ධ හා සංවර්ධනශීලී ජන සමාජයක් බිහි කිරීම මෙම ප්‍රතිපත්තිය මගින් අපේක්ෂිතයි. ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව අපගේ වැඩසටහන් එහි අරමුණුවලට අනුකූලව හැඩගැස්වීම දැන් අරඹා ඇත.

## 2. ප්‍රසංග කලා

### 2-I. කොළඹ ජාතික කලා කේන්ද්‍රය

දේශීය හා විදේශීය කලාකරුවන්ගේ විවිධ නිර්මාණ සැමට දැකගත හැකි වනසේ ප්‍රධාන වශයෙන්ම ආසන 1268 කින් සමන්විත රඟහලක්, නවීන තාක්ෂණික පහසුකම්වලින් සපිරි වේදිකා, ශබ්දගාර ඇතුළු පහසුකම්, පුස්තකාල, සංරක්ෂණාගාර, පර්යේෂණාගාර මෙන්ම කලා ශිල්පීන්ට සිය රඟ දැක්වීම් සඳහා අවශ්‍ය අතිරේක පහසුකම් ද සමග මෙහි ඉදිකිරීම් දැනට සිදුවේ. මේ වසර අගදී මෙය විවෘත කර සේවා අරඹනු ඇත.

### 2-II. කුණ්ඩසාලේ ජාතික කලා නිකේතනය

දේශීය කලාකරුවනට සිය කලා කටයුතු වැඩිදියුණු කිරීමට අවශ්‍ය අධ්‍යයන, පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා මෙමගින්

පහසුකම් සැලසේ. එසේම නවක කලාකරුවන්ට අවශ්‍ය ක්ෂේත්‍රයන්හි අධ්‍යාපන පහසුකම් ද මෙමගින් ලබාදීමට නියමිතයි. දැනට ඉදිකිරීම් කටයුතු අරඹා ඇති අතර, ඉදිරි වර්ෂය අවසානය වන විට සේවා ඇරඹීමට ක්‍රියා කරමු.

## 2-III. ජාතික පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ

දිවයිනේ දැනට ක්‍රියාත්මකව පවතින සංස්කෘතික මධ්‍යස්ථානවල සේවය කරන සම්පත්දායකයන් පුහුණු කිරීමට ජාතික හා අන්තර්ජාතික නර්තන ප්‍රසංග සඳහා සහභාගී කරවන ආධුනික ශිල්පීන් පුහුණු කිරීම, මධ්‍යස්ථාන භාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් හා එම කාර්ය මණ්ඩල පුහුණු කිරීම පිණිස මෙම මධ්‍යස්ථානය ඉදි කරන ලදී. මෙය දැනට ක්‍රියාත්මකයි.

## 2-IV. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම.

සාක් රාජ්‍ය නායක සමුළුවේ දී ගන්නා ලද තීරණයක් පරිදි මෙම මධ්‍යස්ථානය මාතර පිහිටුවීමට දැනට මූලික කටයුතු කරගෙන යයි. මේ මගින් සාක් කලාපීය රටවල සංස්කෘතික හා කලා අංග අධ්‍යයනට හා ඒ පිළිබඳ සාමාජික රටවල අදහස් අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කරගෙන ඒවා දියුණු කිරීමට හා සංරක්ෂණය කිරීමට කටයුතු කිරීමට පහසුකම් සැලසේ. අක්කර 10 ක භූමි භාගයක ඉදිවන මෙම මධ්‍යස්ථානය තුළ දෙස් විදෙස් කලාකරුවන්ට නේවාසිකව සිටිමින් සිය අධ්‍යායන හා පර්යේෂණ කටයුතු සිදු කිරීමටත්, ගෝලීයකරණයේ යහපත් ප්‍රතිඵල නෙලා ගනිමින් දේශීය සංචාරක කර්මාන්තය හා බැඳි සංස්කෘතික ප්‍රවර්ධන ක්‍රියාවලියක් ගොඩනැගීමටත් අවස්ථාව සැලසීම අපේක්ෂා කෙරේ.

මේ සියල්ල අන් සියලු කාර්යාංශවල සහායෙන් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවයි.

## 2-V. ටවර්හෝල් රඟහල පදනම

වසර සියයක් සපිරෙන ටවර් හෝල් රඟහල අප රටේ නූතන නාට්‍ය කලා සංවර්ධනයේ තිඹිරිගෙය යයි හැඳින්වීම නිවැරදිය. 2005 වසර වන විට අබලන්ව පැවති මෙහි ගොඩනැගිලි හා පහසුකම්

ප්‍රතිසංස්කරණය කිරීම හා නවීකරණය දැනට සිදුකෙරේ. පැරණි ගොඩනැගිලි සම්ප්‍රදායන් එලෙසම ආරක්ෂා කරමින් නවීකරණය කෙරෙන මෙහි නව තාක්ෂණික පහසුකම් මෙන්ම නැරඹුම් පහසුකම් ද ඇති කෙරේ. මේ වසර තුළදී නවීකරණ කටයුතු නිමකර නාට්‍ය කලාවේ නියැලි සැමටත්, කලා ලෝලීන්ටත් පහසුකම් සැළසීමට මෙය විවෘත කරනු ලැබේ. එසේම එල්ෆින්ස්ටන් රඟහල හා රුක්මණීදේවී කලාගාරය ද ප්‍රතිසංස්කරණය කිරීම දැනටමත් ආරම්භ කර ඇත.

## 3. "උරුම අරුණ" ව්‍යාපෘතිය

3-I. ශ්‍රී ලංකාව මුළුමණින්ම පාහේ පුරාවිද්‍යා නිධානයකි. වසර 3000 කටත් අධික කාලයක් තිස්සේ අපගේ නරපතීයන් විසින් ගොඩනැගූ ස්මාරක, පූජනීය ස්ථාන, නගර ආදිය ඇතුළත් පුරාවිද්‍යාත්මක ස්ථාන, 250,000 ක් පමණ අප සතුව ඇති බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇත. මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් "අතීත අබිමන හෙටටත්" යන තේමාව යටතේ මෙකී ස්ථාන සුරක්ෂිත කිරීම හා ප්‍රදර්ශනය කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් බව ප්‍රකාශ කර ඇති අතර, මෙය ක්‍රියාත්මක කිරීමට රජය විවිධ වැඩසටහන් හඳුන්වා දී ඇත. බෞද්ධාගමික මෙන්ම හින්දු ආගමික පුදබිම් ද මේ යටතේ සංරක්ෂණය කෙරේ. මේ සඳහා එම පුදබිම් හා සංරක්ෂණය කළ යුතු ස්ථාන සියල්ල පුරාවිද්‍යා පනත යටතේ ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රතිසංස්කරණය හා සංරක්ෂණය කිරීම දැනටමත් ආරම්භ කර ඇත. අනුරාධපුර ජේතවනාරාමයේ සංරක්ෂණ කටයුතු දැනටමත් නිමකර ඇති අතර දිවයිනේ විවිධ පළාත්වල මෙවැනි තවත් ස්ථාන සංරක්ෂණය කිරීම ද දැනට සිදු කෙරේ. මෙම වැඩපිළිවෙල යටතේ වාර්ෂිකව තව තවත් මෙබඳු ස්ථාන සංරක්ෂණය කිරීමට පියවර ගනිමු.

ගාල්ල ඓතිහාසික කොටුව ප්‍රදේශයම සක්‍රිය උරුමයක් ලෙස සංරක්ෂණය කෙරේ.

3-II. "නැගෙනහිර නවෝදය" වැඩසටහන යටතේ "උරුම අරුණ" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ආගමික සිද්ධස්ථාන මෙන්ම අනෙකුත් ස්ථාන ද රැසක් නැගෙනහිර ප්‍රදේශයේ ඇත. 2007 වසරේ නැගෙනහිර පළාත සංස්කෘතික කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව සේරුවිල මංගල රජමහා විහාරය, පදියතලාව පුරාණ රජමහ විහාරය, පොත්තාන්කඩු මුත්තන්කායි ශිව දේවාලය බක්මීවැව, කිවුලකඩවිල ශ්‍රී ශෛල බිම්බාරාමය ඇතුළුව ආගමික සිද්ධස්ථාන රැසක් සංවර්ධනය කිරීම දැනට ආරම්භ කර ඇත. එම කටයුතු ප්‍රදේශයේ සෙසු ස්ථාන කරා ද ව්‍යාප්ත කර සංවර්ධනය කරමු.

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රධාන කොට ගෙන මධ්‍යම සංස්කෘතික අරමුදල හා ගාලු පදනම මගින් මේවා සියල්ල රැකගැනීම හා සංරක්ෂණය කිරීම සිදුවෙමින් ඇත.

4. ආදිවාසීන්ගේ සංස්කෘතික උරුමයන් සංවර්ධනය කිරීම.

අතිගරු ජනාධිපතිතුමා මෙම කරුණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. මේ යටතේ දඹානේ "ආදිවාසි ජන උරුම කේන්ද්‍රය" දැනටමත් පිහිටුවා ඇති අතර, එහි කටයුතු සඳහා මාසිකව මුදලක් එම ආයතනයට අප අමාත්‍යාංශය මගින් ලබාදේ. ජන උරුම ක්ෂේත්‍රය විසින් සිය පාරම්පරික ජන ජීවිතයේ සංස්කෘතික මෙන්ම ඓතිහාසික වටිනාකමක් ඇති වස්තු සංරක්ෂණය කිරීම, කලා කටයුතු, නිර්මාණ කටයුතු මෙන්ම සංස්කෘතික අංගයන් සංවර්ධනය ද මෙමගින් කරගෙන යයි. මෙම කටයුතු වඩාත් පුළුල්ව සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීමට දැනට කටයුතු කරගෙන යයි. එසේම මෙරට දීර්ඝ හා ප්‍රෞඪ ඉතිහාසයේ වැදගත් සාධක සපයන දිවයිනේ විවිධ පළාත්වල වෙසෙන සියලුම ආදි වාසීන්ගේ ජන ජීවිතය ද පෝෂණය කිරීමේ වැඩ සැළසුම් රැ සක් මේ වන විට ආරම්භ කරමින් සිටිමු.

## 5. පාරම්පරික ජන සාහිත්‍යාංග හා ජනශ්‍රැති ආදිය සංරක්ෂණය කිරීම.

අප රට පාරම්පරික ප්‍රාදේශීය ජන සාහිත්‍යාංගවලින් ඉතා පොහොසත් රටකි. ප්‍රාදේශීයව ගොඩනැගී සංවර්ධනය වුනා නැටුම්, කවි, විරිඳු, ගීත ගායනා ශෛලීන්, වාදන සම්ප්‍රදයන්, ජනශ්‍රැති රැසක් අප සතුව ඇත. මේවායේ සැහෙන ප්‍රමාණයක් තවමත් ජීවමානව ඇති අතර, තවත් බොහොමයක් ඒ ඒ ප්‍රදේශවල ජනවහරේ තවම පවතී. මේවා අභාවයට යා නොදී රැක ගැනීමේ වැඩ සැලැස්මක් දැන් ක්‍රියාත්මකය. මේ අනුව මෙකී උරුමයන් දීර්ඝ කාලයක් පුරා රැකගත හැකිවන ආකාරයට සූක්ෂම සංරක්ෂිත තාක්ෂණික මාධ්‍ය මගින් නැවත පටිගත කිරීම, වාර්තා ගත කිරීම, සංරක්ෂණය කිරීම හා කල්පවත්නා අයුරු ගබඩා කිරීමක් යටතේ පරිහරණයට ගැනීමට කටයුතු කරමු.

## 6. කලාවන් හා කලාකරුවන් ඇගයීම - වාර්ෂික කලා මහෝත්සවය

අවුරුදු 2550 කට අධික වාර්තාගත ඉතිහාසයක් අප සතුව පවත්නා අප රටේ භාෂාවන්හි හා කලාවන්හි ඉතිහාසය ද එතරම්ම පැරණිය. සිංහල භාෂාවේ ඉතිහාසය මිහිඳු මාහිමියන් මෙරටට වැඩමවීමෙන් පසුව ආරම්භ වූ බවත් උන්වහන්සේ ඇතිකරලූ සිංහල භික්ෂු පරපුර ජාතියත්, භාෂාවත්, ආගමත්, රටත් පරපුරෙන් පරපුරට සංකීර්ණ කරවූ බවත්, ආචාර්ය පුංචිබණ්ඩාර සන්නාසගල මහතා පෙන්වා දෙයි. මෙසේ ආරම්භ වූ භාෂාව අපට සාහිත්‍යයක් දයාද කළේය. ඊට ගද්‍ය, පද්‍ය, වියරණ, සඳැස්, කෝෂ ආදී විවිධ සාහිත්‍ය අංග බිහි කළේය. තවද මහින්දගමනයෙන් පසුව මෙරටට පැමිණි අටළොස් වැදෑරුම් කලා හා නිර්මාණකරුවන් අතින් අපේ චිත්‍ර, මූර්ති, කැටයම්, ආදී විවිධ කලාවන් පෝෂණය විය. මුල පටන් රාජ්‍ය අනුග්‍රහය යටතේ දියුණු වෙමින් ජනතාවගේ උරුමයක් ලෙස පවත්වා ගෙන ආ මෙරට කලාවන් අද වන විට ඉතා දියුණු මට්ටමකට පවතින බව ලොවම දන්නා කරුණකි.

7. "භාෂාව හා සාහිත්‍යය"
මහින්ද චින්තනය අප රටේ භාෂාව ගැන මෙසේ සඳහන් කරයි.

මිනිසා විසින් නිර්මාණය කරන ලද උසස්ම සන්නිවේදන මෙවලම භාෂාවයි. භාෂාව ද සම්පතකි. එය නිසි කළමණාකරණ ක්‍රම ඔස්සේ දියුණු කිරීමෙන් එහි සන්නිවේදන ධාරිතාව තවත් පුළුල් කළ හැකිය. ශ්‍රී ලංකාවේ භාවිතාවන සිංහල හා දෙමළ භාෂාවලට අවුරුදු දහස් ගණනක ප්‍රෞඪ ඉතිහාසයක්, හරවත් ජන ශ්‍රැතියක්, ප්‍රබුද්ධ සම්භාව්‍ය සාහිත්‍යයක් උරුම ව තිබේ. එසේම නූතන සාහිත්‍යය හා ජන සන්නිවේදනය තුල ද සිංහල හා දෙමළ භාෂාවන් ස්වභාවික උරුමයන් අත්පත්කර ගෙන තිබේ. මේ කරුණු සැලකිල්ලට ගනිමින් අපේ ජාතික භාෂාවන් දියුණු කර ගැනීමේ ඉදිරිගාමී වැඩපිළිවෙලක් අරඹමු."

"මහින්ද චින්තන" - 95 පිටුව

ඉහත සඳහන් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අප අමාත්‍යාංශය පහත දක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කරයි.

7-I. ලේඛකයන් දිරිගැන්වීම සඳහා ඔවුන් විසින් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් ලියා ප්‍රසිද්ධ කරන ගුණාත්මක මට්ටමේ පොත්පත් විද්වත් මණ්ඩලවල ඇගයීම් හා නිර්දේශ පරිදි මිලට ගෙන පුස්තකාල මගින් ජනතාවට ප්‍රයෝජන ගැනීමට සලස්වනු ලබයි. එමගින් උසස් මට්ටමේ ග්‍රන්ථ ප්‍රයෝජනයට ගෙන සිය භාෂා සාහිත්‍ය හා අනෙකුත් විෂයයන් පිළිබඳ දැනුම, අවබෝධය, පුළුල්කර ගැනීමට උපකාරී වීම සහ භාෂා සාහිත්‍ය ප්‍රවර්ධනයක් ඇති කිරීම සිදු කිරීමට අපේක්ෂිතය.

7-II. වාර්ෂිකව පළ කෙරෙන ග්‍රන්ථ ඇගයීමට ලක්කර හොඳම ග්‍රන්ථ සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ලබාදීමත් ලේඛකයන් සම්මානයට පාත්‍ර කිරීමත් මගින් ලේඛනකරණය සඳහා ඉහළ පෙළඹුමක් ඇති කිරීම.

7-III. ඒ ඒ භාෂාවන්හි හා විෂයන්හි විද්වතුන් ලවා ප්‍රසිද්ධ දේශන පැවැත්වීම මගින් විද්වතුන්ගේ දැනුම පොදු ජන සමාජයට සමීප කිරීම.

7-IV. ඇතැම් කෘති අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන මගින් මුද්‍රණය කරවා බෙදා හැරීම සිදුවේ. මේ අනුව විශේෂයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, ටවර් හෝල් රඟහල පදනම, යන ආයතන විසින් මෙම කාර්යය ඉතා සාර්ථකව සිදුකරනු ලැබේ. භාෂාව, සාහිත්‍යය, කලාව පෝෂණය සඳහා ඉපැරණි සෙල්ලිපි, ලිඛිත ග්‍රන්ථ, ලේඛන කෘති, සංගීත, ගද්‍ය, පද්‍ය, සාහිත්‍ය කෘති, නූර්ති නාඩගම් ආදී කෘතීන් රැසක් මේ යටතේ මුද්‍රණය කර බෙදා හැරේ. නීතිඥ ජෝන් ද සිල්වා නාට්‍ය වේදියානන්ගේ "සිරි සඟබෝ" නාට්‍යයත්, නීතිඥ චාල්ස් ඩයස් නාට්‍ය වේදියානන්ගේ "විධුර" නාට්‍යයත් දැනටමත් මුද්‍රණ කටයුතු අවසන් කර ඇත. විශේෂයෙන් ටවර් හෝල් රඟහල පදනම පැරණි නාට්‍ය පිටපත්, පැරණි ග්‍රැමෆෝන් ගීත ආදිය මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ජනප්‍රිය කරවනු ලබයි.

7-V. පොත්පත් මුද්‍රණය, අලෙවිය හා ප්‍රචාරණය.

සංස්කෘතික දෙපාර්තමේන්තුවේ "ජයන්ති පොත්හල" හා අපගේ අනිකුත් දෙපාර්තමේන්තු හා ආයතන සියල්ලම සිය විෂය ක්ෂේත්‍රයන්ට අදාල පොත්පත් අලෙවිය සඳහා අලෙවිසැල් පවත්වාගෙන යයි. එසේම ප්‍රාදේශීය වශයෙන් පවත්වනු ලබන වැදගත් අවස්ථාවන්හි දී ජංගම අලෙවි පහසුකම් මගින් ඒවා සලසනු ලබයි. මෙමගින් පොතපත ජනතාව ළඟටම ලැබීමේ අවස්ථාව අපි ලබා දෙන්නෙමු. මෙම කටයුතු තවදුරටත් පුළුල් කෙරේ.

7-VI. තවද ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසින් වාර්ෂිකව ජාතික නාට්‍ය සම්මාන, ජාතික නර්තන සම්මාන, ජාතික සාහිත්‍ය සම්මාන, ජාතික චිත්‍ර සම්මාන, ජාතික සංගීත සම්මාන, ජාතික මුද්‍රා නාට්‍ය සම්මාන, ජාතික රූකඩ රූපණ සම්මාන, ජාතික ළමා චිත්‍ර සම්මාන, ජාතික සංගීත සම්මාන, ජාතික ළමා නාට්‍ය සම්මාන උළෙලවල් ද සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් ජාතික ටෙලි නාට්‍ය සම්මාන උළෙලවල් ද පැවැත්වීම තුළින් ඒ ඒ ක්ෂේත්‍රවල උසස් නිර්මාණ ඇගයීම සිදුකරනු ලබයි. මේවා තුළින් දිරිය ලබන සාහිත්‍ය කලා

නිර්මාණකරණය මෙන්ම ඒ හරහා බිහිවන ජාතික සමගිය අති මහත්ය.

8. පාසැල් සංස්කෘතික සමාජ වැඩසටහන

8-I. මේ මගින් පාසල් දරු දැරියන්ගේ භාෂා සාහිත්‍ය හා සන්නිවේදන කුසලතා ඔප් නැංවීම සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීම අරඹා ඇත. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා අපි එක්වීමු.

8-II. "දැයේ උරුමය දරුවන්ටයි" වැඩසටහන

මෙම ව්‍යාපෘති යටතේ ළමා නිර්මාණ සාහිත්‍යය පෝෂණය කරනු වස් හොඳම ළමා ග්‍රන්ථ මුද්‍රණය කරවීමත්, පාසල්වල භාෂා සාහිත්‍යමය සජීවී වැඩසටහන් පැවැත්වීමත් අරඹා ඇත. සාහිත්‍යය ක්ෂේත්‍රයේ අගතැන්පත් වියතුන් පාසැල්වලට සහභාගී කරවාගෙන යෞවනෝදය සාහිත්‍ය රසවින්දනය හා භාෂා කුසලතා සංවර්ධනය සඳහා වැඩමුළු දැන් අපි පවත්වමු. මෙම වැඩසටහන ඉතාම ජනප්‍රිය වූවකි.

9. ශ්‍රී ලංකා කලා මණ්ඩලය

ශ්‍රී ලංකා කලා මණ්ඩලය මෙරට සාහිත්‍ය කලා ක්ෂේත්‍ර සියල්ලක දී ම ඉටුවිය යුතු සේවා සැලසීමේ දී අමාත්‍යාංශයේ කාර්යභාර කටයුතු මෙහෙයුම්කරණ ආයතනයකි. 1952 දී පාර්ලිමේන්තු පණතක් මගින් පිහිටවනු ලැබූ මින් අපේක්ෂා කරන්නේ

(අ) ලලිත කලාවන් පිළිබඳව ප්‍රථුල දැනුමක් අවබෝධයක් සහ ක්‍රියාකාරීත්වයක් වර්ධනය කිරීම.

(ආ) ශ්‍රී ලාංකික ජනතාව කරා කලා කටයුතු ගෙන යාම දියුණු කිරීම.

(ඇ) ලලිත කලා කටයුතුවල තත්වය වැඩිදියුණු කිරීම.

(ඈ) ශ්‍රී ලංකාවට ආවේණික කලාවන් සහ කර්මාන්තයන්හි සංවර්ධනය තහවුරු කිරීම, දිරි ගැන්වීම සහ උනන්දු කරවීම.

(ඉ) ඉහත සඳහන් අරමුණුවලට කෙලින් හෝ අනියම්ව අදාළ වන කුමන කරුණකදී වුවද රජයේ දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය බල මණ්ඩල සහ අනෙකුත් ආයතනවලට උපදෙස් දීම.

මෙම අරමුණු ඉටුකරගැනීම සඳහා එම මණ්ඩලයට උපදෙස් ලබා දීම සඳහා ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් වියතුන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩල පත්කර ගැනීමේ අවකාශ සලසා ඇත. ඒ අනුව දැනට (අ) සාහිත්‍ය, (ආ) නාට්‍ය, (ඇ) නර්තන මුද්‍රා නාට්‍ය හා රූකඩ රූපණ, (ඈ) සංගීත හා (ඉ) චිත්‍ර හා මූර්ති නමින් උපදේශක සභා පහක් ක්‍රියාත්මකය. ඒ ඒ ක්ෂේත්‍රවල උන්නතියටත් සමාජයේ විවිධ කොටස් අතර දැනුම බෙදා හැරීමටත් නිර්මාණ ජනප්‍රිය කරවීමටත් හේතු වන පරිදි ඇගයීමට ලක් කොට උසස් ගණයේ නිර්මාණවලට සම්මාන හා ත්‍යාග පිරිනැමීමේ ජාතික සම්මාන උළෙලවල් සංවිධානය කිරීමේ භාරදූර කටයුත්ත ඉටු කරනු ලබන්නේ ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසිනි. මෙම වර්ෂයේ සිට මහින්ද චින්තනයේ ඉදිරි දැක්මේ ඉලක්ක සපුරා ගැනීමේ දී ශ්‍රී ලංකා කලා මණ්ඩලය වෙත හිමි විය යුතු සේම විශාල කාර්ය භාරයක් පැවරීමට අදහස් කෙරේ. ඒ අනුව ශ්‍රී ලංකා කලා මණ්ඩල පණත සංශෝධනය කොට ඊටම අයත් මූලස්ථානයක් සපයා සියළු පහසුකම් හා කාර්ය මණ්ඩල ලබාදී එය බලගන්වා අනෙක් ආයතන සමග සහයෝගයෙන් ගම් මට්ටම දක්වා වූ සමාජයේ විවිධ කොටස් වෙත සාහිත්‍ය, කලා හා සංස්කෘතික භාවිතයන් ගෙන යාමට සියළු කටයුතු කරනු ඇත. කලාවේ හා සාහිත්‍යයේ උද්දීපනය හා විජයග්‍රහණය යනු උසස් රසඥතාවකින් යුත් මෙත්, කරුණා සිත් ඇති සංවේදී ජනතාවක් බිහිවීමයි. එය මහින්ද චින්තනය මල්පල ගැන්වීමයි.

සාරාංශගත කොට පෙන්වා දෙනු ලැබූ ජාතික උරුමයන් හා සංස්කෘතික අමාත්‍යාංශයේ මෙම වැඩසටහන තුළින් ප්‍රධාන වශයෙන් අපේක්ෂා වන්නේ එක් විශේෂ අරමුණක් සාක්ෂාත් කර ගැනීමය. එනම් සියළු ජනතාවගේ ඒකායන අපේක්ෂාව කැටි කොට ගත් මහින්ද චින්තන ඉදිරි දැක්ම යථාර්තයක් කිරීමය. ඒ ඇයි? ඒ තුළින් සාහිත්‍ය කලාව හා සංස්කෘතියේ උද්දීපනය මෙන්ම ඒ ඒ ක්ෂේත්‍රවල සියළු කලාකරුවන්ගේ අභිවෘද්ධිය සහතික කිරීම මගින් මෙරට සියළු අන්දමේ ජන කොටස් වෙත සහෝදර හැඟුමෙන් බැඳුන එකම පවුලක සමගි සම්පන්න පිරිසක් ලෙස ජීවත්වනු දැකීමටය. සමගිය, සාමය, සෞභාග්‍යය උරුම කොට ගත් ඔවුන් සංතුෂ්ටියෙන් යුත් තෘප්තිමත් ජනතාවක් කරවීමටය. එවිට මෙම

පුණ්‍ය භූමිය ඔවුන්ගේ ආදරණීය මව්බිම බවට පත් කර ගැනීමෙන් නව ශ්‍රී ලංකාවක් බිහි කොට එය ආසියාවේ ආශ්චර්යමත් දේශය කිරීමට ශක්තිය ධෛර්යය හා පසුබිම සහතික කොට සපයා දෙනු ඇතැයි අපේ විශ්වාසය වේ. සැබෑම වූ ක්‍රියාකාරී වූ ඵලදායක වූ ජාතික සමගිය බිහිවීමත් එය සදාකල් පැවතීමත් ඒකාන්ත කොට දක්විය හැක්කේ එමගින් පමණි. මහින්ද චින්තන ඉදිරි දැක්ම ජනතා පැතුම වී ඇත්තේ ද එබැවිනි. එය යථාර්තයක් බවට පත් කිරීමට දායක වීම අප හැමගේ පරම වගකීම වනු ඇත.

ආනන්දයෙන් ප්‍රඥාව කරා ජනතාව රැගෙන ගිය කලාව ද සුණු විසුණු කළ

# බෙදුම්වාදී ත්‍රස්තවාදයට පෝෂණය සැලසූ මෙරට මාධ්‍ය භාවිතය

## මානවවිද්‍යාඥ පණ්ඩුල ඇඳගම

වසර තිහක් තිස්සේ සියළු අංශයන්ගෙන් මෙරට විනාශයට ඇද දමුවා වූ ද කෲරත්වයෙන් හා ම්ලේච්ඡත්වයෙන් මුළු ලොවම කම්පාවට පත් කළා වූ ද බෙදුම්වාදී මිනීමරු කොටි ත්‍රස්තවාදය භෞතික වශයෙන් වසර දෙක හමාරක් තුළ දී මෙරටින් අතු ගා දමා ශ්‍රී ලංකාව විසින් විශ්මිත විජයග්‍රහණයක් අත්කොට ගෙන මේ වන විට වසරක් ගෙවී ඇත. පසුගිය වසර පුරාම ජනතාවත් පාලක පංතියත් මෙම ජයග්‍රහණයේ උද්දමයෙන් කෙතරම් දුරට මත් වූයේ ද යත් අභිමුඛ සතුරා විනාශ වුව ද අනභිමුඛ අදෘශ්‍යමාන සතුරා තවතවත් කෝපයෙන් දේශයට එරෙහිව බලමුළු බඳින අයුරු අමතක කළ තරම්ය. පසුගිය ජනාධිපතිවරණයෙන් මෙම යථාර්තය මනාව පහද දෙනු ලැබිනා. වසර තිහක් පුරා කිසිදු රාජ්‍ය නායකයෙකුට විසඳිය නොහැකි වූ දැවැන්ත ත්‍රස්ත බලවේගයක් වසර දෙක හමාරකින් සුණු විසුණු කල යථාර්තය පිළිගැනීමට අකැමති පිරිසක් තවමත් සිටිති. එවන් පිරිස්වල ද යහපත සඳහා කළ යුතුව ඇත්තේ යුද සමයේ විනාශ කරන ලද සමාජයත් ආර්ථිකයත් නගා සිටුවා ජනතාව නැවත කිසිද සතුරාගේ ගොදුරක් බවට පත්වීමට ඇති සියළු ඉඩකඩ අහුරා දැමීමය. ඒ සඳහා සමාජය සුවපත් කරන කලාව නැවත නගා සිටුවීම කදිම මගකි. ත්‍රස්තවාදීන්, යුද්ධවාදීන් හැමවිටම ජනතාව මර්දනය සඳහා මුලින්ම එය විනාශ කරනු ලබන්නේ එය සතු අසීමිත බලය නිසාය.

ආනන්දයෙන් පටන්ගෙන ප්‍රඥුව කරා රැගෙන යමින් විනාශකාරී කටයුතුවලින් ජනතාව මුදවාගන්නා කලාව මිනිසාට මිනිස්කම කියා දීමට සුවිශාල වූ ශක්තියක් දරයි. එහෙයින් මෙවන් අති භයානක මෙන්ම ලොව මෙතෙක් නුදුටු විරූ අපරාධකාරී ව්‍යාපාරයක් විසින් විනාශ කරන ලද මනුස්සකම නැවත ගෙන ඒම සඳහා කලා කෙත අස්වැද්දිය යුතුය. සශ්‍රීකත්වය කරා යන ගමනේ සාර්ථකත්වය එහි ඇත. තවත් අතකින් මෙවන් අධ්‍යයනයක් මිනීමරු ත්‍රස්තවාදී උන්මත්තකයන් පිරිසක් විසින් කරන ලද ඇදහිය නොහැකි අපරාධ රැල්ලක් ලෙස ඉතිහාසගත සංසිද්ධියක් පිළිබඳ කෙරෙන විමර්ශනයක් ද වනු ඇත. එසේ කෙරෙන විමර්ශනයක දී පැහැදිලි ලෙස දැකිය හැකි ප්‍රධාන සාධකයන් කිහිපයක් ඉස්මතු වී පෙනෙනු නිසැකය. ඒවා අතුරින් ජනතාව යහ මග යැවීමට නිවැරදි දැනුවත්භාවය ලබාදීමට ඉන්නා වූ ජන සංනිවේදන මාධ්‍යයෙන් මෙරට ජනතාවගේ චින්තනය කෙරෙහි බලපෑම් කරමින් බෙදුම්වාදී ත්‍රස්තවාදයට හිතකර හා සානුකම්පික වාතාවරණයක් නිර්මාණය කිරීමට සපයන ලද දායකත්වය අන් කිසිදු සාධකයකට නොදෙවැනි ලෙස පෙනී යනු නිසැකය. ඒ ඇයි ද යන්න සාකච්ඡා කිරීම මෙම විමර්ශනයේ අරමුණ වේ.

පැහැදිලිවම නිශ්චය කරනු නොලැබූ ආරම්භයක් සහිත වූ ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී අරගලය[1] මීට ශතවර්ෂයකට පමණ ඉහත දී කෙසේ වෙතත් එහි සීඝ්‍ර ව්‍යාප්තිය සිදු වූ පසුගිය වසර 30-40 පමණ කාලය තුළ[2] අති බිහිසුණු ත්‍රස්තවාදී ස්වරූපයක් ගත් බව කිසිවෙකුට හෝ රහසක් නොවේ. අන් සියල්ල සමඟ බිඳුන හදවත් යා කරන රෝගී වූ සමාජය සුවපත් කරන කලාව පොඩි පට්ටම් කරමින් ක්‍රමයෙන් වර්ධනය වූ එහි ත්‍රස්තවාදී ස්වරූපය කෙතරම් දරුණු වූයේ ද, කුරිරු වූයේ ද යත් එය ලොව අතිශය මිලේච්ඡම බිහිසුණුම ත්‍රස්තවාදී ව්‍යාපාරය ලෙසටත් එය කිසිදු පැරද විය නොහැකි බවටත් මතයක් ත්‍රස්තවාදීන්ට හිතවත් මාධ්‍යය උපයෝගී කොටගෙන ලෝක පූජිත කරවනු ලැබීය.[3] එයින් නොනැවතී, එවන් විනාශකාරී සහාසික ව්‍යාපාරයක් මර්දනය කිරීම සඳහා නීත්‍යානුකූලව පිහිටුවන ලද රජයක් වෙත ව්‍යවස්ථාවෙන්ම පවරන ලද වගකීම ඉටුකරනු වස් බලය යොදා කටයුතු කිරීම "යුද්ධයක්" ලෙස හුවා දැක්වීමට ද කිසිදු චකිතයක්,

හිරිකිතයක් හෝ සදාචාරයක් නොමැතිව දෙමළ ඊළාමයේ කොටි ත්‍රස්තවාදින්ගේ බෙදුම්වාදයට හිතවාදී පිරිස් විසින් මාධ්‍යය යොදා ගන්නා ලදී. සෙවරී, නිදහස් රටකට එරෙහිව නැගී සිටි නීති විරෝධී පිරිසක් මර්දනයට පියවර ගැනීම යුද්ධයක් සේ පුම්බා තබා, නැති යුද්ධයක් ගැන ඇදහීමට ජනතාව පුරුදු කරන ලදී. මෙම සියළු අසාමාන්‍ය අමූලික අසත්‍ය ප්‍රචාරයන් අපේක්ෂිත ඉලක්කයන් කරා ගෙන යාමට කෙතරම් දුරට හැකි වූයේ ද යත් ත්‍රස්තවාදය කිසිසේත් අතහැරිය නොහැකි දෙයක් ලෙස අකැමැත්තෙන් වුව ද රටපුරා ජන කොටස් අතර පිළිගැනීමට පත් කරනු ලැබුවා පමණක් නොවේ. රට බෙද දී හෝ සාමය කරා යාම අප සතුව ඇති එකම විසඳුම ලෙස සැළකීමට ජන විඥනය සකස් කළහ.

ඔවුන් එපමණකින් ද සෑහීමකට පත් වූයේ නැත. රට බෙද වෙන් කොට ඇතැයි යන මිත්‍යා සංකල්පය ජනතා සිත් සතන් තුළ පැල පදියම් කරන ලදී. ඒ අනුව ඊළාම් රාජ්‍යයේ මායිමේ පිහිටි සිංහල ජනතාව වෙසෙන "සීමා මායිම් ගම්මාන" ගැන කථාකිරීමට ජනතාව හුරු කරනු ලැබූහ. මිනීමරුවන් විමුක්තිකාමීන් කොට ඔවුන්ට වීරත්වයක් ආරෝපණය කොට දෙනු ලැබීය. මිනීමරු ත්‍රස්තවාදීන්ට නීත්‍යානුකූල හමුදා තනතුරු නාමයන් පටබඳින ලදී. මිනීමරුවන් මර්දනය කිරීම සඳහාත් භූමියේ අඛණ්ඩතාවය හා ජාතියේ නිදහස ආරක්ෂා කිරීම සඳහාත් ත්‍රස්තවාදීන්ට පහර දී කටයුතු කිරීම මානව හිමිකම් කඩකිරීම් ලෙස හැඳින්වීමට පොළඹවනු ලැබූහ. ඒ සියලු සාවද්‍ය මත ප්‍රචලිත කරනු ලැබුවේ නීති විරෝධී ත්‍රස්තවාදී සුළු පිරිසක් විසින් කරනු ලබන මිනී මැරීම්, මංකොල්ලකෑම්, දේපළ විනාශයන් සියල්ල ඊනියා විමුක්ති අරගල ලෙස හුවා දක්වමිනි.[4] වගකිව යුතු දේශපාලන නායකයන්, වියතුන් මෙන්ම නිලධාරීන් විසින් ද කිසිදු විචාරයකින් තොරව ත්‍රස්තවාදීන්ගේ මෙම සාවද්‍ය අදහස්, මත හා සංකල්පවලට නීත්‍යානුකූල බව ලබාදෙමින් නිරන්තුරුව ත්‍රස්තයන්ගේ වදන් කෝෂයම භාවිතා කරන තත්වයක් උදා කරන ලදී. ඔවුන්ගේ එවන් වැරදි භාවිතයන් සමස්ත බාල පරම්පරාවම නොමග යවනු ලබන සුළු විය.[5] වටිනා තරුණ ජීවිත ද බිලි දෙමින් රට රැකුමේ නිරත වූ වීරෝධාර රණවිරුවන්ට අපහාස උපහාස අවමාන ගෙනදීමට තරම් ඔව්හු නිවට වූහ. එය එසේ සිදු කළේ

කවුරුන් විසින් ද? කාගේ වුවමනාවකට දැයි විමසා බැලීම ඉතිහාසය විසින් අපට පවරනු ලබන වගකීමකි. අපව ගිල ගැනීමට කැසකවන බලවේග හඳුනා ගැනීමට ද එය උපකාරී වනු ඇත.

ජන විඥානය හැඩගැස්වීමෙහිලා බලපාන සන්නිවේදනය යනු මානව අන්තර් ක්‍රියාවලියකි. මිනිසාගේ ප්‍රභවයේ සිට ආරම්භ වූ මෙම ක්‍රියාවලිය ක්‍රමයෙන් විකාශනය විය. අද වන විට සන්නිවේදනයේ ප්‍රධාන පාර්ශවකරුවකු වන්නේ සන්නිවේදකයාය. ඔහු කුමන මාධ්‍යයක් (පුවත් පත්, ගුවන් විදුලිය, රූපවාහිනි) භාවිත කළත් සන්නිවේදනය කළ දෙයෙහි හොඳ නරක අඩු වැඩි වීමක් සිදු නොවේ. මේ නිසා "ඔහුගේ දැනුම, අවබෝධය, නිපුණතාව, සමාජ වගකීම හඳුනා ගැනීමේ හැකියාව අතිශයින් වැදගත් වේ.."[6] මක්නිසා ද යත් මිනිසාගේ යහපත් පැවැත්ම සඳහා අවශ්‍ය දැනුවත්භාවයට පාදක වන තොරතුරු නිවැරදි විය යුතුය. නිරවුල් ද විය යුතුය. ඒ දැනුවත්භාවය ලබා දෙන තොරතුරු තුළින් රට, ජාතිය, දේශීයත්වය, ජාතියේ හැදියාව, සාර ගුණධර්ම ජාතික උරුමයන් වූ සියළු කලා ක්ෂේත්‍රයන් ආදී වූ සියල්ල සුරැකීම, වැඩි දියුණු කිරීම හා ශක්තිමත් කිරීම සඳහා පෙළඹවීමක් ද ලැබිය යුතුය.

සන්නිවේදන මාධ්‍යයේ කාර්යභාරය ගැන අප විමසිලිමත් විය යුත්තේ ඊ සතු මෙම සමාජ වගකීම් සම්භාරයේ ප්‍රබලතාව නිසාය. රටේ ජාතියේ පැවැත්මට තර්ජන එල්ල වන විට ඉන් මිදීම සඳහා ජනතාව පෙලගැස්වීමට ක්‍රියා කිරීම වගකිව යුතු මාධ්‍යයක කාර්ය භාරය වනු ඇත. රටේ ආරක්ෂාවට එල්ල වී ඇති තර්ජනවලින් රට ආරක්ෂා කර ගැනීමට දඟලන රජයකින් මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදී නිදහස, සාධාරණත්වය ආදිය ඉල්ලා කෑමොර ගැසීම කෙසේවත් සමාව දිය හැකි අපරාධයක් නොවන්නේ ඒ නිසාය. ජන මාධ්‍යයේ කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳ සොයා බැලීමට 1990 දශකයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පත්කරන ලද කොමිසමේ වාර්තාව විසින් පෙන්නා දෙන පරිදි තොරතුරු සම්පාදනය යනු ජන සන්නිවේදනයේ එක ප්‍රධානතම කාර්යයකි යයි ක්‍රියා සිටින්නේ ද ඒ නිසාමය.[7]

ජනසන්නිවේදන මාධ්‍යයන් පවත්වාගෙන යන්නේ කා සඳහා ද ? කුමක් සඳහා ද? ඒ අනුව එහි වගකීම කුමක් විය යුතු ද යන්න පිළිබඳ විමසා බැලීම ද ජන විඥානය හැඩ ගැස්වීමෙහිලා බලපැවැත්වෙන සන්නිවේදන මාධ්‍යය භාවිතය ගැන කෙරෙන විමසීමක දී අවධානය යොමු කළ යුතුම වූ පැතිකඩකි. සන්නිවේදනය ජනතාව සඳහා සිදුවන්නක් බවට අටුවා ටීකා අවශ්‍ය නොවනු ඇත. එහෙයින් ම ජනතාව කේන්ද්‍ර කොට නොගන්නා ජන සන්නිවේදන මාධ්‍යයකට පැවැත්මක් තිබිය නොහැකිය. එවිට එම මාධ්‍යය ක්‍රියාකාරීව සිටීමට උත්සහා ගන්නේ නම් එක්කෝ හොර සල්ලි වැය කරන ගුප්ත පිරිසකගේ ආයෝජන මත යැපිය යුතුය. නැතිනම් ජනතාව ආකර්ෂණය කර ගත හැකි ඕනෑම ක්‍රමවේදයකට පෙළඹිය යුතුය. ඒවායින් රටට ජාතියට, සමාජයට, ජනතාවට, සිදුවන්නේ සේවයක් ද අනර්ථයක් ද යනු කිසිවක් ඔවුනට ප්‍රශ්න නොවේ. ආණ්ඩු විරෝධී වීම ජනප්‍රිය රැල්ලක් නම් ත්‍රස්තවාදයකට තබා වෙනත් ඕනෑම නීති විරෝධී ක්‍රියාවකට වුව ද මානව හිමිකම්, සමාජ සාධාරණය, ප්‍රජාතන්ත්‍රවාදය ආදී සළුපිළි අන්දවා හැඩ වැඩ දමා ඉදිරිපත් කොට තම අරමුණු ඉටු කරගැනීමට පසුබට වන්නේ ද නැත. කෙටි පණිවුඩ මගින් ජනාධිපතිවරුන් තේරීමට හෝ දක්ෂ නිර්මාණශීලී කලාකරුවන් තේරීමට හෝ මෙරට සමහර මාධ්‍ය ආයතන ඉදිරිපත් වූයේ මෙසේ ජන පදනම නැති වී ගිය කල්හි එය ආපසු ලබා ගැනීම අරමුණු කොට ගෙනය. ත්‍රස්තවාදයට හිතෛෂී වීම ඔවුනට ගැටළුවක් නොවන්නේ එබැවිනි.

<u>ත්‍රස්තවාදය යනු කුමක්ද?</u>

ත්‍රස්තවාදය යනු කුමක්දැයි හඳුනා ගැනීම ද මෙවන් අධ්‍යයනයකදී අතිශය වැදගත් වනු ඇත. ත්‍රස්තවාදය යයි කිව් පමණින් ඕනෑම අයකු තුළ බිය වැද්දවීම පදනම් කොටගත් ක්‍රියාවලියක් ධ්වනිත වනු ඇත. ත්‍රස්ත්‍රවාදය යන්නට ඉංග්‍රීසි යෙදුම වූ Terrorism යන වදන අර්ථ ගන්වන Collins Concise Dictionary and Thesaurus නම් ශබ්ද කෝෂයේ 2003 දී පළකළ තුන්වන මුද්‍රණයේ 996 පිටුවේ මෙසේ දැක්වේ. “The systematic use of violence and intimidation to achieve political ends" මෙහි දී "දේශපාලන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රමානුකූලව හිංසාකාරිත්වය හා බිය වැද්දීම යොදා ගැනීම

ත්‍රස්තවාදය" යයි දක්වා තිබීමෙන් ත්‍රස්තවාදය යනු සියළු ශිෂ්ට සම්පන්න සමාජවල සදචාර විරෝධී වූ ද සමාජයට හතුරුකම් කරන්නා වූ ද ව්‍යාපාරයක් බවට අර්ථ දක්වයි. එසේ නම් ත්‍රස්තවාදය කිනම් පදනමක් මත හෝ ජනතාව වෙත පිළිගැන්වීම සඳහා කිසිවෙකුට අයිතියක් හෝ හැකියාවක් තිබිය හැකිද? අවාසනාවකට මෙන් ශ්‍රී ලංකාවේ බොහෝ ජන සංනිවේදන මාධ්‍ය හා මාධ්‍යකරුවන් විසින් කිනම් හෝ සැඟවුන හේතූන් නිසා ත්‍රස්තවාදය සහේතුක කොට දක්වා ජනතාව අතර පිළිගැනීමට සැලැස්වීම ජාතියකට එරෙහි වූ සමාව දිය නොහැකි බරපතළ අපරාධයක් බව සැඟවිය නොහැකි තරම් සත්‍යයකි. එය වඩාත් බරපතළ වන්නේ ඔවුන්ගේ සාපරාධී ක්‍රියාමාර්ග අප වැනි කුඩා රටවල් ගිල ගැනීමට මාන බලමින් සිටින බලවත් රටවල මාධ්‍යයන්ට හිතා මතා සපයන රස බොජුන් බවට පත්වීමෙන් අපේ ස්වාධීනත්වයට එල්ල වන තර්ජන ගැන සළකන විටය.

අනෙක් අතට ත්‍රස්තවාදියා යන වචනයට පරියාය වූ Terrorist යන්නට Concise Oxford Dictionary of Current English නමින් ලෝ ප්‍රකට ඔක්ස්ෆෝර්ඩ් ප්‍රකාශනයේ 1951 දී ප්‍රකාශිත සිව්වන මුද්‍රණයේ අංක 1316 පිටුවේ අර්ථ දක්වා ඇත්තේ මෙසේය. "One who favours or uses terror inspiring methods of governing or coercing government or community" යනුවෙනි. "පාලනය සඳහා හෝ රජයක් හෝ ජන සමාජයක් බිය ගැන්වීම සඳහා හෝ ත්‍රාසජනක ක්‍රමවේද භාවිතා කරන්නා හෝ භාවිතයට වඩා ඇලුම් කරන්නා ත්‍රස්තවාදියෙකු වේ." යන්න එහි සිංහල අර්ථය වේ. මෙහි සඳහන් සෑම වචනයකින්ම ත්‍රස්තවාදියා යනු සමාජයට අහිතකර ක්‍රියාවල යෙදෙන සමාජ විරෝධී අපරාධකරුවෙකු බව නිතැකියෙන්ම අර්ථ ගැන්වෙයි. ඒ අනුව ඔවුන් සමාජයේ යහපත් සිතුවිලි සහිත ජනතාවට සියළු රස වින්දනයන් ලබා දෙන කලා මාධ්‍යයන් සුණු විසුණු කොට දමන දුෂ්ඨ බලවේග බව නිසැකය. එසේ නම් ඔහු සමාජයෙන් පිටුදැකිය යුත්තෙකි.

## සංනිවේදන මධ්‍යය යනු කුමක්ද?

අද සමාජයට නැතිවම බැරි අංගයක් ලෙස සැළකෙන සන්නිවේදන මාධ්‍යය යනු කුමක්ද? "මාධ්‍යය වනාහි අපගේ එදිනෙද

ජීවිතය පුරා පැතිරුණු නෛසර්ගික, ප්‍රශ්න කල නොහැකි කොටසකි. අපෙන් බොහෝ දෙනෙකු උදෑසන පිබිදෙනුයේ ගුවන් විදුලියේ ඔරලෝසු නාදය හෝ තමා කැමතිම ගුවන් විදුලි නාලිකාවේ ප්‍රවෘත්ති ඇසීමෙනි. එක්කෝ රූපවාහිනිය ක්‍රියාත්මක කර ප්‍රවෘත්ති නැරඹීම හෝ පරිගණකයෙන් අළුත්ම ප්‍රවෘත්ති හෝ විද්‍යුත් තැපෑල (E-mails) පරීක්ෂා කර බැලීමෙනි. එසේත් නොමැති නම් උදෑසන ඇවිදින්නට යන විට තම ජංගම දුරකථනයෙන් හෝ කුඩා රේඩියෝවෙන් හෝ ප්‍රවෘත්ති ඇසීමෙනි. අප අවදිව සිටින කාලය තුළ මෙසේ කුමන හෝ මාධ්‍යයක් සමග අපි සම්බන්ධ ව සිටිමු."[8] එම සම්බන්ධය නිසාම ඒවා අපට කෙරෙන බලපෑම් අපමණය. එම බලපෑම් ජන විඥනය හැඩ ගස්වයි. ඕනෑම රටක මෙන් මෙරට ද එසේ ජනවිඥනය සකස් කිරීමෙහි ලා බලපෑම් කරනු ලබන මාර්ග රාශියක් වේ. එක පමණටම ශක්ති සම්පන්න වූ ඒ සන්නිවේදන මාධ්‍යයන් හා තොරතුරු සපයන වෙනත් මාධ්‍යයන් රාශියකි. ජන සන්නිවේදනය අර්ථ දක්වමින් සමාජ විද්‍යා විශ්වකෝෂය (1974) සඳහන් කරන්නේ " තාක්ෂණික මාර්ගයකින් කිසියම් පණිවිඩයක් ප්‍රජාවට ගෙන යන ප්‍රධානතම මාධ්‍යය ලෙසය" තවත් එක් විග්‍රහයකට අනුව ජන සන්නිවේදනයට ජන සන්නිවේදනය යයි කියන්නේ සන්නිවේදනය කරන අවස්ථාවන් හිදී සංඛ්‍යාවෙන් විශාල වූ ජනතාවක් සම්බන්ධ වන හෙයිනි."[9] පුවත් පත්, පොත් පත්, සඟරා, පත්‍රිකා, දැන්වීම්, දේශන, සමුළු, ගීත, නාට්‍ය, ගුවන් විදුලිය, රූපවාහිනිය, චිත්‍රපට ආදී සියල්ල ඊට අයත් වේ. ඒ බව "The mass media includes all forms of communications to mass audiences" යයි[10] සඳහන්ව තිබීමෙන් සනාථ වේ. තව ද මෙහි දී ජන සන්නිවේදන මාධ්‍යයන් පිළිබඳව හාවිලි වැනි මාධ්‍ය විශේෂඥ වියත් පිරිස්වල[11] මත අතිශය වැදගත් වනු ඇත.

සමාජයේ ජනප්‍රිය වූ සාම්ප්‍රදායික මාධ්‍යයන් සියල්ල මතට නූතනයේ දුරකථනය, අන්තර්ජාලය, විද්‍යුත් තැපෑල, කෙටි පණිවුඩ ආදී වශයෙන් වූ නවතම ක්‍රමවේදයන් එක්වීමෙන් සමාජය සතු ජනසංනිවේදන මාධ්‍ය ගොන්න පුළුල් වී ඇත. මෙහි දී අප විසින් මහත් අභිමානයෙන් සුරකිනු ලබන නාට්‍ය, නර්තන, සංගීත, චිත්‍ර මූර්ති ආදී වශයෙන් වූ කලා අංගයන් ද සංනිවේදන මාධ්‍යයන්

ලෙස සැලකිය හැකි බව අමතක නොකළ යුතුය. විවිධ ජන සංනිවේදන මාධ්‍යයන් විසින් ජන විඥානය සකස් කිරීමෙහි ලා බලපෑ ආකාරය, බලපෑම්වල ප්‍රමාණය, ගැඹුර හා ස්වභාවය විවිධ බැවින් ඒවා එකිනෙක වෙන වෙනම සළකා බැලීම වැදගත් වුව ද සියළු මාධ්‍යයන් විසින් කරනු ලබන්නේ ජනතාවට තොරතුරු සැපයීම තුළින් ඔවුන්ගේ අදහස්, තීරණ හා නිගමන සකසා ගැනීමේ දී ඍජු ලෙස මැදිහත් වීම බැවින් යම් පමණකට සියළු සංනිවේදන මාර්ග එකට ලා සලකා බැලීම අසාධාරණ නොවනු ඇත. ඒ ඒ මාධ්‍ය මගින් ඉටු කරනු ලබන බලපෑම් හා බලපෑම් සිදුකරන ආකාරයේ විවිධත්වය නිසාම ජන විඥානය හැඩ ගැස්වීමෙහිලා ඒවා බලපාන අන්දම ඉතා සූක්ෂම විය හැකිය. ත්‍රස්ත ක්‍රියා රටපුරා ප්‍රචලිතව පැවති අවදිවල ඒවාට උඩ ගෙඩි දුන් මෙකී සමහර මාධ්‍යයන් ත්‍රස්තවාදය පරාජය කරනු ලැබීමෙන් අනතුරුව ද එකී ජයග්‍රහණයන් හෑල්ලු කිරීමට දරන ලද පරිශ්‍රමයෙන් පෙනේ.

## සන්නිවේදන මාධ්‍ය වර්ගීකරණය

ජන විඥානය හැඩගැස්වීමෙහිලා බලපෑම් කරන සන්නිවේදන මාධ්‍ය පහසුවෙන්ම කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. ලිඛිත නොහොත් මුද්‍රිත මාධ්‍යය, විද්‍යුත් නොහොත් විදුලි කාර්මික ශිල්පය පාදක කොටගත් මාධ්‍යය හා භාෂිත නොහොත් කථනය භාවිතා කරන මාධ්‍යය වශයෙනි. මේ සියල්ලම එක පමණට ප්‍රබල වන්නේ ජනතාවගේ සිතුම් පැතුම්, අදහස් උදහස් තීන්දු කිරීමේ දී ඒ ඒ අයට ප්‍රවේශ වීමට පහසු කුමන මාධ්‍යයක් වුව ද ජනතාව විසින් උපයෝගී කොට ගන්නා බැවිනි. ලිඛිත මාධ්‍යය අතර ප්‍රධානතමයා වශයෙන් පුවත්පත් හැඳින්වීම පිළිබඳ වාදයක් නැත. එහෙත් පොත පත, පත්‍රිකා, දැන්වීම් ප්‍රදර්ශන පුවරු (පෝස්ටර්) ආදී සියල්ල ද ප්‍රබල භූමිකාවක් ඉටු කරන බව පිළිගැනේ.

විද්‍යුත් මාධ්‍යය අතර පුරෝගාමී සේවාවක් ඉටු කරනු ලැබුවේත්, ලබන්නේත් ගුවන් විදුලියයි. එහෙත් වර්තමානය වන විට රූපවාහිනිය පෙරමුණ ගෙන ඇත්තේ එහි ඇසි දිසි විශේෂ ගුණය නිසාය.[12] නරඹන්නන් හට තම මිතුරෙකු විද්වතෙකු, විනෝදය හා රසාස්වාදය සපයන ශිල්පියෙකු අභිමුඛව සිටින්නා සේ සළකා

සම්බන්ධ විය හැකි වීම රූපවාහිනියේ ආකර්ෂණීය ගුණයකි.[13] මේ සියල්ල සමග අද වන විට දුරකතන මෙවලම ද ප්‍රබල මාධ්‍යයක් වී ඇත. එය ලබා ඇති දියුණුව අනුව ජංගම දුරකථන සේවාව අතිශය වැදගත් වේ. ක්ෂණිකව තොරතුරු හුවමාරු කර ගැනීම ද රූපවාහිනී දර්ශන නැරඹීම ද පහසුවීම ජංගම දුරකථන ප්‍රබල වීමට විශේෂ හේතුවකි. පරිගණක සේවාව පුළුල් වීම හරහා තොරතුරු ලබාගැනීමේ මාධ්‍යයක් ලෙස එය ප්‍රබල භූමිකාවක් ඉටු කරන අන්දම මේ වන විට ඉතා පැහැදිලි වේ. අන්තර්ජාලය, විද්‍යුත් පණිවුඩ ක්‍රමය, සමුළු පැවැත්වීමේ පහසුව ආදී සියල්ල නිසා අන්තර් මහාද්වීපික සම්බන්ධතා පැවැත්වීමට හැකිවීම එහි ප්‍රබලත්වය තීව්‍ර කිරීමට හේතු වී ඇත.

භාෂන මාධ්‍යය ලෙස හඳුන්වනු ලබන්නේ දේශන, සම්මන්ත්‍රණ, ගායන ආදී කොටගත් අංගයන්ය. ඒවා ජන විඥනය හැඩගැස්වීමෙහිලා විශාල බලපෑමක් කරන බව අවිවාදිතය. නාටකය, චිත්‍රපට, කැසට් පට ආදිය ද විශාල ලෙස ජන විඥනය පෝෂණයට හේතුකාරක වන බව අමතක කළ හැකි නොවේ. ඒවා සන්නිවේදනය හා විනෝදය සපයන මාධ්‍ය වන බැවිනි. මේවා සියල්ලම පසුගිය කාලයක් පුරා බෙදුම්වාදී ත්‍රස්තවාදය වෙත හිතකර ලෙස ජන විඥනය හැඩගස්වා ගැනීමට භාවිත කොට ඇති පමණ අනාවරණය වන්නේ දැන්ය. සමාජ සාරධර්ම සුණු විසුණු කොට අසංවර සමාජයක් බිහි කිරීම සඳහා කලා මාධ්‍යයන් වන නාට්‍යය, සිනමාව, ටෙලි නාට්‍ය, සංගීත සංදර්ශන ආදිය යොදා ගැනීම පවා බෙදුම්වාදයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමක් යයි නිසැකව සඳහන් කළ යුතුය.

<u>මුද්‍රිත මාධ්‍යය</u>

(අ) පුවත්පත්

මෙරට දක්නට ලැබෙන මාධ්‍ය විවිධත්වය අති විශාල බව මුලින්ම පිළිගත යුතුය. ඒවා අතර අද වන විට මුද්‍රිත මාධ්‍ය අභිබවා විද්‍යුත් මාධ්‍ය පෙරමුණ ගෙන ඇති බැවින් මුද්‍රිත මාධ්‍ය එතරම් ප්‍රබල යයි කිව නොහැකි වුව ද බලපෑම් ගැඹුරුය. විශේෂයෙන් පුවත්පත් සෑම සමාජයකම දෛනික අවශ්‍යතාවක් බවට පත්ව ඇත. "නූතන පුවත් පත ප්‍රථම සැබෑම ජන සන්නිවේදන මාධ්‍යය විය. ඊට හේතු වන්නේ පුවත් පත සහ සමාජය අතර පවත්නා සබඳතාව අනෙකුත්

ජන සන්නිවේදන මාධ්‍යයන්ට සාපේක්ෂව ශක්තිමත් වීමය."[14] සාක්ෂරතාවය ඉතා ඉහළ මට්ටමක ඇති මෙරට අනෙක් රටවල් හා සාපේක්ෂව ගත් කළ පුවත්පත් ප්‍රමාණය ද විශාලය.

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත පුවත්පත් සියල්ල වර්ග හතරකට බෙද දැක්විය හැකිය. රාජ්‍ය පාලනය යටතේ පුවත්පත් (රාජ්‍ය මාධ්‍යය) පෞද්ගලික ආයතනවල පුවත්පත් (පෞද්ගලික මාධ්‍යය) දේශපාලන පක්ෂ කණ්ඩායම්වල පුවත්පත් (පක්ෂ මාධ්‍ය) හා විවිධ සංවිධානවල හා රාජ්‍ය නොවන සංවිධානවල පුවත්පත් (විකල්ප මාධ්‍යය) වශයෙනි. ජන විඥනය හැඩ ගැස්වීමෙහිලා විශේෂයෙන් බෙදුම්වාදී ත්‍රස්තවාදයට ජනතා පක්ෂපාතිත්වය හරවා ගැනීමෙහිලා සුවිශේෂ සේවාවක් කරනු ලැබ ඇති පුවත්පත් පහසුවෙන් හඳුනා ගැනීමට මෙම වර්ගීකරණය උපකාරී වනු ඇත. මෙරට සිංහල, දෙමළ ඉංග්‍රීසි යන ප්‍රධාන භාෂා සියල්ලන්ගෙන්ම පළකරන දිනපතා සතිපතා මාසික ආදී වශයෙන් වූ පත්තර ගණන ද විශාලය. ඒවා අතුරින් ජාතික පුවත්පත් විශාල වශයෙන් රටපුරා නිති පතා අලෙවි වන අතර අනෙක්වා සීමිත පිරිස් අතරේ නැතිනම් ප්‍රාදේශීයව සීමිත අලෙවියක් සහිත ඒවා ලෙස සැළකිය හැකිය. විශේෂයෙන් අවිනිශ්චිත මූලයන් ඔස්සේ ලබන මුදලින් පළ කෙරෙන පුවත්පත්වල අලෙවිය ඔවුන්ට කිසිවිට ප්‍රශ්නයක් නොවේ. පිටපත් ස්වල්පයක් පළ කොට අවශ්‍ය වූ ප්‍රවෘත්තිවලට ප්‍රසිද්ධිය ලබා දී මුදල් සපයන විදේශීය බලයන් වෙත ඉදිරිපත් කොට මුදල් ලබාගැනීම පමණක් ඔවුන්ගේ අරමුණ වන බැවිනි.

සිංහල භාෂාමය පුවත්පත් අතර දිනමිණ, සිළුමිණ, දිවයින දිවයින ඉරිද සංග්‍රහය, ලංකාදීප, ඉරිද ලංකාදීප, ලක්බිම, ලක්බිම ඉරිද සංග්‍රහය ප්‍රධාන තැනක් ගන්නා ජාතික පුවත්පත් වන අතර සතිපතා පළවන පුවත්පත් අතර හෙළදිව, සියත, රිවිර, ඉරුදින, රාවය ආදිය ප්‍රධාන තැනක් ගනී. ඉංග්‍රීසි භාෂාවෙන් පළවන පුවත්පත් අතර Sunday Observer, Ceylon Daily News, Daily Mirror, Island ප්‍රධාන වන අතර Sunday Island, Nation, Sunday Leader, Sunday Lakbima News, Sunday Times ඉංග්‍රීසි සතිපතා පුවත්පත් අතර ප්‍රධාන තැනක් ගනී. වීරකේසරී, තිණකරන්, සුදනෝලි ආදිය දෙමළ

භාෂාවෙන් පළවන පුවත්පත් වන අතර යාපනයේ පළවන ප්‍රාදේශීය පුවත්පත් ද සංස්කරණයේ ඇති බව අමතක කළ යුතු නොවේ. මෙම ජාතික තලයේ පුවත්පත් අතරින් එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක් හවුස්) මගින් පළ කරන පුවත්පත් රාජ්‍ය මාධ්‍ය ලෙස හැඳින්වෙන අතර අනෙක් සියල්ලම පුද්ගලික ආයතන හෝ සංවිධාන මගින් පලකරනු ලබන ඒවා වේ.

දේශපාලන පක්ෂ මගින් නිකුත් කරන සති, මාසික හෝ වාර පුවත්පත් සියල්ල ඒ ඒ දේශපාලන පක්ෂ මතවාද ඉදිරිපත් කරන ඒවා වන බැවින් පාඨක පිරිස් බොහෝ දුරට සීමිත විය හැකිය. එහෙත් වෙනත් පක්ෂවල අය ඒවා පරිහරණය කිරීම නොසිදුවන බවක් ඉන් නොහැඟ වේ. රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම වෘත්තීය සංගම් විසින් ද වාර ප්‍රකාශන බහුලව බෙදා හරින බව විශේෂයෙන් සැලකිය යුත්තේ ඒවා එක්කෝ නොමිලේ බෙදා හරින නැත්නම් පොදු ආයතනවල පුස්තකාලවල තබන නිසා ඒවායේ කියවන්නන් ප්‍රමාණය විශාල විය හැකි බැවිනි. වෘත්තීය සමිති ප්‍රකාශන තමන් බද්ධ වී සිටින දේශපාලන පක්ෂ මතවාද පතුරුවා හැරිය ද රාජ්‍ය නොවන සංවිධාන විශාල ප්‍රමාණයක් ආගමික, පාරිසරික, මානුෂීය සහන ආදී ක්ෂේත්‍ර පදනම් කොට ගත් ඒවාය. කුමන නමින් හැඳින් වුව ද ඒවා විදේශීය බලවතුන්ගේ අදෘශ්‍යමාන හස්තය වශයෙන් මෙරට කටයුතුවලට ඇඟිලි ගසන අරමුණ සහිත වේ. එහෙයින්ම ජනතාවාදී රජයන්ට විරුද්ධව කටයුතු කරන ඔවුන්ගේ ප්‍රකාශන හරහා පළකරන සියළු අදහස් ජනතාවාදී රජයක් බලයේ සිටින විට රාජ්‍ය විරෝධී ස්වරූපයක් ගැනීම නිරතුරුව දැකිය හැකිය. ඔවුන් භාවිත කරන වචන පවා බොහෝ සෙයින් රාජ්‍ය විරෝධය උසිගන්වන සුළු වීම විශේෂ ලක්ෂණයකි. සිය ගණන් සාමාන්‍ය ජනතාව මරා දමද්දී නිහඬව සිටි රාජ්‍ය නොවන සංවිධාන සිවරාම් නැමැති කොටි මාධ්‍යවේදියාගේ මරණය පිළිබඳ නැගූ මහා ඝෝෂාව ඔවුන්ගේ ත්‍රස්ත හිතවාදයට කදිම නිදසුනකි.[15] මෙවන් සංවිධානවල ප්‍රකාශන බහුලව සංසරණයේ නොයෙදෙන නමුදු මුද්‍රිත මාධ්‍යයේ ඇති එක් සාධණීය ගුණයක් වූ කල් පවතින ගුණය හේතු කොටගෙන ප්‍රමාද වී හෝ ඒවායේ ප්‍රවෘත්ති ජනතාවගේ අවධානයට යොමුවිය හැකිය. ඒවා පුස්තකාලයක දී හමුවිය හැකිය. භාණ්ඩ එතීමට

යොදාගෙන තිබිය දී හමුවිය හැකිය. කුමන ක්‍රමයකින් හෝ එම පුවත්පත්වල, පත්‍රිකාවල පළවන තොරතුරු ජන විඥානය හැඩ ගැස්වීමෙහිලා කාල නියමයකින් තොරව බලපාන බව අවධාරණය කළ යුතුය.

එහෙයින් මෙරට පුවත්පත් බහුල වශයෙන් ඒවායේ අයිතිකරුවන්ගේ අවශ්‍යතා පරිදි ද්‍රෝහී දේශපාලකයන් උගතුන් හා මාධ්‍යවේදීන් ලවා බෙදුම්වාදීන්ට හිතකර ලෙස ජන විඥානය හැඩ ගැස්වීමෙහිලා විශාල මෙහෙයක් ඉටුකරන ලද බව සැඟවිය නොහැකි සත්‍යයකි. මෙය පුවත්පත් ඉතිහාසය පුරා සිදුවන දෙයකි.[16] 1960 දශකයේ දී ප්‍රදර්ශනය වූ පරිදි හෘද සාක්ෂියට එකඟව කටයුතු කළ පත්‍ර කලාකරුවන්[17] මෙකල නොසිටි බැවින් හෝ ඔවුන්ගේ ජීවන මාර්ගය පිලිබඳ අභියෝගය නිසා හෝ ඔවුන්ගේ දක්ෂකම් පුවත්පත් සමාගම්වල සුරාකෑමට ලක් විය. රාජ්‍ය පාලනය යටතේ වූ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රකාශන තුළින් ද නිරන්තරයෙන්ම බෙදුම්වාදයට එරෙහි මතවාදයක් ගෙන ගිය බව ස්ථිර ලෙස කිව නොහැකිය. වරක් රාජ්‍ය ප්‍රධානිය හා ඇගේ පාලනය යටතේ ප්‍රකාශිත මතය වූයේ ත්‍රස්තවාදයට එරෙහි වී බෙදුම්වාදයට සමීප ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් තමන් යුධ විරෝධී ස්ථාවරයක සිටින බව පෙන්වීමය. එසේ කරමින් රජයේ සියළු මාධ්‍ය හරහා යුධ විරෝධී තවලම් ව්‍යාපාරය, සුදු නෙළුම් ව්‍යාපාරය ආදී වශයෙන් වූ බෙදුම්වාදීන්ගේ සිත් දිනා ගැනීමේ ව්‍යාපාර දියත් කලා පමණක් නොවේ. යුද්ධය යනු ලේ පිපාසිතයන්ගේ විනෝද ක්‍රියාවක් වන බැවින් හමුදාවට බැඳීම මිලේච්ඡයන්ගේ ක්‍රියාවක් යයි මත පළ කළ මාධ්‍ය ලෙස කටයුතු කරන ලදී. ඒ අනුව රජයේ ප්‍රබල කොටස් ත්‍රස්තවාදීන්ගේ හිතවතුන් සේ හැසිරුණු බව අමතක කළ නොහැකිය.

ඊට පෙර පැවති එ.ජා.ප. රජය යටතේ ද ත්‍රස්ත විරෝධී වුව ද බෙදුම්වාදීන් සමග එක ගෙයි කෑමේ නිරත විය. එවන් තත්වයක් යටතේ කොටි ත්‍රස්තවාදීන් සමග සාකච්ඡා පැවැත්වීම, සහන හුවමාරු කරගැනීම, මූල්‍යමය හා යුධ අවි ආධාර ලබා දීම හා අවසානයේ දී ත්‍රස්තවාදීන්ට නීත්‍යානුකූලත්වය ලබා දෙමින් ත්‍රස්තවාදීන්ගේ සටන්වල අරමුණ වූ නිජබිම, මායිම් ගසා වෙන්කොට දී රජයේ

හමුදා එකී ප්‍රදේශ තුළ නිරායුධ කොට අකර්මණ්‍ය කරන ලදී. අවසානයේ දේශද්‍රෝහී සටන් විරාම ගිවිසුම අත්සන් තැබීම ආදී ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම හේතු කොටගෙන රජයේ පාලනය යටතේ වූ පුවත්පත් ත්‍රස්තවාදීන් නලවන ස්ථාවරයක් ගන්නා ලදී. චෙනකක් තබා නීත්‍යානුකූල රජය තුළ රටේ ආරක්ෂාව පිළිබඳ පූර්ණ වගකීම දැරූ ආරක්ෂක ලේකම්වරයා නීති විරෝධී ක්‍රියාවල යෙදුන අපරාධ කරුවෙකු වූ ත්‍රස්තවාදීන් යටතේ යුද පෙරමුණේ සිටි පුලිදේවන්ගේ කරට උඩින් අත දමා ගෙන "මචාං" යයි කියමින් යාම සමගියේ හා වීරත්වයේ ලක්ෂණයක් ලෙස මවා පෑමට තරම් පහත් බොළඳ තත්වයකට එද සන්නිවේදන මාධ්‍ය ඇද දමා තිබුණි.

අද ද මොවුන් තුළ වූ ජාතියට එරෙහි වෛරයත් බටහිර ගැති බවත් ඒ නිසාම කොටි ත්‍රස්තවාදීන්ට හිතවත් බවත් කෙතරම් ද යත් කොටි ත්‍රස්තවාදය මුළුමණින්ම පරාජය කරනු ලැබුවාට පසු ද කොටි පරාජය වූ බව නොපිළිගනිමින් "අද මේ රට තුළ මහා විනාශයක් ඇති කරන රටට ජාත්‍යන්තර අපකීර්තියක් ඇති කරන ආර්ථිකය සම්පූර්ණයෙන්ම විනාශ කරන මේ රටේ දෙමළ ජනතාව ත්‍රස්තවාදීන් බවට පත් කරමින් සිටින මේ" "ආණ්ඩුවේ මෝඩකම, උද්දච්චකම නිසා ලංකාවේ දූකට සැපට ඉතිහාසය පුරා සිටි ජත්‍යන්තර ප්‍රජාව ඈත් කරලා හුදකලා වෙමින් සිටිනවා. සුද්දන්ට කෑ ගැහුවම ගැලරියේ සිටින අය චූන් වුනාට ඒක ඉතාම භයානක ප්‍රවණතාවක්. ශ්‍රී ලංකා රජයත් එල්.ටී.ටී.ඊ. යත් එකම තලයට දලයි ජාත්‍යන්තරය අද කටයුතු කරන්නේ" යයි[18] අවලාද නැගීමට තරම් කෝප වී ඇත. ඒ බටහිර අධිරාජ්‍යවාදීන්ගේ පදයට නොනටන නිසාය. මෙරට පුවත්පත් අතර බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව නිරන්තරයෙන්ම ජනතා මතවාදය පිළිබිඹු කිරීමෙහි ලා කැපී පෙනෙන ලෙස සේවය කරනු ලැබුවේ උපාලි පුවත්පත් සමාගම විසින් නිකුත් කරන දිවයින, Island පුවත්පත් සමූහය බව නොරහසකි. එය වැඩි දෙනාගේ පිළිගැනීම ද වේ.[19]

(ආ) පොත් සඟරා හා පත්‍රිකා

එලෙසින් ම සඟරා හා පත්‍රිකා ද දැනුම් තොරතුරු බෙද හැරීමේ නියමුවෙකි. මිල අධික වීම, පහසුවෙන් ලඟාවීමට අපහසු

වීම ආදී විවිධ හේතූන් නිසා පොත පත බහුලව භාවිතා නොවෙතැයි සැලකුව ද බලපෑම් මට්ටම ප්‍රබලය. එහෙත් කියවීමට හැකියාව, විවේකය හා උනන්දුව අනුව පොත පත කියවීම පුවත්පත් කියවීම පමණට පුළුල් නොවන බව පිළිගත යුතු සත්‍යයකි. එහෙයින් මුද්‍රිත මාධ්‍යයේ බලපෑම් ප්‍රබලව දකිය හැක්කේ ඒ ඒ ප්‍රකාශන කියවන සමාජයේ එක් එක් කොටසකට යැයි ද තර්ක කල හැකිය. අනෙක් අතට දේශන හා සමුළු ප්‍රධාන වශයෙන් උගත් කොටස් අතර ද ප්‍රචාරක රැලි ආදිය පොදු ජනතාව අතර ද ප්‍රචලිත මාධ්‍යයක් බැවින් ඒවායේ බලපෑම් ද බලපවත්වන්නේ සමාජයේ යම් යම් කොටස් කෙරෙහි පමණි.

පොතපත, පත්‍රිකා, දැන්වීම්, ප්‍රදර්ශන පුවරු ආදී සියල්ල ද යම් යම් ඉලක්ක ගත අරමුණු ඔස්සේ පළ කරනු ලබන බව පිළිගන්නා නමුදු ඒවා සියල්ලම අන්තර්ගතය, ඉදිරිපත් කරන ආකාරය, ඉලක්ක ගත කණ්ඩායම් ආදී කරුණු රාශියක් මත ප්‍රශ්නයට සෘජු ලෙස සම්බන්ධ බව නොකියා බැරිය. නැති යුද්ධයක් මවා ගනිමින් යුද්ධයේ ආදීනව ප්‍රකාශ කරමින් යුද්ධයේ නිර්මාණකරුවන්ගේ ම්ලේච්ඡත්වය වසන් කරමින් රජයේ හමුදාවල ඇතැයි අනුමාන කළ සැහැසිකම් සැබෑ දේ ලෙස සළකා ලියන නව කථාවක, කෙටි කථාවක, කවි පන්තියක, නාට්‍ය පිටපතක සැඟවුන පරමාර්ථය ජනතාව රජය කෙරෙහි බිඳුවා බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට හුස්ම ගැනීමට අවස්ථාව සලසා දීමට නම් එහි බලපෑම් අවියක බලයට වඩා බලවත් බවත්, සැහැසි බවත් අමුතුවෙන් විස්තර කළ යුතු නොවේ. විශේෂයෙන් ජන පදනමක් නැති දේශපාලන කණ්ඩායම් හා රාජ්‍ය නොවන සංවිධාන බහුල වශයෙන් මෙරට ක්‍රියාත්මක වන්නේ ත්‍රස්තවාදයට හිතකර අන්දමින් බැවින් ඔවුන්ගේ පුවත්පත්, පත්‍රිකා ආදී හැම මුද්‍රිත මාධ්‍යයකම තේමාව වන්නේ රජය විසින් ත්‍රස්තවාදීන්ගේ මූලික අයිතිවාසිකම් පාගා දමන බව පෙන්වීමය. ඒ කිසිවෙකු විසින් ත්‍රස්තවාදීන් ගේ ම්ලේච්ඡත්වයෙන් මූලික අයිතිවාසිකම් පමණක් නොව ජීවිත ද අහිමි වන අහිංසක මිනිසුන්ගේ නැතිවන දේ පිළිබඳව ප්‍රශ්න කිරීමක් නැත. තිරශ්චීන ලෙස මනුෂ්‍ය ඝාතනවල යෙදී සිටින අපරාධකරුවන්ට හිමි මූලික අයිතිවාසිකම් තිබිය හැකි ද කියා හෝ කිසිවිට සළකා බලා නැත. එහෙයින් මොවුන්ගේ සන්නිවේදන

මාධ්‍යයන් නිසැක වශයෙන් හමුදාවන්ගේ බර අවිවල විනාශකාරී ශක්තියට වඩා බලවත් බව ප්‍රත්‍යක්ෂ වනු ඇත.

මුද්‍රිත මාධ්‍යයට අයත් පොත පත, පත්‍රිකා, ප්‍රකාශන ආදිය පසුගිය කාල පරිච්ඡේදය පුරා අති විශාල වශයෙන් නිර්මාණය වූ බව පැහැදිලිය. විශේෂයෙන් රාජ්‍ය නොවන සංවිධාන ජන මතය විකෘති කිරීමේ ඒකායන අරමුණින් විවිධාකර ලෙස යුධ විරෝධී මානසිකත්වයක් බිහි කිරීමට කටයුතු කරන ලද බව නොරහසකි. යාපනය විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් පිළිබඳ ආචාර්ය කමිටුව ත්‍රස්ත විරෝධී ජාතික සංවිධානය වැනි සංවිධාන කිහිපයක් හැර ලංකා සාම මණ්ඩල, යුද විරෝධී ජාතික පෙරමුණු ආදී වශයෙන් වූ බාහිර සංවිධාන රාශියක් ප්‍රබල ලෙස ක්‍රියාකාරී විය. එහෙත් විශ්මයට කරුණක් වන්නේ මෙරට යුද්ධයක් නොමැතිව තිබිය දී යුධ භීතිය වැපිරීමට මේ අය විසින් මෙතරම් විශාල උත්සහායක් දැරුවේ ත්‍රස්තවාදීන්ගේ වාසිය, පහසුව හා ශක්තිය සඳහා බව සැඟවිය නොහැකි සත්‍යයක් වීමය. මෙහිදී කැපී පෙනෙන විශේෂත්වයක් වන්නේ මෙරට ත්‍රස්තවාදය මර්දනය කිරීමට නීත්‍යානුකූල රජය විසින් ගෙන යන සටන යුද්ධයක් ලෙස පුම්බා දැක්වීම සඳහා ත්‍රස්තවාදයට හිතවත් අය විසින් තම ප්‍රකාශනවලට තොරතුරු ලබා ගැනීමේ දී මූලාශ්‍ර වශයෙන් යොදා ගනු ලබන්නේ ශ්‍රී ලංකාව කෙරෙහි සතුරු ආකල්පයක් දරන විදේශීය ජනමාධ්‍ය මෙන්ම ත්‍රස්තවාදීන්ගේ සංවිධානය වූ එල්.ටී.ටී.ඊ යේ ප්‍රකාශන හා තොරතුරු ජාලාවන් වීමය.[20] මේ සෑම ක්‍රියාවකදීම මෙරට අභිමානවත් කලාව යටත් කරවන ලද අතර සමහර කලාකරුවන් මුදලට ගෙන මෙම බෙදුම්වාදී ප්‍රචාරක කටයුතුවල යොදනු ලැබීය.

රාජ්‍ය විරෝධීන්ගේ සෑම සාවද්‍ය ප්‍රචාරයකින්ම පළමු කොට දේශීය වශයෙන් රටේ ජනතාව යුද භීතියෙන් මුසපත් කොට හමුදාමය ක්‍රියාමාර්ගවලින් ඈත් වන්නට රජයට බල කෙරෙන උද්ඝෝෂණ හා විරෝධතාවලට ජනතාව පෙළ ගැස්ස වීම අපේක්ෂිත විය. ඒ සියල්ල පුම්බා පෙන් වූ කොටි හිතවත් මාධ්‍ය හැම එකක්ම පාහේ ජනතා පිළිකුලෙන් හුළං ගිය බැලුම් බෝල තත්වයට පත්විය. හැමදා ජනතා පිළිකුලට ලක් වූ විදේශීය මත වාද හිස මත තබා ගෙන දේශීය වූ

හැම දෙයට ගරහන දේශපාලන "පක්ෂ" වල අපකීර්තිමත් පුද්ගලයන් ඒ හැම අවස්ථාවකදීම රාජ්‍ය විරෝධී ව්‍යාපාරවල මුල් තැන ගත්තේ විදේශීය ආයතනවලින් ලබන දීමනා අඛණ්ඩව වැඩි වැඩියෙන් ලබා ගැනීම පහසු කරවීමට "රජයේ හිරිහැරයන්ට ලක් වූ නායකයන්" යන ලේබලය අලවා ගැනීම සඳහා මිස තමන්ට කියා එක ද සැබෑ අනුගාමිකයෙකු සිටි නිසා නොවේ. ඊනියා මාධ්‍යවේදීන්ගේ ක්‍රියා පිළිවෙත ද එය ම විය. "කොටි අරමුදල මත යැපුන මාධ්‍යවල නිරුවත හෙළිවෙයි" නමින් 2009 මැයි මස 30 දින දිවයින පුවත් පතේ 09 වැනි පිටුවේ සඳහන් තොරතුරු ඊට සාක්ෂි දරනු ඇත.

විදේශීය වශයෙන් මෙම සාවද්‍ය ප්‍රචාර හරහා අපේක්ෂා කළේ රජයට, රටට, හිතැති විදේශීය මිතුරු රටවල තිගැස්මක් ඇති කොට අධිරාජ්‍යවාදී බලවත් රටවල උගුලේ සිරකරමින් මෙරටට ලැබිය හැකි ආධාර උපකාර පමණක් නොව හිතවත්කම් හා අනුකම්පාව ද අහිමි කිරීමය. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය පුරා ද මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම හරහා ද රටට එරෙහි යෝජනා සම්මත කිරීමට ගත් උත්සහායන්ගෙන් පමණක් නොව රට බේරා ගැනීමට කැප වූ රාජ්‍ය නායකයන් හා හමුද නායකයන් ජගත් අධිකරණය හමුවට පමුණුවා බරපතල යුද අපරාධ කරුවන් ලෙස දඬුවම් පැමිණවීමට තර්ජන කිරීමෙන් මේ සියළු දෙනාගේ අභිප්‍රායන් මොනවට දිස් විය. මොවුන්ගේ ව්‍යාපාරවල ප්‍රබලත්වය කෙතරම් ද යත් අවසානයේ හමුදපති ද මෙම උගුලේ හිර කොට ගෙන රටත් ජාතියත් ත්‍රිවිධ හමුදවත් අධිරාජ්‍යවාදී දංගෙඩිය මතට පාවා දීමට පොළඹවා ගැනීමට මෙම පිරිස් සමත් වූවා පමණක් නොවේ. ඔහු ලවා ද්‍රෝහී ප්‍රකාශයන් පළ කරවීම හරහා මුළු ජාතියම අනතුරේ හෙළීමට තරම් මෙම බලවේගයන් මේ වන විට සමත් වී ඇති බව අප විසින් අමතක නොකළ යුතුය.

## විද්‍යුත් මාධ්‍යය

මුද්‍රිත මාධ්‍ය සමග සසඳන විට විද්‍යුත් මාධ්‍යය අතුරින් පුළුල් භාවිතය සඳහා ඇති පහසුව නිසා ගුවන් විදුලිය ඉතා ඉක්මණින් තොරතුරු සංනිවේදන කරන මාධ්‍යය වී ඇති අතර ඈත ගම් දනව්වල ජනතාවට ද එසැණින් එම පුවත් තොරතුරු ලබාගත හැකිය.

රූපවාහිනී මාධ්‍යය ගුවන් විදුලිය ද අභිබවා ඉදිරියට පැමිණෙන්නේ එහි ඇසිය හැකි දැකිය හැකි (ඇසිදිසි) බලය නිසාය. එහි සිදුවන දෑ තම අභිමුඛයේ සිදුවන දෑ ලෙස පෙනී යයි. එහෙයින් එය අද ඇති අති ප්‍රබලම පමණක් නොව බලපෑම් දැඩි කළ හැකි මාධ්‍යයක් වී ඇති බව ලොවම පිළිගන්නා කරුණකි. රූපවාහිනී යුගය ඉතිහාස පොත්වල සනිටුහන් වනුයේ ජන සමාජය මාධ්‍යය මගින් පාලනය කළ යුගයක් ලෙසය"[21] යයි සඳහන් වන්නේ එහෙයිනි. එය වඩාත් බලපාන්නේ බාලවයස්කාර පිරිස් කෙරෙහිය. ඒ අහිතකර ලෙසය. එහෙත් එය භාවිතයේ දී අවශ්‍ය කරන වෙනත් උපාංග අවශ්‍යතා සමග සලකන විට ගුවන් විදුලියට තරම් අස්සක් මුල්ලක් නැර ඇතට යා හැකි තත්වයක් නොමැත.

ජන විඥනය හැඩගැස්වීමෙහිලා අද වන විට ඉතා දැඩි ලෙස බලපෑම් කරන දූරකථනයෙන් පටන් ගෙන ගුවන් විදුලිය, රූපවාහිනිය හරහා පරිගණකය, ජංගම දූරකථනය දක්වා ප්‍රසාරණය වී ඇති මෙම මාධ්‍ය ක්ෂේත්‍රය මෙරටට බෙහෙවින් බලපෑම් කිරීමට පටන් ගන්නේ 1980 දශකයේ පමණ සිට යයි කිව හොත් නිවැරදිය. දූරකථනය මෙන්ම ගුවන් විදුලිය ද 20 වැනි සියවස මුලදීම මෙරටට හඳුන්වා දෙනු ලැබුව ද ඒවායේ භාවිතය සීමිත විය. රූපවාහිනිය මෙරටට හඳුන්වා දෙනු ලැබුවේ 1980 දශකයේ ආරම්භයත් සමගය. මේ වන විට එය රට පුරා ව්‍යාප්ත වී තිබෙන ප්‍රමාණය පුදුම එළවන සුළුය. ජංගම දූරකථන සේවාව තුළින් ඉටු කෙරෙන කාර්යයන් දෙස බලන විට එය හඳුන්වා දී නොබෝ කලකින් ම මෙරට අංක එකේ සන්නිවේදන මාධ්‍යය බවට පත් වී තිබෙන ආකාරය පුදුමයක් විය නොහැකිය. මේවා ඔස්සේ යැවෙන කෙටි පණිවුඩ මෙරට දේශපාලන වශයෙන් අතිශයින් වැදගත් වූ ජනාධිපති තෝරා ගැනීමේ දී පවා ජනතා විරෝධී ස්ථාවරයක මුල්බැස සිටින යම් පිරිස් විසින් යොදා ගනිමින් ජන මතය විකෘති කිරීමට ගත් උත්සහාය අමතක කළ නොහැකිය. පරිගණකය ද හඳුන්වාදී සුළු කලක් ගත වුව ද එය ව්‍යාප්ත වී ඇති ප්‍රමාණය අනුව සළකන විට එහි බලපෑම ද අති විශාල බව සැළකිය හැකිය. වසර 2010 ජනාධිපතිවරණයේ ප්‍රතිපල පරිගණක ජිල්මාට් එකක් ලෙස හැඳින්වීමට පරාජය ඉවසා ගත නොහැකි වූ අපේක්ෂකයෙකුගේ ප්‍රධාන ආධාර කරුවෙකු විසින්

කරන ලද කථාව මෝඩ තකතීරු කථාවක් ලෙස හැඳින්වුව ද පරිගණකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ යම් ඉඟියක් දී ඇතැයි නොකියා බැරිය.

<u>ගුවන් විදුලිය</u>

මෙරටට ගුවන් විදුලිය හඳුන්වා දෙනු ලැබුවේ 1925 තරම් ඈත යුගයක දී වුව ද එහි පල ප්‍රයෝජන හා බලපෑම් ජනතාවට තදින්ම දැනෙන්නට පටන් ගත්තේ 1960 දශකයේ සිට ගුවන් විදුලි සේවාව පුළුල් වීමත් සමගය. 1977 මැතිවරණයෙන් පසු එක්සත් ජාතික පක්ෂය රජයක් පිහිටුවා ගැනීමෙන් අනතුරුව බොහෝ දෙනාගේ උදහසට ලක් වූ විවෘත ආර්ථික ක්‍රමය මෙරටට හඳුන්වා දීමත් සමග පුද්ගලික අංශයට ද කැමැති පරිදි ගුවන් විදුලි නාලිකා ආරම්භ කිරීමට බලපත්‍ර ලබාදෙන තුරු ගුවන් විදුලි සේවාව මෙරට රජයේ ඒකාධිකාරයක් විය. එහෙයින් ම එය එක්තරා ප්‍රමාණයකට දැනුම බෙදා හරින, අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ද තවත් විටක උසස් රස වින්දනයට අවස්ථාව සැලසූ සංගීත පර්යේෂණාගාරයක් ද විය. ඒ රජය විසින් ගුවන් විදුලිය ඉහළ ප්‍රමිතියකින් පවත්වා ගැනීමට ගන්නා ලද උත්සහායේ ප්‍රතිපලයකි.[22] වල්පල් දොඩන, බස හැසිරවිය නොහැකි, නිවැරදිව කට හඬ පාලනය කළ නොහැකි, වාදන භාණ්ඩ නිසි අන්දමින් හැසිරවිය නොහැකි, හිතවත්කමට මුදලට හෝ වෙනත් අමතර හේතූන් නිසා බඳවාගත් "හිස්" අය ගුවන් විදුලියේ නොවූහ. එහෙයින් ගුවන් විදුලියේ බලපෑම ජන වින්දනයට හිතකර එකක්ම විය. එහෙත් එහි සේවය සීමිත ශ්‍රාවක පිරිසකට පමණක් ලබාගත හැකි විය. මත් ද යත් එක් අතකින් ගුවන් විදුලි යන්ත්‍ර බහුල නොවීය. අනෙක් අතට ඒවා පරිහරණය කිරීමට අවශ්‍ය විදුලිය වැනි අමතර සේවා සීමිත විය.

1980 දශකය දක්වා රජයේ ඒකාධිකාරයක් වූ ගුවන් විදුලිය මේ වන විට FM නාලිකා 50 කට ආසන්න වූ ගණනාක් දක්වා වර්ධනය වී ඇති අතර ඒවා සියල්ලම පෞද්ගලික ආයතන සතු ඒවා වේ. මේවා බොහෝවිට සමාජ සාරධර්මවලට සෘජුවම බලපාන තරමට බෙදුම්වාදී ත්‍රස්තවාදයට අනියම් ලෙස උපකාරී වන බවට නැගෙන චෝදනා තුළින් වක්‍රව රාජ්‍ය ආරක්ෂාවට ද තර්ජනයක්

වන්නේය යන්න සනාථ වේ. මෙරට බෙදුම්වාදී ත්‍රස්තවාදයට හිතවත් මෙවන් මාධ්‍යයන් එක් අතකින් රටතුළ ජනතා හැඟීම් අවුස්සාලමින් ජනතාව කුපිත කරවමින් විනාශකාරී ක්‍රියාවලට පොළඹවන අතර විදේශීය වශයෙන් දෙමළ ජනතාවට මෙන්ම ඔවුන් බළල් අත් මෙන් යොදු ගන්නා ඒ විවිධ බලවේගවලට සම්පූර්ණ අසත්‍ය තොරතුරු ප්‍රචාරය කරමින් තම සැඟවුන අරමුණු ඉටු කරවා ගැනීමට ගුවන් විදුලිය ඉතා කදිම කාර්යක්ෂම හුරුබුහුටි අවියක් ලෙස භාවිතා කරන බව නොරහසකි.

මිනීමරු කුරිරු ත්‍රස්තවාදීන් එළිපිටම දූසිම් ගණනින් මහ මග මරා දමා යද්දී ත්‍රස්ත හිතවත් නාලිකා ඒවා වාර්තා කළේ " නන්නාඳුනන අවිගත් පිරිසකගේ" පහරට ලක් වී මරණයට පත් වූ බවය. එහෙත් එම නාලිකාවන්ම ත්‍රස්තවාදියෙකු ගම් වැසියන් අතින් හෝ මරණයට පත් වී තිබුණත් ප්‍රධාන ප්‍රවෘත්ති වශයෙන් විකාශනය කළේ රජයේ හමුද විසින් අමු අමුවේ ඝාතනය කළ අහිංසකයකු පිළිබඳවය. ඔවුන් හැමවිට හමුදුව විසින් සිදුකරන ලද මරණ පැහැදිලිවම හඳුනාගෙන තිබුණ ද ත්‍රස්තවාදීන් අතින් මරණයට පත්වූවෙකු ගැන කිසිවෙකු දැක නැති සේය. මෙලෙසින් කිසිදු හිරිකිතයකින් තොරව "මායිම් ගම්මාන" ගැන ද දෙමළ ජනයාගේ " පාරම්පරික වාසභූමි" ගැන ද නොකඩවා දෙඩන මෙම නාලිකා ප්‍රචාරය සඳහා තමාට අවශ්‍ය කරන රටට අහිතකර ප්‍රවෘත්ති ලබාගන්නා වෙරිටාස්, අල් ජසීරා, සීඑන්එන්, බීබීසී ආදී කොටගත් තම මිතුරු විදේශීය නාලිකා වෙත ද සම්පූර්ණ අසත්‍ය ප්‍රවෘත්ති ලබා දී ප්‍රචාරය කරවීමෙන් මෙරට පමණක් නොව විදේශවල ද ජන විඥනය විකෘති කොට ඇති ප්‍රමාණය අසීමිතය. ඒ අනුව මිනීමරු කොටි ත්‍රස්තවාදය පෝෂණය කරනු වස් ත්‍රස්තවාදීන්ට අනුකම්පා සහගත මෙන්ම හිතවාදී වන අන්දමට ජන විඥනය සැකසීම පිළිබඳ බරපතළ වරදකරුවන් ලෙස චෝදනා ලබන්නන් අතර මෙවන් සංනිවේදන මාධ්‍යයන් සිටින බව ඉතා පැහැදිලිය. ඉහත සඳහන් කළ පරමාණු බෝම්බයකට සමකළ හැකි ගුවන් විදුලි නාලිකා පිළිබඳ නිදර්ශන මෙරටින් ම ලැබෙන අවස්ථා විරළ නොවන බව පැහැදිලිය. යම් යම් කාල වකවානුවල දී රජයේම මැදිහත් වීමෙන් රජයේ මාධ්‍යයන් ද ත්‍රස්තවාදීන්ට හිතවාදීව මෙහෙය වූ බව රහසක් නොවේ.

## රූපවාහිනිය

විවෘත ආර්ථිකයත් සමග 1979 දී රූපවාහිනිය පෞද්ගලික අංශය හරහා මෙරටට හඳුන්වා දෙනු ලැබීය. නොබෝ දිනකින්ම එය රජයට පවරා ගන්නා ලද අතර පසුව ජපානයේ පරිත්‍යාගයක් ලෙස අංග සම්පූර්ණ රූපවාහිනී සේවාවක් ලෙස 1982 ජාතික රූපවාහිනී සංස්ථාව ආරම්භ කරන ලදී. ස්වාධීන රූපවාහිනී සේවය නම් වූ මුල් රූපවාහිනී සේවය රජයේ පාලන යටතේ වෙනමම පවත්වාගෙන එනු ලැබීය. රූපවාහිනී මාධ්‍යයේ අති ප්‍රබල මාධ්‍ය ශක්තිය නොබෝ කලකින්ම හඳුනාගත් මහාරාජා සමාගම, ඒ.ඒ.පී. එදිරිසිංහ සමූහ ව්‍යාපාරය, වෙල්ෂාන්, මැක්ස් සමාගම වැනි මෙරට ප්‍රධාන ව්‍යාපාරික ආයතන කිහිපයක් විසින් රූපවාහිනී සේවා ආරම්භ කිරීමට අවසර ලදින් අද වන විට මෙරට පෞද්ගලික රූපවාහිනී සේවා ආයතන 15ක් පමණ දක්නට හැකිය. ඒවා අතර එම්.ටී.වී, ස්වර්ණවාහිනී, ටී.එන්.එල්, දෙරණ, ටීවී ලංකා, මැක්ස් ආදිය ප්‍රධාන වේ. ඊට අමතරව බී.බී.සී, සී.එන්.එන්, ෆොක්ස් නිවුස්, වැනි විදේශීය ආයතනවල විකාශන ද දක්නට හැකිය. රූපවාහිනිය සන්නිවේදන මාධ්‍යයක් ලෙස දරණ ශක්තිය හා බලය අනුව සළකන කළ රජය සතු ආයතන දෙක හැර අන් සියල්ලම පාහේ මෙරට පවතින බෙදුම්වාදී ත්‍රස්තවාදයට රුකුල් දෙන ආයතන ලෙස සැකයට භාජනය වී ඇත. ඒ ඔවුන් බෙදුම්වාදී ත්‍රස්තවාදය කෙරෙහි දක්වන ආකල්පත් රටේ, ජාතියේ දේශීයත්වයේ ආරක්ෂාවට, දියුණුවට හා පැවැත්මට බරපතළ ලෙස අනතුරුදායක විය හැකි යයි ඒත්තු යන පමණට ඔවුන්ගේ වැඩසටහන් ආදිය භාවිතයේ දක්නට ඇති පක්ෂග්‍රාහී බවත් නිසාය.

මෙම ආයතන අතුරින් සෘජු ලෙස ත්‍රස්තවාදීන්ට හිතැති පුද්ගලයන් සතුව ඇත්තේ ස්වල්ප වූ ආයතන සංඛ්‍යාවක් බව සැබවි. එහෙත් ඒවා නිර්දය ලෙස රාජ්‍ය විරෝධී වීම හේතු කොට ගෙන ත්‍රස්තවාදයට හිතවත් අන්දමින් හැසිරීමත් රටේ සදාචාරයට හානිකර වැඩසටහන් මෙහෙයවීමෙන් බරපතලකමත් රටට දැනෙන ආකාරය විටින් විට ඒවා ජනතා විරෝධයට හේතු වී පහරදීම්වලට ද ලක් වී ඇති ප්‍රමාණයෙන් මැන ගත හැකිය. බහුතරයක් වූ රූපවාහිනී නාලිකා දේශපාලන අරමුණු ඉටුකර ගැනීම් වස් රාජ්‍ය විරෝධී ප්‍රචාරයන්

ගෙන යාමේ දී නොදැනුවත්ව හෝ ඔවුන්ගෙන් බරපතළ ලෙස ප්‍රහාර එල්ලවන්නේ හමුදා හා ත්‍රස්ත විරෝධී හමුදා ක්‍රියාමාර්ගයන් වෙතය. රූපවාහිනී පුවත් විකාශයන්, දේශපාලන සාකච්ඡා හා සංවාද මණ්ඩප, පුද්ගලයන් හා සංකල්ප හඳුන්වා දීම ආදී කොටගත් ප්‍රධාන වැඩසටහන් හැම එකකින්ම ආණ්ඩු විරෝධයක් එම විරෝධය සහේතුක කිරීම සඳහා හමුදාවේ හා පොලිසියේ කටයුතු විවේචනයට ලක්කිරීමත් ඒවා හැල්ලුවට පත් කිරීමත් නිරතුරුව දැකිය හැකිය. වෙනකක් තබා ගායක ගායිකාවන් හා වෙනත් කලාකරුවන් හඳුන්වාදීමේ දී ද හැමවිටම පාහේ රාජ්‍ය විරෝධී ආකල්ප ඇති අය පමණක් කැඳවීම සිදුවේ. මේ සියළු දේ මගින් රජයට පහර ගැසීම අරමුණ වුව ද ඉන් වාසි ලබන්නේ ත්‍රස්තවාදීන්මය. මෙලෙස රාජ්‍ය විරෝධී ක්‍රියා හේතු කොටගෙන ජනතා අප්‍රසාදයට පත්වන මෙම රූපවාහිනි ආයතනයවලින් සමහරක් සිය පැවැත්ම සඳහා අවරගනයේ විදේශීය වැඩ සටහන් මෙරටට හඳුන්වා දීම හේතුකොටගෙන සමාජයේ සියළු උදාර පුරුෂාර්ථ සුණු විසුණු කොට ඇත. "රූපවාහිනී යුගය ඉතිහාස පොත්වල සනිටුහන් වන්නේ ජන සමාජය මාධ්‍යය මගින් පාලනය කල යුගයක් ලෙසය" යයි විශේෂඥ මතයක් පළකර ඇත්තේ ඇයි දැයි යනු ඒ අනුව වටහා ගත හැකිවනු ඇත.[23]

ජාතිද්‍රෝහී දේශද්‍රෝහී මාධ්‍ය ආයතනයන් ජනතාවගේ පිළිකුලට හා ගැරහිල්ලට ලක් වූ විට පිරිහීම වැළැක්වීමට සිදුකරනු ලබන සහාසික අපරාධයක් වී ඇත්තේ රටට ජාතියට දේශීයත්වයට පරිසරයට නොගැලපෙන ඉතා ලාභදායී පහත් මට්ටමේ විදේශීය වැඩ සටහන් අවිචාරවත් ලෙස විකාශයට යොදා ගැනීමයි. මේවා රටට ජාතියට හැදියාවට හිතකර නොවුව ද එමගින් මාධ්‍ය ආයතනයන්ට ජනතාව මුලා කර ගැනීමට ඇති හැකියාව වැඩි වී ඇත. එයට තවත් හේතු ඇත. මෙරට සමස්ත සමාජයම අධිරාජ්‍ය වාදීන්ගේ පාලනයෙන් පසු යටත් විජිත මානසිකත්වයෙන් පෙළීමත් රටේ අභිමානවත් ඉතිහාසය, උදාර හැදියාව, ආදර්ශමත් සාරගුණධර්ම පාසැල් විෂය මාලාවෙන් ඉවත් කිරීම හරහා බාල පරම්පරාවන්ගෙන් වසන් කොට තැබීමත් විශේෂයෙන් විවෘත ආර්ථික ක්‍රමය විසින් විනාශ කරනු ලැබූ සමාජයක් උරුම වී තිබීමත් විජාතිකත්වයකට ආවඩන මාධ්‍යවලට විශාල වාසියක් වී ඇත. මෙලෙසින් පාලනයකින් තොරව ඕනෑම ද්‍රෝහියෙකුට තමාට රිසිසේ කටයුතු කිරීමට මෙරට

ඇති ඉඩකඩත් මූලික මානව අයිතිවාසිකම් රැකීමේ නාමයෙන් අපේ රාජ්‍ය පාලනයට පනවා ඇති සීමාවන්ගේ බහුලත්වයත් දඩමීමා කරගෙන ශීලාචාර සමාජවල ඉහළින් සැලකුම් ලබන සදාචාර සම්පන්න ගුණධර්ම අමතක කොටදමා කටයුතු කිරීමට මෙරට ද්‍රෝහී සන්නිවේදන මාධ්‍යයන්ට ශක්තිය ලබා දී ඇත. දේශප්‍රේමය ජාති වාත්සල්‍යය යන ලොවම අගේ කරන්නා වූ ගුණාංග මොවුනට ඒඩ්ස්, සූකර උණ තරම් පිළිකුල් සහගත වසංගත වී ඇත්තේ ද ඒ නිසාමය. එවන් පිරිසකගෙන් තමන් සන්නිවේදන මාධ්‍ය පවත්වා ගෙන යනු ලබන්නේ කා සඳහා ද යන්න පමණක් නොව කුමක් සඳහා ද යන්න ද ඇසීමෙන් පලක් නැති තරම්ය.

## භාෂණය මාධ්‍යය

භාෂණය නොහොත් කථනය මාධ්‍යය වූ දේශන, සාකච්ඡා, සංවාද, සමුළු, වැඩමුළු ආදි වශයෙන් වූ අනේක විධ වැඩසටහන් මෙරට හාන්සි පුටු චින්තකයන්ගේ ඉතාම ඉහළ ප්‍රසාදයට පත් සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස හැඳින්විය හැකිය. විදේශීය මුදල් ලබා ගනිමින් තැන තැන දුසිමක් දෙකක් පමණ වූ පිරිස් සහභාගී වන "අති දැවැන්ත" යෝධ සමුළු, රැස්වීම්, වැඩමුළු පවත්වන, විද්වතුන් යයි කියා ගන්නා, අරමුණක් නැති, විදේශීය දේශපාලන මතවාදවල වැරදි කොනින් එල්ලී සිටින මෙරට විකෘති මනෝවිකාර සහිත බටහිර කෝචේ හැඩ ගැසුන ආචාර්ය මහාචාර්යවරුන් ස්වල්ප දෙනාගේ අවසාන ඉලක්කය වී ඇත්තේ කුමක්ද? බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට අනුකම්පාව හා ආධාර උපකාර ලබා දී තමාගේ ද පැවැත්ම සහතික කර ගැනීමය. මොවුන්ට මිනීමරු ත්‍රස්තවාදීන් පෙනෙන්නේ "විමුක්තිකාමීන්". "සටන්කාමී දරුවන්". "මාක්ස්වාදයේ සැබෑ අර්ථය මූර්තිමත් කරන සුරු විරු තරුණයන්". සමාජයට නායකත්වය ලබාදෙන, සමාජ සාධාරණය වෙනුවෙන් අසාධාරණයට එරෙහිව සටන් කරන "වීරවරයන්" ලෙසය. විදේශ රටවලට ගොස් හෝ නොගොස් ගිල දමනු ලැබූ විදේශීය මතවාද දිරවා ගැනීමට නොහැකිව දඟලන රට, ජාතිය, දේශීයත්වය පිළිබඳ අබමල් රේණුවක හැඟීමක් දැනීමක් නැති එහෙත් අනෙක් අයට ජාත්‍යන්තරවාදය, ජාත්‍යන්තර සහෝදරත්වය උගන්වන මෙම විද්වතුන් දන්නා එකම සමාජ සාධාරණය නම් සිංහල බෞද්ධකම සමගම දේශීය වූ උරුමයන්

සියල්ල විනාශ කළ හැකි ඕනෑම බලවේගයකට බාධාවකින් තොරව නැගී සිටීමට අත හිත දීමය. බෙදුම්වාදී මිනීමරු ත්‍රස්තවාදීන්ට ඉන්නා ප්‍රබලම න්‍යායාචාරීන් මෙන්ම ඔවුන් වෙනුවෙන් ලෝකයා ඉදිරියට පැමිණ විය හැකි හොඳම පෙරකදෝරුවෝ ද වෙති.

කොටි හිතවාදී බෙදුම්වාදයේ ප්‍රබලතම ප්‍රචාරකයන් වූ ජනමාධ්‍යයෙන් සමාජයේ ජන විඥනය හැඩ ගැස්වීමෙහි ලා ප්‍රධාන වශයෙන් කෙරෙන බලපෑම් කදිමට ප්‍රදර්ශනය කෙරෙන ක්ෂේත්‍ර කිහිපයක්ම පහසුවෙන් හඳුනාගත හැකිය.

## නිජබිමක් පිළිබඳ මිත්‍යාව මත බිහිවූ බෙදුම්වාදයක්

ශ්‍රී ලංකාවේ බිහි වූ දෙමළ ත්‍රස්තවාදයේ මූලික අරමුණ "නිජබිම" යන මිත්‍යාවක පැටලී රටේ කොටසක් වෙන් කොට ගෙන ස්වාධීන රාජ්‍යයක් පිහිටුවීමෙන් රට දෙකඩ කිරීම වූ බැවින් එය බෙදුම්වාදය පදනම් කොටගත් ත්‍රස්තවාදයක් බව තවදුරටත් සැඟවිය හැකි නොවේ. මෙම නිජබිම සංකල්පය යනු කුමක්ද? එහි ඉතිහාසය කුමක්ද? එය කාගේ ඕනෑකමක් පිරිමැසීමට ගන්නා උපක්‍රමයක්ද? යයි අවබෝධ කොට ගැනීම වැදගත් වනු ඇත. මොවුන්ගේ ව්‍යායාමයේ සැබෑ අර්ථය නම් ඈත අතීතයේ සිට හෙළදිව, සිහළ දිව නොහොත් සිංහලද්වීපය, සිංහලේ, ලංකාව, රත්නද්වීපය, ටැප්ප්‍රොබේන් (තම්බපන්නි) ආදී අන්වර්ථ නාමයන්ගෙන් නිවැරදි ලෙස හැඳින්වන ශ්‍රී ලංකාව නමින් අද හඳුන්වන සිංහලයන්ගේ දේශයෙන් කොටසක් කඩා වෙන් කොට ගෙන ස්වාධීන ද්‍රවිඩ ඊළාම් රාජ්‍යයක් පිහිටුවීමය. ඈත අතීතයේ සිටම එක් සේසත් රටක් ලෙස පැවති හෙළ දිව වෙනත් කිසියම් ජන කොට්ඨාශයක් සිටිය ද ඒ සියළු දෙනා මෙය සිංහලයන්ගේ දේශය බව මුළු හදවතින්ම පිළිගනිමින් සමගියෙන් හා සහෝදරත්වයෙන් ගැටළුවක් නොමැතිව රිසි සේ සියළු අයිතිවාසිකම් භුක්ති විඳිමින් ජීවත් වූහ. එවන් රටක් ද්‍රවිඩ නිජබිමක් යන මිත්‍යාව මත කැබලි කොට එහි වෙනම රාජ්‍යයක් පිහිටුවීමට ගන්නා උත්සාහය පදනම් විරහිතය.

යම් හෙයකින් වෙනම රාජ්‍යයක් ඉල්ලා ආයුධ සන්නද්ධව ත්‍රස්තවාදයට නැඹුරු වී ඇති කොටස්වල ඉල්ලීම්වලට ඉඩ ලබා දුනහොත් හෙට වන විට අනෙක් වාර්ගිකයන් ද තමාගේ කොටස්

වෙන් කර ගැනීමට උත්සාහ කළ විට රටක් ලෙස හැඳින්වීමට භූමි ප්‍රදේශයක් මෙරටට ඉතිරි නොවන්නට ඉඩ ඇත. යම්කිසි හේතුවක් නිසා සුළුතරයකගේ ඉල්ලීම පරිදි බෙදුම්වාදය සැබවින්ම ක්‍රියාත්මක කිරීමට හේතුවන්නේ නම් ඒ මගින් රටක ජනතාවට හිමිව තිබූ සියළු අයිතිවාසිකම් අහිමි කරන බරපතළ සාපරාධී ක්‍රියාවක් සිදුවන බව අමතක නොකළ යුතුය. ඉන්දියාව පාකිස්ථානය වෙන් කිරීමේ දී සිදු වූ පරිදි තමාගේ හිතවතුන්ගේ හා ඥාතීන්ගේ ඇසුර අහිමි වීම, තම උපන් භූමියේ ඕනෑ තැනක ජීවත්වීමේ, සැරි සැරීමේ අයිතිය අහිමි වීම, නිදහස් නිවහල් විශාල රටක උරුමක්කාරයන්ය යන මානසික ප්‍රබෝධය අහෝසි වී යාම ආදී හානිය අති විශාලය. එහෙයින් බෙදුම් වාදයට ඉඩකඩ සැලසීම හෝ ඒ සඳහා දිරිමත් කිරීම ලොව හැම කල්හි හැම තන්හිම ප්‍රතික්ෂේප කරන්නකි. පිළිකුල් කරන්නකි. එහෙත් කොටි හිතවාදී බෙදුම්වාදයට උඩගෙඩි දුන් මාධ්‍යයන් විසින් මෙය වටහා ගත්තේ නැත.

## සිංහලද්වීපයේ වෙනත් නිජබිමක් තිබිය හැකිද?

ශ්‍රී ලංකාව වසර තුන්දහසකට නොඅඩු දීර්ඝ අඛණ්ඩ ලිඛිත ප්‍රෞඪ ඉතිහාසයක් සහිත අභිමානවත් රටකි.[24] එහෙත් මෙරට මිනිස් ජනාවාස පිහිටුවීම ආරම්භ වී ඇත්තේ අදින් වසර 45000-50000 කට පමණ ඉහත දී බව මේ වන විට ප්‍රාග් ඉතිහාසඥයන් විසින් විද්‍යාත්මක පර්යේෂණ හරහා නවතම සොයා ගැනීම් ඔස්සේ (2009) පැහැදිලි ලෙස සනාථ කොට ඇත. මෙම නව සොයා ගැනීම් විසින් සනාථ කරනු ලබන තවත් ඉතා වැදගත් කරුණක් නම් දැනට ලැබී ඇති සාධක අනුව අදින් වසර 45000කට එහා කාලයේ සිට යටත් පිරිසෙයින් අදින් වසර 2800 ක් දක්වා වූ කාල පරාසය තුලට අයත් වන ප්‍රාග් ඓතිහාසික ස්ථාන හා ශේෂයන් සොයා ගෙන තිබීමෙන් හෙළදිව ශිෂ්ඨාචාරය වසර 45000 කට එහා සිට ආර්ය සංක්‍රමණය දක්වා අඛණ්ඩව පැවත ආ බවය. බලි, පුලස්ති, කුවෙර, රාවණ ආදී ශ්‍රේෂ්ඨ රාජ යුග පිළිබඳ පුවත් හුදු ප්‍රවාද ලෙස තවදුරටත් ඉවත් කළ නොහැක්කේ එහෙයිනි.

බුදුන් වහන්සේ මෙරටට වැඩම කළ ප්‍රථම අවස්ථාවේ දී දමනය කරන ලද යක්ෂයන් සිව් හෙළයන් අතර එක් දේශීය කොටසක් වූ අතර ඔවුන් කිසිදු හේතුවක් නිසා දෙමළ හෝ ද්‍රවිඩ

හෝ වෙනත් දකුණු ඉන්දීය ප්‍රභවයක් සහිත පිරිසක් නොවූ බවට සැකයක් ඇත්තේම නැත. නාගදීපයට මෙන්ම කැළණියට ද බුදුන් වහන්සේ වැඩම කොට නාගයන් හට දම් දෙසූ බව සඳහන් වන අතර මෙම නාගයන් ද කිසිවිට දෙමළ ජන කොටසක් වූ බවට සාධක නැත. එහෙත් ඉතිහාසය විකෘති කරමින් බෙදුම්වාදී ත්‍රස්තවාදීනට හිතකර, ඉතිහාසඥයන් යයි කියා ගන්නා අවස්ථාවාදීන් විසින් මවා පාන ලද ප්‍රලාපයන් ඇති බව අප අමතක නොකළ යුතුය.[25] දකුණු ඉන්දීය ප්‍රභවයක් සහිත සංක්‍රමණිකයන් ගැන කරුණු ඉතිහාසයෙන් සොයා ගත නොහැකි තැන මෙම ව්‍යාජ ඉතිහාසකරුවන් විසින් මෙරට දේශීයයන් වූ යක්ෂ, නාග, දේව, රාක්ෂ යන සිව් හෙලයන් ද්‍රවිඩ සම්භවයක් සහිත එදා දකුණු ඉන්දියාවේ වාසය කළ පිරිස් ලෙස හුවාදැක්වීමට නොගන්නා තැනක් නැත. ඉතිහාසය විකෘති කරන පිරිස් විසින් ගෙන ඇති නිවට උත්සහායන් අතර වෙනකක් තබා ලොවම ශ්‍රේෂ්ඨ ඉංජිනේරුවන් පවා විශ්මයට පත් කළ මෙරටට ආවේණික යයි ඔවුන් විසින් සළකන වාරි තාක්ෂණය පවා දකුණු ඉන්දියාවෙන් මෙරටට හඳුන්වා දෙන ලදැයි හුවා දැක්වීමට ගන්නා ලද උත්සහායන් ද වේ.[26] මෙහි හාස්‍යජනක කොටස වන්නේ ලොව දීර්ඝතම අඛණ්ඩ ඉතිහාසය අඩංගු මූලාශ්‍රයක් ලෙස සැළකෙන අපේ මහාවංශයේ පරස්පරතා සොයන්නට සිය ජීවිත කාලය ම කැප කරන අප්‍රමාණ පුද්ගලයන් අතර ඇතැමෙක් දෙමළ ජාතිවාදයට උඩගෙඩි දෙන සිංහල හෝ බටහිර උගත්හුය. එහෙත් ඔවුන් දෙමළ ජනතාවගේ ඉතිහාසය නිරවුල් ලෙස පෙළගැස්වීමට උත්සහා දරනු අපි දැක නැත්තෙමු.[27] දෙමළ බෙදුම්වාදී වර්ගවාදී සාවද්‍ය මත පතුරන්නන්ගේ ක්‍රියා කලාපයටත් වඩා ඛේදවාචකය වී ඇත්තේ ඊනියා මාධ්‍යවේදීන් විසින් ඒවාට ඉහළම ප්‍රසිද්ධිය ලබාදෙමින් අහිංසක ජනතාව අතර ඒවා පිළිගැනීමට පොළඹවා මිත්‍යා මායා පටලයක් තුළ ඔවුන් සිරකරුවන් කොට දැමීමය.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ආරම්භ වන්නේ ආර්යයන් වූ විජයගේ පැමිණීමෙන් නොව ඊට පෙර සිටි සිව් හෙළයන්ගෙන් බවට මතවාදයක් ගොඩනැගෙමින් තිබුණ ද දෙමළ ජන කොටසක් පිළිබඳ ඉඟියක් හෝ නැත. මෙරට ලේඛනගත ඉතිහාසයේ එළාර යුගය දක්වා යක්ෂ නාග දේව රාක්ෂ්‍ය යන දේශීය සිව් හෙළයන් හා ආර්ය

ජන කොටස් හැර අන් කිසිදු ජන කොටසක් පිළිබඳ ඉතිහාස කථාවල තබා ජනප්‍රවාදවල ද සඳහන් නොවීමෙන් දෙමළ ජන කොටස් විසින් මෙම දිවයින තම නිජබිම වශයෙන් සැළකීම බරපතළ මවා පෑමක් බවට සැකයක් නැත. දිවයිනේ සියළුම ප්‍රදේශවලින් පාහේ පැරණි සෙල්ලිපි හමු වී ඇති අතර මෙම සෙල්ලිපි පිහිටුවන ලද සිංහල ජනතාව ක්‍රි.පූ. තුන්වන සියවස තරම් කාලයේ දී දිවයිනේ උතුරු, දකුණු, නැගෙනහිර සහ බටහිර යන සිව් දිසාවන්හි ම ජනාවාස පිහිටුවා ගෙන සිටි බව එයින් පැහැදිලි වේ යයි සී.ඩබ්.නිකලස් හා ඇස්. පරණවිතාන නම් කීර්තිමත් ඉතිහාසඥයන් දක්වා ඇති අදහස් බැහැර කළ නොහැක්කේ එහෙයිනි.[28]

හෙළදිව ඉතිහාසයේ පළමුවරට දකුණු ඉන්දියාවට සම්බන්ධ අයකු පිළිබඳ සඳහන් වනු දැකිය හැක්කේ විජය කුමරු මෙරට රාජ්‍යත්වය උදුරා ගැනීමෙන් පසු කුවන්නාව පලවා හැර බිසවක සොයා පාණ්ඩ්‍ය දේශයේ මධුරා පුරයට පණිවුඩ යවා ගෙන්වා ගනු ලබන කුමරි පිළිබඳ සිද්ධියක් සමගය. එහිදී ද පාණ්ඩ්‍ය දේශය ඒ වන විට ආර්යකරණයට යටත් වී සිටි බවත් එහෙයින් විජය විසින් ගෙන්වා ගනු ලැබ ඇත්තේ ආර්ය සම්භවයක් සහිත ක්ෂත්‍රිය කුමරියක බවත් ඉතිහාසඥයන්ගේ මතය වී ඇත.[29] සැබෑ ලෙස දකුණු ඉන්දීය ආක්‍රමණයක් ලෙස හැඳින්විය හැකි එසේම දකුණු ඉන්දියානු සම්භවයක් සහිත ප්‍රථමයා ලෙස ලංකා ඉතිහාසයට සම්බන්ධ වන පුද්ගලයන් වන්නේ භාවිත වර්ෂයෙන් මීට වසර 2300 කට පමණ පෙර පැමිණි සේන-ගුත්තික නම් අශ්ව වෙළඳුන් දෙදෙනාය. මොවුන්ගේ නම් ගම් මෙන්ම වෘත්තිය ද මොවුන් හෙළදිව සමග නිරතුරු වෙළඳ ගනුදෙනු තිබුණා විය හැකිය යන උපකල්පනය ද අනුව සේන-ගුත්තික දෙදෙනා ආර්ය ජන කොටසකට අයත් විය හැකි බවට ඉතිහාසඥයන් අතර මතවාදයක් තිබීමෙන් පෙනී යන්නේ ඒ වන තුරුත් මෙරට දෙමළ ජනවාර්ගික සම්බන්ධයක් නොතිබුණ බවය. ඒ අනුව සැබවින්ම ද්‍රවිඩ මූලයක් සහිත ප්‍රථම ආක්‍රමණිකයා එළාර බව නිසැකය.

ද්‍රවිඩයෙකු ලෙස බොහෝ දෙනා නොපිළිගන්නා වූ එළාර නම් දකුණු ඉන්දීය ආක්‍රමණිකයා විසින් වසර හතළිස් හතරක කාලයක්

තුළ මෙරට පවත්වාගෙන යන ලද රාජ්‍ය පාලනය යහපත් ස්වරූපයකින් වර්ණනා කොට දැහැමි පාලනයක් ගෙන යන ලදැයි මහාවංශයේ සඳහන් කිරීමෙන් මෙරට ඉතිහාසකරණයේ යෙදුනු ගරුතර භික්ෂූන් වහන්සේ ඇතුළු සියළු දෙනා කෙතරම් මැදිහත් ලෙස ඒ දෙස බලා ඇත්ද යනු ප්‍රත්‍යක්ෂ කරවයි. අනෙක් අතට එළාර රජ ද දැහැමි පාලකයෙකු ලෙස කටයුතු කිරීමට තරම් සාධාරණ අයකු වී ඇත. එහෙයින්ම ඔහු යටතේ සේවය කළ සිංහලයෝ ද වූහ. එතෙකුදු වුවත් එළාර යනු විදේශික ආක්‍රමණිකයෙකු බවත් දේශයේ ජාතියේ නිවහල් බවට ඔහුගේ පැවැත්ම බරපතල හානියක් බවත් රට ජාතිය සිය පණටත් වඩා අගේ කොට සැලකූ ජාතියක් විසින් සැලකීම පුදුම විය නොහැක්කකි. එපමණකුදු නොවේ. හෙළ දිව භූමිය තුළ ඔහුට අයත් හෝ දමිළයන් ලෙස සැළකිය හැකි වාර්ගික කොටසක් ඒ වන විට ජීවත් වූයේ නම් දුටුගැමුණු කුමාරයා හට එවන් දැහැමි ප්‍රබල රජකෙනෙකු පහසුවෙන් පරාජය කොට පළවා හැරීමට ඉඩක් ද නොලැබෙනු ඇත. ඒ අනුව ද මැනවින් පෙනී යන්නේ එළාර යුගය වන විට ද දෙමළ හෝ ද්‍රවිඩ වාර්ගික කොටසක් මෙරට ජනගහණයේ ප්‍රබල කොටසක් ලෙස නැගී නොසිටි බවමය. එළාර රජු පළවා හැර රට එක්සේසත් කරනු ලැබුවාට පසු නැවතත් දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳ සඳහන් වන්නේ වලගම්බා රජුගේ රාජ්‍ය සමයේ දී ය. වසර 14 ක ඔවුන්ගේ රාජ්‍ය පාලන කාලයෙන් පසු නැවත රාජ්‍යය දිනාගත් වළගම්බා රජුගෙන් අනතුරුව සිංහලේ බලය දිවයින පුරා පිහිටුවනු ලැබූ බවට සාධක ලබාදීමට පසුබිම පැන නගින්නේ රටේ උතුරු ප්‍රදේශයෙන්ම වීම විශ්මය ජනකය. ඒ වන විටත් එහි දෙමළ නිජබිමක් නොවූ බවට එය ද සාධකයකි.

වලගම්බා රාජ්‍ය සමය අවසන් වී නොබෝ කලකින්ම මෞර්යය රාජ පරම්පරාව අවසන් කොට උතුරු ප්‍රදේශයෙන් බිහි වූ ලම්භකරණ වංශික වසභ නම් රජුගේ පාලන සමයේ උතුරේ නකදිව (නාගදීප) පාලනය භාරකරු ලෙස කටයුතු කළේ ඉසගිරි නම් සිංහලයෙකු වූ බවට වල්ලිපුරම් රන් සන්නස සාක්ෂි දරයි. එපමණක් ද නොවේ. එම ප්‍රදේශය පුරා බුදු දහම ද ප්‍රචලිතව තිබූ බව කන්දරොදෙයි (කදුරුගොඩ)[30] පුරා විද්‍යාත්මක සාධකවලින් මැනවින් පෙනී යයි. ඒ සමගම තවත් වැදගත් කරුණකට අවධානය යොමුවිය

යුතුය. මෙරට ලිඛිත සටහන් තැබීම ආරම්භ වී රට පුරා තැන තැන සෙල්ලිපි පිහිටුවා වසර 700-800 ක් පමණ කාලයක් ගෙවී යන තුරු කිසිදු ලේඛනයක වාර්ගික නාමයකින් කිසිවෙකු සඳහන් නොවී තිබීම ද විශේෂ වටිනාකමකින් යුත් සාක්ෂියකි. මෙරට පහල වූ ලොවම පිළිගත් ශ්‍රේෂ්ඨතම පුරාවිද්‍යාඥයා වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ගේ මතය අනුව සෙල්ලිපිවල සිංහල යන වාර්ගික නාමය කිසිවිට සඳහන් කිරීමක් නොවූයේ මෙරට ජීවත් වූ සියළු දෙනාම සිංහලයන් වූ බැවින් එසේ සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නොවූ බැවිනි. එහෙත් වෙනත් වාර්ගික අයකු සඳහන් කිරීමට අවශ්‍ය වූ හැම විටම ඒ නම සඳහන් කොට ඇත. දමෙඩ, මිලක (මේලෙච්ඡ) ආදී නම් දකින්නට ලැබෙන්නේ ඒ අනුවය.[31] මේ සියල්ල මගින් ඉතා පැහැදිලි ලෙසම දෙමළ නිජබිම සංකල්පය මිත්‍යාවක් බවට නිසැක ලෙස සනාථ කරනු ලබයි.

පුරාණ ශ්‍රී ලංකාවේ ඉතිහාස කථාව තුළින් ඊනියා ද්‍රවිඩ නිජබිමක් පිළිබඳ කිසිදු විශ්වාසනීය සාධකයක් සොයාගත නොහැකි තැන ඉතිහාසය, ජනශ්‍රැති, නම්ගම්, භූගෝලය ආදී සියල්ලම විකෘති කොට තම අහිංසක සාමාන්‍ය ජනතාව මෙන්ම සිංහල බෞද්ධකමට වෛර බැඳි විදේශික අධිරාජ්‍යවාදී හා අන්තවාදී ආගමික කොටස් රැවටීමට ගන්නා උත්සහායන් ගැන අපමණ සාක්ෂි දැකිය හැකිය. මහාචාර්ය කාතිගේසූ ඉන්ද්‍රපාලන් මහතා විසින් එදා ආචාර්ය උපාධිය සඳහා පර්යේෂණ කොට ලන්ඩන් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද පර්යේෂණ මගින් ක්‍රි.පූ. හෝ ක්‍රි.ව. ආරම්භක කාලයේ තබා 13 වැනි සියවස දක්වාම උතුරේ ස්ථිර දෙමළ ජනාවාස නොතිබූ බව ඔප්පු කළ නිබන්ධනය[32] මේ අය විසින් ජනතාව වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. එවිට සිංහලේ ඉතිහාසයේ ආරම්භයේ සිට ද්‍රවිඩ නිජබිමක් මෙහි නොතිබුණ බව කදිමට අවබෝධ වනු ඇත.

## ජාතියක් තුළ තවත් "ජාතියක්" තිබිය හැකිද?

චීන ජාතිකයන්ගේ දේශය චීනය වූ සේම ජපන් ජාතිකයන්ගේ දේශය ජපානයත් ඉංග්‍රීසි ජාතිකයන්ගේ දේශය එංගලන්තයත් විය. එහෙත් ලොව අන් සියළු ලොකු කුඩා සියළු රටවල මෙන් මේ සෑම රටකම වෙනත් වාර්ගික කොටස් විශාල වශයෙන් වෙසෙන බව

රහසක් නොවේ. අමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය ආදී රටවල විශාල වශයෙන් ලොව සිටින සියළුම අන්‍ය වාර්ගිකයෝ වෙති. එතෙකුදු වුවත් ඒ කිසිවෙකු නමින් නිජබිම් ඒ ඒ රටවල නොමැත. ඔවුන්ගේ විවිධ භාෂා පිළිගැනීමක් ද නැත. ඒ සඳහා කිසිදු ඉඩක් ද නැත. මූලික මිනිස් අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, සමාන අයිතීන් ආදී කිසිවක් ඒ මහ ජාතීන්ගෙන් අනෙක් අයට නොලැබේ. එහෙත් එම න්‍යාය හෙළදිවට අදාළ නොවන බවක් පෙන්වයි. හෙළයන්ගේ දිවයින හෙළදිව කීවා සේම සිංහල ජාතිය සතු දේශය වූ බැවින් ම සිංහල දේශය නමින් ඈත අතීතයේ සිට පෙර'පර දෙදිග ම ප්‍රසිද්ධියට හා කීර්තියට පත්ව තිබූ බව ලොව කිසිවෙකුට හෝ රහසක් නොවේ. එවන් වූ රටක් තුළ ඉතිහාසයේ කිසිදු නොතිබූ හා නොපිළිගැනුන දමිළ නිජබිමක් පිළිබඳ දැඩි මිත්‍යාවක් දමිළ ජනතාව තුළ පමණක් නොව මේ රටේ ඉතිහාසය පිළිබඳ බිඳක් හෝ නොදත් එහෙත් සිංහලකම හා බෞද්ධකම සමග බද්ධ වෛර බැඳගත් විදේශිකයන් තුළ ද වපුරවා මේ වන විට අත් කොට දී ඇති විනාශය මෙතෙකැයි කියා නිම කළ නොහැකිය. මෙසේ සිංහලද්වීපය තුළ තවත් වාර්ගික කොටසක් "ජාතියක්" බවට පත්කරමින් වෙනම රටක් ද බිහිකොට එය මොවුන්ගේ නිජබිම බවට පිළි ගැන්වීමට ජන විඥානය සකස් කිරීමට මෙවන් පිරිස් විසින් ගන්නා ලද අධම ප්‍රයත්නයන් මීට වසරකට ඉහත දී අතුගා දමන ලද අප රට මුහුණ දී තිබූ විනාශකාරී කුරිරු ත්‍රස්තවාදය පොෂණ කොට උත්සන්න කිරීමට හේතු භූත වී ඇති වග නොපිළිගන්නේ මිනිස් වර්ගයාට එරෙහිව එම පිළිකුල් සහගත ද්‍රෝහී ක්‍රියාවල යෙදී සිටින ආත්මාර්ථකාමී පිරිස් පමණි.

බටහිර අධිරාජ්‍යවාදීන්ගේ ඕනෑ එපාකම් ඉටු කිරීමේ වගකීම භාරගෙන අවි බලය, දේශපාලන බලය, තාන්න මාන්න ප්‍රදානය හරහා අධිරාජ්‍යවාදීන්ට සාක්ෂාත් කරගත නොහැකි වූ අපේක්ෂාව විජාතික චින්තනය ජන හදවත් තුළ පැළපැදියම් කිරීමට ගන්නා උත්සහායේ අවසාන ඉලක්කය වී ඇත්තේ ජාතියේ ශක්තිය වූ සමගිය, සාමය හා සෞභාග්‍යය අතුරුදහන් කොට බෙදුම්වාදය ජයග්‍රාහී කරවීමය. ඒ සඳහා අවශ්‍ය වන පරිදි ජනවිඥනය හැඩගැස්වීමට කටයුතු කර ඇති අවස්ථා හා සාධක අපමණය. ඒ අතුරින් සිංහලයාගේ

මව්බිම පිළිබඳ ඇති ආදරය ඇල්ම හා බැඳීම විනාශ කොට එම භූමිය තුළ අළුතින් ජාතියක් බවට හංවඩුව ද ලබා දී ඇති ආගන්තුක වාර්ගික කොටසකට නිජබිමක් සාද දී වෙනම රාජ්‍යයක් පිහිටුවීමට අවශ්‍ය පසුබිම හා ඊනියා සාධාරණීකරණය ද ලබා දීම ප්‍රධාන තැනක් ගන්නා බව නොරහසකි.

හැම රටක මුල් පදිංචිකරුවන්ට අමතරව කලින් කළ සංක්‍රමණය වී පැලපදියම් වූ වෙනත් වාර්ගික කොටස් ද සිටිනු දක්නට ලැබීම සාමාන්‍ය සිද්ධියක් පමණි. එහෙත් ඒ කිසිවෙකු මුල් පදිංචිකරුවන්ගේ නොහොත් භූමි පුත්‍රයන්ගේ අයිතියට, උරුමයට, අභියෝග, තර්ජන එල්ල කොට නැත. මුල් අයිතිකරුවන්ගේ උරුමයන් පිළිගනිමින් සාමකාමීව සමගියෙන් තමන්ට ශක්ති පමණින් ඒ දේශයේ හැදියාවට දයකත්වය සපයමින් ඒ හැදියාවේම කොටස්කරුවන් ලෙස ජීවත්වීම මේ හැම රටකම ඉතිහාසය තුළින් මැනවින් පෙනී යයි. මෙම තත්වය ශ්‍රී ලංකාවේ අතීත ඉතිහාසය පුරා කදිමට දැකිය හැකිය. මෙරට ආක්‍රමණය හෝ සංක්‍රමණය කළ වෙනත් වාර්ගික නායකයන් මෙරට රජ වූයේ සිංහල බෞද්ධයන් ලෙසය. භූමි පුත්‍රයන් පමණටම ඔවුන් ද දේශයේ සංස්කෘතියට දයකත්වය සපයා ඇත. එහෙත් මෙම තත්වය යටත්විජිත වාදය සමග වෙනස් වන්නට පටන්ගත්තේය. මෙය මුළුමණින් ම මිනිස් සංහතියේ සාමකාමී පැවැත්මට එරෙහි ව බටහිර අධිරාජ්‍යවාදයත් සමග බිහි වූ නිර්මාණයකි. ඔවුන් විසින් ගන්නා ලද මාර්ග අතරින් ඉතා ප්‍රබලම මෙන්ම සාර්ථකම ක්‍රමය වී ඇත්තේ බෙදා පාලනය හරහා භේදභින්නතාවය ඇති කිරීමත් අධිරාජ්‍යවාදීන්ගේ මිල මුදලින් පෝෂණය කරන සංවිධාන හා ජන සංනිවේදන මාධ්‍ය හරහා ජන විඥානය නව යටත් විජිත වාදයේ ක්‍රමවේදයන්ට හිතකර ලෙස සැකසීමට උත්සහා ගැනීමත්ය.

## අධිරාජ්‍යවාදී උපක්‍රමයේ අනිසි විපාක

අධිරාජ්‍යවාදීන් විසින් ඒ ඒ රටවල මුල් පදිංචිකරුවන්ට එරෙහිව අනෙක් විවිධ කොටස් නගා සිටුවීම සඳහා ආධාර උපකාර අනුග්‍රහ දැක්වීමෙන් විවිධ කොටස් අතර අසමගිය ඇති වී සටන් ඇවිලීමෙන් ඒ ඒ රටවල සමගිය මත බිහි වූ ශක්තිය අතුරුදහන් වීමෙන් අධිරාජ්‍යවාදීන්ට විශේෂ වාසි හා පහසුකම් සැලසිනි. ශ්‍රී

ලංකාවේ ව්‍යාප්ත වී තිබූ බෙදුම්වාදී දෙමළ ත්‍රස්තවාදයෙන් මොවුන්ගේ බෙදා පාලනය කිරීමේ ක්‍රමයේ රුදුරු ප්‍රතිඵල මැනවින් පෙන්වා දෙනු ලබයි. මෙවන් සෑම උත්සහායක දී ම සිංහල ජනතාව පාලකයන් සමග පමණක් නොව අනෙක් ජන කොට්ඨාශ සමග ද අවුල් ඝට්ටන ඇති කර ගැනීමෙන් රටේ සමගිය එකමුතු බව බිඳී ගියේය. එවිට ගැටුම්වලට සම්බන්ධ සියළු පක්ෂ අතර සාමය ඇති කිරීමට ඉදිරිපත් වන්නේ අධිරාජ්‍යවාදී පාලකයන්මය. ඔවුන්ගේ කොන්දේසි මත වැඩ කිරීමට සිදුවීම නිරායාශයෙන්ම සිදුවන්නකි.

තම රට ජාතිය ආගම පිළිබඳ ඇල්මෙන් බැඳීමෙන් ජනතාව ඈත් කරවමින් එදා යටත් විජිත යුගයෙන් ආරම්භ කළ බෙදා පාලනය කිරීමේ ප්‍රතිපත්තිය අධිරාජ්‍යවාදීන්ට කෙතරම් සාර්ථක ප්‍රතිපල ගෙන දී ඇත් ද යත් වසර 3000 කට එහා සිට රට දැයට ආදරය කළ දේශප්‍රේමීන්ගෙන් පිරුණ රට අභ්‍යන්තරයේ වර්ගවාදී කලකෝලාහල කිසිත් ගැන අසා නොතිබුණ ශ්‍රී ලංකාවේ වර්ගවාදය අධිරාජ්‍යවාදීන් ගේ කාලය තුළ පිළිලයක් ලෙස නිදන් ගත කරවන ලදී. ඔවුන් මෙරට හැරද ආපසු යාමත් සමග රට එකම වාර්ගික ගිනි ජාලාවකට මැදිකරවන්නට සැලසුම් කරන ලදී. මේ දක්වා වූ කුරිරු මෙලේච්ඡ දෙමළ ත්‍රස්තවාදය එහි අවසන් නිර්මාණය වීය. අප්‍රිකාව, ආසියාව, ලතින් අමෙරිකාව පමණක් නොව යුරෝපය පුරා ද අධිරාජ්‍යවාදීන් විසින් ගෙනයනු ලබන මෙම ප්‍රතිපත්තිය නිසා එදා දුසිමකටත් වඩා අඩු වූ අප්‍රිකානු රටවල් සංඛ්‍යාව මේ වන විට අර්ධ ශතකයකට ආසන්න වී ඇත. 1945 දී දෙවන මහා ලෝක යුද්ධය අවසන් වන විට නැගෙනහිර යුරෝපයේ බිහිකරන ලද එක්සත් රටවල් සංඛ්‍යාව මේ වන විට භේදභින්න ව අළුත් රටවල් බවට පත්කිරීම තුළින් එද මෙන් 7-8 ගුණයක රටවල් සංඛ්‍යාවක් දක ගැනීමට අපේ ජීවිත කාලය තුළ දී ම හැකි වී ඇත.

## මව්බිම සංකල්පය ගැරහීම

බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට පක්ෂග්‍රාහී වූ සංනිවේදන මාධ්‍යයන් විසින් ජන විඥානය විකෘති කිරීම සඳහා යොදා ගන්නා ලද තවත් එක් මගක් වූයේ මව්බිම සංකල්පය විකෘති කිරීමෙන් හා ජනතාව අපහාසයට උපහාසයට ලක් කිරීමෙන් ජනතාව තුළ පැවති ජාතික

හැඟීම් දේශප්‍රේමය හා දේශජ ගුණය වනසා දැමීමය. එහෙත් පෙරදිග උරුමයේ කොටස් කරුවන් වූ ශ්‍රී ලංකාව ඇතුළු ආසියානු රටවල ජනතාව තමන්ගේ යයි මහත් ආදරයෙන් හා අභිමානයෙන් සළකන ලද තමන් උපන් භූමිය මාතෘභූමිය ලෙස සළකා ඊට මහත් වන්දනීයත්වයෙන් ගෞරව දැක්වීමට කටයුතු කොට ඇත්තේ බටහිර මතවාදවලට බොහෝ කලකට ඉහත දී සිට එනම් ඉතිහාසයේ ඈතම යුගයේ සිට බව අවධාරණය කළ යුතුය. භාරතීය මුණිවරයන් විසින් වැදූ මවත් උපන් බිමත් ස්වර්ගයටත් වඩා අගනේ යයි (ජනනී ජන්ම භූමිශ්ච.. සවර්ගා ගති ගරියසී..) ඉගැන්වීම තුළින් එය පැහැදිලි වනු ඇත.

කෙනෙකුට, අන් කවර අය දුසිම් ගණනින් සිටිය හැකි වුව ද අම්මා කෙනෙකු වශයෙන් සිටිය හැක්කේ එක් අයකු පමණි. එහෙයින් ම ඒ එකම අම්මාගේ වටිනාකම මිලකොට දැක්විය නොහැකිය. උපන් දේශය ද එසේමය. එහෙයින් වැදූ මව හා දිනූ දේශය මිළ කොට දැක්විය නොහැකි උත්තරීතර අසමසම වටිනාකමකින් යුත් එක සමානම වස්තූන් දෙකක් ලෙස හැම කල්හිම පෙරදිග හැදියාව තුළ සැලකුම් ලබා ඇත. ජගත් මාතා වන්දනය තුළින් ද පිළිබිඹු කරන්නේ එම සංකල්පය බව ඉතා පැහැදිලිය. අද ද හෙළ ජනතාව තම උපන් දේශය වූ හෙළදිවේ අනභිබවනීය උදාර ප්‍රෞඪ ඉතිහාසය පිළිබඳ අභිමානයෙන් කථා කරනු ලබන්නේ ඇයි? ඉතිහාසය පුරා තම මුතුන් මිත්තන් සිය පණ දෙවැනි තැන තබා මව්බිම ආරක්ෂා කොට ගැනීම සඳහා කටයුතු කොට ඇති ආකාරය ලොව අන් කිසි රටක දක්නට නොලැබෙන ආකාරයෙන් අඛණ්ඩව ලේඛන ගත කොට ඇති වාර්තා තුළින් සනාථ වන බව ඔවුන් මැනවින් දන්නා බැවිනි. එහෙත් ජාතියේ අසහාය නර වීරයන් වූ දුටු ගැමුණු, විජයබා, පැරකුම්බා ආදී ජාතික වීරවරයන් ත්‍රස්ත හිතවාදීන්ට නම් ජාතිවාදී ආගම්වාදී හතුරන්ය.

**යුද්ධයක් පිළිබඳ භීතිකාවක් ඇතිකිරීම.**

මෙරට සමහර ජනසංනිවේදන මාධ්‍යයන් විසින් ජනතාවගේ විඥානය විකෘති කරලීම සඳහා යොදාගත් තවත් එක් මගක් වූයේ රට තුළ යුද්ධයක් පිළිබඳ භීතියක් වපුරාලමින් ජනතාව දේශයේ

අඛණ්ඩතාවය වෙනුවෙන් නැගී සිටීම වළකාලීමය. යටත් පිරිසෙයින් 1976 න් පසු මෙරට එක් වාර්ගික කණ්ඩායමකට අයත් ආත්මාර්ථකාමී බලලෝභී දේශපාලන නායකයින් විසින් තරුණ පිරිස උසිගන්වමින් රටේ සාමය, සමගිය හා සුභදතාවය කෙළසන අන්දමින් හිංසාකාරී ප්‍රචණ්ඩතාවයක් ශ්‍රී ලංකාව තුළ බිහි කිරීමට ගන්නා ලද උත්සාහය කිසිවකුට රහසක් නොවේ. කිසිදු එළිදරව් නොකරන ලද ද්‍රවිඩයන්ගේ "අභිලාෂයන්" පිළිබඳ පුහු බස් දොඩමින් මෙම බලලෝභී දෙමළ නායකයන් විසින් කරන ලද්දේ බළලුන් ලවා කොස් ඇට බාවන නියාවෙන් දෙමළ තරුණ කොටස් බිල්ලට දී තමන්ගේ බල තණ්හාව හා බැඳුන අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමට උත්සහා කිරීමය. මේ යථාර්තය තේරුම් නොගත් කොටස් බලලෝභීන්ගේ චාටු බස්වලට අවනත වූයේ ඇයි ? එක් අතකින් තරුණ ජවය හේතු කොටගෙන නිරායාශයෙන් දැකිය හැකි විප්ලව කිරීමේ උන්මාදය විසින් ඔවුහු තාරාවන් දියට බසින්නාක් මෙන් විප්ලවයට ඇද දමනු ලැබූහ. අනෙක් අතට තමන්ටය කියා රටක් රාජ්‍යයක් නොමැති ඕනෑම ජන කොටසකට රටක් ලබා දී එහි රාජ්‍යත්වය ලබා දෙන බවට පොරොන්දු වූ කළ අකැමැති වන අයෙකු වේ නම් ඒ උන්මත්තකයෙකු හෝ මුග්ධයකු විය යුතුය. කපටි, වංචාකාර, බලලෝභී නායකයන්ගේ බහට වහ වැටුන දෙමළ තරුණ පිරිස් නිජබිමක් නැතිනම් තමන්ගේ ම රාජ්‍යයක් හා රාජ්‍ය බලයක් වෙනුවෙන් මුලා වූහ. ඔවුන් අවි අතට ගෙන මෙරට ඓතිහාසික පදනමක් සහිත ජාතියක නීත්‍යානුකූල එකම රාජ්‍යයට විරුද්ධව "යුද්ධ" ප්‍රකාශ කරන ලද්දේ ඒ අනුවය. එහෙත් සත්‍ය වශයෙන් ම යුද්ධයක් යනු කුමක්ද?

යුද්ධය යන්නට පරියාය ඉංග්‍රීසි වදන වූ War යන්න ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ අර්ථ ගැන්වෙන්නේ මෙසේය. "Quarrel usually between nations conducted by force, state of open hostility and suspension of ordinary international law prevailing during such quarrel, military or naval attack". එහි අදහස වන්නේ යුද්ධය යනු " ජාතීන් අතර බලය පාවිච්චි කරමින් සිදු කරන ගැටුමකි. එවන් ගැටුම් අවස්ථාවලදී හමුදා හෝ නාවුක හමුදා පහරදීමක දී බලපැවැත්වෙන සාමාන්‍ය ජාත්‍යන්තර නීති අත්හිටවූ විවෘත සතුරු ක්‍රියා පවතින තත්වයකි." මෙහි දී ජාතීන් යනුවෙන් අදහස් වන්නේ

මෙරට දී මෙන් අමු අමුවේ විකෘති කොට නියම ජාතිය මරාදමා සුළු ජනවාර්ගික කොටස්වලට ද පිරිනමා ඇති තත්වයේ "ජාතීන්" නොවේ. සැබෑ ජාතීන් නම් නිශ්චිත දේශයක් හිමි, ස්වීය වූ භාෂාවක්, සංස්කෘතිකයක් හා පාලන ක්‍රමයක් ඇති පිරිසකි. කොලින්ස් (Collins) ශබ්ද කෝෂය යුද්ධය අර්ථ දක්වා ඇත්තේ මෙසේය. Open armed conflict between two or more countries or groups. එහි සිංහල අනුවාදය වන්නේ රටවල් හෝ කණ්ඩායම් දෙකක් හෝ වැඩි ගණනක් අතර විවෘත ආයුධ සන්නද්ධ ගැටුමය. මෙම ශබ්ද කෝෂ අර්ථ ගැන්වීම් දෙකෙන්ම පැහැදිලි ලෙස පහදු දෙන්නේ යුද්ධයක් නම් රටවල් හෝ ජාතීන් දෙකක් අතර ආයුධ සන්නද්ධ සටනක් ලෙසටය.

එසේ නම් ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට එරෙහි සටන යුද්ධයක් විය නොහැකිය. නීත්‍යානුකූල රටක නීත්‍යානුකූල රජයකට එරෙහිව අවි ගැනීම නීති විරෝධී ක්‍රියාවක් වන බැවින් එම නීති විරෝධී කල්ලිය මර්දනය කිරීම සඳහා ගන්නා කිනම් ක්‍රියා මාර්ගයක් වුව ද එය යුද්ධයක් ලෙස හැඳින්විය නොහැකිය. ඒ අනුව ත්‍රස්තවාදීන්ගේ මිතුරු බලවේග විසින් ලංකා රජයේ නීත්‍යානුකූල ක්‍රියාමාර්ගය යුද්ධයක් ලෙස හැඳින්වීමෙන් කරනු ලබන්නේ දේශීය වශයෙන් රටේ සාමකාමී ජනතාව බිය ගන්වා රජයේ ක්‍රියා මාර්ගයට සහාය දැක්වීමෙන් වළකා ගැනීමය. එවිට රජය ගැටළුවලට මුහුණ දී සටන් අත්හල විට ජයග්‍රහණය ලබන්නේ කොටි ත්‍රස්තවාදීන්ය. අනෙක් අතට විදේශීය වශයෙන් ද මෙම ප්‍රචාරණ හේතු කොටගෙන විශේෂයෙන් බටහිර ප්‍රජාතන්ත්‍රවාදී යයි කියාගන්නා බලවත් රටවල ශ්‍රී ලංකාව කෙරෙහි සතුරු ආකල්පයක් මෝදු කිරීම අපේක්ෂා කෙරේ. එවිට ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට පත්ව රටට ලැබිය යුතු ආධාරාදිය නතර කිරීමට හේතුවනු ඇත. එහිදී අවසාන ප්‍රතිපලය වන්නේ කොටි ත්‍රස්තවාදීන් ජය ගැනීමය.

එපමණකුදු නොවේ. යුද්ධයක් හටගත හැක්කේ සතුරු රටවල් දෙකක් අතරය. ශ්‍රී ලංකාවේ සිදු වන්නේ එකම රටක් තුළ තවත් රාජ්‍යයක් පිහිටුවීමට ගන්නා නීති විරෝධී උත්සාහයක් මැඩ පැවැත්වීම විනා යුද්ධ කිරීමක් නොවේ. එහෙත් ආගමික බැඳීම හෝ අධිරාජ්‍ය ගැති බව හෝ දේශීයත්වය දුර්වල වීම නිසා හෝ ත්‍රස්ත හිතවාදී

තත්වයට පත්ව සිටින මාධ්‍ය කරුවන්ගේ "යුද්ධය" පාදක කොට ගත් නිරන්තර හඬ නැගීම් හේතු කොටගෙන රටේ ජනතාව " යුද්ධය" නිසා විනාශ වන දේපළ, ජීවිත හානි දැක එය පිටුදැකීමට රජයට බලපෑම් කිරීම වර්ධනය කිරීම ත්‍රස්තවාදීන්ගේ හා ඔවුන්ගේ හිතවතුන්ගේ එකම අරමුණු විය. මෙරට පවතින්නේ යුද්ධයක් යයි ප්‍රචාරය කිරීමෙන් ත්‍රස්තවාදී කොටස්වලට රාජ්‍ය තාන්ත්‍රික නැතිනම් රාජ්‍යයක තත්වය ලබා දීමට ගන්නා ලද උපක්‍රමයක් දැකිය හැකිය. ඒ අනුව මෙරට මාධ්‍යය විසින් යුද්ධය පිළිබඳ බිල්ලෙකු මවා පෑමෙන් කරන ලද්දේ රට නිදහස් කර ගැනීමේ සටනේ කොටස් කරුවන් වීමේ ප්‍රවණතාවයෙන් ජනතාව ඈත් කරන අතරම ත්‍රස්තවාදී බෙදුම්වාදී ජන වර්ගයකට "ජාතියක" තත්වය ලබාදීමේ උත්සහායක් බවද පැහැදිලියි. රජය කරවන සමහර දේශපාලනඥයන් පිරිසක් විසින් ද ඊනියා යුද්ධයට එරෙහි ජන මතයක් ඇති කිරීම අරමුණු කොටගත් "තවලම් ව්‍යාපෘතියක්" හා "සුදු නෙලුම්" ව්‍යාපාරයක් දියත් කිරීම මොවුන්ට එය තවත් පහසු කරවනු ලැබුවේය. යුද්ධයට යන්නේ ලේ පිපාසිතයන් බවට රටපුරා වේදිකා මත සිට බෙරිහන් දුන් දේශපාලන නායක නායිකාවන් වෙතින් ත්‍රස්තවාදය නිමා කොට යුද්ධයකින් තොරව රටට ගෞරවනීය සාමයක් ලඟා කොට දෙනු ඇතැයි විශ්වාසය කිරීමට 2002-2004 කාලය තුළ මෙරට ජනතාව පොළඹවනු ලැබීන. ත්‍රස්තවාදීන් ශක්තිමත් කිරීමට ප්‍රබල හේතුවක් විය. රටත් ජාතියත් මුදා ගැනීමේ නූතන වීරෝධාර මෙහෙවර සමස්ත ලෝකයාගේම ප්‍රසාදයට හේතු වී තිබෙද්දීත් එය ගැරහීමටත් අවතක්සේරුවටත් පත් කරන ආකාරයෙන් පච්චු පරාජිත දේශපාලනඥයන් විසින් අද දක්වාම කරන කියන දේ තුලින් ඔවුන්ගේ දේශද්‍රෝහී ස්වභාවය දැක ගත හැකි වනු ඇත. ජාතියට ද්‍රෝහී වූ මෙවන් මාධ්‍ය ඇතුළු ත්‍රස්ත හිතවාදීන් මෙරට පවතින ත්‍රස්ත ගැටුම උතුරු අයර්ලන්ත සටනට සමාන කොට පෙන්වන්න හදන්නේ උතුරු අයර්ලන්තයට එරෙහි සටන් කරන බ්‍රිතාන්‍යය පිටස්තර රාජ්‍යයක් වන අතර යාපනයේ සටන් කරන්නේ එහි නීත්‍යානුකූල හිමිකරුවා වන ශ්‍රී ලංකා රජයම බව සඟවමින් බව අපට අමතක කළ නොහැකිය.

නීත්‍යානුකූලව පිහිටුවන ලද රාජ්‍යයකට එරෙහිව අවි අමෝරා ගෙන සටනට පැමිණෙන පිරිසක් හමුවේ ජනතාවගේ රටත්, රාජ්‍යයත්, ජීවිතත්, දේපළත් ආරක්ෂා කිරීම නීත්‍යානුකූල රජයක ප්‍රථම හා පරම යුතුකම වේ. නීතියේ ආධිපත්‍යය පිහිටුවීම සඳහා ගන්නා වූ සාමය අරමුණු කොටගත් සාධාරණ, යුක්ති සහගත මානුෂීය මෙහෙයුමක් මිස වෙන කුමක්ද? එහෙත් ත්‍රස්තවාදීන්ටත් වඩා ඔවුන්ගේ සුමිතුරන් හට එය පිළිගත නොහැකි විය. "යුද්ධය මෙහෙය වූ ආකාරය ගැන මට සිංහල බෞද්ධයෙකු ලෙස ප්‍රශ්න තිබෙනවා යයි[33] යුද්ධය හමාර කොට මාසයක් ගෙවී ගිය තැන ද එවන් අයට ගැටළු ඇති බව ප්‍රකාශ කිරීම ඊට කදිම නිදසුනකි. රාජ්‍ය විරෝධී කොටස් විසින් තම මාධ්‍ය සගයන් ද හවුල් කොට ගෙන නිරතුරුවම ප්‍රචාරය කලේ කුමක්ද? ශ්‍රී ලංකාවේ රජය දෙමළ ජනතාවට එරෙහිව "යුද්ධයක්" ප්‍රකාශ කොට ඇති බවය. මෙම දුෂ්ඨ ව්‍යාපාරය කෙතරම් දුර ගියේ ද යත් පසුකාලීනව එය "ජන සංහාරයක්" (Genocide) දක්වා පුළුල් කරනු ලැබීය. සැබෑ ලෙසම සිදු වූයේ කුමක් ද? " දෙවන ලෝක යුද්ධයේ දී මිත්‍ර ජාතීන්ට යුද වැදීමට සිදුවී තිබුනේ හිට්ලර් සහ ජපනුන් සමග පමණි. එහෙත් කොටි අපරාධකාරී සමාගමට එරෙහි වූ ආරක්ෂක හමුදාව යුධ වදිද්දී පාර්ශවයන් පහක් සමග සටන් කිරීමට සිදු විය. "ඒ නම් බලවත් කොටි හමුදාව, කොළඹ ජාත්‍යන්තර එන්.ජී.ඕ ජාලය, මාධ්‍ය ජාලය, තානාපති ජාලය, කොටි හිතවාදී ඇතැම් ව්‍යාපාරික ජාලය වේ."[34]

## මායිම් ගම්මාන - සීමා ගම්මාන

බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ විනාශකාරී ක්‍රියාමාර්ගයන් වසන් කොට ඒවා විමුක්ති අරගල ලෙස සළු පිළි අන්දවා ලොවට හඳුන්වා දුන් බෙදුම්වාදී මිනීමරු ත්‍රස්තවාදීන්ගේ මිතුරු මාධ්‍යයන් හා සංවිධාන ගෙන ගිය තවත් ව්‍යාජ ව්‍යාපාරයක් වූයේ සීමා ගම්මාන නැතිනම් මායිම් ගම්මාන පිළිබඳ මිත්‍යාව පණ ගැන්වීමට ගත් උත්සාහයයි. ඔවුන්ගේ අපේක්ෂාව වූයේ ත්‍රස්ත්‍රවාදීන්ට ඍජු හෝ වක්‍ර අන්දමින් සහාය පළ කරමින් ඔවුන් වෙනුවෙන් දේශීයව ජනතා අනුකම්පාව ලබා ගැනීම ද විදේශීයව ඒ ඒ රටවල බලධාරීන්ගේ හා විවිධ සංවිධානවල බලපෑම් කරවීම, ආධාර උපකාර ලබා ගැනීම්, මෙරට නීත්‍යානුකූල රජයේ ජාත්‍යන්තර පිළිගැනීම අවතක්සේරු කිරීමාදී

අරමුණු ඉටුකර ගැනීමය. මායිම් ගම්මාන යනු මොනවාද? ඒවා කොහේ පිහිටා ඇද්ද? මායිම් වී ඇත්තේ කුමකටද? යන ප්‍රශ්නවලට පිළිතුරු සොයන අයකුට මෙරට ත්‍රස්ත හිතවාදී මාධ්‍ය කරුවන් විසින් ජන විඥානය විකෘති කිරීමෙහිලා පමණක් නොව මෙරට පොදු ජනතාව මෙන්ම දූන උගත් පිරිස් අතර ද වැරදි භාවිතයන් ප්‍රචලිත කිරීමෙන් ඒවාට නීත්‍යානුකූල බව ලබාදීමෙහිලා ගන්නා ලද නිර්ලජ්ජිත උත්සාහයන් ප්‍රත්‍යක්ෂ කොට ගත හැකි වනු ඇත.

මෙරට මායිම් ඇත්තේ රටේ වෙරළේ සිට නාවුක සැතපුම් 200 ගණනක් ඈත මහමුහුදේ බවත් සහහර දිසාවලින් එය ඊට අඩු වැඩි විය හැකි බවත් නොදන්නා අයකු නැති තරම්ය. එහෙත් මේ වන විට දේශපාලන වේදිකාවල ද වියත් සමූළුවල ද ප්‍රබුද්ධ ලේඛකයන්ගේ ලේඛනවල ද නිරතුරුව මායිම් ගම්මාන ගැන කියවෙනු ලියවෙනු දැකීම සුලබ දෙයකි. මොවුන් විසින් මායිම් ගම්මාන යන වදන භාවිතා කරනු ලැබුවේ මිනීමරු බෙදුම්වාදී ත්‍රස්තයන් විසින් රටේ යම් ප්‍රදේශ ප්‍රමාණයක් සීමා ලකුණු කිරීම තුළින් ඒ තමන්ගේ නිජබිමය යන මිත්‍යාව තහවුරු කිරීම සඳහාය. මෙම උපක්‍රමය කෙතරම් දුරට සාර්ථක වී ඇද්ද යත් උගතුන්, වියතුන්, දේශප්‍රේමීන් පවා පුන පුනා මෙම සාපරාධී වැරදි භාවිතයේ යෙදෙනු දැකිය හැකිය. ත්‍රස්තවාදීන්ගේ හිතවතෙකු වශයෙන් චිර ප්‍රසිද්ධියක් ඉසිලූ එක්තරා සිංහල අබෞද්ධ දේශපාලඥනයෙකු ත්‍රස්තවාදී මිනීමරුවන්ගේ ප්‍රහාර දැඩිව එල්ල වූ කාලයේ දී "මායිම් ගම්වල" ජනතාවට කොටි ප්‍රහාර සිදුවන විට පලා යාමට සංඥා කිරීම සඳහා සයිරන් නලා බෙදා දීමේ ව්‍යාපාරයක් ගෙන ගියේ මිනීමරු ත්‍රස්තවාදීන්ට නිතියෙන් හිමි රටක මායිම් මේවා යයි ජනතාවට අනතුරු හැඟවීම තුළින් බව අප කෙසේ නම් අමතක කරමුද? රට ත්‍රස්තවාදයෙන් නිදහස් කරගත් පසු ද මෙම සාවද්‍ය භාවිතය පුවත් පත් කලාවේදීන් විසින් එලෙසම සිදු කරන බවට කදිම නිදසුනක් 2009 ජූනි 07 වැනි බදාදා දින ජාතික පුවත්පතකින්[35] දැකිය හැකිය. එහෙයින් මෙය ත්‍රස්තයන් වෙනුවෙන් ජනප්‍රිය කරවන ලද අමූලික අසත්‍ය මිත්‍යාවක් බව ද ඉතා පැහැදිලිය.

## ත්‍රස්තවාදය ජාතික ගැටළුවක් බවට මවාපෑම.

නොමග ගිය ත්‍රස්තවාදී සුළු පිරිසකගේ නීති විරෝධී ආයුධ සන්නද්ධ සාහසික සාපරාධී ක්‍රියාදාමයක් ජාතික ගැටළුවක් ලෙස හුවා දැක්වීම ත්‍රස්ත හිතවාදී සන්නිවේදන මාධ්‍යයන් හරහා සිදු කරන ලද බරපතල අපරාධයකි. සමාජයේ ජන ජීවිතය විසංවිධාන වන අන්දමින් කටයුතු කරමින් අපරාධවල යෙදෙන ඕනෑම පිරිසක් අපරාධකරුවන් මිස විමුක්තිකාමීන් ලෙස හැඳින්විය නොහැකිය. එහෙත් මෙම දෙමළ සන්නද්ධ පිරිසකගේ ක්‍රියා කලාපය ජනවාර්ගික අර්බුදයක් නිසා පීඩාවට පත් දෙමළ ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් කරනු ලබන අරගලයක් ලෙස හුවා දක්වන ලද්දේ මෙම මාධ්‍යවල පක්ෂග්‍රාහී බව නිසාය. රටපුරා අවුලවාලන ලද ත්‍රස්තවාදී ගිනි ජාලාව ජාත්‍යන්තර ප්‍රජාවගේ පිළිකුලට ලක්වීම වැලැක්වීම සඳහා ඔවුන් විසින් ඊට "ජනවාර්ගික" පදනමක් ආරූඪ කරන ලදී. ඒ අතර ඔවුන්ට නිරතුරුව සහායට සිටි අධිරාජ්‍යවාදී බලවේග විසින් ඔවුන්ගේ තැරැව්කාර මාධ්‍යකරුවන්, දේශීයත්වයට එරෙහි වූ වාමාංශික කොටස්, උගතුන් යයි කියාගත් බටහිර කරපින්නා ගත් පිරිස් ආදීන් ලවා මෙම අපරාධ රැල්ල සාධාරණීකරණය කිරීමට අවශ්‍ය බර පැන දරන ලදී.

## ජනවාර්ගික ගැටළුවක් නම් දෙමළ වූ පමණින් දෙමළ ජනයා මුහුණ පාන ප්‍රශ්න මොනවාද?

දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදයට ජන වාර්ගික මුහුණුවර දෙන ලද කිසිවෙකු වෙනම ජන වර්ගයක් වූ නිසාම දෙමළ ජනතාවට මුහුණ පාන්නට සිදු වූ ගැහැට, ප්‍රශ්න හෝ අර්බුද පෙන්වා දීමට අපොහොසත් වූ බව රහසක් නොවේ. අධ්‍යාපනය අතින් ඉහළම අධ්‍යාපන පහසුකම් හිමි වූයේ යාපනයට බව වාර්තාවලින් පෙන්වා දී ඇත.[36] නැගෙනහිර විශේෂයෙන් මඩකලපුව දිස්ත්‍රික්කවල දෙමළ ජනයාගේ ප්‍රශ්න යාපනය කේන්ද්‍ර කොට ගත් ද්‍රවිඩයන්ගේ අවධානයට යොමු වූයේ තමාගේ අර්බුදය පුම්බා විශාල කොට පෙන්වීමට අවශ්‍ය වූ විට පමණි. භාෂාව ද ඔවුන්ගේ ප්‍රගමනයට බාධාවක් නොවූයේ සාමාන්‍ය දෙමළ ජනතාව සිංහල භාෂාව දත් නිසා දෛනික කටයුතු සඳහා ඔවුන්ට එය ගැටළු උද්ගත නොකළ බැවිනි. සිංහලය රාජ්‍ය භාෂාව වීම ගැටළුවක් වූයේ අධිරාජ්‍යවාදීන් ගේ හවුල්කරුවන් ලෙස

ක්‍රියාකළ මිෂනාරී ව්‍යාපාරයට අයත් දෙමළ නායකයන්ට පමණි. 2009 විශ්මිත විජයග්‍රහණයෙන් පසු මාධ්‍යයට කථාකළ බොහෝ සාමාන්‍ය ජනතාව සිංහලෙන් කථාකළ මුත් පූජකයන් කථාකළේ දෙමළ නැත්නම් ඉංග්‍රීසියෙනි. ඒ සියල්ල අභිබවා 1815 දී මේ රට ඉංග්‍රීසීන්ට පාවා දෙන තුරු සිංහලේ රාජධානියේ රාජ්‍ය භාෂාව වූයේ සිංහල බව ඔව්හු දන සිටියහ. රටට අහිමි කරන ලද භාෂා අයිතිය 1956 දී නැවත දිනා ගැනීමේ දී විරුද්ධ වීම හුදු කුහක කමක් පමණක් ද? නැතිනම් ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් වෙත දක්වූ ගැති බව සනාථ කිරීමක් ද? යනු ජනතාව විසින් ප්‍රශ්න කරන ලදී. සිංහලය රාජ්‍ය භාෂාව කිරීම මෙරට ජනවාර්ගික ප්‍රශ්නයකට හේතු වූ බවට මොවුන්ගේ සාවද්‍ය ප්‍රචාරය කෙතරම් ප්‍රබල ලෙස විවිධ මාධ්‍ය හා වෙනත් සංනිවේදකයන් විසින් සමාජගත කරන ලද්දේ ද යත් සැබෑ යථාර්තය පිටු දකින අධම සිංහල දේශපාලන නායකයන් අතර ද එම මතය පිළිගැනීමට තරම් නිවට වූ අය එදත් සිටියහ. අදත් සිටිති. රටේ ප්‍රශ්න සියල්ලට හේතුව සිංහල රාජ්‍ය භාෂාව කිරීම යයි පැවසීමට තරම් මොවුන් නිවට වූව ද සිංහල රාජ්‍ය භාෂාව නොවන්නට තම ගමේ හතර මායිමෙන් එපිටට යන්නට තමන්ට අවස්ථාව නොලැබෙන්නට තිබුණ බවවත් අවබෝධ කොටගැනීමට නොහැකි මුග්ධ අකෘතඥයන් ද සිංහල දේශපාලකයන් ද ඉහළ තානාන්තරවල වැජඹුන හා වැජඹෙන අය අතර සිටිනු දැකීම කොතරම් ඛේදවාචකයක් ද?

දෙමළ ජනතාව මුහුණ පා ඇත්තේ ජනවාර්ගික ගැටළුවකට නම් ඔවුන් නිරතුරුව බහුලව අර්බුදවලට මැදි විය යුත්තේ බහුතරයක් සිංහල ජනතාව වෙසෙන ප්‍රදේශවල දී යයි තර්ක කිරීම සාධාරණය. එහෙත් යථාතත්වය ඊට හාත්පසින් වෙනස්ය. සිංහල ජනතාව සමග වාසය කරන දෙමළ ජනතාව ඉතා සතුටින් තම දෛනික කටයුතු කිසිදු බාධාවකින් තොරව කරගෙන යනු ලබන අන්දම කාටත් දැකගත හැකි තරමට විවෘතය. කාන්තාවන්ගේ ආරක්ෂාව හා ගෞරුත්වය මදකුදු තර්ජනයට ලක් වී නොමැත. දරුවන්ගේ පාසැල් කටයුතු අවහිරයකින් තොරව සිදුවන්නේ පාසැල් යන වයසේ සියළු දෙනාට පාසැල, නිල ඇඳුම්, පොත් පත් ආදිය සැපයීම රජයේ වගකීමක් ලෙස සළකා සමස්ත ජාතිය වෙත භේදයකින් තොරව ඉටුකරනු

ලබන බැවිනි. සිංහල ජනතාව බහුලව ජීවත්වන ප්‍රදේශවල දෙමළ ජනතාව ආගමික, සමාජයීය, සංස්කෘතික කටයුතුවලට ක්‍රියාකාරී දායකත්වය සපයමින් සියළු දෙනා සමග සමගියෙන් ජීවත්වනු නිරතුරුව දැකිය හැකිය එසේ නම් මෙහි ජනවාර්ගික ප්‍රශ්නයක් ඇති බවට ගෙන යන ප්‍රචාරයේ සත්‍යය කුමක්ද? නිසැක වශයෙන්ම එහි අර්ථය නම් දුෂ්ඨ වූ දේශපාලන බලලෝභී වුවමනාවන් ඉටුකර ගැනීම සඳහා ආයුධ සන්නද්ධව කටයුතු කිරීම ජගත් මානව සංහතියෙන් සඟවා තබා ඔවුන්ගේ අනුකම්පාව හා අනුග්‍රහය ලැබ දේශපාලන ත්‍රස්තවාදය බාධාවකින් තොරව පවත්වාගෙන යාම බවට වාදයක් නැත.

මෙරට ජනවාර්ගික ගැටුම් සිදුවූයේ නැත.

පසුගිය දශක පහක-හයක පමණ කාලයක් තිස්සේ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ ගැටුම්, හැල හැප්පීම්, කැරළි ආදිය සුපුරුදු සංසිද්ධීන් වූවේ යයි කීව ද නිවැරදිය. එහෙත් ඒවා 1883 දී සිදු වූ බෞද්ධ විරෝධී ගැටුම මෙන් හෝ 1915 දී හටගත් සිංහල, මුස්ලිම් කොලාහල මෙන් හෝ වාර්ගික හෝ භාෂාමය හෝ ආගමික පදනමක් සහිත වූ ඒවා නොවීය. ඒවා තුළ සිංහල බෞද්ධ විරෝධය සළකුණු වූ නමුත් බෙදූ පාලනය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කළ අධිරාජ්‍ය වාදීන්ගේ දුෂ්ට ක්‍රියා පිළිවෙත වූ වාර්ගික කොටස් අතර වෛරය පැතිර වීම පොදු මහජනතාව දක්වා කිඳා බැස නොතිබුණ බවට වාර්ගික සටන් නොතිබීම බලවත් සාක්ෂියකි. එසේ වුව ද ගැටුම් මෝරන අවස්ථාව වන විට යම් පමණක වාර්ගික ගැටුම්වල ස්වරූපයක් ගන්නා ලද බව සැඟවිය නොහැකිය. 1957 දී අන්තවාදී දෙමළ කොටස් විසින් බල ලෝභී දෙමළ නායකයන්ගේ උසි ගැන්වීම මත "ශ්‍රී විරෝධී" ව්‍යාපාරයක් පටන් ගත් විට වාර්ගික අර්බුදයක ස්වභාවයක් දක්වා වැඩි දියුණු විය. එහෙත් එහි දී එය වාර්ගික සටනකට වඩා පන්ති සටනක ස්වභාවයක් ගන්නා ලදී. මේ වන විට රථ වාහනවල සිංහල අකුරු වෙනුවට ඉංග්‍රීසි අකුරු යොදා තිබීම ගැන මෙම එක ද ත්‍රස්තවාදියෙකු දේශපාලඥයකු හෝ මාධ්‍යවේදියෙකු විරෝධයක් පා නැත්තේ ඇයි? 1977 මැතිවරණයත් සමග සිංහල බහුල ප්‍රදේශවල අහිංසක දෙමළ ජනයා ද දෙමළ බහුතරයක් වූ ප්‍රදේශවල පදිංචිව සිටි සිංහල ජනයා ද විපතට පත්

වූහ. එතැන් සිට 1983 සුප්‍රසිද්ධ "කළු ජූලිය" දක්වා ඇති වූ ගැටුම් සියල්ලකින්ම හානියට පත්වූයේ අහිංසක පහළ පන්ති සිංහල හා දෙමළ ජනතාවමය. ඔවුනොවුන්ට පිහිට වූයේ ද එම කොටස්වල සාමාන්‍ය පන්තිකයන්මය.

කුමන පෞද්ගලික අරමුණක් උදෙසා කවුරුන් විසින් හෝ මෙවන් ගැටුම් උත්සන්න කරුනු ලැබුවේ ද යනු සොයා බැලීමක් සඳහා කිසිවෙකු විසින් මෙතෙක් කිසිදු උත්සහායක් නොදරා තිබීම සිංහල බෞද්ධ විරෝධය පෑමේ තවත් මගක් වශයෙන් දැක්විය හැකිය. මන්ද යත් ඒ මගින් සැබෑ ලෙස විපතට පත් වූවන් පිළිබඳ සත්‍යය වසන් කොට දෙමළ ත්‍රස්තවාදය සාධාරණීයකරණය කළ හැකි බවක් පිළිබඳ විශ්වාසයක් මොවුන් තුළ තිබෙන්නට ඇති නිසා පමණක් නොවේ. මෙවන් විමර්ශන ගැන ප්‍රසිද්ධියක් උසුලන්නේ ද සිංහල බෞද්ධ විරෝධීන් වන නිසාය. සිංහල බෞද්ධයන්ට සිදුවන විනාශයන් ගැන විමර්ශනයක් ඔවුන්ට අවශ්‍ය නැත. උග්‍ර සිංහල බෞද්ධ විරෝධී දේශීය හා විදේශීය සංවිධාන විසින් ඔවුන්ගේ මූල්‍ය බලය යොදා දේශීය උගතුන් යයි කියා ගන්නා සමහර ඊනියා බුද්ධිමතුන් සමග අගතිගාමී සමහර මාධ්‍යවේදීන් ද යොදා ගනිමින් දෙමළ කොටස්වල පරම හතුරා සිංහල බෞද්ධයාය යන මිත්‍යාව පැතිරීම සාර්ථකව සිදු කරන ලදී. 1977 සිද්ධීන් පිළිබඳව පත්කරන ලද සන්සෝනි කොමිසම් වාර්තාව මේ අරමුණු කරා ජනතාව ගෙනයාමට ත්‍රස්තවාදී කොටස් විසින් ගන්නා ලද උපක්‍රම පිළිබඳ කදිම නිදසුන් ගෙන හැර දක්වා ඇත. ඒ තුළින් සිංහල දෙමළ වෛරය උත්සන්න වීම වැළැක්විය නොහැකි සිද්ධියක් බවට මතය තහවුරු කොට සිංහල දෙමළ සමගිය විනාශ කොට ඇත. අද වන විට මෙම ජන කොටස් දෙක අතර සමගියට බාධා පමුණුවන බලවේග බිඳනු ලැබ සිටින තත්වයක් යටතේ දෙමළ ජනතාව සිංහල ජනතාව සමග පමණක් නොව රජයේ හමුදා සමග ද පවත්වා ගෙන යන ලෙන්ගතුකම් වලින් පැහැදිලි වන්නේ සිංහල දෙමළ ජන කොට්ඨාශ දෙක අතරට තුන්වැනි පාර්ශව කරුවකු විසින් විෂ එන්නත් කිරීමක් නොකරන තාක්කල් මෙම දෙපාර්ශව අතර සමගිය හා සහජීවනය පලදු නොවී අන්‍යොන්‍ය විශ්වාසයෙන් හා සතුටින් එදා මෙන් අදත් සිටිය හැකි

බවය. ඒ සඳහා ඔවුන් දිරිමත් කරවන පොළඹවන බොහෝ සමාන වූ ඥාතිකම් දෙපක්ෂය අතර ඇති බව අවිවාදිතය.

මෑත කාලය තුළ ගැටුම් අතර කිසිදු අවස්ථාවක වචනයේ සැබෑ අරුතින් ජන වාර්ගික ගැටුම් හටගත් බවක් කිව නොහැකිය. එහෙත් විමතියට කරුණක් වනුයේ සිංහල-බෞද්ධ වෛරය වපුරන විශ්ව විද්‍යාලවල ඊනියා ආචාර්යවරුන්ගේ මග පෙන්වීම යටතේ පර්යේෂණ කරන ගෝල පිරිස් ද "ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය වර්ධනය වීමට අවශ්‍ය පසුතලය නිර්මාණ කළ ප්‍රධාන සහකරුවෙක් ලෙස ජනමාධ්‍ය ඉදිරියෙන් සිටියි. එහි දී ප්‍රධාන ස්ථානයක් මුද්‍රිත මාධ්‍යයන්ට හිමිවේ" යයි ද ඍජු ලෙස කියා සිටීමට තරම් අසාධාරණ වීමට හැකි වීමය. ඔවුන්ගේ මතවාදය වනුයේ "සම්මුතිවාදී ඒකාග්‍ර සමාජයක සිට ගැටුම් සමාජයක් දක්වා ශ්‍රී ලංකාව පරිවර්තනය වීමේ දී ජනවාර්ගික ගැටළුව මගින් සිදුකලා වූ බලපෑම සුවිශේෂීය"[37] බවය. එහිදී ද ඔවුන්ගේ චෝදනාව සිංහල බෞද්ධ ශක්තිය දුර්වල නොවීම ගැනය. මෙම ත්‍රස්තවාදයට ශක්තිය සපයන කපටි දේශපාලන නායකයන් විසින් මුළු ලෝකයා හමුවේ මෙරට ජන වාර්ගික අර්බුදයක් ඇතැයි කියමින් සිය පටු දේශපාලන අභිමථාර්ථයන් ඉටුකර ගැනීම සඳහා සියළු කටයුතු කරන්නේ ද සිංහල බහුතරය ජීවත් වන ප්‍රදේශවල කිසිදු හිරිහැරයක් කරදරයක් අත් විඳින්නේ නැතිවම සිංහලයන්ගේ හිතවත්කම්වලින් ආගන්තුක සත්කාරවලින් උපරිම පල නෙලා ගනිමින් බව දන්නේ කීයෙන් කී දෙනෙකු විසින්ද?

මිලේච්ඡ ත්‍රස්තවාදයට හිතකර ලෙසට ජන විඥානය හැඩ ගැස්වීම සඳහා මෙරට ජන සන්නිවේදන මාධ්‍යයන් ගෙන යන ප්‍රචාර නිවැරදි නම් සියළු වාර්ගික කොටස් එකට ජීවත් වන විශාල වශයෙන් දෙමළ ජනතාව කැටි ගැසී සිටින කොළඹ නගරය නිති පතා වාර්ගික ගැටුම්වලින් උණුසුම් විය යුතු නොවේද? යන්න ඔවුන්ට කල්පනා නොවීමට තරම් අන්ධ හා මුග්ධ අන්දමින් ඔවුන් විසින් මාධ්‍ය හසුරුවන බව ප්‍රත්‍යක්ෂ කරුණකි. එහි නිරතුරුව දෙමළ ජනතාව නිදහසේ ගනුදෙනු කරමින් ආගමික වත් පිළිවෙත්වල යෙදෙමින් අධ්‍යාපන කටයුතුවල නිරතවෙමින් ක්‍රියා කිරීමට අවකාශ ලබා ඇත්තේ කෙසේ දැයි කිසිවිට අවබෝධ කොටගෙන නැත.

වටිනා රත්‍රං ආභරණ පැළඳ ගත් සුරූපී දෙමළ තරුණියන් තනියම පොදු ගමනාගමන පහසුකම් උපයෝගී කොට ගනිමින් සිත් සේ ගමන් බිමන් යන්නේ කෙතරම් නිදහස් හැඟීමකින් ද? අනතුරුදායක බවක් පිළිබඳ ඡායාමාත්‍රයක තැකීමක්වත් නැතිවය. දුර බැහැර කෝවිල්වල පූජාදියට සහභාගී වී මහත් ප්‍රබෝධයකින් මොවුන් යන එන අන්දම දිනපතා සුලබ දර්ශනයකි. එහෙත් දෙමළ බහුතරය වෙසෙන ප්‍රදේශවල සිංහලයන්ට තබා දෙමළ වැසියනටද ඒ ආරක්ෂාව හා සුරක්ෂිත බව තිබේද? මෙයින් පැහැදිලි වන්නේ මෙරට ජන වාර්ගික ප්‍රශ්නයක් නැති බවත් ඇත්තේ ත්‍රස්තවාදී ගැටළුවක් පමණක් බවත්මය.

## ත්‍රස්තවාදය පරදින විට මූලික අයිතිවාසිකම් චෝදනා පෙරමුණට

මෙරට බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට හිතවත් සියළු ආකාරයේ මාධ්‍යයන් විසින් රට අස්ථාවර කරමින් ත්‍රස්තවාදීන්ට සහාය ලබාදෙනු වස් නිරන්තරයෙන් අනුගමනය කළ තවත් උපක්‍රමයක් විය. එනම් ත්‍රස්තවාදීන් පහර පිට පහර කමින් පරාජය අභිමුවට පැමිණෙන හැම අවස්ථාවක දී ම රජය හා රජයේ හමුදා අතින් ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බව ඉතා උස් හඬින් ප්‍රචාරය කොට ජනතාව උසි ගැන්වීම මගින් රජයේ අවධානය ත්‍රස්තවාදීන් මර්දනයෙන් වෙනතකට හරවා ගැනීමය. කිරි සප්පයාගේ පටන් මහල්ලා දක්වා ගැබිනි මවුවරුන්, සුපේශලශීලී මහා සංඝයා වහන්සේ ආදී කිසිවෙකු ගැන නොතකා ශ්‍රී මහා බෝධිය, ශ්‍රී දළදා මාලිගාව වැනි ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද පූජනීය වූ වස්තූන් නොසළකා, ආර්ථික මර්මස්ථාන, රෝහල්, පාසැල්, සෙනඟ පිරි ප්‍රවාහන මාධ්‍යයන් කිසිවක් මායිම් නොකොට බෝම්බ ඇටවීමෙන් මරාගෙන මැරෙන මිනිස් බෝම්බ යැවීමෙන් ජීවිත හා දේපළ විනාශ කළ ලේ පිපාසාවෙන් පෙලුන තිරශ්චීන ත්‍රස්තවාදීන් ගේ අයිතිවාසිකම් ගැන මෙම ජනමාධ්‍යයන් කඳුළු හැලූ හැටි අමතක කළ නොහැකිය. එකී ත්‍රස්තවාදීන් මෙල්ල කිරීම සඳහා අවිය හා බලය පාවිච්චි කළ හැම විටම මෙම ඊනියා ජනසංනිවේදනයන්ගේ අනුකම්පාව හිමි වූයේ සාධාරණ ලෙස කටයුතු කරන හමුදාව හට

නොව පිළිකුල් සහගත, අනුකම්පා විරහිත, නින්දිත ත්‍රස්තවාදීන් වෙතමය.

ත්‍රස්තවාදීන්ගේ නැති වූහයි සැළකෙන මූලික අයිතිවාසිකම්, නිදහස, අත්පා ආදි සියල්ල ගැන කතා කළ මෙම සංනිවේදන මාධ්‍යයෝ ඔවුන්ගේ ම්ලේච්ඡත්වය හමුවේ මූලික මිනිස් අයිතිවාසිකම් තබා ජීවිතය ද අහිමි කොට ගැනීමට සිදු වූ නිරායුධ අහිංසක ප්‍රාණකාරයන්ගේ අයිතිය වෙනුවෙන් කිසි විට පෙනී නොසිටියහ. ත්‍රස්තවාදීන්ගේ නැතිවෙනවා යයි කියන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ගැන එසේ විලාප නගන සාමයට ලැදියි කියන මෙම ඊනියා මාධ්‍යවේදීන් සම්මත නීති රීති සියල්ල නොසළකා හැර අනෙක් අයගේ ජීවත්වීමේ අයිතිය පවා පැහැර ගන්නා වූ උන්මත්තකයන් ලෙස කටයුතු කරන්නාවුන් හට හිමි කිසිදු ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකමක් තිබිය හැකි දැයි මොහොතකට හෝ සිතා බලා ඇද්ද? වී. ආනන්ද සංගරී නම් ද්‍රවිඩ නායකයා විසින් ධර්මරත්නම් සිවරාම් නැමති කොටි මාධ්‍යවේදියාගේ මරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකාවේ දෙමළ මාධ්‍ය විසින් භාර ගත යුතු යයි සඳහන් කිරීමෙන් මාධ්‍ය භාවිතයේ බලපෑම් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකිය.[38]

යුද්ධමය වාතාවරණයක් පවතින වටාපිටාවක දී මිනිස් ජීවිත හානිවීම වැළැක්විය නොහැකිය. යථාර්තය එසේ වුවත් නීත්‍යානුකූල රජයකට එරෙහිව නීති විරෝධී ලෙස ආයුධ සන්නද්ධ සුළු පිරිසක් විසින් කැරළි ගසන අවස්ථාවක දී රජය විසින් අනිවාර්යෙන් ඉටු කළ යුතු වගකීමක් වන්නේ කැරලිකරුවන්ට එරෙහිව බලය යොදා හෝ ජනතාව වෙනුවෙන් රට ආරක්ෂා කිරීමය. එවන් අවස්ථාවක දී කැරළි කරුවන්ගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි රජයට චෝදනා කිරීමට තරම් යම් මාධ්‍යයක් මුග්ධ විය හැකිද? එසේ නම් ඒ මාධ්‍ය භාවිතය හැඳින්විය යුත්තේ කෙසේද? නීති විරෝධී ක්‍රියාවල යෙදෙන අපරාධකරුවන්ට හිමි විය යුතු මානව අයිතිවාසිකම් තිබිය හැකි දැයි ඇසීමට තරම්වත් මෙවන් සන්නිවේදකයන්ගේ දැනුවත්භාවය හීන ද? එසේ නම් සිතාමතා දේශ ද්‍රෝහී වෙමින් සදාචාර විරෝධී ලෙස මාධ්‍ය භාවිතය කරන ලදැයි චෝදනා අසාධාරණ ද?

යම් කිසි නායකයෙකු විසින්, නායකයෙකු සතුවිය යුතු ගුණාංගවලින් වියුක්ත නිසාම දේශපාලන බලලෝභිත්වයෙන් මඩින ලදුව කොටිනම් කවදුවත් පරදවනු තබා කොටි සිටින අසළකටවත් යා නොහැකි බව මෙරට දී පමණක් නොව පිටරටවල දී ද උස් හඬින් දෙසා බානු ලැබීම සාධාරණද? ඉන්පසු රටේ ජාතියේ ත්‍රිවිධ හමුදා විසින් කොටියාගේ ගුලටම රිංගා ඔවුන්ගේ ගෙල මුලින්ම අල්ලා ගත් විට "අහ් එහෙනම් දූන් තෙල්මිල බස්සවන්න මං අභියෝග කරනවා" යයි නත් දෙඩවිලි දෙඩීම හරිද? එවන් විටක වගකීමෙන් යුතු, යුතුකම් දන්නා සන්නිවේදන මාධ්‍යයක් විසින් ක්‍රියා කරන්නේ කෙසේද? අපේ පිරිපහදු කරන ලද තෙල් නිධි හෝ ගබඩා කිලිනොච්චියේ ආරක්ෂා කොට තබා ඇතැයි යන අදහසක් ජනතාවට දෙන මෙවන් මුග්ධ දෙඩවිල්ලකට මුල් තැන දෙමින් නැවත නැවත ප්‍රචාරය කොට ජනතාව මුලා කරවීම ඔවුන්ගේ කාර්යය විය නොහැකිය. කලයුතු වන්නේ එවන් නායකයන්ගේ ද්‍රෝහිකම පිළිබඳව ජනතාවට තෝරා බේරා දීමය.

වියරු කොටිම්ලේච්ඡයන් විසින් අහිංසක සිංහල ජනතාව වාසය කළ ගම්බිම්වලට කඩා වැදී ජනයා සමූල ඝාතනය කරමින් ගේ දෙර දේපළ ගිනි බත් කොට විනාශ කර භූමිය අල්ලා ගන්නා විට එවුන්ගේ සැහැසිකම්වලට ඉඩ දී ගේ දොර ගම්බිම් ද උන්ටම බිලි දී ඒ ඒ තැන්වලින් පලා යෑම සඳහා සිංහල ජනතාවට සංඥා නිකුත් කරන සයිරන් නලා බෙදා දෙන ලද ඊනියා "සාම ලැදි" කොටි හිතවාදී දේශපාලකයන්ගේ ද්‍රෝහී ක්‍රියා කලාපයන්ට චරිත සහතික දීම වගකිව යුතු මාධ්‍ය කරුවන්ගේ කාර්යය නොවන බව අමුතුවෙන් කිව යුතු නොවේ කොටින් විසින් ජනතාව යන එන ආගමික ස්ථාන බලෙන් අල්ලාගෙන අවි ආයුධ ගබඩා ලෙස පරිහරණය කරමින් මෙහෙයුම් මධ්‍යස්ථාන ලෙස භාවිතා කරන තාක්කල් නිශ්ශබ්දව සිටි "ආගම" විකුණා කමින් දේශපාලනය කරන එම වංක නායකයන්ම හමුදාව විසින් එකී ස්ථාන කොටින්ගෙන් බේරාගත් සැණින් "දූන් ආගම ඇදහීමට ජනතාවට යන්න ඉඩකඩ අවසර වහා දියව්" යනුවෙන් ප්‍රෝඩාකාරී උද්ඝෝෂණ කරන ලද්දේ ස්ථානය වටා අටවා තිබූ බිම් බෝම්බ අනතුර ද අමතක කරමිනි. කොටින්ට අහිමි වූ දේවල් ගැන හඬන වැලපෙන මෙවන් ද්‍රෝහීන් රටට

ජනතාවට හඳුන්වා දී ඔවුන්ගේ බොරු මුහුණු ගලවා කොටි හිතවාදී සැබෑ ස්වරූපය ප්‍රදර්ශනය කිරීමේ වගකීම දරන මාධ්‍යවේදීන් ඒ වෙනුවට එකී ප්‍රෝඩාකාරයන් වීරයන් කොට දක්වීමෙන් සිදු කරන ලද්දේ ද ත්‍රස්තවාදයට ආවැඩීමක් බව එකී මාධ්‍යකරුවන්ට කියා දිය යුතුව ඇත.

වරක් නීතිය හා සාමය, අභ්‍යන්තර ආරක්ෂාව පිළිබඳ ඉන්දීය ප්‍රාන්ත මහ ඇමතිවරුන්ගේ සමුළුවකට ගිය ඉන්දීය අගමැති "කවර හෝ දේශපාලන එකඟතාවක් ත්‍රස්තවාදය සමග තිබිය යුතු නැති බවත් ත්‍රස්තවාදයට මුහුණදීමේ දී පක්ෂ පාට ආදී සෑම දේශපාලන භේදයන් අමතක කොට එක්ව මුහුණ දිය යුතු බවට කරන ලද ප්‍රකාශය[39] මෙරට බංකොලොත් දේශපාලන නායකයන්ට මතක් කර දිය යුතුය. වීරෝදාර ත්‍රිවිධ හමුදා ජීවිත පරදුවට තබා කොටින්ගේ මර්මස්ථාන වූ කිලිනොච්චිය, අලිමංකඩ වැනි ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා අධිෂ්ඨානශීලී මාරාන්තික ගමනක යෙදෙන විට "අලිමංකඩ කියා පාමංකඩට නැතිනම් කිලිනොච්චිය කියා මැදවච්චියට යනවා" යයි අඳ බාල දේශපාලනඥයන් විසින් අවඥාවෙන් උසුළු විසුළු කරන අවස්ථා උලුප්පා දක්වමින් තම ප්‍රවෘත්ති විකාශයන් තුළින් නිරන්තරයෙන් ප්‍රචාරය දීම සිරසක් නැති කුමන රාජා කෙනෙකුගේ නාලිකාවට පුළුවන් වුව ද රටක් ජාතියක් කෙරෙහි සැබෑ ආදරයක් වගකීමක් ඇති සන්නිවේදන මාධ්‍යයකට නම් කළ නොහැකිය. එහෙත් විදේශීය වූ විජාතික වූ ලොකු පොඩි ව්‍යාපාරික රාජාලා වෙනුවෙන් කත් අදින ලේබල් කාර මාධ්‍ය වේදීන්ගේ එවන් මෙමෙහෙවරක් බලාපොරොත්තු වීම නිෂ්පලය.

## ත්‍රස්ත හිතවාදීන් සියලු දෙනාගේ පොදු ලක්ෂණ

බෙදුම්වාදී ත්‍රස්තවාදයට දැන හෝ නොදැන සේවය කරන ජනසන්නිවේදන මාධ්‍යයේ නිරත මෙන්ම ඒවා හරහා බෙදුම්වාදයට උත්තේජන සලසන උගතුන්, කලාකරුවන්, මාධ්‍ය කරුවන් යයි කියා ගන්නා දේශද්‍රෝහිකම්වල යෙදෙන හැම කෙනෙකුම පාහේ එක් විශේෂ පොදු ලක්ෂණයකින් හෙබි අය වෙති. ඔවුන් හැම අයකුම එක්කෝ විදේශීය දේශපාලන මතවාද කරපින්නා ගත් නමුදු ඒවා තම දේශයට පරිසරයට ගැලපෙන ලෙස සකසා ගැනීමට නොහැකි

වූ ඊනියා ජාත්‍යන්තරවාදීහු වෙති. නැතිනම් වර්තමාන සදාචාර සීමාවන් ද ඉක්මවා ගිය සංකල්ප අනුව උන්මත්තක චින්තනයන් අනුගමනය කරන අන් කිසිවෙකු නොදන්නා පශ්චාත් නූතන වාදීහු වෙති. එසේත් නැතිනම් සිංහලකම බෞද්ධකම නයාට අඳු කොළ මෙන් සළකා ඒවා විනාශ කිරීමට සපත කොට ගත් හොර රහසේ පොල් ගෙඩිය, චිත්ත රෙද්ද, සබන් කැටය ඔස්සේ විදේශීය මූලධර්මවාදී ආගමික මතවාද පතුරුවා හරින්නෝ වෙති. නැතිනම් අන්තවාදී දේශපාලනයේ යෙදී අසාර්ථක කැරළි මගින් විදේශීය ස්වාමිවරුන්ට සේවය කිරීමට ගොස් හිරබත් කා පසුව බටහිර අධිරාජ්‍යවාදීන්ගේ අනුකම්පාව, වරප්‍රසාද සමග උපාධි ලැබ දූන් ඔවුන්ට බැල මෙහෙවර කරන අය වෙති. එසේ නොවේ නම් නිසැක වශයෙන් අධිරාජ්‍යවාදී විදේශීය ස්වාමිවරුන්ගෙන් ලබන ඩොලර්, පවුම්, ප්‍රෑන්ක්, ඩොයිෂ්, මාර්ක් ආදී කොටගත් ප්‍රදානයන් මත යැපෙන්නෝ වෙති.[40] එසේත් නොවේ නම් දවල් මිගෙල් රෑ දනියෙල් චරිත රඟ දක්වමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාර මෙහෙයවමින් මාධ්‍ය නිදහස වෙනුවෙන් ලබාදෙන කෝටි ගණන් ආධාර මුදල් ද ගසා කමින් විදේශීය ස්වාමිවරුන්ගේ වැටුපට සේවය කරන තක්කඩියෝ වෙති. මේ හැම දෙනාටම මෙරට තුළ ඕනෑම වංචාවක්, දූෂණයක්, අපරාධයක් සිදු කොට සුවසේ රටින් පැන ගොස් සුර සැප විඳීමට පහසුකම් සපයන දේශපාලන රැකවරණය ලබාදෙන ස්වාමිවරු බටහිර දිග රටවල එමට සිටිති. දෙපිරිසේ ඥාති සම්බන්ධකම පිළිබඳ කදිම සාක්ෂිය ද එයම වේ.

ඒ සියළු දෙනාම සමග පෑහෙන පිරිසක් ද වේ. ජනතා හිතවාදී සමාජවාදී අරමුණු පෙරටු කොට ගෙන රාජ්‍ය පාලනය ගෙන යන ජනතා රජයන් පෙරළා දමා තම ව්‍යාපාරික කටයුතු ජයග්‍රහණය කරවීමත් සිංහල විරෝධී ස්ථාවරය ශක්තිමත් කිරීමත් රටක් ජාතියක් අස්ථාවර කිරීමත් ආදී ඉලක්ක සපුරා ගැනීමට ඕනෑම පහත් වැඩක් කිරීමට සපත කොටගත් ජාතිද්‍රෝහී දේශීය මෙන්ම විදේශීය ආත්මාර්ථකාමීහු වෙති. මොවුන් දැන හෝ නොදැන ලොව ප්‍රබල අවි ජාවාරම් කරුවන්ගේ අන්තර්ජාලයේ වැදගත් මෙහෙවරක් ඉටුකරන, ඔවුන්ගේ සුවච කීකරු සේවකයෝ වෙති. ඔවුන්ගේ සහායට හා ඔවුන්ට අවශ්‍ය කරන මතවාද තර්ක විතර්ක සියල්ල සපයා දීමට ඉහත කී ස්වාමිවරුන්ගේ මුදලින් යැපෙන ඊනියා ආචාර්යවරුන්,

අන් කිසිවක් කළ නොහැකි වුව ද මෙවන් ඔත්තු සේවාවල අති දක්ෂයන් ලෙස වැජඹෙන පිරිස් ද විශ්වවිද්‍යාලවල එමට ඇත. නිරන්තරයෙන්ම අදාළ ජන සන්නිවේදන මාධ්‍යවේදීන්ගේ මාධ්‍යයන් හරහා අවර ගණයේ ලිපි, සම්මුඛ සාකච්ඡා, දේශන, තීරු ලිපි, විශ්ලේෂණ, මත ප්‍රකාශ කිරීම් ආදී සියල්ල නමින් හෝ ආරූඪ නම්වලින් සපයනු ලබන්නේ මෙම එකම කල්ලියේ පිරිස් බව වටහා ගැනීම අපහසු නොවනු ඇත. තමා රටේ පාලනයට, අධිකරණයට තබා දෙවියන් වහන්සේට වත් පාලනය කළ නොහැකි මහා තෙද බල සහිත ඇස් තුනක් ඇති අය ලෙස වහසි බස් දොඩවන ටියුෂන් කඩකාර සන්නස් නැති ගල් වැනි "පොට්ට" කලාකරු කල්ලි අයත් වන්නේ ද මොවුන්ගේ ගණයට ම ය.

වර්ෂ 2009 මැයි මස 18 ද අත්පත් කර ගත් විශ්මිත ජාතික විජයග්‍රහණය නොවන්නට ශ්‍රී ලංකාව ද කැබලි කීයකට කැඩී බිඳී යන්නට අධිරාජ්‍යවාදීන් විසින් සැලසුම් කර තිබුණේ ද යන්න දූන්වත් මොවුන් විසින් විමසා බැලිය යුතුව ඇත. මෙකී කුමන්ත්‍රණ අවසානයේ දී දෙමළ ත්‍රස්තවාදය හිණි පෙත්තටම නංවා තැබුවාට පසු එද හනුමා ලංකා පුරය ගිණි ජාලාවක් කලා සේම දෙමළ ත්‍රස්තවාදීන් විසින් ශ්‍රී ලංකාවම අවුල් ජාලයක් බවට පත් කරනු ලැබීමට වගබලා ගත් අන්දම දූන් කා හටත් පැහැදිලිය. එද බෝම්බ පුපුරන්නේ නැති දවසක් නොවීය. සිය ගණනින් මිනිසුන් මරා නොදමන ලද දිනයක් නොවීය. ඒ සියළු උපක්‍රම මගින් උදවූ ඛෝර දිලයේ මාළු බාන්නට අධිරාජ්‍යවාදීන් මාන බැලූ හැටි කාටවත් රහසක් නොවේ. සමහරුන්ට අපේ ඛණිජ නිධි ගසා කෑමේ අවශ්‍යතාවය විය. සමහරුන්ට අපේ වරායන් අවශ්‍ය විය, තවත් අයට අපේ ස්වභාවික වාණිජ සම්පත් අවශ්‍ය විය. ඒ සියළු අරමුණු වසාගෙන යුද්ධයක් අවුලවා එහි බේරුම්කරු ලෙස ඉදිරිපත්වීමට අධිරාජ්‍යවාදී රටවල් අතර පොර කෑම ද අන්තිමේ දක්නට හැකිවිය. රාජ්‍ය මට්ටමින් නොවුන ද විවිධ රාජ්‍ය නොවන සංවිධාන මගින් ද ඔවුනොවුන්ගේ සමාජ සේවා ආයතන මගින් ද හොර රහසේම ත්‍රස්තවාදීන්ට ලබා දී ඇති මුදල්, අවි ආයුධ වෙනත් සේවා මෙතෙකැයි කියා නිම කළ නොහැකි බව මානුෂීය මෙහෙයුමෙන් පසු කරන ලද පරීක්ෂණවලින් සොයා ගන්නා ලද තොරතුරු හා අවි ආයුධ තොගවලින් පෙනී යයි.

යම් හෙයකින් ඔවුන්ගේ කුමන්ත්‍රණ උපක්‍රම මගින් යුද්ධයක් නිර්මාණය කිරීම සාර්ථක වූයේ නම් සටන් විරාම ගිවිසුමෙන් පිළිගත් පරිදි ඊළාම රාජ්‍යය පිහිට වූයේ නම් සිංහල ජාතිය සතු වූ එකම මාතෘ භූමිය වූ මේ කුඩා දිවයින කෑබලි කීයකට නම් කැඩෙන්නට තිබිණද? එහි කෙතරම් නම් ස්වාධීන රාජ්‍ය බිහිවන්නට තිබිණිද? ඊළම, නසරිස්තානය, මලයනාඩුව ස්ථිර ලෙසම පිහිට වන්නට ඉඩ තිබූ හෙයින් සිංහලයාට ඉතිරිවන්නට තිබුණේ මහ මුහුද පමණි. කෙටියෙන්ම කිවහොත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් සේනාධිනායකයා වශයෙන් නිවැරදිව එඩිතරව නායකත්වය ලබා දෙමින් මේ සිදුකොට ඇත්තේ සරළ සටනක් නොවේ. ලෝක යුද්ධයකි. මුළු ලෝකයම තමාගේ විජිතය යයි සැළකූ අමෙරිකාව ප්‍රධාන බටහිර ලෝකය හා ඔවුන්ගේ කීකරු අතවැස්සන් විසින් ශ්‍රී ලංකාවට එරෙහිව ඇතුලතින් හා පිටතින් විවිධ බලවේග මෙහෙයවමින් කරන ලද්දේ මහා පරිමාණ යුද්ධයකි. මේ කුඩා දිවයින් රාජ්‍යය විසින් එම යුද්ධය දිනා ගන්නා ලදැයි සැනසීමට හැකි තරම් පින්වත් බවක් අප විසින් ද ලබා ඇත. එවන් දැවැන්ත සත්‍යයක් පවා මෙම ඊනියා මධ්‍යස්ථ මාධ්‍ය කරුවන්ට දැක ගැනීමටවත් අවබෝධ කොට ගැනීමටවත් පිනක් නොතිබීම ඔවුන්ගේ පාපතර භාවිතයේ කරම කියාපාන්නකි.

ත්‍රස්ත හිතවාදීන් විසින් සන්නිවේදන මාධ්‍යය භාවිතා කළ අන්දමින් ජන විඥනය හැඩගැස්වීමෙහිලා කරන ලද බලපෑම්වල ප්‍රමාණය මැන ගැනීමටත් ඒ හරහා සිදු වන්නට ගොස් වැළකී ගිය මහා විනාශකාරි තත්වය වටහා ගන්නටත් මේ සියල්ල මගින් ඉඩ සැලසෙනු ඇත. කුණුරුවන්ට පූජා කරන ලද පින්බිමක් වූයෙන් මෙවර ද අපේ මාතෘභූමිය ආරක්ෂා වී යයි අපට සැනසිය හැකිය. එහෙයින් වැළකී ගිය විනාශය ගැන සිතා සැනසුම් සුසුමක් හෙළන සැමගේ ඊළඟ බරපතළ වගකීම වනු ඇත්තේ දිනාගත් නිදහස තහවුරු කිරීමට නොමසුරුව කැපකිරීම් සඳහා සූදනම් වීමය. යථාර්තය අවබෝධ කොටගත නොහැකිව තවමත් සක්‍රීයව ඇති ජාතියේ විරුද්ධවාදීන්ගේ දුෂ්ඨ එදිරිවාදිකම් අස්සේ ඇසෙන අයිතිවාසිකම්, නිදහස, සහන ආදී වූ කෙඳිරිලි ලජ්ජාව වසා ගත නොහැකි වූ ද්‍රෝහීන්ගේ මායාවන් ලෙස ඇස්බැන්දුම් සේ සළකා රටේ ආරක්ෂාව

දිනාගත් පරිදිම පළමුව අනාගතය සඳහා රටේ සාමය හා ආර්ථිකය ශක්තිමත් කළ යුතුය. අපේම වූ කලාවත් ඔස්සේ බිඳී ගිය හදවත් සුවපත් කොට අන්‍යෝන්‍ය විශ්වාසය වර්ධනය කොට ජාතික සමගිය වර්ධනය කළ යුතුය. හැම බිම් අඟලක්ම වගා කොට දේශීය ආර්ථිකය ශක්තිමත් ලෙස සංවර්ධනය කොට අනුන්ට අත පෑමේ දීන ගතියෙන් ඈත් විය යුතුය.

අයිතිවාසිකම් වෙනුවට යුතුකම් හා වගකීම්වලට මුල් තැන දිය යුතුය. රටෙන් අපට නොව අපෙන් රටට සිදුවූ මෙහෙවර කුමක්දැයි අසමින් කළයුතු මෙහෙවර කරමින් උපත් බිමට ඇති සඳ ණය ගැති බවින් මිදීමට ශක්ති පමණින් සේවය කොට සැනසිය යුතුය. ඒ සියල්ල කළ හැකි නම් ජාතියේ ද්‍රෝහීන්ට දේශයේ සතුරන්ට දිය හැකි හොඳම පිළිතුර එය වේ. උතුරේ එල්.ටී.ටී.ඊ නමින් හැඳින් වූ රුදුරු ත්‍රස්තවාදීන් ද ඔවුනට සියළු බැල මෙහෙවරවල යෙදුන මාධ්‍යවේදීන්, කලාකරුවන්, උගතුන් ආදී නම්වලින් හඳුන්වා ගත් බෙදුම්වාදී ත්‍රස්තවාදයේ ඒජන්තවරුන් සියළු දෙනා ද දැන හෝ නොදැන මෙතෙක් දරදිය ඇද ඇත්තේ නව යටත් විජිතවාදයේ ස්වාමිවරුන්ගේ සැඟවුන අරමුණු ඉෂ්ඨ කරගැනීමට බව මනාව තේරුම් ගත යුතුය. ඒ සියළු දෙනාගේ උත්සහායන් සුණු විසුණු කර දමා වීරෝධාර රණවිරුවන් ජීවිත පූජාවෙන් රැක දුන් රටත් ජාතියත් සුරක්ෂිත ලෙස සංවර්ධනය කරා ගෙන යාමේ ඒකායන මාර්ගය වැටී ඇත්තේ සතුරා නිවැරදිව හඳුනාගෙන අපෙන් ඉටුවිය යුතු යුතුකම් කොටස ඉටු කිරීම තුළින් පමණි. කලා ලොවේ සියළු දෙනාගේ පරම වගකීම වන්නේ සියළු හදවත් සැනසීමේ බලය හිමි කලා මාධ්‍යය හරහා රටට ජාතියට සුවය ගෙනෙන පරිදි කලා ක්ෂේත්‍රය මෙහෙය වීමය. ජාතියේ සමගියට සහජීවනයට පෙරමුණ ගත යුත්තේ සැබෑවටම රටට ජාතියට අපේකමට ආදරය කරන සංවේදී වූ අපේම කලා කරුවන්මය.

ත්‍රස්තවාදයට හිතකර ලෙස ජන විඥනය සැකසීම වෙනුවෙන් මෙරට ජන සන්නිවේදන මාධ්‍යයන් මේසා දැඩි උත්සහායක් හා කැපවීමක් ගෙන ඇත්තේ මෙම මාධ්‍යයන් මෙහෙයවන ලද අදෘශ්‍යමාන පිරිස්වල අභිමථාර්ථයන් ඉටුකර ගැනීම

පහසු කරවීමට උචිත පරිදි ජන විඥානය සැකසීමේ වගකීම මොවුන්ට භාර වී තිබීම නිසා බව දුන් ප්‍රත්‍යක්ෂ වනු ඇත. සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ ත්‍රස්තවාදීන්ගේ අභිමථාර්තය වෙනම රාජ්‍යයක් බිහි කොට දීම යයි මතුපිටට පෙන්වූව ද සැබෑම අරමුණු වී ඇත්තේ මේ රට කුඩා කැබලිවලට කඩා විසුරුවා දමා නව යටත් විජිතවාදයේ පහසු ගොදුරක් බවට පත් කිරීම බව නිසැකය. එමගින් වසර 450 ක් තිස්සේ අධිරාජ්‍යවාදීන්ට ඉටු කර ගත නොහැකි වූ කාර්යය එනම් අභිමානවත් ආදර්ශමත් සිංහල බෞද්ධ සමාජය මිහිපිටින් තුරන් කරවීමේ කාර්යය ඉටු කර ගැනීමය. මේ සියල්ල සිදු කරනු ලබන්නේ කාගේ වුවමනාවකට දැයි සොයා බැලීමේ දී කරළියේ රඟ දක්වෙන රූකඩයන් ස්වයංක්‍රීය ඒවා නොවන බව පෙනෙන අපට ඒවා නටවන නූල් සූත්තර ක්‍රියාත්මක කරන සැබෑ නළුවන් සෙවීමට යම් පමණක මහන්සියක් ගත යුතු වනු ඇත. මෙරට බෙදුම්වාදී ත්‍රස්තවාදීන් ලෙස හැසිරෙන දේශපාලන බලලෝභයෙන් පිස්සු වැටී විකාර කරන කියන ත්‍රස්ත හිතවත් සියළු දෙනා රූකඩ නැටුමේ නළුවන් හා පිටපත්, දෙබස්, ගීත, සංගීත රචකයන් පමණි. ඇඳුම් ආයිත්තම් සකසන, පසුතල නිර්මාණ කරන්නන් පමණි. ඒ හැම කාර්යයක් සඳහාම ඉතා ඉහළ මිලක් ගෙවනු ලබයි. එහෙත් සැබෑවටම රූකඩ නටවන්නේ බටහිර දිග නව යටත් විජිත වාදයට පාවාඩ එළන පැරණි අධිරාජ්‍යවාදීන්මය.

එද අධිරාජ්‍ය ගොඩනගා ගෙන යටත් විජිතයන් සූරා කෑමෙන් තම රට රාජ්‍යවල් සශ්‍රීක කොටගෙන සුර සැප වින්ද, මොවුනට අද ඒ සියල්ල හමාර වූ තැන උරුම වී ඇත්තේ විනාශය පමණි. එකී විනාශයෙන් ගොඩ ඒමට නම් නිදහස ලබා තම තමන්ගේ නිෂ්පාදන ශක්තිය වැඩිදියුණු කොටගෙන බොහෝ දුරට ස්වයං පෝෂිතව සිටින එද යටත් විජිත ලෙස තිබූ රාජ්‍යවල ස්ථාවරත්වය විනාශ කළ යුතුය. ඒ සඳහා භේද භින්නතාවය පැතිරිය යුතුය. තමන්ගේ ආගමික, දේශපාලන, ආර්ථික ආදී වශයෙන් වූ මතවාද පැලපදියම් කළ යුතුය. ආයුධ සංස්කෘතිය ප්‍රචලිත කොට පාතාල ලෝක ශක්තිමත් කළ යුතුය. බාලාපචාර, කාන්තා හිංසනය, මිනී මැරුම් ආදිය ප්‍රචලිත වීමෙන් සමාජය විසංවිධාන කළ යුතුය. යටත් විජිත වාදය ලොව පුරා පැතිරවීමේ ක්‍රමවේදය මේ අයුරින් ක්‍රියාත්මක කිරීමේ දී දේශීය

උගතුන්, දේශපාලනඥයන්, කලාකරුවන්, මාධ්‍යවේදීන් ඇතුළු පිරිස් පමණක් නොව කොටි ත්‍රස්තවාදීන් ද තමාගේ කුලීකරුවන් ලෙස යොදා ගැනේ. අද ශ්‍රී ලංකාව තුළ රඟ දක්වෙන්නේ මෙම නව යටත් විජිත වාදයේ මහා බේදවාචකය නම් රූකඩ නාට්‍යය වේ. බටහිර මාධ්‍යය විසින් මෙම රඟපෑම කොතරම් දක්ෂ ලෙස කරනු ලැබුවේද යත් "බටහිර මාධ්‍ය කුමන්ත්‍රණ බිඳ වැටීම" මැයෙන් 2009 ජූනි 2 වැනි දින දිවයිනට (පි. 11) සැපයූ ලිපියක පෙන්වා දී ඇති පරිදි එල්.ටී.ටී.ඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් සහ සෙසු නායකයන් අවසාන මොහොතේ පවා සියලු උපක්‍රම යොදා බේරා ගැනීමට බටහිර මාධ්‍ය නොගත් උත්සහායක් නැත. ඔවුන් යුද මුක්ත කලාපයේ කොටු වූ අවස්ථාවේ දී අල් ජසීරා (AL Jaseera), BBC, CNN මාධ්‍ය ආයතන අඛණ්ඩව හුවා දැක්වූයේ සිවිල් වැසියන් දහස් ගණනින් මරා දමන බව හා ශ්‍රී ලංකා හමුදාව විසින් යුද අපරාධ සිදුකරන බවයි. පසුගිය (2009) මැයි 10 ද සිට මෙම සේවා ඔස්සේ පළ වූ පුවත් හා විශේෂාංග මෙයට කදිම නිදසුනක් වේ" යයි එහි සඳහන් කරයි.

එහෙයින් ජීවිත පරිත්‍යාගයෙන් රැකගත් රට හා එහි නිදහස සුරක්ෂිත කොටගත යුතු ආකාරය ගැන දේශප්‍රේමීන්ට කිසි වාද භේද තිබිය නොහැකිය. යථාර්තය තේරුම් ගෙන සියළු දෙනා එක මිටියට සිට ගත යුතුය. සිතිය යුතුය. වැඩ කළ යුතුය. රට වෙනුවෙන් අප සතු කාර්ය භාරය එයයි. සාපලත් තිස් අවුරුදු විනාශයෙන් ගොඩ ඒමට ඇති එකම මග එයයි. එම අඳුරු යුගය තුළ වැළලී ගොස් තිබූ කලා ක්ෂේත්‍රය නව පන ගන්වමින් ක්‍රියාත්මක කිරීම දැහිතකාමී කලා කරුවන්ගේ අනුලංඝනීය වගකීමක් ලෙස සළකමු. මන්ද යත් ආනන්දයෙන් පටන් ගෙන ප්‍රඥව කරා ජනතාව ගෙන යන කලාකරුවා තරම් බිඳුණ සිත් සනසන්නට දුරස්ථ වූ දිවි එකට ගැට ගසන්නට කඳුළු පුරවා ගත් මුහුණ සිනහවෙන් සරසන්නට හැකි සංවේදී ගුණයෙන් යුත් වෙනත් පිරිසක් නොමැති බැවිනි. එහෙයින් සාහිත්‍ය නිර්මාණ, නාට්‍ය නිර්මාණ, සංගීත නිර්මාණ, නර්තන නිර්මාණ, චිත්‍ර හා මූර්ති, චිත්‍රපට හා රූපවාහිනී නිර්මාණ ආදී වශයෙන් කී නොකී හැම කලා මාධ්‍යයක් ම එල්ල කළ යුතු වන්නේ බිඳුන හදවත් සුවපත් කොට වෛර සිතුවිලි ආදර සිතුවිලි බවට පත් කොට සමගිය සහජීවනය හැමගේ නොවරදින පොදු මග

බවට පත් කොට එකම හෙළ ජාතියක් ලෙස සිතන්නට ක්‍රියාකරන්නට හැසිරෙන්නට හුරු කරවීම සඳහාය. අතීතයේ සිට අපේ වීරෝධාර මුතුන් මිත්තන්ගෙන් උරුම කොට ගෙන පරම්පරාවෙන් පරම්පරාවට දායාද කොට දෙන ලද අපේ වටිනාම සම්පත එය බව සඳ සිහි කරමු.

# පාදක සටහන්

1. ශ්‍රී ලංකාවේ සිංහල්, ද්‍රවිඩ ගැටුම ඉතිහාසය පුරා තිබුණ අතර යටත් විජිත යුගය තුළ එය ප්‍රදර්ශනය නොවූයේ දෙපිරිසටම බලය අහිමි වීම නිසා බව ඇතැම් අය විසින් (ජනවාර්ගික ගැටලුව තුළ මුද්‍රිත මාධ්‍යයේ හැසිරීම - අමුද්‍රිතයි පි. 16-17) කියා ඇතත් අධිරාජ්‍යවාදීන්ගේ "බෙදා පාලනය කිරීම" රාජ්‍ය පාලනයට යොදා ගත්තා තුරු කිසි විට ලංකා ඉතිහාසයේ එවැන්නක් තිබී නැති බව රටේ ඉතිහාසය නිවැරදිව නිරවුල්ව දන්නා අය දනිති.
2. Constitutional Manoeures of Separatist Forces. Manohara R. de Silva 2009.Chapter 1.
3. දිවයින - 2009 ජූනි 02 දා පි. 10.
4. රට සිරකළ සටන් විරාම උගුල, චතුර පමුණුව, සරසවි ප්‍රකාශකයෝ, 2009.
5. "ජනවාර්ගික ගැටලුව තුළ මුද්‍රිත මාධ්‍යයේ හැසිරීම" නමින් අවසන් වසර විභාගය 1998/99 සඳහා ඉදිරිපත් කොට ඇති නිබන්ධනයේ (අමුද්‍රිත) සඳහන් ජනවාර්ගික ගැටලුව" යන්නෙන් සිට ඇති යෙදුම කිසි ලෙසකින් හෝ සාධාරණීයකරණය කළ හැකිදැයි සැක සිතෙන යෙදුම් වීම ඛේදවාචකයකි. එම නිබන්ධනය සිංහල බෞද්ධ දේශප්‍රේමය විත්ති කූඩුවට නංවා රට, දය සාමයට එරෙහි වූවන්ගේ චෝදනා පත්‍රයකට උත්තර ලබා ගැනීමට ගන්නා ලද උත්සහායක ප්‍රතිපලය හා සමානය.
6. රූපවාහිනී සමීක්ෂා, දෙවන කලාපය, 2008. පි. 73.
7. රූපවාහිනී සමීක්ෂා, දෙවන කලාපය, 2008. පි. 78.
8. ආචාර්ය උෂා වයාසූලී රෙඩ්ඩි. රූපවාහිනී සමීක්ෂා තෙවන කලාපය. 2009. පි. 131.
9. Sociology in Focus Jaylor. Richardson, Yeo. March. Trobe. Pikcington 1933.
10. - එම -
11. Usually understood as news papers, magazines, Cinema, television, radio and advertising, sometime including book publishing (especially) popular fiction and music (Hartly 1994)

12. රූපවාහිනී සමීක්ෂා දෙවන කලාපය 2008. 131.
13. රූපවාහිනී සමීක්ෂා දෙවන කලාපය 2008. 135
14. රූපවාහිනී සමීක්ෂා දෙවන කලාපය 2008. 135
15. රට සිරකළ සටන් විරාම උගුල. 142 පි.
16. ලංකාවේ පුවත්පත් මෙල්ල කිරීම. ගුණදාස ලියනගේ. පි 1,2 හා 6
17. - එම - පි. 4 හා 6.
18. ලක්බිම 2009.05.17. පි. 07.
19. දිවයින. 2009 මැයි 23 ද
20. ජනවාර්ගික ගැටලුව තුළ මුද්‍රිත මාධ්‍යය හැසිරීම. පි. 62.
21. දිවයින 2009.05.12. පි. 09.
22. - එම - පි. 09.
23. රූපවාහිනී සමීක්ෂා, දෙවන කලාපය, පි. 135.
24. The People of Ceylon N.D. Wijesekara. පි. 54.
25. Untold Story of Ancient Tamils in Sri Lanka.
26. Untold Story of Ancient Tamils in Sri Lanka. P. 37.
27. දෙමළ ජනතාවගේ සංක්ෂිප්ත ඉතිහාසය. චන්න සුදත් ජයසුමන. පි. 6.
28. සංක්ෂිප්ත ලංකා ඉතිහාසය. දෙවන පරිච්ඡේදය.
29. Mahawansa Edited by Ananda W.P. Guruge P. 34 - Verses 49-50 in Chapter 7.
30. යාපා පටුන හා සිංහල උරුමය. ඊ.ඩී. කන්නන්ගර.
31. Inscriptions of Ceylon. I. S. Paranavithana.
31. මහාචාර්ය කාතිගේසු ඉන්ද්‍රපාලන්
32. දිවයින. 2009. ජූනි 5. පි. 14.
33. දිවයින. 2009 ජූනි 02. පි. 10.
34 ලක්බිම. 2009 ජූනි 07. පි. 19. මායිම් ගම්මාන වැසියන් ප්‍රභාකරන්ගේ මරණය ගැන කියන කථා.
35. ජනවාර්ගික ගැටලුව තුළ මුද්‍රිත මාධ්‍යයේ හැසිරීම. පි. 16.
36. - එම -
37. රට සිරකළ සටන් විරාමය. පි. 143.
38. - එම - පි. 156.
39. දිවයින. 2009 ජූනි 02. කර්තෘ වාක්‍යය. පි. 10.

# ආශ්‍රිත ග්‍රන්ථ

1. ඊ.ඊ. කන්නන්ගර. යාපා පටුන හා සිංහල උරුමය. 1990.
2. ආචාර්ය සූරිය ගුණසේකර. මහා සිංහලේ ඓතිහාසික අසාධාරණය. 2009.
3. මහාචාර්ය නලින් ද සිල්වා. බුදු දහම පාවාදීම - දේශප්‍රේමී පෙරමුණ ප්‍රකාශනයකි. 1993 දෙසැ. (මහාචාර්ය ස්ටැන්ලි ජේ. තම්බයියා මහතා විසින් 1990 ලියා 1992 දී පළකර ඇති බුද්ධාගම පාවා දෙයි? යන පොතට පිළිතුරකි.
4. සී.ඩබ්. නිකොලස් ඇස් පරණවිතාන. සංක්ෂිප්ත ලංකා ඉතිහාසය. සිංහල පරිවර්තනය 2004.
5. ජනවාර්ගික ගැටලුව තුළ මුද්‍රිත මාධ්‍යයේ හැසිරීම. අමුද්‍රිතය. පේරාදෙණිය විශ්වවිද්‍යාල නිබන්ධනයකි. 1998/99
6. චන්න සුදත් ජයසුමන. දෙමළ ජනතාවගේ සංක්ෂිප්ත ඉතිහාසය. නුගේගොඩ 2009.
7. චතුර පමුණුව. රව සිරකළ සටන් විරාම උගුල. සරසවි ප්‍රකාශකයෝ 2006.
8. පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි. නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය. දයාවංශ ජයකොඩි. 2003.
9. ගුණදාස ලියනගේ. ලංකාවේ පුවත්පත් මෙල්ලකිරීම. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ 1993.
10. කේ.එච්.ජේ. විජයදාස. සිංහල ජාතිය පාවාදීම දයාවංශ ජයකොඩි සහ සමාගම 2005.
11. රූපවාහිනී සමීක්ෂා, දෙවන කලාපය 2008. තෙවන කලාපය. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 2009.
12. රූපවාහිනී සමීක්ෂා, තෙවන කලාපය. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 2009.
13. ලංකාවේ නැගෙනහිර පළාත මඩකලපුව දිස්ත්‍රික්කයේ වෘත්තාන්තය. එස්.ඕ. කනගරත්නම්. සිංහල පරිවර්තන. වයි.ඩබ්. ගුණවර්ධන. 2008.

A. K.M. de Silva. The Traditional Homeland of the tamils.

B. Constritution Manoeuvres of Separatist Form. Manohara R. de Silva 2009.

C. Ananda W.P. Guruge. Mahavamsa - The Great Chronicle of Sri Lanka. 1989.

D. The Untold Story of Ancient Tamils in Sri Lanka - Chelvadurai Manogaran. Kumaran Publishers. Chennai. 2000.

E. The people Ceylon. N.D. Wijesekara. M.D. Guunasena 1949

# යුද බංකර්වලින් ගලාහැළෙන කලා රසය - බංකර් කුරුටු ගී

මේජර් ජෙනරාල් ප්‍රසාද් සමරසිංහ

ජීවිතයේ දී මුහුණදුන් කාන්සිය, මහන්සිය, පාලුව, තනිකම මකා ගන්නට පැරැන්නෝ කවි ගායනා කළහ. හේනේ පැලේ දී, කෙතේ දී, කමතේ දී එදා ඔවුන් ගේ මුවින් නික්මුණු කවි වලට ඔවුන්ගේ චිත්ත සන්තානයේ හටගත් දුක, සතුට,ප්‍රේමය වැනි නිර්ව්‍යාජ සිතිවිලි පාදක විය. ඒ තුළින් ඔවුන්ගේ ජීවිතවල විවිධ පැතිකඩයන් අනාවරණය විය. වරෙක සිතතුළ උතුරා යන ප්‍රේමය සේම, සිත් මඬලෙන් නැඟුන බිහිසුනු කෝප අග්නිය ද, වෙඬරු පිඬක් සේ සියොළඟ දවාලන දුක්ඛ දෝමනස්නයන් ආදී විවිධාකාර වූ මානව හැඟුම් සමුදායන් ද එදා ඔවුන් විසින් කවියට පෙරළන ලදී. ඒ තුළින් ශ්‍රී ලාංකික අපටම අනන්‍යය වූ ප්‍රබල ජන සාහිත්‍යයක් උරුම විණ. එනමුදු දශක තුනක් වැනි දීර්ඝ කාලයක් මුළුල්ලේ රටේ අභ්‍යන්තර සිවිල් යුද්ධයක හැඩගත් අර්බුදයක් තිබුණ ද ලාංකික අප අතින් ප්‍රබල යුද සාහිත්‍යයක් බිහිවී නැත. ත්‍රස්තවාදය සමඟින් ගෙවුනු ඒ අඳුරු යුගය තුළ රණවිරුවන් අතින් බංකරේ ලියැවුනු කුරුටු ගී කිහිපයක් පමණක් අදටත් අප අත ඉතිරිව පවතී. ඒවා ද ගැටුම් පැවති ප්‍රදේශවල ජනජීවිතය යථාතත්ත්වයට පත්කරලීමේ කාර්යභාරය තුළ ක්‍රම ක්‍රමයෙන් විනාශව යමින් පවතී.

යුද බංකර් තනාන්නට යොදා ගැනෙන තල් කොටන්, වැලි උර ආදිය මත ලියැවුනු අපේම රණවිරුවන්ගේ සිතුවිලි, වැකි, කාව්‍ය අප සතු තවත් එක් උප සාහිත්‍යයක් වැනිය. කාකි නිළඇඳුම හා ගිනි අවිය අත දරාගනිමින් අව්, වැසි වලින්, මැසි මදුරුවන්ගෙන් පීඩා විඳිමින් රණවිරුවන් ගෙවූ ඒ දුෂ්කර ජීවිතය හා බැඳුනු සංකල්පනා

බංකර් සටහන් වලට පාදක වී තිබේ. ඒ නිසාම බංකර් කාව්‍යය තුළින් විවරණය වන්නේ රණවිරුවන්ගේ සැබෑ ජීවිතය නොවේයැයි කිසිවෙකුට හෝ තර්ක කළ නොහැකිය. රණවිරුවෝ ද මනුෂ්‍යත්වය රැඳි ඇස් - ඉස් - මස් වලින් නිර්මිත මිනිසුන් වෙති. ඒ මනුෂ්‍යත්වය අත් අය අතුරින් සුවිශේෂී වන්නේ දේශය වෙනුවෙන් උපන් දේශානුරාගයෙන් පිබිද ලක්මව රකින්නට ඔවුන් දිවි දෙවෙනි කොට පෙරට ආ නිසාය. දේශය වෙනුවෙන් අප්‍රමාණ කැපකිරීම් කරමින් කටුක ජීවිත ගෙවන ඔවුහු මේ දෙරණ මත සිටින අභිමානවත් මිනිසුන් වෙති. ඔවුන් තුළ ද ආදරය, සෙනෙහස, දුක, සන්තාපය වැනි මානුෂීය ලක්ෂණ නිරන්තරයෙන් දෝලනය වෙයි. දුක - සැප දෙකෙහි දී සංවේදී වන හදවත් ඇති ඔවුන් බංකරය මත කුරුටු ගාන බංකර් කවි තුළින් සැබෑ ලෙසම ඔවුන්ගේ ජීවන රිද්මය විනිවිද දැකිය හැකිය. 'බංකර් කුරුටු ගීත' රණවිරුවන්ගේ ජීවිත විනිවිද දැකිය හැකි කැඩපතක් වැන්න.

බහුතරයක් දෙනා ස්වකීය ජීවිත වල තාරුණ්‍යය යුද පිටියට දියකර හරිද්දී ඔවුන්ගේ සිතුවිලි පිටකර හරින මාධ්‍යයක් ලෙස බංකර් කුරුටු ගීත යොදා ගත්හ. සැබවින්ම බංකර් කවි මෙරට ජනසාහිත්‍යයෙහි තවත් උප ලක්ෂණයක් සේ දිස්වෙයි. එහෙත් වෙනසක් ඇත. එදා පැරැන්නෝ ජනකවි හඬනගා ගායනා කරමින් තම සිතෙහි උපන් රසවත් සිතුවිලි නිහඬ වා තලයට මුසු කළහ. එනමුදු රණවිරුවෝ සිය දිවි දෙවෙනි කොට සලකන ශික්ෂණය තුළ හදවතේ තෙරපුම්කමින් නළියන තම සිතවිලි හඬනගා පිට නොකළහ. ඔවුහු ඒ සිතුවිලි බංකරයේ මටසිළුටු නොවූ තල්කොටන් මත සටහන් කළහ. එහෙත් බොහෝ බංකර් කවිවල රචකයා අඥාතය.

ව්‍යාංගාර්ථවත් කාව්‍ය භාෂාවක් බොහෝවිට භාවිත කොට නොමැති මෙම කුරුටුගීත තුළ සෘජුවම තමන්ගේ අදහස් පළකිරීමක් දැකිය හැකිය. අලංකාරවත් භාෂාව, සංයමය, අනුභූතිය, රිද්මය ආදී අංකුර කාව්‍ය ලක්ෂණ බංකර් නිර්මාණ තුළ දක්නට නොවීමද මෙම නිර්මාණයන් අනිකුත් නිර්මාණවලින් වෙන්කෙරෙන සුවිශේෂී ලක්ෂණයකි.

සිය දෙමාපියන්ගෙන් මිදී ඈත දුෂ්කර ප්‍රදේශවල බංකර්ගත ජීවිත ගෙවන රණවිරුවන්ට නිතර තම නිවසට යන්නට - එන්නට ඉඩක් නැත. දිගු කලකින් තම මව පියා දකින්නට යන්නට අවකාශ ද නැත. එවැනි විටෙක සෙබළාට සිය නිවස සිහියට නැගීම අරුමයක් නොවේ. නිසොල්මනේ ගිනි අවිය සුරත දරමින් සිටින ඔවුහු සඳමෝරා නැගෙන රැයක තිහඬ බව අතරින් හදවතින් තම මව්පියන් තුරුල්ලට යති. රණවිරුවා ස්වභාව සෞන්දර්යයේ මිහිරියාව ද ඈදාගනිමින් චිත්තරූප මැවෙන අයුරින් තබන මේ සටහන අපූරුය.

ලා සඳ එළිය වැටිලා තල් ගස් උඩට
ලැබුණා පහස සීතල සුළඟේ ගතට
දැනුනා තනිය පාළුව බංකරෙ තුළට
සිහිවේ අනේ ආදර මව්පියන් මට

මව්ගුණ පාදක කොටගත් කුරුටු ගී රණවිරුවන් අතින් සුලභව ලියැවී තිබෙනු දැකිය හැකිය.

දස මසක් කුස දරා
මා නමින් දුක් දරා
මට මෙලොව දැක ගන්න
දෙනෙත් දුන්නේ තුඹයි
ඒ පිනෙන් සසර මඟ
යළි දුකක් නොවේවා.....

සොහොයුරු ප්‍රේමයෙන් මුසපත්වුනු බංකරයේ රචකයා තම දූප්පත් සොයුරිය මවක මෙන් දකියි. මාපිය රැකවල් අහිමි තමන්ට දරිද්‍රතාවය මැදින් වුවද රැකවරණය දෙමින් ලෝකයට හොඳපුරවැසියෙකු කරන්නට දැරූ උත්සාහය තුළ ඇයගේ ලෝකය දිරාපත් වන අයුරු මනසින් දකී. ඒ දැක සංවේදී වන ඔහු කුරුටුගීතයට එය වස්තු බීජය කරගනියි. ඒ සඳහා ඔහු ශබ්දාර්ථය ද දැනවෙන පරිදි සිව් පද විරිතට පද යොදා ගෙන ඇති අයුරු මනරම්ය.

අම්මා නොමැති ගෙපැළට අම්මා වෙච්චී
අප්පච්චි නැතත් ඒ දුක නොදැ නෙච්චී
වැරහැලි අඳින ගත ලිපටම දිය වෙච්චී
අම්මා නොමැති උඹ මට අම්මා වෙච්චී

වෙඩි හඬින් දෙදරුම්කන මරණය පෙනි පෙනී සතුරා සමඟ යුද වැදෙන සංග්‍රාම භූමිය නිරන්තරයෙන් උණුසුම්ය. ජීවිතය පිළිබඳ අවිනිශ්චිතභාවය ඉතා ප්‍රබලය. එවන් පසුබිමක් තුළ කොයි මොහොතේ ප්‍රහාරයක් එල්ලවේදැයි දෙගිඩියාවෙන් පසුවන සෙබළාට මනසේ විවේකයක් නැති තරම්ය. ඔහු බංකරයේ සිට කල්පනා කරන්නේ තමන් යුදබිමේ මියැදුනහොත් දයාබර බිරිඳ හා දරුවන්ට අත්වන ඉරණම ගැනය. තමන් නැති ලොවක ඔවුහු තනිවෙතැයි රචකයා ශෝක වෙයි. 'අනේ එපා අමතක කරන්නට - මගෙ කිරිල්ලිය හා මගෙ පැටව් ටික' ඔහු ලොවෙන් ඉල්ලීමක් කරයි. නිෂ්ඵල ගෞරවාචාර වලට වඩා තම පවුලට රැකවරණයක් වටිනා බව ඔහු කල්පනා කරයි.

වෙඩි මුර කුමකට ද -දෙනේ සැතපෙන මාහට
පදක්කම් හා තුති කුමටද - මා නැති මගෙ කැදැල්ලට
එක්කලා මම වැඩක් - මගෙ රටට
අනේ එපා අමතක කරන්නට
මගෙ කිරිල්ලිය හා මගෙ පැටව් ටික

රණබිමේ සෙබළුන් ගෙවන බංකර ජීවිතය කිසිසේත් සුවබර නැත. මැසි, මදුරුවන්ගෙන් පීඩා විඳිමින්,අව් වැසිමැද පීඩාවිඳින රණවිරුවන් හදවතින් ජීවත්වෙන්නේ තම අඹුදරුවන් සමඟිනි. මෙහි රචකයා ද බිරිඳත්, දරුවාත් සමඟින් කල්ගෙවන්නට සිහින දකියි. අළුත උපන් කිරිකැටියාගේ සිනහව දකින්නට නොහැකිව ළතැවෙන පියෙකුගේ සිත සටහනට අනුභූතිය වෙයි.

ආදරය දෑඟිලි එක්කලා
ඉතින් නුඹ මවක් වී
මම තවම බංකරේ

පෙනේ සිහිනෙන්
සිනාසෙන පුතුගේ මුව
ඉවසන්න සොඳුරියේ - තව ටිකයි දිනන්නට

තවත් බංකරයක ලියැවෙන්නේ තමන්ගේ ජීවිතයේ දුක්බර පැතිකඩකි. විවාහ පත්ව සිටින තවත් අයෙක් දරුවන් නැති සොවින් පසුවෙයි. ඔහු ඒ ගැන දිවා රෑ ළතැවෙයි. ඔහු තම දුක බංකරයේ තල් කොටයක් මත කුරුටු ගායි. බංකර් කවියේ රචකයා ඊට සිව්පද යොදාගෙන ඇති අතර එය උපමාරූපක බස්වහරක් බවට පරිවර්තනය කරගනී. දරුවන් නැති ජීවිතය ඔහු උපමා කරන්නේ 'සඳ නැති අහසටය'. සඳනැති රෑය අඳුර රජකරන්නා සේම ඔහුගේ ජීවිතය ද දරුවකු නැතිකමින් අඳුරුව ඇතැයි ඔහු ව්‍යංගාර්ථයෙන් පවසයි.

දහසක් පැතුම් පොදි බැඳ ඇය සමඟ මම
පැතුවේ සොඳුරු දිවියකි දරුවන් සමඟ
ගතවී වසර ගණනක් දරුවන් නැතිව
ගෙවනා දිවිය සඳ නැති අහසක් වැනිය

සුරතල් මුවින් නැගෙනා කෙදිරුම් හඬට
කිරි කැටි සුවඳ පිසගෙන එන මද සුළඟ
මුසු වී සිඟිති හසරැල්ලක ඇති මිහිර
විඳිනට මදිද කල පින් දෙවියනි අපිට

හිරිමල් යෞවනය බොහෙවින් ම සුන්දරය. ඒ නිසාම තාරුණ්‍යයේ පසුවන බහුතරයක් යුද සෙබළුන්ට බංකරයක කුරුටු ගාන්නට ආදරය යන තේමාව සුවිශේෂී අනුභූතියක් වෙයි. නිර්මාණය අදාල වචන, උපමාරූපක භාවිතය මෙන්ම පාරිසරික සෞන්දර්යය ඇඳාගත් බංකර් කුරුටුගීතයේ නිර්මාණ කෞශල්‍යය අග්‍රගණ්‍යය.

වනාන්තරේ සිට මල් සුවඳක් එනවා
නිරන්තරේ මට ඔබ සිහි වෙනවා

ඔය හිතින් හැමදාම ලැබේ නම් ආදරය
ආදරෙයි මකු මතුත් රත්තරන් ඔය හිතට

'ඉරහඳ නැති වුවද
ඔබ මට වටී'

තරු පිරුණු සඳපිරුණු අහස යට
අමාවක දා වගේ මගේ සිත

පරිසරය නිහඬව, නිසල බවින් ගිලෙන මොහොතක දැහැන් ගතවන සිත සිය පෙම්වතිය වෙත සැනෙන් දිවයයි. ඒ ආදර සිතිවිලි වලින් බංකරයේ සිටින සෙබලාගේ සිත පිරී යයි. ඔහු තම බංකරයේ කුරුටුගාන කවිය හැඩකරන්නේ පරිසරයේ චිත්‍රත්වය ද ඊට උපමා ලෙස යොදා ගනිමිනි.

පින්නෙ පිපී හිනැහෙන මල් කැකුළ වගේ
වැල්ලෙ හැපී විසිරෙන මහ රැල්ල වගේ
සීතල රැයක හිතයට උණුසුමක් වගේ
නුඹ ආවා අකලට වට වැස්ස වගේ

සිව් දිගින් නැගෙන බියකරු වෙඩි හඬ, අඳුර කපාවිත් සවනට වැටෙද්දී සංඝුදුර රැඳුනු රැය තනිව නොනිදා පහන්වන දිනෙක සිත වෙලාගන්නා පාලුව, ශෝකය මැද තරු පිරුණු අහස දෙස හිස් බැල්මෙන් බලා හිඳිනවා මිස කුමක් කරන්නද?

රෑ නොනිදා මා කාලය ගෙවන්නේ
සතර දෙසින් වෙඩි හඬමයි ඇසෙන්නේ
සිතේ සතුට නම් නැහැ ළඟ රැඳෙන්නේ
සඳේ එළිය මැද තරුකැට ගනින්නේ

බංකරේ තනිවුනු මොහොතක සෙබළාට තමන්ගේ ප්‍රේමවන්තිය සිහිවෙයි. තමන්ට ඇය සතුකර ගන්නට නොහැකිවේදැයි දෙගිඩියාවෙන් පසුවන රචකයා සිය සිතුවිලි කවි

පද හතරක දවටන්නේ සොඳුරු උපමා රූපක ද නිර්මාණයට පාදක කර ගනිමිනි. 'පුන්සඳ ඔයා නම් මම ඒ මැද හාවා' 'හඳෙන් සාවා වෙන්කළ නොහැක්කා සේම' රචකයා සිය ආදරවන්තිය හා බැඳි ආදර බැම්ම වෙන්කළ නොහැකි බව ව්‍යංගාර්ථයෙන් පවසයි.

ගින්දර දුටුව පළඟැටියෙකු නොවේවා
සුන්දර ලෙසම සුදු මැණිකෙව හිමිවේවා
රන්කඳ ඔයා ගැන උපමාවක් මැවා
පුන්සඳ ඔයා නම් මම ඒ මැද හාවා

ආදරය සේ ම විරහව ද බංකර් කුරුටු ගීතයට විෂය වන ප්‍රබල තේමාවකි. කෙනෙකු තමන් ආදරය කළ පෙම්වතිය අන්සතුව කුලගෙට යන දෙස උපේක්ෂා සිතින් බලාසිටියි. නිර්ව්‍යාජ ලෙසින් ම ඇයට පෙම්කළ ඔහු තුළ ඒ ගැන වෛරයක් නැත. මන්ද ඇය හැමදාක ම සිහිනයක් ලෙසින් ඔහුගේ හදතුළ අමරණීය බැවිනි.

ඇරයුම් නැත - මට එන්නට
ඔබෙ කුල ගෙදරට
අහිතක් නෑ - මේ හිත යට
හීනය මගෙ ළඟ

තමන් පතන ආදරය තමන්ට නොලැබෙන බව ඔහු දනී. එනමුදු ඔහු කඳුළු සලා හැඬුවේ නැත. ඒ දෙස උපේක්ෂාවෙන් දකින ඔහු හදවත සනසා ගන්නට යත්න දරයි.

කඳුලැලි නොමැත නෙතු අද්දර පිසලන්න
කවදා හරි දිනෙක හැකි යළි නුඹ දැකගන්න
කිසිදා පැතුම් ඉටු නොවුනත් සැනසෙන්න
හසුනක් එවන්නෙම් මගෙ හදවත සැනසෙන්න

ජීවිත මංපෙත සැරිසරණ අතරතුර හමුවුනු ආදරය විටෙක මායාවක්, විරහවක් බවට පත්වෙද්දී ඉන් අප්‍රමාණ කලකිරීමට කෝපාග්නියට පත්වන අයෙකු ආදරය මුලාවක් ලෙස අර්ථ

දක්වයි.'ගැහැණිය නිසා ජීවිතයම සුනු විසුණු' 'ආදරෙ කියන වදනට රැවටෙන්න එපා' වැනි වැකි නිර්මාණකරුවා තුළ තිබූ ප්‍රේමය වෛරයක් බවට පරිවර්තනය කර ඇති අයුරු විදාමාන කරයි.

මවක් හැදූ පුතෙක් ලැබුවා යුද පුහුණු
නිමක් නැතිව දුක් වින්දා මහ දරුණු
මවත් පියත් නැති දා ඉතිරි වෙන කවුරු
ගැහැණිය නිසා ජීවිතයම සුනු විසුණු

ආදරෙ කියන වදනට රැවටෙන්න එපා
ආදරෙ කිය කියා මාළිග තනනු එපා
මාළිග බිඳුණු විට කිසි දින හඬනු එපා
ජීවිතෙ බිලි දීල රට වනසන්න එපා

යුද බිමේ සිටින තවත් අයෙකු සිය ප්‍රේමය බිඳවැටීම තුළ ඇතිවන අප්‍රමාණ ආවේගය කළකිරීම හා වේදනාව සමනය කරගන්නට හමුදාවට එක් වූවෙකි. සිය මෘදු හදවත දැඩිකරගෙන රණබිමට පැමිණ සිටින ඔහු අත අද ගිනි අවියකි. ඔහු පෙම්බඳින්නේ ඒ බියකරු ගිනි අවියටය.

නුඹ වෙත බැඳුණු පෙම මිලිනව ගිය හින්දා
ගිනි අවියකට දිනයක මම පෙම් බැන්දා

ඊට ම සමාන අත්දැකීමක් රැගත් තවත් නිර්මාණයක් මෙසේයි.

රුදුරු ගිනි අවිය
අත දරන් - මේ පාළු බංකරේ
හිඳිමි මා මතකයේ
ආදරය නිසාණේ
යුද බිමේ තනිවුණේ
ගෙවී යන යෞවනය
පුදනෙමි මවුබිමට

බිම්බෝම්බ, මරඋගුල්, වගවළසුන් සිටින බියකරු වනාන්තරයේ හුදකලා බංකර තුළ බාහිර සමාජයෙන් මිදී දින, සති, මාස ගණන් ගෙවී යද්දී ඔවුන් තුළ මතුවන භාවාත්මක හැඟීම් ඉතා ප්‍රබලය. මිනිස් වාසයෙන් ශූන්‍ය බංකර්ගත කලාප දැඩි නිහඬතාවය, පාළුව රජකරයි. දිවා - රැය ගෙවෙන හැම තත්පරයක ම නිසොල්මන් පරිසරය තාරුණ්‍යයේ පසුවන ඔවුන් තුළ භාවාත්මක හැඟීම් ජනනය නොකරන්නේ යැයි කාටනම් කිව හැකිද? මේ එවන් බංකර් කුරුටු සටහන් කිහිපයකි.

පපු තලේ රණකිසරු උණුසුම සිහිවෙනවා
රන් මලේ නුඹෙ සුවඳ යුද බිම පැතිරෙනවා

බංකර් තුළයි අපි නිතරම ලත වෙන්නේ
සතුරා වෙතයි සිත නිරතුරු ඇදෙන්නේ
කාලය ගියත් පිනි විසිරුණු හඳපානේ
සුපිපුණු යොවුන් හැඟුමන් වළකණු බෑනේ

වනේ කඳවුරෙන් එන්නට හිත මැණිකේ
දිනේ කියන්නට යුද බිම බැහැ මැණිකේ
තනේ කිරි සුවඳ කිරි වැදිලද මැණිකේ
ඉනේ රෙද්ද නොලිහාපන් මගෙ මැණිකේ

හමුදා ජීවිතය අත්විඳින යුද සෙබළියන්ගේ සිතුම් පැතිකඩයන් ද බංකර් ගී අතර දැකිය හැකිය. මාපිය සෙවණේ හැදී වැඩෙන සුකොමාළ තරුණියක හමුදා සේවය වැනි රළු වෘත්තියක් තෝරා ගනිද්දී මුහුණ දෙන අත්දැකීම මෙම සටහනට විෂය වෙයි. ජීවිතයේ ප්‍රථම වරට මටසිළිටි සිනිඳු දෑතට රුදුරු ගිනි අවියක් ලැබෙද්දී, අඳුරු කරුවලේ බංකර් ජීවිතයක් ගෙවන්නට ලැබීම තුළත් ඇය අත් විඳින අත්දැකීම කෙබඳු විය හැකිද? ඇය හමුදා ජීවිතයේ ත න් ව විඳි ප්‍රථම අත්දැකීම මෙම කවියට අනුභූතිය සපයයි. ඇය විඳි අත්දැකීම ඇයට කොතරම් බියකරු වූයේදැයි 'ලොව සැම සියළු දෙවියන් සිහි වුණා මට' යන වැකියෙන් කදිමට විවරණය වෙයි.

දැතේ ගතට ගිනි අවියක් ලැබුණු විට
ගත සිත සැළුණු හැටි මතකයි තවම මට
අඳුර වැටුණු බංකරයට යැවූ විට
ලොව සැම සියළු දෙවියන් සිහි වුණා මට

සැමටම බැහැනෙ තිලඇඳුමක් අඳින්නට
දායක වන්න මේ මව්බිම රැකගන්ට

සෙබළිය කියා නැහැ වෙනසක් අපි අතර
යුතුකම වෙන්නෙ මේ මව් බිම රැක ගැන්ම

මෙම බංකර් ගීතවල ඇතැම්විට ජනකවි ආර ද දැකිය හැකිය. ජන කවිවල අනුවර්තන ස්වභාවයක් ද මේවායෙහි අන්තර්ගතව තිබේ. ඉතා ප්‍රකට ජන කවියක් වන 'කළුගල් තලාලයි පාරට දමන්නේ - එම ගල් පෑගිලයි ගොනුකුර ගෙවෙන්නේ.........' කවියේ රිද්මය මෙම කවියට ද රිද්මය වන අතර මෙම මුල් කවියේ ම වචන පෙරළියක් බව දැකිය හැකිය. සෙබළා තුළ ඇති ධෛර්යවන්තකම, කැපවීම, දේශානුරාගය සියල්ල ද මේ තුළ ගැබ්ව ඇත.

තල්කොට කපාලයි බංකර් තනන්නේ
එම කොට ඔසවලයි උරහිස් රිදෙන්නේ
සතා නොවෙයි මිනිසයි යුද කරන්නේ
රුදු කොටි හැක්ත හින්දයි දුක් විඳින්නේ

සඳැස් ආරකට ලියා ඇති මෙම සිව්පදය ද දේශානුරාගයෙන් පිබිද දැඩි ආවේගශීලීත්වයකින් යුතුව රචනාවූවක් සේ පෙනේ.

ජාතිය නමින් ගිනි තිබ්බේ කොයි වළහා
ආගම නමින් ගිනි තිබ්බේ කොයි පොළඟා
මේ රට බෙදන්නට හැදුවේ කොයි පරයා
උන්නැති කෙරුවේ උගෙ දරුවන්ගේ සතුටා

මව්බිමට ද සිය මවට සේ ආදරය කරන දිරිය පුතුන් ලක් මවට සැබැවට ම වාසනාවකි. ත්‍රස්තවාදයෙන් ලක්මව පීඩා විඳිද්දී එකී පීඩාවෙන් දේශය බේරා ගන්නට විරු පුත්තු දිවි පරදුවට තබා පෙරට ආහ. එහිදී සතුරා කෙරේ උපන් වෛරයෙන් රෝද බැඳුනු ඔවුහු මව්බිම දිනා ගන්නට ජාතිවාත්සල්‍යයෙන් යුතුව පෙරමුණ ගත්හ. රණවිරුවා තුළ ඇති ඒ අධිෂ්ඨානය, ධීර, වීර ගුණය කියැවෙන දේශානුරාගී ගී සංකල්පනා ද බංකර් කුරුටු ගීත අතර වෙයි. මේ එවැනි පැදි කිහිපයකි.

"පෙරට තැබූ පය පස්සට ගන්නෙ නැහැ
උතුරෙ සටන ජය ගෙන මිස යන්නෙ නැහැ"

(01)

සෙනෙහස පුදා ආදර මව්පියන් හට
පා යුග වැළඳ ඉල්ලා අවසරය මට
ආවා යුද බිමට ලක්මව රැකී මට
මම මගෙ දිවිය සේ රකිනවා මගේ රට

(02)

සිහල ලෙයින් මගෙ ගත දිරි වැඩී ඇත
බියගුළුකම මගෙ ළඟ ගැවිලා නැත
සාමය සතුට පතුරන්නට සියළු අත
සුපුරුදු යුද පිටිය වෙත යොමු කරමි සිත

(03)

ඇතින් නටනවා සතුරන් වියරු වැටී
බොරුවට නහින්නට මුන් උඩ පනින හැටී
මරණය බල බලා සතුරන් සමඟ ගැටී
මැරුණත් සැපයි වනසා දැමූ පසුව කොටී

(04)

සටනට දිවිය හුරු මගෙ ජීවන ගමන
යුද පිටියම තමයි මට හිමි මල් විමන

(05)

නියගය එන්නෙ නැහැ ගස්වැලි හිඟ නැත්තම්
යුද්දෙට යන්න බැහැ ගිනි අවි අත නැත්තම්
සැනසී ඉන්න බැහැ අපි සෙබළුන් නැත්තම්
සෙබළුන් වෙන්න බැහැ එඩිතරකම නැත්තම්

(06)

නැඟෙන වෙඩි හඬ වැටෙන මළකඳ
සසල වී නැත හද නුඹේ
දෙරණ රණගොස - දැයේ නිදහස
එයයි අදිටන අද දිනේ

තවකෙකුට හිරු අවරට යන මොහොතේ ගත - සිත විඩාව දැනෙද්දී සිහියට නැඟෙන්නේ මඳුවිතයි. එහෙත් නිළඇඳුමේ නීතිය ඊට හරස් වෙයි. බංකර් කවියාට විෂය වන්නේ තම හිත තුළ කැකෑරෙන නොකිත් ආශාවන්ය.

තෙරපුම මැදින් මතුවී එන හිනාවට
ආයුෂ අඩුයි වියැකෙයි කළු වලාවට
හැඩවැඩ වුණත් වටපිට හරි ළතාවට
නීතිය හරස් වේ ඇඟපත රුදාවට

රණවිරුවන්ට ඇති නිවාඩු බෙහෙවින්ම අල්පය. ඔවුන්ට මසකට වැඩි කලක් නොකඩවා සේවය කිරීමෙන් අනතුරුව දින කිහිපයක නිවාඩුවක් ලැබේ. අළුත් අවුරුද්ද, වෙසක් පොසොන් කියා රාජකාරියේ නිවාඩු ද නැත. සඳරැසින් නැහැවුනු බුදු තෙමඟුළ සිහිගන්වන වෙසක් පුන්පෝදාක මල් මිටක් අත දරා විහාරයට පිය නගන්නට මෙහි එන රචකයාට අවකාශ නැත. එහෙත් ඔහුගේ සිත සමාධිගතව ඇත. බෞද්ධාලම්භන ප්‍රීතියෙන් ඔදවැඩුනු සෙබළා පරිසර සිරියාව ද ඇඳාගනිමින් නිර්මාණය කළ කවි සිතිවිල්ල අපූරුය.

නිල්වන් අහස් කුස තරුකැට බබලනවා
බංකර් තුළට ඒ සඳරැස් දිස්වෙනවා
වෙසක් සඳින් මුළුපෙදෙසම නැහැවෙනවා
සිතින් මාත් පන්සල වෙත ඉඟිලෙනවා

බංකර ජීවිතය නිරායාසයෙන්ම පාළුව, කාන්සිය කැඳවයි. නිවාඩු විරළ හමුදා ජීවිතය විටෙක රචකයාට කාන්තාරයකි. වෙසක් - පොසොන් - අවුරුදු යැයි විවේකයක් ද නැත. බංකරය තුළ ගෙවී යන්නේ ඔවුන්ගේ වටිනා තාරුණ්‍යයයි. ඒ ගැන මේ සෙබළා කනස්සල්ලට පත්ව තිබේ.

වෙසක් පොසොන් තිබුණත් අවුරුදු සමය
තිබුණත් මොකද සෙබළෙකු හට එහි ඵලය
තුරුළු කරන් පපුවට රුදු ගිනි අවිය
බංකර් වල ගෙවෙයි අපගේ තරුණ විය

හමුදාව තුළ උසස් නිළතල දරන නිළයන් වෙතින් ලැබෙන දොස්මුර මිස රණවිරුවාට කිසිදිනෙක පැසසුම් නැතැයි පවසන බංකර් රචකයා ආවේගශීලී ලෙස වචන ගලපයි. ගැරහුම් මිස නම්බුව, කිත් පැසසුම් පහළ නිළයන්ට නැතැයි පවසන රචකයා එවන් ගරු නම්බු කිසි දිනෙක මිහිපිට දී හමුනොවන බව පවසන්නේ කදිම උපමාවක් ද නිර්මාණයට අන්තර් ග්‍රහණය කර ගනිමිනි. 'කළුනික සොයා පිව්සෙමු අඟහරු ලොවට'

ගැරහුම් ලැබෙන මුත් අසරණ පොඩි අපට
වැඩ හොඳ වුණොත් නම්බුව නම් ලොකු අයට
පැසසුම් වදනකින් හදවත සැනසුමට
කළුනික සොයා පිව්සෙමු අඟහරු ලොවට

තවත් අයෙකු මෙම තත්ත්වය දකින්නේ උපේක්ෂාවෙනි. එවන් පසුගාමී හැඟුමන් පසෙක දමමින් ඔහු රට වෙනුවෙන් වූ එකම අරමුණකින් සිටියි.

නිවනක් නොමැති වැඩ ඇති මේ රැකියාවේ
අප හැකියාව දැක හදවත නිවුනාවේ
වැඩ නැති බහුතරය පසෙකින් සිටියාවේ
අප හැම දෙනා ඉන්නේ එක හමුදාවේ

තනතුරු පරතරය තවත් කවියකට අනුභූතිය වී තිබේ.

තරු ඔටුනු බැබලෙති
තනි තරුව ඔරවති
පටි තුන ෂේප් වෙති
ප්‍රයිවට් අපි තැලෙති පොඩි වෙති

ඒ ගෙවෙමින් තිබෙන්නට ඇත්තේ දැඩි නියං සමයකි. වතුර බිඳක් පිපාසාවට සොයාගන්නට අපහසු කාලයකි. හමුදා සාමාජිකයින් වතුර මදක් සිඳී ගිය ළිඳකින් පිපාසාව සංසිඳුවා ගන්නට ඇත. එහිදී ඉහළ නිළයන්ට මෙම ළිඳෙන් හොඳම වතුර කොටස රැගෙන යද්දී එය අසාධාරණයක් ලෙස දුටු රචකයා ඉන් කම්පිතව ළිඳ අසළ සිය බංකරයේ තම ආවේගය පද හතරකට ගොනුකළේ මෙසේය.

උඩ වතුර තරු වලට
මැද වතුර පටි වලට
මඩ වතුර අපි සැමට
කොටි ගහල මදි කොපිට

මෙලෙස බංකරයට වී සිය රාජකාරිය ඉටුකරන රණවිරුවෝ තමන්ගේ හදවතට නැඟෙන සිතිවිලි වචන වලට පෙරලූහ. ඒ තුළ සැබවින් ම මූර්තිමත් වූයේ කලා රසයකි. අයෙකු බංකරයේ ලියා යන අදහසට පිළිතුරු අදහස් ද ලියැවී තිබේ. ඇතැම් ඒවා විටෙක හාස්‍යය ජනක වන අතර ම සභ්‍යත්යට පරිබාහිරව යයි. මෙම කුරුටු ගී වල රණවිරුවාගේ දුක,සතුට, පාලුව, තනිකම, අසාධාරණය, අයුක්තිය වැනි මානව හැඟීම් සමුදායක් ප්‍රභාමත් කරයි. ඒවා තුළින් මතුකෙරෙන රසය ඉතා උත්කෘෂ්ටය. සීඝ්‍රයෙන් වැළලී යන මේ බංකර් කවි චින්තාවන් ශ්‍රී ලාංකික අපෙන් ගිළිහී යමින් පවතියි. එහෙත් ඉතිරිව පවතින අතළොස්සක් නිර්මාණ යුද්ධය පැවති සමයේ රණවිරුවන්ගේ හදවත් තුළට එබිකම් කර බලන්නට සියුම් අවකාශයක් ඉතිරි කර ඇතැයි සිතේ.

# ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජයගැනීමට බාධාකාරී විය හැකි සංරෝධක

ඩී.ඇම්. අජිත් දිසානායක

ශ්‍රී ලංකාවේ මේ වන විට දූගී පැල්පතේ සිට ජනපති මැඳුර දක්වා ගොවිපලේ වැඩපලේ ගෙදර දොරේ සිට මැති සබය දක්වා හැම තැනක හැම මූනක දක්නට හැක්කේ පුදුමාකාර ආඩම්බර බැල්මකි. සුභ අනාගතයක් සඳහා වූ සුභ ප්‍රාර්ථනාය. හදපත්ලෙන්ම මහත් ලෙන්ගතුකමින් නැගෙන අවිහිංසක සිනා රැලිය. ඒ අන් කිසිවක් නිසා නොවේ. සෞභාග්‍යය අප දෑත මත පතිත වූ නිසා නොවේ වසර 3000 කට නොඅඩු ප්‍රෞඪ ඉතිහාසයක උරුමක්කාරයන් වශයෙන් ජීවත් වූ අපට පසුගිය වසර තිහක් තිස්සේ පැවති කුරිරු විෂම ත්‍රස්තවාදයේ සාපයෙන් රටත් ජාතියත් ජනතාවත් මිදී නැවතත් එක් සේසත් රාජ්‍යයක උරුමක්කාරයන් වූවා යයි යන අභිමානවත් සිතුවිල්ල හැම හදකම නැගෙනු දැකිය හැකි බැවිනි. සම්බුද්ධ සාසනයට කැප කරන ලද මෙම පුණ්‍ය භූමිය නැවතත් අධිරාජ්‍යවාදී තම බලවතුන්ට නතු කර දීම සඳහා පසුගිය කාලය තුළ දේශීය මෙන්ම විදේශීය වශයෙන් බලමුළු ගැන්වුන ජාතියේ සතුරු ද්‍රෝහීන්ගේ උසිගැන්වීම් මත බෙදුම්වාදී ත්‍රස්ත පිරිසක් මෙහෙයවමින් කටයුතු කළ ආකාරය ලොවම මැනවින් දකින ලදී. එහෙයින්ම එය ලොව මෙතෙක් දුටු බලසම්පන්නම ත්‍රස්ත ව්‍යාපාරය බවත් එය කිසිදු පැරදවිය නොහැකි යයි අපව බිය ගන්වනු ලැබින. ඔවුන්ගේ අන්තේවාසිකයන් ඊට අවනත වුවු ද වීර සිංහල පරපුරුවලට නැකම්

කිව් දේශප්‍රේමී රාජ්‍ය නායකයා ඇතුළු වීරෝධාර රණවිරු සියළු දෙනාත් ජාති හිතෛෂී මහජනතාවත් එක හඬින් එය ප්‍රතික්ෂේප කරමින් ඉදිරියට ගියේ පුබ්බා තබන ලද මහ බලවේගය සුණු විසුණු කොට මිස ආපසු නොහැරුනහ. මෙම වසරේ (2010) හැයි 18 දිනට වසරක් පිරෙන ජාතියේ අසමසම එකී ජයග්‍රහණයත් සමග ජනතාවට පියෙකු වූ රාජ්‍ය නායකයා ජනතාව සමග එක් සේසත් දූන් ආර්ථික සෞභාග්‍ය ළඟාකර ගැනීමේ සටනට අවතීර්ණ වී ඇත. අපේ වගකීම වන්නේ එම සටන ද ජයග්‍රාහී කරවීමට අවශ්‍ය පසුබිම සකසා දීමය.

## අතීත අත්දැකීම්

පෙරදිග ධාන්‍යාගාරය යන විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට ලෝක ආර්ථිකයේ වෙළෙඳ කේන්ද්‍රස්ථානයක් වශයෙන් පැවැති බවට සාක්ෂි බොහෝය. පැරණි සේද මාර්ගය ඔස්සේ ඊසානදිග සුලඟ ආධාරයෙන් චීන වෙළෙන්ඳන් ද නිරිතදිග සුලඟ ආධාරයෙන් අරාබි වෙළෙන්ඳන් ද අප රටට පැමිණ තම වෙළෙඳ කටයුතු සිදුකර ඇත්තේ එවකට පැවැති විවෘත වෙළෙඳ ආර්ථික ක්‍රමය යටතේ විය හැකිය. එකී වෙළෙඳාමේ දී දේශීය වශයෙන් අතිරික්ත නිෂ්පාදන විදේශීය වෙළෙන්දන් විසින් මිල දී ගත් අතර දේශීය වශයෙන් නිෂ්පාදනය නොවුන එහෙත් රටවැසියනට අත්‍යවශ්‍ය භාණ්ඩ විදේශීය වෙළෙන්දන්ගෙන් මිල දී ගන්නා ලදී. (Wickaramasinhe J.W. 1994). මෙම ක්‍රියාවලිය හිඟයකින් හෝ අතිරික්තයකින් තොරව සිදුවීම සැබැවින්ම තුලිත ආර්ථිකයක් සතු මූලික ගති ලක්ෂණයකි.

යටත්විජිත පාලනයේ මුල් කාලයේ දිවයින තුළ ද්විත්ව ආර්ථික ලක්ෂණ පෙන්නුම් කර ඇත. එනම් අපනයනය අභිමුඛ කරගත් වාණිජ භෝග වගාව සහ දේශීය අවශ්‍යතා සපුරාගැනීම වෙනුවෙන් සාම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මාන්තය යන අංශ දෙකම එකවර ක්‍රියාත්මකවීමයි. මෙම කාලසීමාවේ ගෝලීය වශයෙන් ආර්ථික අර්බුද සහ ආහාර අර්බුද පැවැතිය ද දේශීය ආර්ථිකයේ පැවැත්මට ඒවා එතරම් අභියෝගයන් නොවීය. එහෙත් පසුකාලීනව දේශීය යැපුම් කෘෂිකර්මාන්තය වෙත පාලකයින්ගේ අවධානය යොමු නොවුන නිසාම එතෙක් පැවැති ස්වයංපෝෂිත අර්ථක්‍රමය බිඳ වැටුණු අතර ආනයනික ආහාර මත යැපෙන ආර්ථිකයක් බිහිකරන ලදි. එය

පාලකයින් විසින් තම යටත්විජිත පාලනය පහසු කරගැනීමේ උපායමාර්ගයක් වශයෙන් හිතා මතාම සිදුකරන ලද්දකි. වතු වගාවේ නියුතු ඉන්දියානු කම්කරුවන් සිය පරිභෝජනය වෙනුවෙන් ආනයනික ආහාර ඇතුළු විවිධ භාණ්ඩවලට හුරු කරවනු ලැබූයේ දේශීය ආහාර නිෂ්පාදනයේ අතිරික්තයක් පැවැති වකවානුවකය. පාලකයන් විසින් දෙමළ වතු කම්කරුවන් සහ උඩරට සිංහලයන් අතර සහජීවනයෙන් ජීවත් වීමට අවැසි පසුබිම සකස් නොකිරීම සහ ඒ වෙනුවෙන් අනුබලයන් ලබා නොදීම රටතුළ ප්‍රශ්න රාශියක් ඇතිවීමට හේතු විය. (Wickaramasinhe J.W. 1994). අතීතයේ පමණක් නොව වර්තමානයේ ද එකිනෙකා පිළිනොගැනීම, මානව අවශ්‍යතා ඉටු නොවීම සහ ජාතීන් වශයෙන් බෙදී වීමට එකී තත්ත්වය මූලික වශයෙන් ඉවහල් විය. යම් හෙයකින් වතු කම්කරුවනට දේශීය නිෂ්පාදකයින් සමඟ යහපත් වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගෙන යාමට පාලකයින් විසින් අවස්ථාව ලබාදුන්නේ නම් මෙරට ඉතිහාසය වෙනස් වීමට බොහෝ දුරට ඉඩ තිබුණි.

## විවෘත ආර්ථිකයට පෙර සහ පසු

ශ්‍රී ලංකාව වර්ෂ 1948 දී නිදහස ලැබූවායින් පසුවත් එතෙක් පැවැති ආයාත නිර්යාත ආර්ථික ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙයට සමගාමීව දේශීය යැපුම් කෘෂිකර්මාන්තයේ ප්‍රගමනය උදෙසා පාලකයින් විසින් විවිධ අනුබලයන් ලබාදෙන ලදී. ඒ යටතේ ගොවිජනපද ව්‍යාපාරයට මූලිකත්වයක් ලැබුණි. වර්ෂ 1977 දක්වා විවිධ ආණ්ඩු යටතේ සාපේක්ෂව අඩු වැඩි වශයෙන් දේශීය ආර්ථිකය නඟාසිටුවීම උදෙසා විවිධ ආර්ථික උපායමාර්ග අනුගමනය කළ ද පොදුවේ ගත්කළ අභ්‍යන්තරාලෝක ආර්ථික ප්‍රතිපත්ති ප්‍රමුඛ ක්‍රියාමාර්ග මෙහි දී කැපී පෙනේ. මෙම උපායමාර්ග යටතේ රටට අනවශ්‍ය භාණ්ඩ විදේශීය රටවලින් ආනයනය කිරීම් සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පැවැතුණි. ඒ බව 1970 සිට 1977 දක්වා පැවැති සමගි පෙරමුණ පාලන කාලයේ ආර්ථික කළමණාකරණ ක්‍රමෝපායන් පරීක්ෂා කිරීමේ දී තහවුරු වනු ඇත. (Wickaramasinghe J. 1989). අවාසනාවකට මෙන් එකී ආර්ථික ක්‍රමෝපායන්හි යහපත් අස්වැන්න ලැබීමට පෙර 1978 වන විට එකී ක්‍රමවේදය පාලකයින් විසින් අවසන් කරන ලදී. එසේ නොකළේ නම් මෑත අතීතයේ ජීවිත සහ

ලේ මස් කඳුළු දහඩිය පරිත්‍යාගයෙන් ගණනය කළ නොහැකි තරම් විශාල කැපකිරීම් සිදුකිරීමට මෙරට ජනතාවට අවශ්‍ය නොවනු ඇත. අනෙක් අතට විසඳුම් ලබාදියයුතු විවිධ අර්බුදයන් රටතුළ උද්ගත නොවනු ඇත. ඒ බව බොහෝ දේශහිතෛෂී විද්වතුන් විසින් නොයෙක්වර පෙන්වා දී ඇත. රටට සහ අනාගත පරම්පරාවන් කෙරෙහි ආදරයක් නොමැති බටහිර මතය පමණක් නිවැරදි යයි සැමවිටම සිතූ පාලකයින්ගේ අදහස් පමණක් ක්‍රියාත්මක වීම නිසා තුලිත දේශීය ආර්ථිකයක් ගොඩනැඟීමට තිබූ වටිනා අවස්ථාව එමඟින් රටට අහිමි විය.

ශ්‍රී ලංකාව යටත්විජිත පාලන සමයේත් ඉන් පසුවත් ආර්ථිකමය වශයෙන් ඉතා යහපත්ව පවත්වාගෙන යාමට උතුරු පළාත සහ නැගෙනහිර පළාත සාපේක්ෂව විශාල දායකත්වයක් සපයා ඇත. කෘෂිකාර්මික සහ ධීවර අංශයේ වාර්තාගත නිෂ්පාදන රටට හිමිකර දෙනු ලැබුයේ මෙ පළාත් දෙකිණි. එහි ප්‍රතිලාභයන් එම පළාත්වල නිෂ්පාදකයින් ඇතුළු ජනතාවට හිමිවිය. ඉතාමත් අඩු පහසුකම් යටතේ වුව ද නිෂ්පාදකයිනට තම භාණ්ඩ අලෙවිය සඳහා දේශීය වෙළෙඳපොළින් කිසම තර්ජනයක් හෝ බාධාවක් නොපැවැතුණි. එයට හේතු වූයේ දිවයින තුළ විවිධාකාර අභ්‍යන්තර අර්බුද පැවැතියත් වර්ෂ 1978 වන තෙක්ම ඒකීය රටක් වශයෙන් දේශීයත්වයට නැඹුරුව සියළුම ආර්ථික කටයුතු පවත්වාගෙන යාමයි. විවෘත ආර්ථිකයේ අනිටු ඵලයන් සමඟම එතෙක් වාර්ගික වශයෙන් සහජීවනයෙන් කටයුතු කළ අර්ථක්‍රමය වෙනස් කිරීමට ආයුධ සන්නද්ධ බෙදුම්වාදි ද්‍රවිඩ කණ්ඩායම් බිහිවිය.

## විවෘත ආර්ථිකයේ ප්‍රතිවිපාක

වර්ෂ 1977 න් පසුව රටතුළ ක්‍රියාත්මක කරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ එතෙක් පැවැති වෙළෙඳ ආර්ථික රටාව උඩු යටිකුරු කරවිය. කෘෂිකාර්මික නිෂ්පාදන ඇතුළු බොහෝ භාණ්ඩ විදේශීය වශයෙන් ආනයනය කරන ලදී. රටවැසියන් ද මෙම ආනයනික භාණ්ඩවලට ගිජු කර වූවා පමණක් නොව දේශීය නිෂ්පාදන සහ දේශීය නිෂ්පාදකයින් ද විනාශ කර දමන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරන ලදී. (Gtiratne, 1993). එතෙක් තම නිෂ්පාදන

වෙනුවෙන් දකුණින් වෙළෙඳ පොලක් හිමිව සිටි උතුරු නැගෙනහිර නිෂ්පාදකයින්ට එය අහිමි වූයේ මෙමගිනි. එහි භයානක ප්‍රතිඵල වසර කිහිපයකින් භුක්ති විඳීමට පාලකයිනට පමණක් නොව සියලු රටවැසියනට සිදුවිය. උතුරේ බලාපොරොත්තු කඩ වූ පිරිස් තම අවශ්‍යතා වෙනුවෙන් පළමුවෙන්ම තම දේශපාලන නායකයින් මරා දමන ලදී. එය ශිෂ්ඨ සමාජයේ පිළිගත නොහැක්කක් වුව ද එකී භීෂණය වර්ධනය වීමට අවැසි පසුබිම නිර්මාණය කර දී තිබීම අමතක නොකළ යුතුය. ක්‍රමයෙන් වර්ධනය වූ උතුරේ අවනීතිය නිවැරදි කිරීමට තරම් හැකියාවක් දකුණේ පාලකයිනට නොතිබුණි. මච්චිමට ආදරය කරන රටවැසියනට දියසෙන් කුමරු පැමිණ මච්චිමට නිදහස උදාකර දෙන තෙක් වසර 30 කට ආසන්න කාලයක් තම ජීවිත ඇතුළු සියලු දේ කැපකිරීමට සිදුවීම කිසිවිටෙකවත් ලඝුකර අමතක කර දැමිය නොහැක. බෙදුම්වාදී ත්‍රස්තවාදයට ජීවය සපයන ලද මෙම විවෘත ආර්ථික ක්‍රමය රටත් ජාතියත් ආර්ථික සංවර්ධනය අතින් වසර ගණනාවකට ආපසු ඇද දමන ලද බව අවධාරණය කළ යුතුය.

## බෙදුම්වාදය

උතුර සහ නැගෙනහිර බෙදුම්වාදී ත්‍රස්තවාදීන් සහ ඔවුනට හිතවත් දේශීය මෙන්ම විදේශීය බල වේග විසින් වපුරන ලද විනාශකාරී බීජ එහි වෘක්ෂයන් බවට පත්ව තිබූ මොහොතක සිදුවන්නට ගිය ජාතික විනාශයෙන් රට මුදා ගැණීමත් සමඟම අභියෝගයන් රැසකට මුහුණ දීමට රටටත් රජයටත් සිදුව ඇත. මෙතෙක් මෝරන ලද ජාතිවාදීයට සහ බෙදුම්වාදයට විසඳුම් ලබාදීම පහසු කාර්යයක් නොවනු ඇත. එකී පළාත් හි වෙසෙන ජනතාව යළි නඟා සිටුවීමත් සමඟම බෙදුම්වාදය මින් මුළුමණින්ම විනාශ කිරීමෙන් සාර්ථක විසඳුම් ලබා දිය යුතුය. එවිට එකී ජනතාව දිනා ගැනීමට හැකිවනු ඇත. මේ සඳහා පවත්නා බාධාවන් හඳුනාගැනීම පමණක් ප්‍රමාණවත් නොවන අතර ඊට සාර්ථක විසඳුම් කඩිනමින් ලබා දිය යුතුය. එහිදී පක්ෂ, වාර්ගික, ආගම් සහ කුල භේද පසෙකලා සියළු රටවැසියන් එකා වන්ව අනාගත පරම්පරා වෙනුවෙන් තිරසාර සංවර්ධනයක් කරා ගමන් කරීමට එක් සිත්ව බැඳී සිටීම ජනතාවගේ පරම යුතුකම වනු ඇත.

## සංවර්ධන අභියෝග

රටක සංවර්ධනය උදෙසා මානව සහ භෞතික වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාළු අත්‍යාවශ්‍ය වන්නකි එකී කටයුතු වෙනුවෙන් රටතුළ දේශපාලන ස්ථාවරත්වයක් පැවැතිය යුතුය. (Dasgtpta, P. 2001). වර්තමානය වන විට ජනතාව විසින් රටට අවැසි දේශපාලන ස්ථාවරත්වය ලබා දී ඇත. දේශපාලන නායකත්වය ජනතා සිතුම් පැතුම් මෙන්ම මූලික, ද්විතීය සහ තෘතීය අවශ්‍යතා හොඳින් අවබෝධ කර ගැනීමත් ඒවා ඉටු කිරීම වෙනුවෙන් ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් සම්පාදනය කිරීමත්, අවශ්‍යතා මත කඩිනමින් ඒවා ක්‍රියාතමක කර ජනතාවට ඉන් ප්‍රතිලාභ ලබා දිය යුතුය. එහෙත් එය සිදුකළ හැකිවන්නේ ඒ වෙනුවෙන් රටවැසි සියලු දෙනාම තම වගකීම් සහ යුතුකම් මොනවාද යන්න හොඳින් අවබෝධ කරගැනීමත් ඊට දායකවීමත් යන කරුණු දෙකම එකවර ක්‍රියාත්මක වීමෙනි.

දේශීය ආර්ථිකයක් ගොඩනැගීම වෙනුවෙන් මූලික බාධාවක්ව පවත්නා වර්තමාන පාර්ලිමේන්තු ව්‍යවස්ථාව වෙනස් කිරීම සංවර්ධනය වේගවත් කිරීම වෙනුවෙන් අත්‍යාවශ්‍ය වූවකි. ඒ සඳහා හේතු කාරක වන කරුණු රාශියකි. මෙම පාර්ලිමේන්තු මනාප මැතිවරණ ක්‍රමය යටතේ ජනතා නියෝජිතයන් පත් කරීම දා හතරවැනි සියවසේ ගෝත්‍ර යුගයකට සමාන වනු ඇත. දිස්ත්‍රික්ක මනාප ක්‍රමය තුළ ඡන්ද දායකයා තම මනාපය ලබා දිය යුතු වන්නේ ජනතාව වෙනුවෙන් කැපවන රටට වැඩ කළ හැකි ශක්තිය ඇති යහපත්, බුද්ධිමත්, කාර්යක්ෂම, සැබෑ නියෝජනයත්වයක් වෙනුවෙනි. එහෙත් පවත්නා මනාප ක්‍රමය යටතේ බොහෝ ඡන්ද දායකයන් තම මනාපය ලබා දීමට තීරණය කරනුයේ තම පක්ෂය, තම වර්ගය, තම ආගම, තම කුලය ආදී කරුණු පාදක කර ගනිමිනි. මෙම තේරීම ගෝත්‍ර සමාජයකට සමාන නොවන්නේ ද යන්න සිතා බැලිය යුතුය.

වර්තමානය වන විට අනුපාත ඡන්ද ක්‍රමය යටතේ අපේක්ෂකයන් තමන්ට හිමි මනාප සංඛ්‍යාව වැඩි කරගැනීම වෙනුවෙන් සිය ප්‍රචාරක කටයුතු කෙතරම් පහත් මට්ටමක වූව ද විවිධ උපායමාර්ග ඔස්සේ සිදු කිරීම නොවැලැක්විය හැක්කකි. එම නිසාම පක්ෂයේ අනෙකුත් අපේක්ෂකයන් සහ ආධාරකරුවන් ඇතුළු සහයෝගය දෙන්නන් අතර බේද වීම් ඇතුළු අමනාප පොරයක්

බවට පත්ව ඇති බව ජනතාව හොඳින් දන්නා කරුණකි. මෙම මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් අති විශාල මූල්‍ය සම්භාරයක් මෙන්ම විශාල මානව සහ භෞතික සම්පත් ප්‍රමාණයක් කැප කිරීමට සිදු වීම සැබැවින්ම ශෝකජනකය. පියවි ඇසට විද්‍යාමාන වන විශාල ධනස්කන්ධයක් මහජන නියෝජිතයන් පත් කර ගැනීම වෙනුවෙන් අපේක්ෂකයන් ඇතුළු ආධාරකරුවනට ලැබුනේ කෙසේ ද යන්න ද ප්‍රශ්නයකි. විවිධ මුහුණුවරින් වැය කළ ද සැබැවින්ම ඒවා රටේ මහජනයා සතු මුදල් විය යුතුය. නැතිනම් මහජන යහපත සඳහා යෙදිය හැකි මුදල්ය. මෙසේ වැය කරනු ලබන මුදල් නැවතත් විවිධාකාරයෙන් ජනතාව අතට පත්වන්නේ නම් එවිට රටේ ආදායම බෙදීයාමේ විසමතාව අඩු විය යුතුය. එහෙත් එය එසේ නොවන්නේ මන්ද යන්න ද සොයා බැලිය යුත්තකි.

නියමිත කාලයට මැතිවරණ පැවැත්වීම රජය සතු වගකීමකි. එහිදී ප්‍රජාව පාලනය කිරීම වෙනුවෙන් මහජන නියෝජතයින් ප්‍රජාව විසින් තෝරා පත් කර ගනු ලබයි. එම නිසාම මහජන නියෝජිතයන් පත්කිරීම වෙනුවෙන් රජය මහජන මුදල් වියදම් කරනු ලබයි. එහෙත් ගැටලුව වන්නේ මහජන නියෝජිතයන් පත් කිරීමේ වගකීම යටතේ මහජන මුදල් වැය කිරීම නොව, එකී මුදල් ප්‍රමාණය මෙන් අසූ ගුණයකට ආසන්න මුදල් සම්භාරයක් මහජන නියෝජිතයන් පත් කිරීමේ රජයේ කාර්යභාරය වෙනුවෙන් පෞද්ගලික අංශය විසින් වැය කිරීමයි. රජයේ කාර්යභාරය වෙනුවෙන් මෙතරම් ධනස්කන්ධයක් වැය කිරීමට තරම් ශක්තිමත් පෞද්ගලික අංශයක් ලොව කිසිම රටක සිටින්නේ ද යන්න ද සොයා බැලිය යුත්තකි. එහෙත් ගැටලුව එය ද නොවනු ඇත. උක්ත කාර්යයන් වෙනුවෙන් පෞද්ගලික අංශය වැය කරනු ලබන මුදලින් ආසන්න වශයෙන් 80% පමණ ප්‍රමාණයක් මෙම කෙටි කාල සීමාව තුළ විදේශගත වීමයි. නිදසුනක් ලෙස ප්‍රචාරක පත්‍රිකා ඇලවීමට අවශ්‍ය තිරිඟුපිටි ප්‍රමාණය විශාලය. ඒවා ආහාර වශයෙන් පරිභෝජනයකින් තොරව බිත්ති, තාප්ප, පාලම්, බොක්කු, විදුලිකනු ඇතුළු බොහෝ ස්ථානවල තවරනු ලබයි. එහෙත් මේවා ගෙන්වනු ලබනුයේ විදේශවලිනි. එපමණක් ද නොව කඩදාසි, තීන්ත වර්ග, මුද්‍රණ ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත උපකරණ සියල්ලක්ම පාහේ ආනයනය කළ යුතුය. අඩි ගණින් උස

ප්‍රචාරක පුවරු සහ තොරන් වැනි ප්‍රචාරක නිර්මාණ බිහි වී ඇත. ඒ වෙනුවෙන් ද අති මහත් මුදල් ප්‍රමාණයක් විදේශගත වේ. අනෙක් අතට මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් ධාවනය කරන යාන වාහන සඳහා ඉන්ධන මෙන්ම ඒවායේ අමතර කොටස් ගෙන්වනු ලබනුයේ ද විදේශයෙනි. මෙලෙසින් හැම අතින්ම සිදුවන්නේ සම්පත් විනාශයකි. තම මැතිවරණ කටයුතු ආධාරකරුවනට කෑම වේලක් දෙන්නේ නම් එහි ඇත්තේ ද ආනයනය කරන ලද ද්‍රව්‍ය වනු ඇත. ඒ සියල්ල අභිබවා පරිසරයට සිදුකරන හානිය, නිදහස් පුරවැසියන්ගේ මූලික මානව අයිතිවාසිකම් අහිමි කිරීම හා සමාජයේ සාමයට සිදුවන බාධා කිරීම් නැගී සිටී.

## විකල්ප සංවර්ධන ප්‍රවේශය

තුලිත ආර්ථිකයක් යනු අන් කිසිවකුට බරක් නොවී සියළු ආර්ථික කටයුතු සමබරව පවත්වාගෙන යාමයි. මෙය විකල්ප සංවර්ධන ප්‍රවේශයක් වනු ඇත. (Dasgtpta, P. 2001). යටත්විජිත වශයෙන් පැවැති බොහෝ රටවල් තම සංවර්ධන උපාය මාර්ග වශයෙන් තෝරාගනු ලැබූයේ බටහිර සංවර්ධන ආකෘතීන්ය. එහෙත් එමගින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ රටවල් රාශියකි. එසේ වීමට හේතු මොනවාද යන්න අධ්‍යයන කළ සංවර්ධන ආර්ථික විද්‍යාඥයන් විසින් තම රටේ ආර්ථික ව්‍යුහයට ගැළපෙන නව විකල්ප වෙත ප්‍රවේශ විය යුතු බව පෙන්වා දී ඇත. එමගින් තිරසාර සංවර්ධනයක් නැතිනම් ධරණීය සංවර්ධනයක් අත්පත් කරගත හැකි බව ඔවුන්ගේ මතයයි.

රටක තුලිත ආර්ථික සංවර්ධනයක් උදෙසා සපුරා ගත යුතු මූලික කරුණු තුනක් පිළිබඳව අවධානය යොමු කළ යුතුය. (Starrett A., 1988).

අභ්‍යන්තර තුලනය
බාහිර තුලනය
පාරිසරික තුලනය

අභ්‍යන්තර තුලනය යනු රටක් අභ්‍යන්තරික වශයෙන් එරට ආදායම සහ වියදම සමබරව පවත්වා ගෙන යාමයි. මෙය ආරම්භ කළ යුත්තේ පවුල නැතිනම් කුටුම්බය යන කුඩාම ආර්ථික ඒකකය තුළිණි. පවුලේ වියදම් පියවා ගැණීමට සරිලන පරිදි පවුලේ ආදායම වර්ධනය කර ගැනීම සහ ගෘහ කළමණාකරණය මේ යටතේ සිදුවිය යුතුය. අඩු ආදායම්ලාභීන්ට තම පවුලේ ආදායම් වර්ධනය කර ගැනීමේ ප්‍රවේශයන් බිහි කිරීම මෙන්ම නිවැරදිව ගෘහ කළමණාකරණය නොවූ කුටුම්බයන් ඒ වෙනුවෙන් යොමු කරවීම මෙම ක්‍රියාවලිය සාර්ථක කරලීම උදෙසා විවිධ ප්‍රජා දැනුවත් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රාදේශීය සම්පත් භාවිතය සහ කළමණාකරණය, ගෙවතු වගාව, ගෘහ කර්මාන්ත, නව වෙළෙඳපොළ ආකර්ශණය, අන්තර් සම්බන්ධීකරණය, අතරමැදි තාක්ෂණය ආදි වශයෙන් පෙන්වා දිය හැකිය. (Dasgtpta, P. 2001).

කුටුම්බය සමතුලිතයට පත්කිරීම පළමු කාර්යය වන අතර එවැණි කුටුම්බ රාශියකගෙන් ගමක් ද ගම් රාශියකගෙන් ප්‍රදේශයක් ද ප්‍රදේශ රාශියකගෙන් දිස්ත්‍රික්කයක් ද දිස්ත්‍රික්ක කිහිපයකින් පළාතක් ද පළාත් රාශියකගෙන් රටක් ද බිහි වීමෙන් එරට අය වැය සමබරව පවත්වාගෙන යාමේ මග නිර්මාණය වනු ඇත.

රටකට අවැසි සියළුම භාණ්ඩ එරට තුළ නිෂ්පාදනය කිරීමේ ශාක්‍යතාවක් නොපැවතිය හැකිය. එමෙන්ම සාපේක්ෂ පිරිවැය වාසි හෝ තරඟකාරී පිරිවැය වාසි තත්ත්වයන් පදනම් කරගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ආනයනය සහ අපනයනය කිරීම, පොදුවේ සිදුවන්නකි. එම නිසාම එකී රටවල් අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වේ. මෙම මූලධර්මය යටතේ බාහිර තුලනය යනු රටක ආනයන වියදමට සරිලන අපනයන ආදායමක් පවත්වා ගැනීමයි. එහෙත් බොහෝ සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන ආදායමට වඩා ආනයන වියදම ඉහළ අගයක් ගෙන ඇත. බාහිර තුලනය යටතේ ආනයන වියදම් අවම කළ යුතුය. ඒ සඳහා විසඳුම් වශයෙන් රටට අත්‍යවශ්‍ය ආනයන මොනවාද යන්න තීරණය කිරීම පළමු කාර්යය වන අතර දෙවනුව එකී ආනයන වියදමට සරිලන පරිද්දෙන් අපනයන ආදායම වැඩි කරගත යුතුය. ඒ සඳහා නව

අපනයන භාණ්ඩ සහ සේවා හඳුන්වාදිය යුතුය. සම්ප්‍රදායික අපනයන මත දැඩි රැඳියාවක් නොදැක්වීම සහ අපනයන භාණ්ඩ කිහිපයක් මත ආර්ථිකය රඳාපැවැත්ම තීරණය නොවන පරිදි කටයුතු කළ යුතුය. මෙම මූලධර්මය යටතේ ගෙවුම් ශේෂ තුලනය මගින් රටකට බාහිර තුලනයක් අත්පත් කරගත හැකිය. (Sterner, T. ,2003).

1980 දශකය වන තෙක්ම ලොව බොහෝ රටවල් සාර්ව ආර්ථික සමතුලිතයක් මගින් තම සංවර්ධන ඉලක්ක වෙත ළඟා වීමට උත්සාහ දරන ලදී. එහෙත් 1990 දශකයේ ලෝවැසියනට මුහුණ දීමට සිදු වූ විශාලතම අභියෝගය වූයේ ගෝලීය පරිසරයේ සිදුවූ විපර්යාසයන්ය. මිනිසා විසින් තම අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් පරිසරයට සිදුකරන ලද බලපෑම්හි අනිටු පලවිපාක බුක්ති විඳීමට සිදුවීම සහ ජයගත නොහැකි ආකාරයේ අනාගත අභියෝගයන් නිර්මාණය කිරීම ප්‍රතිපලය විය. මිනිසා විසින් එකිනෙකා පරයා යාමට කරන ලද තාක්ෂණික විප්ලවය මෙයට හේතු විය. නවීන යුධ ආයුධ නිපදවීම සහ ඒවා භාවිත කිරීම, ලෝක ත්‍රස්තවාදය ව්‍යාප්ත කරවීම, අධික ලෙස බලශක්තිය භාවිතා කිරීම ආදිය ගෝලීය පරිසරයට දරාගත නොහැකි විය. මිනිසා සංවර්ධනයේ මිත්‍යාව පසුපස හඹා යාම පාරිසරික අර්බුද වර්ධනය වීමට මූලිකම හේතුව වශයෙන් පෙන්වා දිය හැකිය. මෙම අභියෝගයෙන් ලොව කිසිදු ජීවියකුට මිදීමට නොහැකි තත්ත්වයක් නිර්මාණය වී ඇත (Dasgtpta, P. 2001). මෙම අභියෝගයට විසඳුම් සෙවීමේදීත්, රටකට තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සකස් කිරීමේදීත්, එරට පාරසරික තුලනය පවත්වාගත යුතු බව වර්තමාන සංවර්ධන ආර්ථිකවිද්‍යාඥයින් විසින් තරයේ අවධාරණය කරනු ලබයි.

මෙම සියළු තත්වයන් හමුවේ පීඩනයට පත්ව සිටි ශ්‍රී ලංකාවට පසුගිය වසර තිහක් තිස්සේ මුහුණ දීමට සිදු වූයේ ලොව කිසි තැනක නොවූ විරූ කුරිරු ත්‍රස්තවාදයටය. රටේ නිෂ්පාදනය ඇන හිටියේය. ජනතාවට මරබියෙන් දිවි ගෙවීමට සිදු විය. ආදයම ලැබේ නම් එය රටේ ආරක්ෂාවටත් ආරක්ෂක හමුද රැකගැනීමටත් වැය කිරීමට සිදු විය. රට ආර්ථික වශයෙන් පරිහුණා පමණක් නොවේ. සදචාරය, සාරගුණධර්ම, සංස්කෘතික වශයෙන්ද පරිහානියටම ගියේය.

යුදමය තත්වයක් ඇති තැන ඊට වැඩි දෙයක් බලාපොරොත්තු විය නොහැකිය. එහෙත් මුළු ලොවම මහා බලවතුන් මෙන්ම කුඩා රාජ්‍යතන්ත්‍ර මචිතයට පත් කරමින් ලොව බලසම්පන්නම ත්‍රස්ත ව්‍යාපාරය බැවින් කිසිදු පැරද විය නොහැකි යයි සැලකූ කොටි ත්‍රස්තවාදය රණවිරු අධිෂ්ඨානය, ජනතා කැපවීම හා නිවැරදි දේශපාලන නායකත්වය මගින් මුළුමණින්ම විනාශ කොට දැමීමට රට සමත් වී ඇත. ප්‍රශ්නය ආරම්භ වී ඇත්තේ එතැන් සිටය.ම මුළු රටම සුන්බුන් ගොඩකි. ආදායම් මාර්ග නොමැත. පඩි නඩි ගෙවා නඩත්තු කළ යුතු රාජ්‍ය හා ආරක්ෂක සේවා ලක්ෂ 20 ක් පමණ වේ. ජීවත්වීම සඳහා අනෙක් ජනතාව ද සහන ඉල්ලා මොරදෙති. ජනතාවගේ රජය විසින් දෙවන යුද්ධය වශයෙන් ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමේ සටන දියත් කොට ඇත්තේ ඊට පිළියම් ලෙසිනි. ත්‍රස්තවාදය විනාශ කිරීම කැපවීම කළ ජනතාව දැන් ආර්ථික යුද්ධය ජය ගැනීම සඳහා ද උපරිමයෙන් දායක වෙමින් සිටිති.

## සමාලෝචනය

දශක තුනකට ආසන්න කාලයක් පුරා පැවැති රුදුරු ත්‍රස්තවාදී භීෂණයෙන් මව්බිම මුදා ගැනීමෙන් අනතුරුව දේශප්‍රේමීන් නැවුම් බලාපොරොත්තු සහිතව අලුත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම වෙනුවෙන් කටයුතු කිරීමෙන් ලොවට ආදර්ශමත් පණිවුඩයක් ලබා දී ඇත. සැබැවින්ම එය අගය කළ යුතු කරුණකි. මෙහි සාර්ථකත්වය සඳහා පක්ෂ බේද, වර්ගවාදී ගැටුම් ආදියෙන් මිදීම අනිවාර්ය වූවකි. රටේ සංවර්ධනය වේගවත් කිරීම සහ මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් සාමකාමී, දැහැමි, නිවහල් රටක් යන්න යථාර්තයක් බවට පත් කිරීම අප සැමදෙනා සතු වගකීමකි. යුග මෙහෙවරකි. තම දෙපයින් නැගී සිටීමටත්, තම කොන්ද කෙළින් වීමටත්, තම බුද්ධියෙන් සිතීමට සහ කටයුතු කිරීමටත් හැකි ස්වාධීන ශ්‍රී ලාංකික ජාතියක් බිහි කිරීමේ අභියෝගය ජය ගැනීමට සියලු රටවැසියන් එකාවන්ව තිර අධිටනින් කටයුතු කළ යුතුය. අප උපන් මාතෘභූමිය තුළ ජීවත්වීමට සමාන අයිතිය අප සියළුදෙනා සතුය. රටේ ජනාධිපතිවරයා අප සියළු දෙනාගේම රාජ්‍ය නායකයා වනු ඇත. ප්‍රජාව විසින් පත් කර ගන්නා ලද ව්‍යවස්ථාදායකයට අප සියළුදෙනා විසින් ගරු කළ යුතුය. අප මව්බිම ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ අභියෝගය යථාර්තයක්

කිරීම වෙනුවෙන් සියළු රටවැසියන් යුතුකම් සහ වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට කාලය එළඹ ඇත. එකී ආකල්පය සහ චින්තනය මගින් තුලිත ආර්ථිකයක් සතු තිරසාර සංවර්ධනයක් අත්පත් කරගත හැකිය. එවන් කලක අප සැමට සුබ අනාගතයක් හිමි වීම ලොව කිසිවකුටවත් වැළක්විය නොහැක.

# ත්‍රස්ත උවදුරින් නිදහස් වූ සමාජයේ සංස්කෘතික ප්‍රගමනය සාක්ෂාත් කරවිය හැකි කලා භාවිතය

කලාසූරී රෝහණ දේව

පැසිස්ට්වාදී ත්‍රස්තවාදය ඔස්සේ අවුලන ලද ජාතිවාදී කුරිරු ගින්නෙහි දැවී අළුවී යාමට ආසන්නව සිටි අපි, අන්තිමේ දී නිදහස් හුස්මකට උරුමකම් ලබා ඇත්තෙමු. මිනීකුණු ගඳ සහ වෙඩි බෙහෙත් දුම වහනය වූ ජන සමාජයක යළි සුමට සුගම නවමු ජීවිතයක් අපේක්ෂාවෙන් ආයාචනය කරන සමයෙක ජීවත්වන අපට වඳුරන් තිදෙනාගේ භූමිකාව නිරූපණය කල හැක්කේද?

## සීමාන්තික ජාතිවාදය

ජාතිකවාදය හා ජාතිවාදය පටලවා ගෙන හරි දේ වැරදි දේ හඳුනා ගත නොහැකිව ජාතිවාදය කරපින්නාගෙන උන්මත්තකයන් සේ හැසිරෙන කිසිවෙකුට කිසිවිට සහෝදරත්වය සොයා යා නොහැකිය. සීමාන්තික ජාතිවාදය සහෝදරත්වයේ ප්‍රගමනයට බාධාවක් ම වෙයි. ජාති හිතෛෂීන් වෙත පරිභව කිරීමට යෙදූ කියමනක් පමණක් ලෙස සීමාන්තික ජාතිවාදය අරුත් ගන්වනු ලැබූව ද එහි බරපතළ පල විපාක නිවැරදිව හඳුනාගත නොහැකි අය ඊට වැඩි වෙනසක් නොපෙන්වන බව ප්‍රතික්ෂේප කළ නොහැකිය. 1505 නොවැම්බර් 15 දා සිට අප රටේ සම්පත් සූරාකෑමට සෘජුවම මැදිහත් වූ බටහිර අධිරාජ්‍යවාදීන් විසින් ස්වදේශිකයන් ගේ අරගල හමුවේ යටත්විජිත තත්වයෙන් අප නිදහස් කරනු ලැබූයේ සීමාන්තික ජාතිවාදයේ රැහැනින් අප තව තවත් දැඩි ලෙස සිරකර තැබීමෙන් අනතුරුව බැව් සිහිපත් කළ හැකි නම් ඕනෑම අයකු ජාතිවාදයෙන් මිදෙනු

ඇත. එවිට දූනට අප ඇද දමා ඇති ආගාධය කුමක්දැයි තේරුම් ගැනීම අපහසු නොවනු ඇත.

අධිරාජ්‍යවාදීහු තම යටත්විජිත අතහැර යන මොහොතේ එකී විජිතයන්හි ස්වදේශිකයන් තුළ තමන් විසින්ම ජාතක කරන ලද සීමාන්තික ජාතිවාදය තියුනු අවියක් ලෙස භාවිත කර තවදුරටත් තම ආධිපත්‍යය පතුරුවාලීමට ඇවැසි පරිසරය සකසා ගැනීමට උපායශීලී වූහ. ගාන්ධිගේ ඉන්දියාව, නේරුගේ ඉන්දියාව සහ අලි ජින්නාගේ පකිස්ථානය ලෙස දෙකඩ කිරීමට ඔවුහු භාවිත කල තියුනුම අවිය තම මව්බිම ගැන නොසිතා කරට ගත් සීමාන්තික ජාතිවාදය නොවන්නේද? තම්බපණ්නි නම් වූ සුන්දර දිවයිනෙහි විසූ ස්වදේශිකයන් සිලෝන් Ceylon වෙත ගාල්කර තනි කණ්ඩායමක් ලෙස නොසිතන ලෙස භේද භින්න කර තම අභිමතාර්ථයන් සාක්‍ෂාත් කරගැනීමට ඉංග්‍රීසි අධිරාජ්‍යවාදය භාවිත කලේද මෙම සීමාන්තික ජාතිවාදය නම් වූ තියුනු අවියම වෙයි. ශ්‍රී ලංකා සහ ඊළාම් නම් ද්විත්ව රාජ්‍ය සංකල්පයක් මේ මාතෘභූමිය මත ස්ථාපිත කිරීමට අවශ්‍ය පිඹුරුපත් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් සකසා ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක කොට එහි අවසන් ඵලය ලැබීමට ආසන්නම මොහොතක එකී මරඋගුලෙන් ගැලවීමට තරම් අපි අද අප්‍රමාණ ලෙස වාසනාවන්ත වී සිටිමු.

එය එසේ වූවද එකී රුහැනින් මිදුනු අප 21 වන සියවසට යෝග්‍යවූ සංස්කෘතික ප්‍රගමනයක් අපේක්‍ෂා කරන්නෝ වෙත් නම්, සීමාන්තික ජාතිවාදයෙන් මිදුනෝ විය යුතුය.

සීමාන්තික ජාතිවාදය ගෝත්‍රවාදය කුළුගන්වයි. ගෝත්‍රවාදය ස්වල්ප වූ පිරිසක් පටු සංස්කෘතික සීමාවක සිරකරනු ඇති බව අප විසින් නොසළකා හරිනු ලබයි නම් අප ද ඊට ගොදුරු වීමට ඇති ඉඩකඩ බොහෝය. එය අපේ භාෂාව සහ සාහිත්‍ය කලා භාවිතයන්හි දී පටු අදහස් හා ආවේගයන් ජනිත කරනු ලබයි. මෙම පටු කොටු පවුර තුළ, බලය අවිය කොට ගෙන අවශ්‍ය දේශපාලනික හා ආර්ථික පසුබිම් සකසා ගත් කල්හි පැසිස්ට්වාදයට පාවාඩ අතුරූ මාවත් සැකසෙයි. එහි අනිටු ඵල විපාක පසුගිය දශක තුනක කාලයක් පුරා

අපි අත් විත්දෙමු. එකී පැසිස්ට්වාදයේ කුරිරු පීඩනයෙන් අත්මිදීමට මේ මොහොතේ අප සමත්ව ඇතත් ගෝත්‍රවාදයේ පටිටු චින්තාවෙන් ඔබ්බට පියමැනීමට තවමත් අප උත්සුක නොවන්නේ නම්.......?

භාෂාව

අපි ක්‍රිකට් ක්‍රීඩා විස්තර විචාරයකට සවන් දෙමු. "ශ්‍රී ලංකා කණ්ඩායම තවත් ලකුණු දෙකක් රැස් කරමින්....." සිංහල විස්තර විචාරකයා මොර දෙයි. " Two more to Sri Lanka ...........(ටූ මෝර් ටු ශ්‍රී ලංකා)" ඉංග්‍රීසි විස්තර විචාරකයා චිත්‍රනය කරයි. "இலங்கை அணிக்கு மேலும் ஒட்டங்கள்(ඉලංගෙයි අනිකෙ මේලුම් ඉරන්ඩ ඔට්ටාංගල්)" දෙමළ විස්තර විචාරකයා තවත් රටක් ලැබූ ලකුණු දෙකක් ගැන කියයි. කවර රටක කුමන භාෂාවකින් මෙම දිවයින ගැන සඳහන් කරන්නෙක් වුව ශ්‍රී ලංකා යන නම භාවිත කරන්නේ වුව ද මෙහිම සහෝදරත්වයෙන් වෙසෙන තවත් ජන සමූහයක් එය ඉලංගෙයි ලෙස හඳුන්වනේනම් අපතුල එකම රටක් පිළිබඳ හැඟීමක් ජනිත වන්නේ ද? දෙමළ බසම පමණක් භාවිත කරන දරුවන් තුල ශ්‍රී ලංකා නම් රටක් පිළිබඳව භක්තිමත් හැඟීමක් ජනිත වේද? එක්කෝ එය ශ්‍රී ලංකා විය යුතුය. නැතිනම් ඉලංගෙයි විය යුතුය. ඓතිහාසික සාධක මගින් එය කුමක් විය යුතුද යන්න මනාව පෙන්වා දී ඇත. එහෙයින් අප කිසිවිට කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතිහාසය පාගා විනාශ කොට අමතක කර නොදැමිය යුතුය. එකම රටක් එකම ජනතාවක් ලෙස ශ්‍රී ලාංකීය සංස්කෘතියක් කරා ගමන් කිරීමට නම් ඒ ගැනත් සිතිය යුතුමය.

මෙම දිවයින තුල බහු සංස්කෘතික ජන සමාජයක් ජීවත්වන බව සැබෑය. විවිධ සංස්කෘතික අනන්‍යතාවයන්ට හානි කිරීමෙන් වැළැකිය යුතුය යන මතයක් ඇති බව ද සැබෑය. එසේ වූව ද ජීවමාන සංස්කෘතියක් සදා එකසේ රැඳී නොපවතින බව ද සැබෑය. ඒ අනුව සංස්කෘතියක් බලහත්කාරයෙන් වෙනස් නොකළ යුතුය. කාලීන අවශ්‍යතා පරිදි අවශ්‍ය වෙනස්වීම්වලට නිතැතින්ම භාජනය වීමට ඉඩ සැලසිය යුතුය. සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ ජීවමාන සකස්වීම නොවන්නේද? එසේ නම් ඊට සකස් වීමට ඇති අයිතිය අහිමි කළ යුතුද? ඉඩකඩ ඇසිරිය යුතුද?

මානව ජීවිතය, එකී මානවයා ජීවත්වන ජන සමූහය, එම ජන සමූහය අයත් වන්නා වූ බහු ජන සමාජය සැකසී හැඩගැසී ඇති විධිමත් රටාව එම ජන සමාජයට අයත් සංස්කෘතියයි. ඇවතුම් පැවතුම්, විශ්වාසයන්, ඇදහිලි, චින්තන රටා ආදි වූ මේ සියල්ල එකී ජන සමාජයේ සංස්කෘතික ලක්ෂණ පිළිඹිබු කරයි. සංස්කෘතියක ප්‍රබලම අංගය භාෂාවයි. භාෂාව සංස්කෘතියෙහි පාදම (foundation) ලෙස හඳුන්වන්නේ එහෙයිනි. භාෂාව අධ්‍යයනය කිරීමකින් තොරව එකී භාෂාව භාවිතයට ගනු ලබන ජන සමූහයේ සංස්කෘතිය හඳුනා ගත නොහැක. සංස්කෘතිය හැඩ ගැස්වීමෙහිලා පරිසරය, ඇදහිලි, විශ්වාස, කෑම්බීම් රටාව, රැකියා, වෘත්තීන් ආදී සියල්ල ප්‍රබලම සාධක වේ. භාෂාව මෙම සංස්කෘතික ප්‍රකාශන මාධ්‍යය ලෙස සකසා ගන්නා ලද්දකි. එය වාචිකව ද, සංඥා ද නැති නම් වෙනත් ක්‍රමයක් ද යනු ප්‍රශ්නයක් නොවේ.

යම් සංස්කෘතියක නැගීම හෝ වැටීම එම සංස්කෘතික සමාජයට නතු වූ දේශයේ ආර්ථික, සමාජයයීය සහ දේශපාලනික ක්‍රියාකාරිත්වය පසුබිම්ව සිදුවන්නකි. යම් කලා සම්ප්‍රදායක් හුදෙක් සාහිත්‍ය හා කලා සිද්ධාන්ත සමූහයක එකතුවක් වශයෙන් නොව එම සිද්ධාන්තයන් ජනිත කරලීමට පසුබිම් වූ සංස්කෘතික ප්‍රවාහයත් ඊට හේතු කාරක වූ ආර්ථික පසුබිමත් මත පිහිටා තේරුම් බේරුම් කරගත යුතුය. එසේ නොවනතාක් එකී සාහිත්‍ය කලා සිද්ධාන්ත දුරාවබෝධ වෙයි.

යම් සමාජ විරෝධී ක්‍රියාවක නියැලි පුද්ගලයකු එකී ක්‍රියාවට පෙළඹුනේ කුමන හේතුවක් නිසාද යන කරුන පිළිබඳ ගවේෂණය කරන සමාජවිද්‍යාඥයා තම විවේචනයන් ප්‍රකාශ කරනුයේ පලමු කී තනි පුද්ගලයාට නොව ඊට පසුබිම් වූ සමාජක්‍රමයටය. සාහිත්‍ය කලා විචාරකයාද මෙලෙසම තම දෘෂ්ඨීන් න්‍යායායයන් වෙත පමනක් නොව තම විචාරයට බඳුන් වන කෘතීන් නිර්මානය කෙරුනා වූ සමාජවිද්‍යානුකූල පසුබිම වෙත ද යොමු කල යුතුව ඇත.

චෛතසික හා කායික ඒකාග්‍රතාවයෙන්, නිර්මානශීලී ලෙස, පූර්වයේ වූ ලෙසම නොව අළුත් යමක් බිහිකිරීමේ ව්‍යායාමය කලාව

ලෙස සැලකිය හැකිය. කලාව නම් මේ යැයි යම් චට්ටෝරුවක් ඒ ලෙසම අනුකරනය කිරිම සාවධ්‍ය භාවිතයකි. එමෙන්ම එකී චට්ටෝරු මුළුමනින්ම බැහැර කලහැක්කේ ද නොවෙයි.

දේශීය සංස්කෘතික මූලාශ්‍ර මත ම පිහිටා අලුත් සාහිත්‍ය කලා භාවිතයක් ගොඩනැගීමට යත්න දැරීම මෙන්ම දේශීය සාහිත්‍ය කලා සම්ප්‍රදායයන් බැහැර කොට විශ්ව භාවිතයන් මතම පිහිටා කටයුතු කිරීම ද සාධනීය නොවේ. විදේශීය වූ සම්ප්‍රදයන් ද උචිත පරිදි ප්‍රයෝජනයට ගෙන අපේ යයි කිව හැකි සාහිත්‍ය කලා සම්ප්‍රදයන් බිහි කිරීම වැදගත්ය. එහෙත් පරගැති බව දුරිභූත කලයුතුවා මෙන්ම සීමාන්තික ජාතිවාදය ද බැහැර කල යුතුය. මෙරට දීර්ඝ කාලීන සංස්කෘතියේ දක්නට හැකි ප්‍රබලතම සාධක වන්නේ ද මෙම නම්‍යශීලී ගුණයයි.

## පරිකල්පනය

උසස් කලා සම්ප්‍රදායක් වර්ධනය කර පෝෂණය කිරිමට නම් නිර්මාණකරුවා උසස් සංකල්පනාවන් (Imagination) සහිත ප්‍රබුද්ධ මතධාරි අයකු විය යුතුය. තම භාවමය ප්‍රකාශනයටත් අපේක්ෂිත රසයටත් අනුකූල වන්නාවූ සංකල්ප රූප මැවීමෙහි සමතෙකු විය යුතුය. හුදු අලංකරණය සඳහා ම නොව තම චිත්තවේගයන් ප්‍රක්ෂේපනයෙහි ලා සමත් වූ සංකල්ප රූප ජනිත කරවීමෙහි ලා සමතෙක් විය යුතුය. පරිකල්පන ශක්තියෙන් අනූන වූවෙකු විය යුතුය.

එකී පරිකල්පන ශක්තිය, පංති කුල ගෝත්‍ර ආදි ලෙස ප්‍රකාශිත සමාජ සමූහයන්හි අභිප්‍රායයන් අනුව හැඩ ගැස්වෙයි. යමෙක් තමා ජීවත්වන සමාජ බලවේගවලට, වඩා සමීපව, වඩා සංවේදිව, සිටියේ වී නම් ඔහුගේ හෝ ඇයගේ සෞන්දර්යා ඥණයන් වඩා පෝෂිත වූවාවෙයි. සමාජ සත්වයෙකු ලෙස මානවයා හඳුන්වනු ලබන්නේ ද අනුන්ගෙන් පෝෂණය වන අනුන් පෝෂණය කරන ගුණය නිසාය.

සංකල්ප රූපය විවරනය කලහැකි, අර්ථ ගැන්විය හැකි, විධික්‍රම බොහෝ පවතියි. එය රසවිඳින්නෝ ඒ සඳහා නා නා අර්ථ

කථනයන් සපයති. එසේ වූව ද ඊට ආවේනික වූ මූලික අරුත අවිනිශ්චිතය. සංකල්ප රූපය වනාහි අසීමිතයේ [Infinite] සීමිතයක් [Finite] ලෙස Schelling ෂෙලිං නම් දාර්ශනිකයා විසින් හුවා දක්වා ඇත.

යමෙකු තුල මෙම සීමා සලකුණු ඔහු හෝ ඇය විසින් පරිශීලනය කරනු ලබන, ග්‍රහනය කරනු ලබන, මාධ්‍ය භාවිතයේ සිද්ධාන්ත මත පිහිටනු ලබයි. අප ඇසූ දුටු දේ මත වර්ධිත අත්දැකීම් අපේ පරිකල්පන ඥාණයන් කෙරෙහි බලපායි. මෙහිදි ජනමාධ්‍ය මගින් කරනු ලබන බලපෑම පිළිබඳව නොසලකා හැරීමට තරම් රජය, සංස්කෘතික බලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් උදාසීන ප්‍රවේශයක් දරයි නම් එය විනාශකාරී බරපතළ හේතුවකි. ඔවුන් ඒසේ වී ඇත්නම් ඊට හේතුව තම ආත්මීය යැපීම ජනමාධ්‍ය වෙත උකස් කර ඇති නිසා දෝ යි සැක සංකා පහල වීම, අරුමයක් කොට නොසැලකිය යුතුය.

සැබෑවටම නම් ජනමාධ්‍ය කලාවේ කාර්යභාරය හා වගකීම කුමක්ද? යුනෙස්කෝ වාර්ථාවක් ඇසුරින් සම්පාදිත (හඬ රැසක් එක ලොවක්) Many Voices One World [also known as the MacBride Report] නම් ග්‍රන්ථයේ 14 පිටුවෙහි දැක්වෙන පරිදි ජනමාධ්‍යයේ මුඛ්‍ය කාර්ය භාරය ලෙස පහත සඳහන් අෂ්ඨාංගික කාර්යාය සාදනය දක්වා ඇත.

- තොරතුරු සම්පාදනය - Supply of Information,
- සමාජානුයෝජනය - Socialization,
- අභිප්‍රේරණය - Motivation,
- විවාදය සහ සාකච්ඡාව - Debate and discussion
- අධ්‍යාපනය - Education,
- සංස්කෘතික ප්‍රවර්ධනය - Cultural promotion,
- විනෝදාස්වාදය - Entertainment,
- අනුකූලනය - Integration

අප රටෙහි දක්නට හැකි වත්මන් මාධ්‍ය භාවිතයේදි මෙකී කරුනු කාරණා ගුරු කොට ගැනීමක් දැකිය හැකිද? ධනවාදි වෙළඳ

පොල අවශ්‍යතා සඳහාම කැප වූ බාල බොළඳ විනෝදාස්වාදය සැපයීමේ වරදකාරි සිතුවිල්ලෙන් නිදහස්වීම සඳහා පමණක් වන යම් අධ්‍යාපනික මෙහෙවරක නියැලෙනු විනා ඒ සඳහා ම වන චින්තාවක් ඇත්තේ ද? අනුකම්පාව, අශ්ලීලත්වය, ආවේගය ආදි වූ පහසුවෙන් අලෙවි කළ හැකි මාධ්‍ය භාවිතයක විනා තම පාඨකයින්, ශ්‍රාවකයින්, ග්‍රාහකයින් වඩා උසස් චින්තන ධාරාවක් මගින් අභිප්‍රේරණය කිරීමේ උවමනාව සහිත මාධ්‍ය භාවිතයක පැහැදිලි ආලෝකයක් දැකීමට තරම් අප භාග්‍යවන්තයෝ වී ඇත්ද? තම සංස්කෘතික ආගමික හා සමාජයයීය වෙනස්කම් මත, අප එකිනෙකා තනි තනිව මෙන්ම විවිධ සාමූහිකයන් ලෙස ගොනුවී සිටින සමාජ ස්ථරය මත සහනශීලීත්වය පතුරුවාලීමට තරම් වූ අවංක වුවමනාවකින් යුතුව තම මාධ්‍ය භාවිතයේ යෙදෙන සීමිත පිරිසක් ඇතිබව ඔවුනට ගෞරව පිණිස සඳහන් කලයුතු වූවද ආයතනික වශයෙන් එවැනි අවශ්‍යතාවයක් සඳහා සැබෑ ලෙසම පෙනී සිටින්නෝ කොතැනක වෙත්ද?

භාෂාව අමු අමුවේම මරා දමමින් කරළියේ රජයන, ගිරාපෝතකයින් දොඩමළුවන FM/SMS එෆ් එම් සහ එස් එම් එස් සංසකෘතිය තුල සිදුවන සංස්කෘතික පරිහානිය පිළිවඳව ආඩපාලි කියනු වෙනුවට තාරුණ්‍යයේ රිද්මය තේරුම් ගත් නූතන අවශ්‍යතාවයන් මෙන්ම සංස්කෘතික අනන්‍යතාවයන් ද සුරකින සමාජයක් බිහි කල නොහැකිද? සන්නිවේදනයේ ප්‍රබලම මෙවලම වන භාෂාව භාවිතයේ දී ගනු ලබන පියවර අප සංස්කෘතික ප්‍රවාහයේ ඉදිරි හැඩතල තීරණය කරනු ලබන බව තේරුම් ගත යුතුය.

භාෂාව ද සංස්කෘතිය මෙන්ම එකතැන රඳා නොසිටින බව ද කලින් කල විවිධ අන්දමින් පෝෂණය වන බව ද සත්‍යයකි. ඒ එසේ වූවද එකී යායුතු දුර කවරේද යන්න පිළිබඳ දැනුවත් වීමක් අප සතු විය යුතුය. භාෂාවක් දැන හෝ නොදැන මරා දැමීම යනු එකී භාෂාව භාවිත කල ජන සමූහයේ සංස්කෘතිය ද මරා දැමීමකි. 'ඒ එසේ වූවාට කම් නැත. අප ජීවත්විය යුත්තේ 21 වන සියවසේ මානවයින් ලෙස ගෝලීයකරණය වූ ලොවක් තුල ය' යි පවසන්නෝ ද සිටිති. එහි සත්‍යතාවය දන්නෝ ඔව්හුමය.

## ගෝලීයකරණය

ගෝලීයකරණය ගැන කථා කරන බොහෝ දෙනා වැරදි වැටහීමක සිටිනා බවක් පෙනෙන්නට ඇත. ලෝකය කුඩා වී ඇත. ඒ ප්‍රවාහන, සංනිවේදන හුවමාරු පහසුකම් වැඩි දියුණු වීම නිසා මිස භෞතික වශයෙන් සිදු වූ වෙස්කම් නිසා නොවේ. අපි වඩා සමීප වූ විශ්ව ගම්මානයක වාසය කරමු. එය සත්‍යයකි. ඒ නිසාම අනන්‍යතාවය තහවුරු කරගැනීමේ අවශ්‍යතාවය වඩා ප්‍රබලව නොපවතී ද? විශ්ව ගම්මානය විශ්ව පවුලක් ලෙස කුඩා වී ඇත. එකම පවුලක අක්කා නංගී අය්යා මල්ලී අම්මා තාත්තා නැන්දා මාමා වන අපි එකිනෙකාට ආවේනික නමක් පමනක් නොව චර්යා රටාවකින් ද සමන්විත නොවෙමුද? මේ මමය යන ගති ලක්ෂණ විදහා දක්වන අනන්‍යතාවක් අප තුල නොවන්නේද? හැරත් විශ්ව ගම්මානය යනු සියල්ලම එකම භාෂාවක් දෙඩන එකම ආගමක් අදහන එකම කෑමක් අනුභව කරන සත්ව වර්ගයක් ජීවත්වන තැනක් නොවේ. අනන්‍යතාව වඩාත් වැදගත් වන්නේ මෙම විවිධත්වය ප්‍රබල කිරීම සඳහාය. එහෙයින් වෙනදටත් වඩා අපේ අනන්‍යතාව වැදගත් වී ඇත.

ගෝලීයකරණය තුල වාර්ගික අනන්‍යතාව තහවුරු කිරීමේ ශක්‍යතාව පුළුල් වී ඇත. ජාතියක පැවැත්මට යම් භූමි ප්‍රදේශයක අයිතිය තහවුරු විය යුතු කාලයක් ද විය. එහෙත් අද වනවිට තත්වය ඉඳුරාම වෙනස් වී ඇත. රාජ්‍යයක පැවැත්මට නිශ්චිත භූමි ප්‍රදේශයක් අවශ්‍ය වූවද ගෝලීය සමාජය තුල වාර්ගිකයක පැවැත්මට නිශ්චිත භූමි ප්‍රදේශයක් අවශ්‍යම නොවේ. ගෝලීයකරණය හා බැඳුනු තාක්ෂණික වර්ධනය වාර්ගික අනන්‍යතාවය ශක්තිමත් කිරීමට අවශ්‍ය සාධක සපයනු නොවෙත්ද? කවර දේශයක ජීවත් වූව ද තම සංස්කෘතික අනන්‍යතාව පවත්වාගන යාමට අවශ්‍ය කරන සාධක ගෝලීයකරණය තුල වඩ වඩා තහවුරු වී ඇත.

කොරියාවේ ජපානයේ අමෙරිකාවේ ආදී වූ කවරම හෝ රටක විසූවද එකී සංස්කෘතික ප්‍රවාහයේ ආගන්තුක විගඩමුන් ලෙස අතරමං නොවී තම වර්ගයාට ආවේනික වූ මූල සංස්කෘතික අනන්‍යතාව සහිතව ජීවත් වීමට විශ්ව ගම්මානයේ මිනිසා

වාසනාවන්ත වී ඇත. එසේ වූව ද එකී අවශ්‍යතාව සපුරන්නා වූ සංස්කෘතික භාවිතයකට අප යොමුනොවන්නේ නම් විශ්ව ගම්මානයේ අක්මුල් සිදී ගිය පරඬැල් බවට අප පත්වනු ඇත.

ගවේෂණය

විජයාවතරණයෙන්, මහින්දාගමනයෙන් මෙපිට ඉතිහාසය තුල වන කලා භාවිතය ඉන්දිය සම්භවය තහවුරු කෙරෙමින් අපගේ සැබෑවූ ජනමූල සංස්කෘතිය යටපත් කර නොමැතිද යන්න විමැසීම වටනේ නොවේ ද?

ඉබ්බන්කටුව, හැවනේගල වැනි පුරාවිද්‍යාත්මක වැඩබිම් තුල ගොඩ දමනු ලබන වැලලී ගිය සංස්කෘතික උරුමයන් සොයා යායුතු නොවන්නේද? බලංගොඩ මානවයාගේ සංස්කෘතික දායාදයන් සොයා යායුතු නොවන්නේද? ත්‍රස්ත ග්‍රහනයෙන් මිදුනු දීගාමඩුල්ලේ මඟුල් දමන, රතුගල් යාය, උතුරු පච්ච, කුමන වන අරණ ආදි වූ තැන්හි හමුවන පුරාවිද්‍යාත්මක සාධක නොසලකා හරිමුද? සිංහල සහ දෙමළ සහෝදර ජනතාව සමීප කරවන පත්තිනි පූජාව, අවුරුදු සිරිත්, ජන නාට්‍ය ශෛලීන් ආදි දෑ පිළිබඳ විශ්ලේෂණය කරමින් වාර්ගික සහයෝගීතාව තහවුරු කිරීම අරමුණු කොටගෙන විනා අතීතය පිළිබඳ ගවේෂණය වාර්ගික වෙනස්කම් සඳහා සාධක තහවුරු කිරීමට යොදා ගැනීමෙන් දුරස්ථ විය යුතුය. සීමාන්තික ජාතිවාදයෙන් බැහැර විය යුතුය. සමානකම් සොයා මිස වෙනස්කම් සොයා කරන ගවේෂණ සඳහා වෙහෙසිය යුතු නොවේ.

සිංහල ජනමූල සංස්කෘතික අනන්‍යතාව මෙන්ම දෙමළ ආදි අන් ජනසමූහයන්ගේ ද සංස්කෘතික අනන්‍යතාවයනට ගෞරව පූර්වකව අවකාශ සැලසීම නොකරන්නේ නම් ලෙයින් යකඩින් දිනූ දේශයේ දිගුකාලීන සාමයක්, මිත්‍රත්වයේ තහවුරු වීමක් අපේක්ෂා කල නොහැකිය. මෙම සමගිය සුරකිමින් වර්ධනය කිරීම සඳහා නිර්මාණකරණය යොදා ගන්නේ කෙසේද යන්න සොයා බැලීම යුගයේ අවශ්‍යතාවය වේ.

## මිත්‍ර ධර්මය

අප නිරුපද්‍රිතව, නිර්භීතව, ප්‍රීතියෙන් ජීවත්වීමට නම් මිත්‍ර ධර්මය සුරැකිය යුතු බැව් එපිකියුරස් Epicurus [341-270 B.C.E.] විසින් ද පෙන්වා දී ඇත. ප්ලේටෝ Plato [427-342 B.C.E] ද අවධාරනය කරනුයේ මිනිසුන් නිතරම අන්‍යෝන්‍ය සහයෝගයෙන් ක්‍රියා කල යුතු බවයි.

මිත්‍ර ධර්මය කෙලෙසන කලා භාවිතයක නියැලීම යලි වාර්ගික අර්බුද සඳහා වන නිද්‍රාශීලී බීජ, රෝපණය සඳහා අවශ්‍ය සාධක සපයනු ඇත. එය සංසකෘතික පරිහානියට විනා සංස්කෘතික ප්‍රගමනයට උපකාරී නොවන බැව් සිහිතබා ගතයුතුවාක් මෙන්ම සහයෝගීතාවයේ නාමයෙන් තහවුරුව නොතිබිය යුතුවන්නා වූ අනන්‍යතාවයන් සුනුවිසුනු කිරීමට ද මැලි නොවිය යුතුය. තහවුරුව තිබිය යුතුවන්නා වූ අනන්‍යතාවයන් පෝෂණය කිරීමට ද උකටලී නොවිය යුතුය.

අනාගතය සැකසෙන්නේ වර්තමානය මත ය. වර්තමානය අතීතය තුල කිමිදී ලබාගන්නා වූ ඉගෙනුම් මත තීරණය කෙරෙයි. දැනුවත්ව හෝ නොදැනුවත්ව අප විසින් ඉටුකරනු ලබන්නේ අනාගත පරපුරෙහි සංස්කෘතික උරුමයෙහි හැඩතල සලකුණු කිරීමය. එකී කාර්යය සවිඥාණකව කෙරෙන්නේ නම් සංස්කෘතික ප්‍රගමනයක ආශ්වාදය අත්විඳිමේ භාග්‍යවන්තයෝ අපගේ දරු පරපුරම නොවෙත්ද?

# ත්‍රස්තවාදී උවදුරෙන් මුදාගත් ශ්‍රී ලංකාව ලත් නිදහස සහ අනාගතය

## (සාමය, සදාචාරය, කලාව, සංස්කෘතිය හා සංවර්ධනය කරා යන ගමන)

**ආචාර්ය ලීල් ගුණසේකර**

දශක ගණනක් තුළ ශ්‍රී ලංකාවට විනා කළ කුරිරු ත්‍රස්තවාදී උවදුර නිමාවූ විට රටට ජාතියට නව ජීවනයක් උදාකළ ස්වර්ණමය යුගයක් ආරම්භවීම ඓතිහාසික සිද්ධියක් බවට කිසිම සැකයක් නැත. මෙසේ රටේ ස්වෛරීභාවය ආරක්ෂා කරගැනීමටත් භෞමික අඛණ්ඩතාවය නැවතත් පවත්වා ගැනීමටත් සතුරු උවදුරු අතා මකා දැමීමටත් ශ්‍රී ලංකාවේ නායකත්වය දැඩි ආත්ම ශක්තියකින් හා අතිශයින් සූර ලෙස කැපවීමකින් කටයුතු කළේය. එය එසේ මෙසේ සතුරු බලවේගයක් පරාජය කිරීමක් නොවේ. ඉහළම පෙළේ ජාත්‍යන්තර මෙන්ම දේශද්‍රෝහී ජාතික බලවේගවලින් ශක්තිය ලබාගත් අතිශයින් බලවත් ලොව පෙර නොවූ විරූ ලොවටම තර්ජනයක් වූ රුදුරු දෙමළ කොටි ත්‍රස්තවාදීන්ගේ තිස් වසරක විනාශකාරී ප්‍රයත්න පරදවා විජයග්‍රහණය කිරීමකි. එහෙයින් එය වසරක් වසරක් පාසා සමස්ත ජාතියම සමඟ එකතු වී මතු පරම්පරාවල යහපත උදෙසා සැමරිය යුතු ඇගයීමට ලක් කළ යුතු සුවිශේෂී සිද්ධියකි.

ජනනායකයින්, විවිධ ආගම්වල පූජකවරුන්, පොදු ජනතාව ජීවිතක්ෂයට පත්කරමින් ජාතික වස්තූන් සහ දේපල විනාසමින් අපේ රටේ සංස්කෘතිය, ආර්ථිකය හා පාලන තන්ත්‍රය දුර්වලකරමින් ප්‍රභාකරන්ගේ නායකත්වයෙන් සෑදී තිබූ එල්.ටී.ටී.ඊ සංවිධානයේ පරාජය යනු මානව සංහතියේම ජයග්‍රහණයක් බව කිව හැකිය. ඔවුනට ලොව සැමතැනම මුදලින්, අවි ආයුධවලින් සහ ශ්‍රී ලංකා

විරෝධී බටහිර රටවලින් මෙන්ම විදේශගත ඔවුන්ගේ සාමාජිකයින්ගේ ශක්තිය ලැබුණි. ඔවුනට හිතවාදී ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව යයි කියාගත් බලවතුන්ගේ මැදිහත්වීමෙන් ශ්‍රී ලංකා රජයත් සමග සාකච්ඡාවලින් දෙමළ ජනතාවට ඇති ප්‍රශ්න විසඳාගත යුතු යයි යන පදනම මත දශක තුනකට වැඩි කලක් අපි ඔවුනට රැවටුනෙමු.

එහෙත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය අප රටේ විපක්ෂය සහ ප්‍රභාකරන්වාදී සතුරු පිරිස්වලින් සහයෝගයක් නොලැබ බිහිසුණු සතුරන් මෙල්ල කිරීමට යුද වැදී ලත් ජයග්‍රහණය හුදු මානුසික අරමුණකින් එල්ල කළ සටනකින් ලත් ප්‍රතිඵල ලෙස ලෝක ප්‍රසිද්ධය. මෙම පසුබිම විසින් තවත් කරුණක් ද්වනිත කරයි. එනම් එම ජයග්‍රහණය සඳහා දේශප්‍රේමී සියළු දෙනාගේම සහයෝගය ලද බවයි. ත්‍රස්තවාදී උවදුර නිමාවත් සමග මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය නිසා රට එක්සේසත් කිරීම සිදුවූ අතර ඉන් ලත් ප්‍රබෝධයෙන් ජනතා හිතවාදීව රට සංවර්ධනයෙන් සෞභාග්‍ය කරා ගෙන යෑමට අවශ්‍ය පදනම යෙදී ඇත.

ගැමි පසුබිමක සිංහල බෞද්ධ හරයන්ගෙන් පෝෂණය වූ නායකයකු ලෙස පමණක් නොව තම දේශපාලන පරිචය නියමානුකූලව කනිටු තත්වයේ සිට ඉතා දක්ෂ ලෙස ජ්‍යෙෂ්ඨත්වයට පත් වුණු නායකයෙකු ලෙස ජනතාව විසින් පිළිගනු ලබන අතිගරු ජනාධිපතිතුමා දුර දක්නා නුවණ ඇත්තෙකි. ජාතිවාදී ප්‍රශ්න ලිහිල් කිරීමට ඉතා වැදගත් පදනම යෙදූ එතුමා අප රටේ ඇත්තේ රටට ආදරය කරන පිරිසක් සහ රටට ආදරය නැති පිරිසක් පමණක් බවත් සුළුජන වශයෙන් පිරිසක් නැති බවත් පෙන්වා දුන්නේය. එම නිසා පාලකයාගේ සහ පාලිතයින්ගේ අභිප්‍රායන් එකම අරමුණක් ලෙස පිළිගැනෙන කාලයක් ලෙස වර්තමානය සැලකිය හැකි බව ප්‍රත්‍යක්ෂ වනු ඇත. මූලික රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස ත්‍රස්තවාදීන් මුලිනුපුටා දමා රටට සාමය ඇති කර ඊළඟට රටේ සංවර්ධනය ඇතිකළ යුතු බවට ජනාධිපතිතුමා ප්‍රකාශ කර ඇත. අප හැම දෙනාගේ බරපතළ වගකීම වන්නේ එම ප්‍රාර්ථනාව ඉටු කර ගැනීම සඳහා හැකි පරිදි සුදුසු පරිදි දයකත්වය සැපයීමෙනි.

මේ පිළිබඳව සේනාධිනායක අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රස්තවාදය අවසාන කිරීමේ විජයග්‍රහණය සැමරීම නිමිත්තෙන් 2009 ජූනි 3 දින ගාලු මුවදෙර පිටියේ දී පවත්වන ලද රාජ්‍ය උත්සවයේ දී එතුමා කළ ප්‍රකාශය අතිශයින් වැදගත්ය. එනම් "මගේ ආදරණීය පුතේ! දුවේ! රටට ආදරය කරන ඔබ වැනි අනාගත පරපුරක් දෑසින් දකින්නට ලැබීම ගැන ලෝකයේ ඉතාම ආඩම්බර වන රාජ්‍ය නායකයා මමයි. මම ඔබට එදා කිව්වා, අද අපිට තියන ප්‍රශ්න ඔබගේ අනාගතයට භාරදෙන්නේ නෑ කියලා. දැන් අපි දුවල පුතාලට මුහුණ දෙන්න ත්‍රස්තවාදී ප්‍රශ්නයක් මේ රටේ ඉතුරු කරලා නැහැ. ඒ නිසා ඔබගේ යුතුකම මේ එක්සේසත් කළ රට රැකගන්නට ඇහැකි ඥානයෙන් ගුණයෙන් ශක්තියෙන් පිරුණ රටට ආදරය කරන යෝධයෙක් වෙන එකයි. මම නැවතත් අවධාරණය කරනවා, මම මේ රටේ හිමිකරුවා නොව මම මේ රටේ භාරකරුවා පමණයි. ඒ නිසා බිය සැක නැතිව එක්සේසත් කළ රට ඔබට බාරයි" (සංවේදන 1-1 ජූනි 2009 ප්‍රජාසංවර්ධන සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශ ප්‍රකාශනය)

මෙය රටේ නායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ චින්තනයේ හරයයි. මේ තුළ අපේ රාජ්‍ය තන්ත්‍රය මෙහෙයීම සඳහා අවශ්‍ය සතර බ්‍රහ්ම විහරණය, සතර සංග්‍රහ වස්තුව ආදී ධාර්මික චින්තනය ගැබ් වී ඇත. අම්මා කෙනෙකු තම දරුවන් වෙත දක්වන අසීමිත ආදරය මේ රටේ ප්‍රධාන පාලකයා තම රට වැසියාට දක්වන කාරුණික සැලකීමය. ජාතියේ දේශයේ නායකයා විසින් කළ නොහැකි දුෂ්කර කාර්ය භාරය ඉටු කොට ඊළඟ කොටස ජනතාවට භාර දෙන විට අපේ වගකීම විය යුත්තේ යා හැකි සියළු අංශ කරා ගොස් ඒ සියළු බලයන් ජවයන් රට රැකීම රට නැංවීම හා අනාගත පරපුර ශක්තිමත් කිරීමට යොදා ගැනීමට උත්සුක වීමය.

දශ රාජ ධර්මයෙන් රට පාලනය කළ රජවරුන්ගේ පිළිවෙත මෙන්ම වර්තමානයට අවශ්‍ය සංකල්ප අනුව ජනතාවට නායකත්වය දෙමින් ජනාධිපතිතුමා විසින් මෙතෙක් කරන ලද සුවිශේෂ කාර්ය භාර්ය වන ත්‍රස්තවාදයෙන් රට බේරාගැනීමේ උත්කෘෂ්ට මෙහෙයන් වඩාත් හොඳ පලදයක ඒවා බවට පත් කිරීම සඳහා විද්වත් සමාජයේ

මෙන්ම පොදු ජනතාවගේ නොමඳ සහයෝගය ලැබිය යුතුමය. දුප්පත්කම තුරන් කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍යය එකිනෙකට බැඳුනු කරුණු දෙකකි. ජනතාවට විවිධ පහසුකම් හා අවස්ථා ලබා දී සමාජ සාධාරණත්වය ඉටු කිරීම සඳහා ජනතාවගේ සහභාගිත්වය ලබාගත යුතුමය.

මේ ගැන තවදුරටත් මෙසේ සඳහන් කළ හැක. මිහිතලය මත ජීවත්වන මිනිසුන්ට මෙන්ම සතුනට ද මෙම මිහිතලය පොදු වස්තුවකි. ඔවුන් අතුරින් මිනිස් වර්ගයාට ළඟාවිය හැකි දෑ කළ හැකි දෑ බොහෝය. නමුත් ප්‍රජාවක් වශයෙන් ගත් විට සමාජයේ ද, ජීවන වෘත්තිය, පක්ෂය, උගත් නූගත් බව, වත් පොහොසත් බව ආදිය මුල්කොට ගෙන ජන කණ්ඩායම් සමාජයේ අඩු සැලකිල්ලට භාජනය වීමක් හෝ කොන්වීමක් සිදුවන බව සත්‍යයකි. විවිධ හේතුන් නිසා ඇතිවන අසමතාවයන් හඳුනාගෙන ඒවා දුරු කිරීමට උත්සුක විය යුතුය. එබැවින් සමාජ විෂමතාවයන් නැති කිරීම සඳහා භෞතික පහසුකම් ලබාදීමෙනුත්, ප්‍රජාව කොන් කිරීමට හේතුවන ජනතාවගේ හදවත තුළ ඇති කෙරෙන විවිධ හැඟීම් දුරු කිරීමෙනුත් ප්‍රජා සංවර්ධනයට මඟ පෙන්වීමේ අභියෝගය ජයගැනීම සඳහා එක්වීමේ කාලය එළඹ ඇත. ඒ සියළු ප්‍රයන්ත රටේ සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කරගැනීම සඳහා සමගාමී ප්‍රයත්නයක් යෙදීම උදෙසා අධ්‍යාපනඥයින් ලේඛකයන්, විවිධ කලාකරුවෝ දූන් දැන් විමසිලිමත් වෙති.

ජාතික සංස්කෘතික ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීම හා ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ආර්ථික සංවර්ධනය අර්ථවත් කිරීම සඳහා සමගාමීව ඉදිරියට යා යුත්තකි (අංක 1525/12 2007 නොවැම්බර් 28 බදදා රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනය). එම ජාතික සංස්කෘතික ප්‍රතිපත්ති නිවේදනයේ සංස්කෘතික පරිහානියට හේතුවන බාහිර සහ අභ්‍යන්තරික සාධක හඳුනාගැනීමේ හා ඒවා නිගමනය කිරීමේ ස්වයං ශක්තිය ජනතාවට ලබාදීම යන කරුණ ඉස්මතු කර ප්‍රතිකර්ම යෙදීම ජාතික වගකීමක් වී ඇත. ඒ පිළිබඳව ආචාර්ය ගුණදාස අමරසේකර මෙසේ අදහස් දක්වයි.

"අද පවතින සියලු විද්‍යුත් සහ මුද්‍රිත මාර්ගතුලින් අපට අදහස් දක්නට ලැබෙන්නේ නිසරු බොළඳ ප්‍රේමාලාප. තරුණ මනස තුළට රටේ තත්වය අවබෝධ කර දෙන කිසිවක් මාධ්‍ය තුළින් සිදුවනේ නැහැ. බැලූ බැලූ අත දක්නට ලැබෙන්නේ රටේ සංස්කෘතියට සදචාරයට හානිකර දේ රටේ හැම සිදුවීමක්ම ආරම්භවන්නේ හැත්තෑ හතෙන් පස්සේ. ඉතින් අපේ සංස්කෘතියට හර පද්ධතියට මෙතරම් හානිකර දේ සිදුවෙද්දී වුනත් අනෙක් පැත්තෙන් අපට තිබූ විශාල අභියෝගයත් ජයගෙන අළුත් රටක් අළුත් සමාජයක් නිර්මාණය කරනන්න යන වෙලාවක් මේක. මේක කරන්න පුළුවන් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයන්න පමණයි. මේ සඳහා මැදිහත් විය යුත්තේ සාහිත්‍යකරුවන්, කලාකරුවන්, බුද්ධිමතුන් සහ උගතුන්. ඔවුන් කළ යුතු වන්නේ විරහ ගීත රස විඳීම නොවෙයි. ප්‍රේමාලාපවලට සවන්දීම නොවෙයි. මෙහෙම අවස්ථාවක අප නිහඬව සිටියොත් ඒක අනාගත පරපුරට කරන ලොකු හානියක් ලෙසය මා දකින්නේ. මේ රටේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයෙන් මුදා ගත්තාට පමණක් මදි. අපේ රටේ තවත් ත්‍රස්තවාදී ව්‍යාපාර තිබෙනවා. ඒවායින් රට මුදාගත යුතුයි." (අමරසේකර සියත 27 පිටුව 2009 අගෝස්තු මස 30 ඉරිදා)

එසේම මෙවන් තත්වවලින් සංස්කෘතික අනන්‍යතාවය කලාවේ උත්තරීතරභාවය සුරක්ෂිත කිරීම සඳහා මුර දේවතාවුන් ලෙස සංස්කෘතික අමාත්‍යාංශයත් ඊට සම්බන්ධ සංස්කෘතික දෙපාර්තමේන්තුවත් ශ්‍රී ලංකා කලා මණ්ඩලයත් දරන ප්‍රයත්න විශේෂයි. මෙම වකවානුව කලා මණ්ඩලයේ අනන්‍යතාවය හා ක්‍රියාකාරීත්වය පලදායී වීම සඳහා කලා මණ්ඩලය ඉටු කිරීමට දරණ ප්‍රයත්න ප්‍රශංසනීය බව සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ. ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ දැක්ම සහ කාර්යභාරයට සම්බන්ධ සහ සම්බන්ධ නැති බොහෝ කරුණු යටතේ යෝජනා මාලාවක් ශ්‍රී ලංකා කලා කරුවන්ගේ ජාතික සංවිධානය මගින් එකල අගමැති තනතුර දැරූ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඒවායින් යෝජනා ගණනාවක්ම දැනට ක්‍රියාත්මක වී තිබීම ප්‍රශංසනීයයි.

කාලීන වශයෙන් ත්‍රස්තවාදී උවදුර නිමාවට පසු.. යන කාරණය යටතේ වැදගත් කරුණු රැසක් සරල ලෙස වාර්තාගත කිරීම සුදුසු යයි සළකමි. මහා පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ

නොයෙක් අභ්‍යන්තර අභියෝග මැද එතුමා පරසතුරු සටන් ජයගෙන රට එක්සේසත් කළ සැටි චූල වංශයේ 68 පරිච්ඡේදයේ ගජබාහු සිද්ධිය යටතේ සඳහන් වී ඇත. නිලධාරීන් සහ ඇතැමුන් යම් යම් යෝජිත දේ ගැන දුෂ්කරතා පෙන්වූ විට (අද යෙදෙන බසින් "රිනාත්මක චින්තනය") රජතුමා මෙසේ අභියෝගාත්මකව ප්‍රශ්නයක් නගා ඇත. "ජනතාවගේ ශක්තිය තිබේ නම් මේ ලොව අපට කරන්නට බැරි කුමක්ද?" ඒ ශක්තිය මත සංවර්ධනය සඳහා අවශ්‍ය ශිල්පීන් සොයා ගැනීමත් පුහුණු කිරීමත් කර ඇත. ගිහි පැවිදි සම්බන්ධය සහ ශාසන සංශෝධන ආදී ඓතිහාසික සංවර්ධන පටිපාටිය ක්‍රියාත්මක කර ඇත. වර්තමානයේ එඩිතර නායකත්වයක් යටතේ දූරදර්ශී පරිනත නායකත්වයක් යටතේ සිදුවන්නේ එද සිදු වූ දෙය ම ද?

විශ්වවිද්‍යාලයීය නිදහස් ආචාර්යවර්යන්ගේ ප්‍රකාශනයේ මෙසේ සඳහන්ය.

"තිස් වසරකට ආසන්න කාලයක් පැවති බියකරු සන්නද්ධ බෙදුම්වාදය යුද්ධමය වශයෙන් පරාජය කිරීමෙන් පසුව පැවැත්වුනු ජනාධිපතිවරණය රටේ අනාගතය තීරණය කරන්නාවූ සන්ධිස්ථානයකි. මිනීමරු කොටි ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කිරීම තුලින් අප ලබාගෙන ඇත්තේ ගමන් බිමන් යෑමේ නිදහස් වාතාවරණයක් පමණක් යයි සුළුවෙන් තක්සේරු කළ නොහැකිය. කොටි ත්‍රස්තවාදයේ පරාජය තුළින් ශ්‍රී ලංකා වාසීන් අත්කරගත් නිදහස අතිශයින්ම වැදගත් යුග පරිවර්තනයකට අඩිතාලම දැමූවකි". මේ පසුබිම මත පොදු සමාජය දෙස බලන විට විශේෂයෙන්ම ත්‍රස්තවාදය තවමත් මුලිනුපුටා දමා නැති බව පිළිගත යුතුය. එම අභියෝග තිබියදීත් රටේ සංවර්ධනය සහ සෞභාග්‍යය සඳහා උතුරු නැගෙනහිර පළාත්වල මෙන්ම සමස්ත ශ්‍රී ලංකාවේමත් ඊට සමගාමීව සංස්කෘතික සහ සමාජයීය ප්‍රගතිය සඳහා ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම අරමුණු කොටගෙන විවිධ සමාජ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන විට බෙදුම්වාදී දේශපාලනයට තැනක් නැති වනු පැහැදිලිව පෙනේ.

අතිගරු ජනාධිපතිතුමා පළමුව මව්බිම දෙවනුව මව්බිම තෙවනුව මව්බිම ආදී අධිෂ්ඨාන සිතිවිලි ජනිත දේශානුරාගය

වර්ධනය කරන්ම කරන්ම සාමය සදාචාරය සංවර්ධනය තුළින් සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරයි.

"අභිමානවත් ශ්‍රී ලංකාවක් යලි ගොඩනගමු
මගේ මව්බිම දූන් යුධ බියෙන් නිදහස්
ඊළඟට අපි ගොඩනගමු රට
සැමට ජීවන මගක්, සැමට නිවහනක්
ජලය විදුලිය මංමාවත් ආදී
සියලු පහසුකම් සහිත ඵලදායී අධ්‍යාපනයක්
සහ
නිරෝගී බවින් යුතු, යහපත් පවුල්වලින් සෑදුනු
සදාචාරයේ යුක්තියේ සශ්‍රීකත්වයේ දේශයක්
අපි ගොඩ නගමු මතු පරපුරට
ජනතාවගේම පාලනයකට මඟ හදමු
බිය සැක නැති මව්බිමක ඔබ සැමට ගෙනෙමු අපි
ජය සතුට පිරි අනාගතයක්"

මහින්ද රාජපක්ෂ
ශ්‍රී ලංකා ජනාධිපති 2010 මාර්තු

ජනාධිපතිතුමාගේ එම අධිෂ්ඨානාත්මක ප්‍රකාශන මෙන්ම විදේශගත සිට මව්බිමට පැමිණි විට ත්‍රස්තවාදය පරාජය කළ බව දූන මාතෘ භූමියට වැඳ නමස්කාර කර දක්වන ලද ආදර්ශය ජනතාව තුළ දේශාභිමානය වර්ධනය කිරීමේ වැදගත්කම ඒත්තු ගැන්වීමට හේතු වූ බව සඳහන් කළ යුතුය. පියදාස සිරිසේන ලේඛකයා නවකථා කවි ආදියෙන් ද ටිබෙට් ජාතික එස් මහින්ද හිමියන් නිදහසේ මන්ත්‍රය වැනි කාව්‍යයන් මගින් ද මෙම ප්‍රයත්නය දැරූහ. රටේ ජනාධිපතිතුමා ලෙස කරන මේ ප්‍රකාශන සහ ආදර්ශ ක්‍රියා ඇත්ත වශයෙන් සරල ලෙස පෙනුනත් එය රාජ්‍ය ප්‍රතිපත්තියයි. රටේ ජනතාවට දැනුම ලබා දී මේ අපේ රට මේ අපේ මිනිස්සු යන සංකල්පය කෙලින්ම ඒත්තු ගැන්වීමට රාජ්‍ය නායකයින් විසින් මෙහෙවර ඉටු කළ අවස්ථා විරලය. ජනතාවගේ හද ගැස්ම දත් ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව, සරලව කරන කියන දෙය මෙකල රාජ්‍ය ප්‍රතිපත්තිය ලෙස

නිරායාසයෙන් ම සැළකේ. ලේඛනගත නොවූවත් එය විධිමත්ව පාර්ලිමේන්තුවෙන් අනුමත කරනු ලබන පනත් වේ.

විශේෂයෙන්ම බෙදුම්කාරී දේශපාලනය තම ජීවන පිළිවෙල කරගත් අයට "මේ රටේ ඇත්තේ රටට ආදරය කරන පිරිසයි, රටට ආදරයත් නැති පිරිසයි යන ප්‍රකාශය ද ජනතාව කුල්මත් කරනු ලැබූ ප්‍රකාශයකි. එසේම අපි කෙතරම් දුෂ්කර වුව ද කුරිරු ත්‍රස්තවාදීන් පැරදීමට මානුසික සටන තුලින් සාමය උදා කරගත්තෙමු. ඒ සාමයේ නියම ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීමට සංවර්ධනය ඇතිකළ යුතුයි යනුවෙන් කළ ආයාචනාවට ජනතාවගෙන් ලැබුනේ ඉහළම ප්‍රතිචාරයයි.

දේශපාලන, සමාජයීය, ආර්ථික අංශවල පැවැත්ම සංස්කෘතියට බලපායි. එසේම සංස්කෘතිය ද අන්‍යොන්‍ය ලෙස රටේ සංවර්ධනයට බලපායි. සංවර්ධනය යනු භෞතික ලෙස ලබාගන්නා දියුණුව අනුව තිබෙන හා අදාළ යටිතල පහසුකම් යයි සැලකේ. සංස්කෘතියෙන් බලාපොරොත්තු වන්නේ මිනිසාගේ පෞරුෂත්වය වර්ධනයට කායික හා මානසික වර්ධනයයි.

අප රටේ සංස්කෘතික කටයුතුවල දී පෙරදිග සංස්කෘතිය සමග අප බෙදා ගන්නා විවිධ දර්ශනාත්මක ඉගැන්වීම් බුදු සමයෙන් ලබා ඇත්තෙමු. බුද්ධ ධර්මය, බුද්ධ චරිතයෙන් සෑදී සාහිත්‍ය කලා ශිල්ප අතීතයේ සිට අද දක්වා සම්භාවනීයත්වයෙන් රැක ගැනීම අපේ ප්‍රයත්නය වී ඇත. එසේම විවිධ වාර්ගිකයන් ඇතුළත් සංයුතියත්, ගෝලීයකරණයත් සමගාමීව අපේ පාරම්පරික ඥානය අනුව නිර්මාණ කලා පෝෂණයට ජනතාවගේ ක්‍රියාකාරී සහභාගිත්වය විවිධත්වයෙන් යුතුව ලබා ගැනීමේ දී විශේෂයෙන්ම වාණිජ රැල්ල ආදී වූ දුෂ්කරතා මැද විවිධ කලා අංශ සඳහා අනුපමේය සේවයක් කරන කලා කරුවන්ට දිරිදීම් රාජ්‍ය ප්‍රතිපත්තිය වී ඇත.

එසේම මෙකල විවිධ මාධ්‍ය අංශවලින් රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත් ආදියෙන් කෙරෙන අහිතකර බලපෑම් ගැන ද සදාචාරාත්මක පදනමක් මත විමසිල්ලට ලක් වී තිබේ. මේ සියල්ලටම කලින් සඳහන් කළ පරිදි රාජ්‍ය අනුග්‍රහය බුද්ධිය මෙන්ම හැඟීමේ සංකලනයන් ලෙස සකස් වීගෙන යාම ජනාධිපතිතුමා වැසියනට පතන සුබ අනාගතයක පෙර නිමිති ලෙස සලකා අපට සතුටු විය හැක.



මිල රු. 140/-

ඇඩ් ඇඩ්ස් - මහරගම